# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# ශිෂ්‍ය අත්පොත 2023/2024

PGIPBS

http://pgipbs.kln.ac.lk

**විමසීම්**

| | | |
|---|---|---|
| පොදු | : | +94 11 2809321 |
| ෆැක්ස් | : | +94 11 2809320/22 |
| අධ්‍යක්ෂ | : | +94 11 2809320 Ex. 101 |
| බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය | : | +94 11 2809321 Ex.109 |
| බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය | : | +94 11 2809321 Ex.110 |
| බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය | : | +94 11 2809321 Ex.112 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | : | +94 11 2809321 Ex.102 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | : | +94 11 2809321 Ex.113 /+94112809322 |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | : | +94 11 2809321 Ex.126 |
| සහකාර ලේඛකාධිකාරී | : | +94 11 2809321 Ex. 120 |
| පර්යේෂණ ඒකකය | : | +94 11 2809321 Ex.130/131 |
| ශිෂ්‍ය කටයුතු අංශය | : | +94 11 2809321 Ex.119 / +113051085 |
| වෙබ් අඩවිය | : | http://pgipbs.kl.ac.lk |
| විද්‍යුත් තැපෑල | : | pgipbs@gmail.com |

# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## ශිෂ්‍ය අත්පොත - 2023/2024

977/5, යුනිවර්සිටි ඩ්‍රයිව්

බුළුගහ හන්දිය, කැලණිය

# ශිෂ්‍ය අත්පොත - 2023/2024

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**
**කැලණිය විශ්වවිද්‍යාලය**

## සංස්කාරක කමිටුව

### උපදේශක

**විනේතෘ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමි**
අධ්‍යක්ෂ, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

### සභාපති

**මහාචාර්ය ඩබ්ලිව්. එම්. දේශප්‍රිය ගුණසේන**
අංශ ප්‍රධාන, බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය

### ලේකම්

**ආචාර්ය තල්ගම්පල පදුම හිමි**
පර්යේෂණ අංශය

### සාමාජික

| | |
|---|---|
| **ආචාර්ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි** | අංශ ප්‍රධාන, බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය |
| **මහාචාර්ය මිරිස්වත්තේ විමලඤාණ හිමි** | අංශ ප්‍රධාන, බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය |
| **ආචාර්ය අශෝක වැලිතොට මහතා** | බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය |
| **මහාචාර්ය රළුවේ පද්මසිරි හිමි** | බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය |
| **මහාචාර්ය පී. ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා** | බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය |
| **ආචාර්ය රත්නසිරි රත්නායක මහතා** | බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය |
| **ආචාර්ය ඉරෝමී ආරියරත්න මහත්මිය** | බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය |
| **එල්. ඒ. සුමිත් ජයසේකර මහතා** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී |
| **ගීතානි අත්තනායක මහත්මිය** | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී |
| **කේ. ඩී. ඩී. එස්. සුගතපාල මහත්මිය** | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී |
| **එම්. බී. වයි. ජී. පෙරේරා මහත්මිය** | සහකාර ලේඛකාධිකාරී |
| **ආචාර්ය විලේගොඩ සිරිවිමල හිමි** | පර්යේෂණ අංශය |
| **ආචාර්ය ඩී. ඩී. සේනාධීර** | ආරාධිත කථිකාචාර්ය |

# පාලි හා බෞද්ධ අධ්‍යයන
# පශ්චාත් උපාධි ආයතනය

## කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## ශිෂ්‍ය අත්පොත - 2023/2024

977/5, යුනිවර්සිටි ඩ්‍රයිව්

බුළුගහ හන්දිය, කැලණිය

ප්‍රථම ප්‍රකාශනයඃ 1992

සයවැනි සංශෝධිත ප්‍රකාශනයඃ 2022

සමාලෝචිත හා සංශෝධිත සංස්කරණයඃ 2023 ජනවාරි

කැලණිය විශ්වවිද්‍යාලයීය පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රකාශනයකි.

977/5, යුනිවර්සිටි ඩ්‍රයිව්

බුළුගහ හන්දිය, කැලණිය

© පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි.

**මුද්‍රණයඃ**

ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂන්ස් සෙන්ටර්, 230/15, කම්මල පාර, කිරිවත්තුඩුව, හෝමාගම

**සැලකිය යුතුයිඃ** සියලු අධ්‍යයන වැඩසටහන්වලට අදාළ මෙම ප්‍රකාශනයෙහි සඳහන් නියම සහ රෙගුලාසි 2023 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වේ.

# පටුන


අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේගේ පණිවුඩය vii

හැඳින්වීම ix

දැක්ම සහ මෙහෙවර xi

කළමනාකාර මණ්ඩලය xii

පීඨ සභාව xiii

අධ්‍යයන කමිටුව xiv

ආයතන කාර්ය මණ්ඩලය xv

බාහිර කථිකාචාර්ය සහ අධ්‍යයන අධීක්ෂණ මණ්ඩලය xvi

01. පශ්චාත් උපාධි අධ්‍යයනඃ පොදු නියමාවලිය 1

අධ්‍යයන පාඨමාලා 1

අධ්‍යයන මාධ්‍යය 2

අධ්‍යයන වර්ෂය 2

ප්‍රවේශය සඳහා අයැදුම් කිරීම 2

ලියාපදිංචි කිරීම 3

ශිෂ්‍යභාවය අවලංගු වීම හා පුනර් ප්‍රවේශය 4

අනියම් ශිෂ්‍යයින් බඳවා ගැනීම 4

පරීක්ෂණ 5

සහතිකපත්‍ර ප්‍රදානය 6

නියමිත ගාස්තු 6

විභාග නීතිරීති හා රෙගුලාසි 7

02. ඉගැන්වීමේ පාඨමාලා 19

02.1 සහතිකපත්‍ර පාඨමාලා 19

02.1.1 EBS: Certificate Course in English for Buddhist Studies 19

02.1.2 CPBS: පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා පාලි සහතිකපත්‍ර පාඨමාලාව 19

02.1.3 CCPB : පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා චීන සහතිකපත්‍ර පාඨමාලාව 25

02.1.4 ත්‍රිපිටක අධ්‍යයනය පිළිබඳ (කෙටිකාලීන) සහතිකපත්‍ර පාඨමාලාව 29

02.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 31

02.2.1 පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 31

02.2.2 බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 41

02.2.3 බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 53

02.3 ශාස්ත්‍රපති උපාධි පාඨමාලා (එක් අවුරුදු) 66

02.3.1 පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 66

02.3.2 බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 80

02.3.3 බෞද්ධ උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 115

03. පර්යේෂණ උපාධි 134

03.1 ශාස්ත්‍රපති (Master of Arts) උපාධිය (දෑවුරුදු) (පාලි හා බෞද්ධ අධ්‍යයනය) 134

03.2 දර්ශනපති (Master of Philosophy) උපාධිය සහ දර්ශන විශාරද (Doctor of Philosophy) උපාධිය 145

03.3 උසස් උපාධියක් සම්පූර්ණ කිරීම සඳහා වන අවශ්‍යතා 150

03.4 පර්යේෂණ උපාධි ශිෂ්‍යයන් සඳහා මාර්ගෝපදේශ 153

03.5 නිබන්ධ සම්පාදනය සඳහා මාර්ගෝපදේශ 157

03.6 අර්ධකාලීන ශිෂ්‍යයෝ 163

03.7 පශ්චාත් දර්ශන විශාරද අධ්‍යයන (Postdoctoral Studies) 163

04. පුස්තකාලය 166

05. මුද්‍රිකා, ත්‍යාග සහ ශිෂ්‍යත්ව 167

06. අනුබද්ධ ආයතන 168

07. සංගම් හා සංවිධාන 182

# අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේගේ පණිවුඩය



පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය ථේරවාදය ප්‍රමුඛ පාලි හා බෞද්ධ අධ්‍යයනය සඳහා ම කැප වූ ශ්‍රී ලංකාවේ ඇති එක ම උසස් අධ්‍යාපන ආයතනය වේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්තා අනුව ශ්‍රී ලංකාවේ වැඩි ම විදේශීය ශිෂ්‍ය ප්‍රමාණයක් ඉගෙනුම ලබන ජාත්‍යන්තර ව පිළිගත්, ශාස්ත්‍රීය ආයතනයක් වශයෙන් මෙය නම් කර තිබීම සුවිශේෂ කරුණකි.

එක් දහස් නවසිය හැත්තෑපහ (1975) ආරම්භක වර්ෂයේ පටන් මේ දක්වා වසර හතළිස් හත (47)ක කාලයක් තුළ මෙම ආයතනය ලබා ඇති සංවර්ධනය උදෙසා එය මෙහෙය වූ අධ්‍යක්ෂවරුන්ගේ දූරදර්ශී මාර්ගෝපදේශකත්වය හා කැපවීම අනතිමානී ව සඳහන් කරමි.

වසර පනහකට ආසන්න දීර්ඝ ඉතිහාසයක් ඇති පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ස්වර්ණමය වර්ෂය දෙදහස් විසිතුන (2023) වර්ෂය යි. එයට හේතුව මෙතෙක් විවිධ ස්ථානයන්හි කුලී පදනම මත පවත්වා ගෙන පැමිණි මෙම ආයතනය, කැලණිය නුවර පාරේ, බුළුගහ හන්දියට ආසන්නයේ ස්වකීය වූ අක්කර දෙකක භූමි භාගයේ සිව්මහල් මන්දිරයක 2023 වර්ෂයේ සිට පවත්වා ගෙන යෑමට හැකියාව ලැබීම යි. මෙම සත් කාර්යය සඳහා කෝවිඩ් දහනවය වසංගතය හා ආර්ථික අර්බුදය මැද වුව ද, අවශ්‍ය ප්‍රතිපාදන ලබා දුන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා විදේශීය ස්වාමීන් වහන්සේලා ප්‍රමුඛ උදව් උපකාර කළ සියලු ම දෙනාට මාගේ කෘතඥතා පූර්වක පුණ්‍යානුමෝදනාව හිමි වේ.

දෙස් විදෙස් විද්‍යාර්ථීන්ගේ පාලි හා බෞද්ධ අධ්‍යයන සඳහා වූ පිපාසය සන්සිඳුවාලමින්, බෞද්ධ අධ්‍යයනයේ විවිධ මං පෙත් විවර කරමින් නූතන ලෝකයට අවශ්‍ය භාෂා ඥානයෙන් හා විෂය දැනුමෙන් සන්නද්ධ ගිහි පැවිදි විද්වතුන් බිහි කරන අප ආයතනය ශ්‍රී ලංකා මාතාවගේ සශ්‍රීකත්වය උදෙසා ම කැපවූවකි. එම අරමුණු හොඳින් අවබෝධ කොට ගෙන ඒ සඳහා වෙර වීර්යයෙන් ක්‍රියා කරන ප්‍රාමාණික දැනුමෙන් යුත් ආචාර්ය මණ්ඩලයක් හා කාර්යක්ෂම අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් මෙම ආයතනයේ සිටීම මහඟු ආශිර්වාදයකි.

මෙම ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා 2023/2024 වර්ෂයේ සපැමිණි සියලු විද්‍යාර්ථීන් සාදරයෙන් පිළිගන්නා අතර වඩාත් ඵලදායි ශාස්ත්‍රීය අධ්‍යයනයක නිරත වීමට ඔබ සැමට ශක්තිය, ධෛර්යය ලැබේවායි ආශංසනය කරමි.

**විනේතෘ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධම්මජෝති හිමි**

**අධ්‍යක්ෂ**

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**

**කැලණිය විශ්වවිද්‍යාලය**

# හැඳින්වීම

කැලණිය විශ්වවිද්‍යාලයයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, එය ආරම්භ කරන ලද 1975 නොවැම්බර් මස 23 දින සිට 1979 දෙසැම්බර් 31 දින දක්වා හඳුන්වනු ලැබුවේ විද්‍යාලඞ්කාර බෞද්ධ අධ්‍යයන ආයතනය යනුවෙනි. අනතුරු ව එය ලඞ්කා (ශ්‍රී ලඞ්කා) විශ්වවිද්‍යාලයයේ විද්‍යාලඞ්කාර මණ්ඩපයට අනුබද්ධ කරනු ලැබීය. එහි වත්මන් නාමය, තත්ත්වය සහ ව්‍යුහය ප්‍රභවය වනුයේ 1980 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වූ 1979 අංක 8 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි අධ්‍යයන නියමාවලියෙනි. එම නියමාවලිය අනුව මෙම ආයතනය ශාස්ත්‍රීය සහ පරිපාලන යන දෙඅංශයේ ම පිරිස් නියෝජනය වන පරිද්දෙන් සමන්විත වූ කළමනාකාර මණ්ඩලයක (විධායක අධිකාරිය) මාර්ගෝපදේශකත්වය සහ පාලනය යටතේ කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වෙයි. විෂයමාලා සංවර්ධනය, අධ්‍යයන පාඨමාලා පවත්වා ගෙන යාම, ඉගැන්වීමේ කටයුතු, පර්යේෂණ සහ විභාග පැවැත්වීම කළමනාකාර මණ්ඩලයේ සහ විශ්වවිද්‍යාල සනාතන සභාවේ අනුමැතියට යටත්ව, පීඨ සභාවේ (අධ්‍යයන අධිකාරියේ) අධීක්ෂණය යටතේ සිදු වේ. ආයතනය අධ්‍යයන අංශ තුනකින් සමන්විත වෙයි. එනම්, බෞද්ධ මූලාශ්‍රය, බෞද්ධ චින්තනය සහ බෞද්ධ සංස්කෘතිය යනුවෙනි. අදාළ ක්ෂේත්‍රය තුළ අධ්‍යයන කටයුතු සහ පර්යේෂණ සඳහා වන පොදු මාර්ගෝපදේශකත්වය ඒ ඒ අංශයේ අංශ ප්‍රධානියා විසින් සිදුකරනු ලැබේ. ඉගැන්වීමේ සහ අධීක්ෂණ කටයුතු ප්‍රධාන වශයෙන් දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලයන්හි මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨවලින් පත්කර ගනු ලබන ආචාර්ය සහ ශාස්ත්‍රීය අධීක්ෂක මණ්ඩලයක් විසින් මෙහෙය වනු ලැබේ. අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිංහල හෝ ඉංග්‍රීසි හෝ මාධ්‍යයන්ගෙන් සිදුකිරීමට අවකාශ ඇති අතර ආයතනය දේශීය හා විදේශීය ශිෂ්‍යයන් සඳහා විවෘතව පවතී.

ශාස්ත්‍රපති උපාධි පාඨමාලා, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ කෙටිකාලීන අධ්‍යයන වැඩසටහන් සඳහා අප ආයතනය විද්‍යාර්ථීන් වෙනුවෙන් ඉගැන්වීම් කටයුතුවල යෙදේ. තාවකාලික ශිෂ්‍යයින් වෙනුවෙන් මෙන් ම විශේෂයෙන් ස්වකීය වූ අධ්‍යයන ව්‍යාපෘති සඳහා සහාය අපේක්ෂිත විදේශීය ශිෂ්‍යයින් වෙනුවෙන් ද ආයතනය මාර්ගෝපදේශය සපයයි. ශාස්ත්‍රපති දැවුරුදු, දර්ශනපති සහ දර්ශන විශාරද පර්යේෂණ උපාධි සඳහා විද්‍යාර්ථීන් විසින් සිදු කෙරෙන පර්යේෂණ කටයුතු මෙන් ම, ඒ හා සබැඳි උපාධි නිබන්ධ අප පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් සහ ආරාධිත විද්වතුන් විසින් අධීක්ෂණයට ලක්කරනු ලැබේ.

අද වන විට ආයතනයේ කාර්ය රටවල් ගණනාවක් කරා විහිද ගොස් ඇත. හොංකොංහි සීමාසහිත හොංකොං බුද්ධ ධර්ම ආයතනය, සිංගප්පූරුවේ බෞද්ධ පුස්තකාලයීය උපාධි ආයතනය සහ චීනයේ මවුන්ට් පුටුවෝහි චීන බෞද්ධ විද්‍යායතනය අප ආයතනයට අනුබද්ධ වෙමින් ඉගැන්වීමේ කටයුතු සහ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරති.

පූජ්‍ය ආචාර්ය හැවැන්පොල රතනසාර හිමියන්ගේ (1975-1979) පුරෝගාමීත්වයෙන් හා අධ්‍යක්ෂකත්වයෙන් ආරම්භ වූ අප ආයතනයේ අධ්‍යක්ෂධුරය ඉන් අනතුරුව පාලි හා බෞද්ධ

අධ්‍යයන ක්ෂේත්‍රයේ විශිෂ්ට බුද්ධිමතුන් වන මහාචාර්ය එල්. පී. එන්. පෙරේරා (1979-1984), පසුව පූජ්‍ය මහාචාර්ය ධම්මවිහාරී හිමියන් ලෙස හඳුන්වනු ලැබූ මහාචාර්ය ජෝතිය ධීරසේකර (1984 1990), මහාචාර්ය වයි. කරුණාදාස (1991-2000), මහාචාර්ය තිලක් කාරියවසම් (2000-2003), මහාචාර්ය අසංග තිලකරත්න (2003-2007), මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ (2007-2013) සහ මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි (2013-2019) යන විද්වතුන් විසින් හොබවමින් ආයතනයේ ගමන් මග ප්‍රභාවත් කර ඇත.

## දැක්ම

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි
පර්යේෂණ සඳහා වන
ලෝකයේ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය බවට පත්වීම

## මෙහෙවර

බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි දැනුම, ආකල්ප හා පර්යේෂණ
කුසලතා වර්ධනයෙහි ලා
විශිෂ්ටත්වය සාධනය කරගනු පිණිස
හැකි උසස් ම අවස්ථා සහ පහසුකම් විද්‍යාර්ථීන්ට සපයා දීම

# කළමනාකාර මණ්ඩලය

## නිල බලයෙන්

**සභාපති**

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ
**විනේතෘ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමි**

**සාමාජික**

උසස් අධ්‍යාපනය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ එම අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්:
**නිමාලි ද සිල්වා මහත්මිය**

සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ එම අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්:
**සී. කේ. විජේමාන්න මහත්මිය**

මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්:
**ආර්. කොළඹගේ මහත්මිය**

## අධ්‍යයන අංශ ප්‍රධාන

**මහාචාර්ය ඩබ්ලිව්. එම්. දේශප්‍රිය ගුණසේන මහතා** - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය
**ආචාර්ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි** - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය
**මහාචාර්ය මිරිස්වත්තේ විමලඤාණ හිමි** - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

## කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නම් කරන ලද සාමාජිකයෝ

**එල්. ඊ. සුසන්ත සිල්වා මහතා**
**එස්. කේ. සිරිල් සුදුවැල්ල මහතා**

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජිකයෝ

**ආචාර්ය විලේගොඩ අරියදේව හිමි**
**සම්මානිත මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය**
**මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා**
**මයිකල් ද සිල්වා මහතා**

## ආයතනික උපස්ථිතියෙන්

**එල්. ඒ. සුමිත් ජයසේකර මහතා** - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
**කේ. ඩී. ඩී. එස්. සුගතපාල මහත්මිය** - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
**එම්. බී. වයි. ජී. පෙරේරා මහත්මිය** - සහකාර ලේඛකාධිකාරී

# පීඨ සභාව

## නිල බලයෙන්

**සභාපති**

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ

**විනේතෘ ජ්‍යෝෂ්ඨ මහාචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමි**

## අධ්‍යයන අංශ ප්‍රධාන

**මහාචාර්ය ඩබ්ලිව්. එම්. දේශප්‍රිය ගුණසේන මහතා** - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය
**ආචාර්ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි** - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය
**මහාචාර්ය මිරිස්වත්තේ විමලඤාණ හිමි** - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

## කැලණිය විශ්වවිද්‍යාලයයේ අදාළ අධ්‍යයනාංශ ප්‍රධානීන්

**ජ්‍යෝෂ්ඨ මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි** - පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
**මහාචාර්ය කේ. බී. ජයවර්ධන මහතා** - සංස්කෘත අධ්‍යයනාංශය

## පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ආචාර්ය මණ්ඩලයෙන්

**ආචාර්ය අශෝක වැලිතොට මහතා** - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය
**මහාචාර්ය රළුවේ පද්මසිරි හිමි** - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය
**මහාචාර්ය පී. ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා** - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය
**ආචාර්ය රත්නසිරි රත්නායක මහතා** - බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය
**ආචාර්ය ඉරෝමී ආරියරත්න මහත්මිය** - බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයින්

**සම්මානිත මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර මහතා**
**ජ්‍යෝෂ්ඨ මහාචාර්ය ආනන්ද තිස්ස කුමාර මහතා** - කොළඹ විශ්වවිද්‍යාලය
**ආචාර්ය මඩිහේ සුගතසිරි හිමි** - කොළඹ විශ්වවිද්‍යාලය
**මහාචාර්ය ඒ. එම්. එන්. ඩබ්. මෙන්ඩිස් මහතා** - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**මහාචාර්ය ගාමිණී රත්නශ්‍රී මහතා** - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## ආයතනික උපස්ථිතියෙන්

**එල්. ඒ. සුමිත් ජයසේකර මහතා** - ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
**එම්. කේ. ගීතානි අත්තනායක මහත්මිය (ආරාධිත)** - ජ්‍යෝෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
**එම්. බී. වයි. ජී. පෙරේරා මහත්මිය** - සහකාර ලේඛකාධිකාරී

# අධ්‍යයන කමිටුව

**සභාපති**

**ආචාර්ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි**

අංශ ප්‍රධාන, බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය

**ලේකම්**

**ආචාර්ය රත්නසිරි රත්නායක මහතා**

බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය

**සාමාජික**

**විනේතෘ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමි**

අධ්‍යක්ෂ

**මහාචාර්ය ඩබ්ලිව්. එම්. දේශප්‍රිය ගුණසේන මහතා**

අංශ ප්‍රධාන, බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය

**ආචාර්ය අශෝක වැලිතොට මහතා**

බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය

**මහාචාර්ය රළුවේ පද්මසිරි හිමි**

බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය

**මහාචාර්ය මිරිස්වත්තේ විමලඤාණ හිමි**

අංශ ප්‍රධාන, බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

**මහාචාර්ය පී. ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා**

බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

**ආචාර්ය ඉරෝමී ආරියරත්න මහත්මිය**

බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය

**පත්කළ සාමාජික**

**මහාචාර්ය නාඹටුන්නේ විමලඤාණ හිමි**

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**මහාචාර්ය දුනේෂ් ගුණතිලක මහතා**

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**මහාචාර්ය පනහඩුවේ යසස්සි හිමි**

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ආරාධිත සාමාජික**

**එල්. ඒ. සුමිත් ජයසේකර මහතා** - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

**එම්. කේ. ගීතානි අත්තනායක මහත්මිය** - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී

**එම්. බී. වයි. ජී. පෙරේරා මහත්මිය** - සහකාර ලේඛකාධිකාරී

**ආචාර්ය තල්ගම්පල පදුම හිමි** - විද්‍යාත්මක සහකාර

**ආචාර්ය විලේගොඩ සිරිවිමල හිමි** - විද්‍යාත්මක සහකාර

# ආයතන කාර්ය මණ්ඩලය

## අධ්‍යක්ෂ

**විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මැදවච්චියේ ධම්මජෝති හිමි**

## අධ්‍යයනාංශ

**බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශය**
මහාචාර්ය ඩබ්ලිව්. එම්. දේශප්‍රිය ගුණසේන මහතා (අංශ ප්‍රධාන)
ආචාර්ය අශෝක වැලිතොට මහතා

**බෞද්ධ චින්තනය අධ්‍යයනාංශය**
ආචාර්ය වඩිනාගල පඤ්ඤාලෝක හිමි (අංශ ප්‍රධාන)
මහාචාර්ය රළුවේ පද්මසිරි හිමි
ආචාර්ය රත්නසිරි රත්නායක මහතා

**බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනාංශය**
මහාචාර්ය මිරිස්වත්තේ විමලඤාණ හිමි (අංශ ප්‍රධාන)
මහාචාර්ය පී. ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා
ආචාර්ය ඉරෝමී ආරියරත්න මහත්මිය

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**
එල්. ඒ. සුමිත් ජයසේකර මහතා

**ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී**
එම්. කේ. ගීතානි අත්තනායක මහත්මිය

**ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී**
කේ. ඩී. ඩී. එස්. සුගතපාල මහත්මිය

**සහකාර ලේඛකාධිකාරී**
එම්. බී. වයි. ජී. පෙරේරා මහත්මිය

**පර්යේෂණ අංශය**
ආචාර්ය තල්ගම්පල පදුම හිමි
ආචාර්ය විලේගොඩ සිරිවිමල හිමි

**ශිෂ්‍ය කටයුතු සහ විභාග අංශය**
බී. ඩී. ආර්. ටී. කේ. බෝධිකොටුව මහත්මිය (කළමනාකරණ සහකාර)
එම්. ඩබ්ලිව්. ආර්. දිව්‍යාංජලී (කළමනාකරණ සහකාර)

# බාහිර කථිකාචාර්ය සහ අධ්‍යයන අධීක්ෂණ මණ්ඩලය

මහාචාර්ය කේ.එල්. ධම්මජෝති හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය දේවාලේගම මේධානන්ද හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි. පී.එච්.ඩී.
මහාචාර්ය කහපොල සුගතරතන හිමි, පී.එච්.ඩී.
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය ගල්ලෑල්ලේ සුමනසිරි හිමි, පී.එච්.ඩී.
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි, පී.එච්.ඩී.
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය නායිම්බල ධම්මදස්සි හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය තැරැලේ ධම්මරතන හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය වරදිවෙල විජයසුමන හිමි, පී.එච්.ඩී.
විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මුවඇටගම ඤාණානන්ද හිමි, පී.එච්.ඩී
මහාචාර්ය නාඔටුන්නේ විමලඥාන හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය පින්නවල සංඝසුමන හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි, එම්. ෆිල්
මහාචාර්ය පිටිගල විජිත හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය බෙලිගල්ලේ ධම්මජෝති හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය උඩුවතුරබුබුලේ මහින්ද හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය මොරගොල්ලාගම උපරතන හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය එළමල්දෙනියේ සාරානන්ද හිමි, පී.එච්.ඩී.
මහාචාර්ය පනහඩුවේ යසස්සි හිමි, පී.එච්.ඩී.
ආචාර්ය මිරිස්සේ ධම්මික හිමි, පී.එච්.ඩී.
ආචාර්ය දෙනියායේ පඤ්ඤාලෝක හිමි, පී.එච්.ඩී.
විශ්‍රාමික මහාචාර්ය හෝමාගම ධම්මානන්ද හිමි, පී.එච්.ඩී
මහාචාර්ය උඩුහාවර ආනන්ද හිමි, පී.එච්.ඩී.
ආචාර්ය මඩිහේ සුගතසිරි හිමි, පී.එච්.ඩී.
ආචාර්ය දිවුලපැලැස්සේ විමලානන්ද හිමි, පී.එච්.ඩී.
ආචාර්ය ජම්බුගහපිටියේ ධම්මාලෝක හිමි, පී.එච්.ඩී.
ආචාර්ය තල්ගම්පල පදුම හිමි, පී.එච්.ඩී.
ආචාර්ය සූරක්කුලමේ පේමරතන හිමි, පී.එච්.ඩී.
ආචාර්ය විලේගොඩ සිරිවිමල හිමි, පී.එච්.ඩී.
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුඹුකන්දන රේවත හිමි, එම්. ෆිල්.
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුඩාකත්නෝරුවේ විනීත හිමි, එම්. ෆිල්.
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජිතපුර ගුණරතන හිමි, එම්. ෆිල්.
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඉලුක්වෙල ධම්මරතන හිමි, එම්. ෆිල්.
සම්මානිත මහාචාර්ය වයි. කරුණාදාස මහතා, පී.එච්.ඩී.
සම්මානිත මහාචාර්ය රත්න විජේතුංග මහතා, පී.එච්.ඩී.

සම්මානිත මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර මහතා, පී.එච්.ඩී.
සම්මානිත මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා, පී.එච්.ඩී., ඩී.ලිට්
සම්මානිත මහාචාර්ය පී. ඩී. ප්‍රේමසිරි මහතා, පී.එච්.ඩී.
සම්මානිත මහාචාර්ය ජී. ඩී. සුමනපාල මහතා, පී.එච්.ඩී.
සම්මානිත මහාචාර්ය ඩබ්ලිව්. එම්. රාජපක්ෂ මහතා, පී.එච්.ඩී.
සම්මානිත මහාචාර්ය අසංග තිලකරත්න මහතා, පී.එච්.ඩී.
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත ගරුසිංහ මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය සරත් ආනන්ද මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය ආර්. ජී. ඩී. ජයවර්ධන මහතා, පී.එච්.ඩී.
විශ්‍රාමික මහාචාර්ය එම්. එච්. ඒ. තිසේරා මහතා, පී. එච්. ඩී
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආනන්ද තිස්ස කුමාර මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි මහතා පී.එච්.ඩී.
මහාචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය රෝහණ සෙනෙවිරත්න මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය ක්ෂුජ් මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය සුදර්ශන බණ්ඩාර මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය දුනේෂ් ගුණතිලක මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය විමල් හේවාමානගේ මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය ඒ. එම්. එන්. ඩබ්. මෙන්ඩිස් මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය ගාමිණී රත්නශ්‍රී මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය මහින්ද හේරත් මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය සිරිනාම බණ්ඩාර මහතා, පී.එච්.ඩී.
මහාචාර්ය වසන්තා සෙනෙවිරත්න මහත්මිය, පී.එච්.ඩී.
ආචාර්ය ප්‍රින්සි පීරිස් මහත්මිය, පී.එච්.ඩී.
ආචාර්ය ඩී. ඩී. සේනාධීර මහතා, පී.එච්.ඩී.
ආචාර්ය රාජිත පුෂ්පකුමාර මහතා, පී.එච්.ඩී.
ආචාර්ය බී. එච්. එන්. ඩබ්. බෝහිංගමුව මහතා, පී.එච්.ඩී.
ආචාර්ය චන්දිම බෝගහවත්ත මහතා, පී.එච්.ඩී.
ආචාර්ය ගාමිණී විජේසිංහ මහතා. පී.එච්.ඩී.
ආචාර්ය සරත් විතාරණ මහතා, පී.එච්.ඩී.
ආචාර්ය නාමල් බලල්ලේ මහතා, පී.එච්.ඩී.
ආචාර්ය අශෝක ගුණසේකර මහතා, පී.එච්.ඩී.
ආචාර්ය ඒ. ඒ. ආර්. ප්‍රියංක මහතා, පී.එච්.ඩී.
ආචාර්ය ප්‍රියන්ත කුමාර වැන්දබෝනා මහතා, පී.එච්.ඩී.
ආචාර්ය යූ නාම් හ්‍යුන් මෙනෙවිය, පී.එච්.ඩී.
ආචාර්ය සමන්ත කුමාර රාජපක්ෂ මහතා, පී. එච්. ඩී.
ආචාර්ය ඉශංක මල්සිරි මහතා, පී. එච්. ඩී.
ආචාර්ය කසුන් බණ්ඩාර මහතා, පී. එච්. ඩී.
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන්ත ඉලංගකෝන් මහතා, එම්.ෆිල්.
කථිකාචාර්ය කේ. වී. ජේ. කෝසලී මහත්මිය, එම්.ෆිල්.

## ඉංග්‍රීසි උපදේශකවරු

ඔලිවර් හෙන්රි ටෙනර් මහතා, එම්. ඒ.

# උපාධි ප්‍රදානෝත්සවය - 2019









# උපාධි ප්‍රදානෝත්සවය - 2019















# 01. පශ්චාත් උපාධි අධ්‍යයන පොදු නියමාවලිය

## අධ්‍යයන පාඨමාලා

1.01 පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය මගින් පහත දැක්වෙන පශ්චාත් උපාධි සහතිකපත්‍ර, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති සහ උසස් පර්යේෂණ උපාධි පාඨමාලා පැවැත්වීමත්, අනුමත අධ්‍යයන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සඳහා පහසුකම් සැලසීමත් සිදුකෙරේ.

### පශ්චාත් උපාධි සහතිකපත්‍ර

- Certificate Course in English for Buddhist Studies
- පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා පාලි සහතිකපත්‍ර පාඨමාලාව
- පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා චීන සහතිකපත්‍ර පාඨමාලාව
- පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා ත්‍රිපිටක මූලාශ්‍රය අධ්‍යයනය පිළිබඳ (කෙටිකාලීන) සහතිකපත්‍ර පාඨමාලාව

### පශ්චාත් උපාධි ඩිප්ලෝමා

- පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
- බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
- බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

### ශාස්ත්‍රපති

- පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (එක් අවුරුදු)
- බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (එක් අවුරුදු)
- බෞද්ධ මනෝඋපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (එක් අවුරුදු)

### උසස් පර්යේෂණ උපාධි

- පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (දැවුරුදු)
- බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (දැවුරුදු)
- දර්ශනපති උපාධිය (පාලි හා බෞද්ධ අධ්‍යයන)
- දර්ශන විශාරද උපාධිය (පාලි හා බෞද්ධ අධ්‍යයන)
- පශ්චාත් දර්ශන විශාරද අධ්‍යයන

## අධ්‍යයන මාධ්‍යය

1.02 සියලු පාඨමාලා ඉගැන්වීම් හා පර්යේෂණ වැඩසටහන් සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන් ම පැවැත් වේ. වෙනත් භාෂා මාධ්‍යයකින් අධ්‍යයන කටයුතු කරගෙන යාමට කැමැත්ත දක්වන ශිෂ්‍යයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටී නම් එම මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වීම සලකා බැලිය හැකි ය. ආයතනයේ පීඨ සභාවේ පූර්ව අනුමැතියට යටත්ව අධ්‍යයන කටයුතු සඳහා වෙනත් භාෂා මාධ්‍යයක් භාවිත කිරීමට විදේශීය අනුබද්ධ ආයතනවලට හැකියාව ඇත.

## අධ්‍යයන වර්ෂය

1.03 ආයතනයෙහි අධ්‍යයන වර්ෂය ආරම්භ වනුයේ ආයතනයේ පීඨ සභාව විසින් තීරණය කරනු ලබන පරිදි වර්ෂයේ මුල් භාගයේ දිනයක දී ය. අධ්‍යයන වර්ෂය වාර තුනකින් සමන්විත වේ. එක් එක් අධ්‍යයන වර්ෂයක වාර නියමය තීරණය කරනු ලබනුයේ ආයතනයේ පීඨ සභාව විසිනි.

## ප්‍රවේශය සඳහා අයැදුම් කිරීම

1.04 මෙම ආයතනයේ කිසියම් පශ්චාත් උපාධියක්, පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා නිර්දේශිත අධ්‍යයන වැඩසටහනකට ප්‍රවේශ වීමට අපේක්ෂා කරන අයැදුම්කරුවකු විසින් එම පාඨමාලාවට අදාළ ව ආයතනය විසින් නියම කර ඇති සියලු ම ප්‍රවේශ අවශ්‍යතා සපුරා තිබිය යුතු ය.

1.05 සෑම වර්ෂයක ම නොවැම්බර් මස 05 දින සිට දෙසැම්බර් මස අවසානය දක්වා වූ කාලය තුළ ප්‍රවේශය සඳහා අයැදුම්පත් භාරගනු ලැබේ. එහෙත් මේ කාලසීමාව යථායෝග්‍ය පරිදි වෙනස් කිරීමේ බලය ආයතනය සතු ය. එක් එක් අධ්‍යයන වර්ෂය සඳහා අයැදුම්පත් භාරගන්නා කාලසීමාව පුවත්පත් මගින් නිවේදනය කරනු ලැබේ.

1.06 ප්‍රවේශය සඳහා වන සෑම අයැදුම්පතක් ම ආයතනයෙන් හෝ ආයතනයේ වෙබ් අඩවියෙන් හෝ ලබාගත් නියමිත ආකෘති පත්‍රය මගින් ඉදිරිපත් කළ යුතු අතර එය ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත යොමු කළ යුතු ය.

1.07 අයැදුම්කරුවකු සිය සුදුසුකම් තහවුරු කිරීම පිණිස පිළිගත් සහතිකපත්වල මුල් පිටපත් හා අයැදුම්පතට අදාළ වෙනත් ලිපි ලේඛන තම මූලික අයැදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

1.08 ලියාපදිංචි වන ක්‍රමය, තමන් අභිමත අධ්‍යයන භාෂා මාධ්‍යය, පාඨමාලාව මෙන් ම ඊට අදාළ ඒකක තෝරා ගැනීමට ද අයැදුම්කරුවකුට හැකියාව ඇති අවස්ථාවක දී ඔහුගේ තේරීම් කවරේදැයි මූලික අයැදුම්පතෙහි ඉතා පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

1.09 අයැදුම්කරුවකු විසින් සිය මූලික අයැදුම්පතෙහි සඳහන් කර ඇති නම හා ඔහුගේ/ඇයගේ අධ්‍යාපන සහතිකපත්වල සඳහන් නම අතර කිසියම් වෙනසක් ඇති විට එම නම් දෙකෙන් ම හැඳින්වෙනුයේ අයැදුම්කරු බව සනාථ කිරීම සඳහා දිවුරුම් සහතිකයක් අයැදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

1.10 නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයැදුම්පත් ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත අයැදුම්පත් භාරගන්නා අවසන් දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය.

1.11 ප්‍රවේශය සඳහා එවනු ලබන එක් එක් අයැදුම්පත සම්බන්ධයෙන්, අවසාන තීරණය ගැනීමේ බලය ඇති පීඨ සභාව විසින් සලකා බලනු ලැබේ. ප්‍රවේශ වීමේ සුදුසුකම් සලකා බැලීමේ දී අවශ්‍ය වුව හොත් වාචික පරීක්ෂණයකට වුව ද පෙනී සිටිය යුතු යැයි පීඨ සභාව විසින් අයැදුම්කරුවකුට නියම කරනු ලැබිය හැකි ය.

## ලියාපදිංචි කිරීම

1.12 ආයතනය විසින් කිසියම් අයැදුම්කරුවකුගේ අයැදුම්පතක් පිළිගත්විට ඔහු/ඇය එකී පශ්චාත් උපාධි පාඨමාලාවේ හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ හෝ සහතිකපත්‍ර පාඨමාලාවේ හෝ පරීක්ෂණවලට අදාළ සියලු ම නීති සහ රෙගුලාසි පිළිපැදීමට යටත් ව ඒ සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

1.13 කිසියම් පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාවක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ පශ්චාත් උපාධි පාඨමාලාවක් හෝ මුල්වරට ලියාපදිංචි වූ දින සිට එම පාඨමාලාවෙහි අවශ්‍යතා සම්පූර්ණ කරන අවස්ථාව තෙක් සිය ලියාපදිංචිය අඛණ්ඩ ව පවත්වාගෙන යන බවට සහතික වීම සෑම ශිෂ්‍යයෙකුගේ ම වගකීම වන්නේ ය.

1.14 ශිෂ්‍යයෙකු සිය ලියාපදිංචියේ ස්වභාවය (අර්ධකාලීන තත්ත්වයෙහි සිට පූර්ණකාලීන තත්ත්වය දක්වා වැනි), පර්යේෂණ නිබන්ධයෙහි මාතෘකාව, ප්‍රමාණය, අන්තර්ගත කරුණු, ලිඛිත පර්යේෂණයෙහි ප්‍රශ්නපත්‍ර හෝ වෙනත් අදාළ කරුණක් සම්බන්ධයෙන් හෝ කිසියම් සංශෝධනයක් අපේක්ෂා කරන්නේ නම්, ඔහු/ඇය විසින් ඒ පිළිබඳ ව ලිඛිත ඉල්ලීමක් යටත් පිරිසෙයින් මාස දෙකකටවත් පෙර ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු ය.

1.15 එවැනි සංශෝධනයකට අවසර ලැබුණු විට, අයැදුම්කරුට තමන් පෙනී සිටීමට නියමිත පරීක්ෂණයේ දිනය යථායෝග්‍ය පරිදි කල් දැමීමට සිදුවනු ඇත. එසේ කල්දමනු ලැබූ පරීක්ෂණයක දින නියමය තීරණය කිරීමේ දී, අයැදුම්කරු මුලින් ලියාපදිංචි වූ දිනයත්, අපේක්ෂිත සංශෝධනය පිළිගනු ලැබූ දිනයත් අතර කාල පරිච්ඡේදය සැලකිල්ලට ගනු ලැබේ. මෙම නියමය අදාළ වන්නේ පර්යේෂණ උපාධියක් සඳහා ලියාපදිංචි වී සිටින අපේක්ෂකයන් සඳහා පමණි.

1.16 යම් අයැදුම්කරුවකු පළමු අවස්ථාවේ දී ම සිය අධ්‍යයන සුදුසුකම්වලට අදාළ ලිඛිත සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහුට/ඇයට තාවකාලික ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉල්ලීමක් කළ හැකි ය. ඔහු/ඇය ස්ථිර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි කරනු ලබනුයේ අදාළ සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීමෙන් පසුව ය.

## ශිෂ්‍යභාවය අවලංගු වීම හා පුනර් ප්‍රවේශය

1.17 යම් ශිෂ්‍යයෙකු සිය අධ්‍යයන කටයුතුවල දී හෝ පර්යේෂණ කාර්යයන්හි දී සතුටුදායක ප්‍රගතියක් නොපෙන්වන බව පීඨ සභාවට පෙනීයන්නේ නම් ඔහුගේ/ඇයගේ ශිෂ්‍යභාවය අවලංගු කිරීමේ අයිතිය එම සභාව සතුව ඇත.

1.18 යම් ශිෂ්‍යයෙකු අධ්‍යයන පාඨමාලාවෙන් සිය කැමැත්තෙන් ඉවත්වී නැවත එම පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන්නේ නම් හෝ, නියමිත කාලය තුළ පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, පශ්චාත් උපාධි සහතිකපත්‍ර හෝ සහතිකපත්‍ර පරීක්ෂණ අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන්නේ නම් හෝ ඔහුට/ඇයට නැවත ලියාපදිංචි වීම සඳහා අයැදුම් කළ හැකි ය. එහෙත් එසේ කළ හැකි වනුයේ අදාළ සිදුවීමෙන් අනුගාමී වර්ෂ 3ක් ඉකුත් ව යාමට පෙර ය. විධිමත් පරිදි ආයතනයට නොදන්වා පාඨමාලා හැර ගිය අවස්ථාවක දී නැවත එම පාඨමාලා හැදෑරීමට කරනු ලබන ඉල්ලීම් සැලකිල්ලට ගනු නොලැබේ.

1.19 නැවත ලියාපදිංචි කිරීම සඳහා අයැදුම්පත් භාරගැනීම සිදු කරනු ලබනුයේ, පීඨ සභාව විසින් අදාළ ශිෂ්‍යයාට නියම කරනු ලබන අවශ්‍යතා සපුරාලීමේ කොන්දේසිය මත ය.

## අනියම් ශිෂ්‍යයින් බඳවාගැනීම

1.20 යම් පුද්ගලයෙකු ආයතනය මගින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවකට හෝ ඉන් කොටසකට සහභාගීවීමට හෝ පශ්චාත් උපාධි පර්යේෂණයක් සඳහා සපයනු ලබන පහසුකම් ලබාගැනීමට හෝ කැමැත්තේ නම් ඔහුට/ඇයට ආයතනයෙහි අනියම් ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි විය හැකි ය. එවැනි ශිෂ්‍යයෙකු ආයතනය විසින් පවත්වනු ලබන පරීක්ෂණවලට පෙනීසිටීම අවශ්‍ය නොවේ.

1.21 එබඳු ශිෂ්‍යයෝ පාඨමාලා හැදෑරීම, පර්යේෂණ කාර්යයන් සඳහා උපදෙස් ලබාගැනීම, යෝග්‍ය අවස්ථාවන්හි දී සම්මන්ත්‍රණ, දේශන හා වැඩමුළුවලට සහභාගී වීම හා පුස්තකාල පහසුකම් ලබාගැනීම ආදියට සුදුස්සෝ වෙති.

1.22 අනියම් ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වීමේ කාල නියමයක් නැති බැවින් ඒ සඳහා ඉදිරිපත් කෙරෙන අයැදුම්පත් අධ්‍යයන වර්ෂයේ කවර හෝ දිනයක ආයතනය වෙත යොමු කළ හැකි ය. කෙසේ වෙතත් කිසියම් පාඨමාලාවක් අධ්‍යයනය කිරීමට අපේක්ෂිත, අනියම් ශිෂ්‍යයින් එම පාඨමාලාව ආරම්භ කරන අවස්ථාවේ සිට ම ඊට සහභාගීවීමට හැකිවනු පිණිස එම පාඨමාලාව සඳහා නියම කර ඇති දිනවල දී ලියාපදිංචි වීම වඩාත් යෝග්‍ය ය.

1.23 අයැදුම්කරුවකු ලියාපදිංචි වීමේ අරමුණ ප්‍රකාශ කරමින් විධිමත් ලිපියක් මගින් තම ශාස්ත්‍රීය හෝ වෘත්තීය පසුබිම හෙළි කළ යුතු ය. ඒ අනුව අයැදුම්කරු බලාපොරොත්තු වන අධ්‍යයන පාඨමාලාවෙන් හෝ පර්යේෂණ කාර්යයෙන් ඔහුට ප්‍රතිලාභයක් වන්නේදැයි තීරණය කිරීමට පීඨ සභාවට හැකි වනු ඇත. අයැදුම්කරු සතු අදාළ සුදුසුකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය.

1.24 අනියම් ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වීම සඳහා කෙරෙන අයැදුමක් සම්බන්ධයෙන් වන ආයතනයේ පීඨ සභාවේ තීරණය, අවසාන තීරණය වන්නේ ය.

1.25 අනියම් ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වීමේ අවසරය ලැබූ විද්‍යාර්ථියකු, ආයතනයේ පූර්ණකාලීන ශිෂ්‍යයකු මෙන් අදාළ සියලු ම ගාස්තු සහ තැන්පතු මුදල් ඔහුගේ ලියාපදිංචිය සිදුකරන අවස්ථාවේ දී ගෙවිය යුතු ය.

1.26 අනියම් ශිෂ්‍යයකුට ආයතනය මගින් පවත්වනු ලබන කවර පාඨමාලාවකට හෝ පාඨමාලා කිහිපයකට හෝ සහභාගි විය හැකි නමුදු, සහභාගීත්වය වෙනුවෙන් විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන කිසිදු සහතික පත්‍රයක්, ඩිප්ලෝමාවක් හෝ උපාධියක් සඳහා අයැදුම් කළ නොහැකි ය. කෙසේ වෙතත්, **සහභාගීත්වය පිළිබඳ සහතිකයක් ආයතනයෙන් ලබාගැනීම සඳහා ප්‍රමාණවත් දේශන සංඛ්‍යාවකට සහභාගි වී තිබීම අවශ්‍ය ය. පාඨමාලාව සාර්ථක ව නිමකළ බවට සහතිකයක් ලබාගැනීම පිණිස අදාළ දේශනවලට සහභාගීවීමට අතිරේක ව අදාළ පරීක්ෂණවලට පෙනී සිට එයින් සාමර්ථ්‍යයක් ලබා තිබීම ද අවශ්‍ය ය.**

## පරීක්ෂණ

1.27 උසස් උපාධි, ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ සහතිකපත්‍ර පරීක්ෂණ ප්‍රවේශය සඳහා අයැදුම් කළ හැකි වනුයේ, අදාළ පාඨමාලා සඳහා විධිමත් පරිදි ලියාපදිංචි වී එය අඛණ්ඩ ව පවත්වා ගෙන ගිය හා පරීක්ෂණයට අදාළ සියලු අවශ්‍යතා සපුරන ලද අපේක්ෂකයන් විසින් පමණි.

1.28 ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ සහතිකපත්‍ර පරීක්ෂණයකට ප්‍රවේශ වීම සඳහා වන සෑම අයැදුම්පතක් සඳහා ම ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගෙන් හෝ ආයතනයේ වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රයක් උපයෝගී කරගත යුතු අතර අයැදුම්පත් භාරගන්නා අවසාන දින හෝ එදිනට පෙර එම අයැදුම්පත ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

1.29 පරීක්ෂණ ප්‍රවේශය සඳහා ඉදිරිපත් කෙරෙන සෑම අයැදුම්පතක් ම, නියමිත ගාස්තු ගෙවූ බවට ලබා ගත් ලදුපතකින් හා එම අයැදුම්පත සමග ඉදිරිපත් කළ යුතු වෙනත් අවශ්‍ය ලිපිලේඛනවලින් ද සම්පූර්ණ විය යුතු ය.

1.30 පරීක්ෂණය සඳහා ප්‍රවේශ පත්‍රය ලැබීමෙන් පසු යම් අයැදුම්කරුවකුට නොවැළැක්විය හැකි හේතුවක් නිසා පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වේ නම්, ඔහු/ඇය පරීක්ෂණයේ ආරම්භක දිනට පෙර ඒ බව අදාළ ප්‍රවේශ පත්‍රය සමඟ අමුණන ලද ලිපියක් මගින් ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත දැනුම් දිය යුතු ය. පරීක්ෂණය ඇරඹීමෙන් පසු, එවැනි දැනුම්දීමක් ලැබෙන අයැදුම්කරුවෙකු වෙනුවෙන්, නැවත පරීක්ෂණයට පෙනී සිටීමේ දී ගෙවිය යුතු ගාස්තුව සම්බන්ධයෙන් වන කිසිදු සහනයක් දෙනු නොලැබේ. කෙසේ වෙතත් පරීක්ෂණයට පෙනීසිටීමට නොහැකි වූයේ කිසියම් සාධාරණ හේතුවක් නිසා නම්, ඒ බව සාක්ෂ්‍ය සහිත ව සනාථ කළ විට, කිසියම් සහනයක් ඔහුට/ඇයට ලබාදීම සඳහා පියවර ගත හැකි ය.

1.31 අයැදුම්කරුවකු පරීක්ෂණයක දී ලබාගත් ප්‍රතිඵල පිළිබඳ ව කරනු ලබන කවර අන්දමේ විමසීමකට වුව ද, ආයතනය විසින් කිසිදු ප්‍රතිචාරයක් දක්වනු නොලැබේ.

## සහතිකපත්‍ර ප්‍රදානය

1.32 උසස් උපාධි පරීක්ෂණයකින් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවකින් හෝ සහතිකපත්‍ර පරීක්ෂණයකින් හෝ සමත් වූ අයැදුම්කරුවකුට සිය සාමර්ථ්‍යය තහවුරු කෙරෙන ප්‍රකාශයක් හෝ තාවකාලික සහතික පත්‍රයක් හෝ නියමිත ගාස්තු ගෙවීමෙන් පසුව ආයතනයෙන් ලබාගත හැකි ය.

1.33 උපාධි ප්‍රදානෝත්සවයෙන් පසුව හෝ විශ්වවිද්‍යාලයයේ සනාතන සභාව සහ පාලක සභාව විසින් නිර්දේශ කරනු ලැබිය හැකි වෙනත් යෝග්‍ය වැඩපිළිවෙළකින් හෝ අනතුරු ව මුද්‍රිත සහතිකපත්‍රය නිකුත් කරනු ලැබේ.

1.34 අවසාන පරීක්ෂණයට පෙනීසිටීම සඳහා සහතිකපත්‍ර පාඨමාලාවක ශිෂ්‍යයෙකු විසින් 80% ක පන්ති සහභාගීත්වය පිළිබඳ අවශ්‍යතාව සම්පූර්ණ කර තිබිය යුතු ය. පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරනු ලබන ශිෂ්‍යයින්ට ආයතනය විසින් සහතික පත්‍රයක් ප්‍රදානය කරනු ලැබේ.

1.35 කුලපතිගේ නියමය පරිදි එක් එක් වර්ෂයේ නියමිත දිනයක නියමිත වේලාවක දී උපාධි ප්‍රදානය කිරීමේ උත්සවයක් විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබේ. පශ්චාත් උපාධි, ශාස්ත්‍රපති හෝ ඩිප්ලෝමා සඳහා නියමිත අවශ්‍යතා නිසි ලෙස සපුරණ ලද සියලු ම ශිෂ්‍යයන් උපාධි ප්‍රදානෝත්සව නිවේදනය ප්‍රකාර ව අදාළ අයැදුම් පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

1.36 ආයතනය සෑහීමකට පත්වන පරිදි අදාළ පාඨමාලාවේ අවශ්‍යතා සම්පූර්ණ කළ අනියම් ශිෂ්‍යයින්, පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලා ශිෂ්‍යයින් හා සහතිකපත්‍ර පාඨමාලා ශිෂ්‍යයින් වෙත සහතිකයක් ප්‍රදානය කෙරේ. කෙසේ වෙතත්, එය උපාධි සහතිකපත්‍රයක් නොවන බව සැලකිය යුතු ය.

## නියමිත ගාස්තු

1.37 පශ්චාත් උපාධි පාඨමාලා හා පර්යේෂණ අධ්‍යයන සඳහා නියමිත ගාස්තු ආයතන අධිකාරීන් විසින් තීරණය කරනු ලැබේ. එක් එක් පාඨමාලාවක් සඳහා නියමිත පාඨමාලා හා පරීක්ෂණ ගාස්තු මෙන් ම ලියාපදිංචි කිරීමේ ගාස්තුව පිළිබඳව ද සියලු විස්තර ඒ ඒ අධ්‍යයන වර්ෂයට අදාළ අයැදුම්පත් සමග සපයනු ලැබේ. මේ සම්බන්ධයෙන් කෙරෙන සියලු විමසීම් ආයතනයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත යොමු කළ යුතු ය.

1.38 වාර්ෂික පාඨමාලා ගාස්තුව එකවර ම හෝ වාරික තුනකින් හෝ ගෙවිය හැකි ය. වාරික වශයෙන් ගෙවීමේ දී ඒ ඒ අධ්‍යයන වාරය පටන් ගැනීමට පෙර අදාළ වාරිකය ගෙවිය යුතු වන අතර පාඨමාලාව සඳහා නියමිත ගාස්තුවෙන් අඩක් හෝ ඊට වඩා වැඩි මුදලක් හෝ ප්‍රථම වාරිකය ලෙස ගෙවිය යුතු ය.

1.39 පරීක්ෂණ ප්‍රවේශ ගාස්තු අදාළ පරීක්ෂණයට පෙර සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු ය.

### 1.40 ලිඛිත පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ නීතිරීති

ඉගැන්වීම් පාඨමාලාවට අයත් විද්‍යාර්ථීන් විභාග සඳහා පෙනී සිටිමේ දී පහත සඳහන් නීතිරීති පිළිබඳ අවබෝධයක් ලබා ඒ අනුව කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.

### 1.40.1 ලිඛිත පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ නීතිරීති

1.40.1.1 විභාග අපේක්ෂකයන් නියමිත ප්‍රශ්න පත්‍රය ඇරඹීමට විනාඩි 15කට පෙර විභාග ශාලාව අසලට පැමිණිය යුතු අතර, විභාග ශාලාධිපති දැනුම් දුන් විට පමණක් විභාග ශාලාවට පිවිසිය යුතු ය.

1.40.1.2 විභාග අපේක්ෂකයන් විභාග ශාලාවට පිවිසි වහා ම තමාගේ අංකය දරන අසුනෙහි අසුන් ගත යුතු අතර, විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය මත හැර කිසි විටෙක තම ආසනය වෙනස් කළ නොහැකි ය.

1.40.1.3 පරීක්ෂණය ආරම්භ වී විනාඩි 30කට පසු ව කිසි ම විභාග අපේක්ෂකයකු ශාලාවට ඇතුළත් කර ගනු නොලැබේ. පරීක්ෂණය ආරම්භ වී විනාඩි 30ක් ගත වීමට පෙර මෙන් ම, පරීක්ෂණය අවසන් වීමට නියමිත අවසන් විනාඩි 30 ඇතුළත ද විභාග අපේක්ෂකයන්ට ශාලාවෙන් පිටවීමට අවසර දෙනු නොලැබේ.

1.40.1.1.1 සියලු ම විභාග අපේක්ෂකයන් ස්වකීය විභාග ප්‍රවේශ පත්‍රය විභාග අංශයෙන් ලබාගත යුතු අතර ශිෂ්‍ය වාර්තා පොත/ශිෂ්‍ය හැඳුනුම්පත සමග සිය අත්සන යොදා, අත්සන ආචාර්යවරයකු විසින් සනාථ කරවා ගත යුතු ය.

1.40.1.1.2 එම ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය.

1.40.1.1.3 එබඳු අවස්ථාවක දී විභාගයට පෙනී සිටීම සඳහා ශාලාධිපති විසින් සපයනු ලබන ආකෘති පත්‍රයක විභාග අපේක්ෂකයා අත්සන් කොට ප්‍රකාශයක් ලබා දිය යුතු අතර, ඊළඟ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අවස්ථාවේ දී අනිවාර්යයෙන් ඉහත සඳහන් කළ අනන්‍යතාව තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

1.40.1.1.4 විභාග අපේක්ෂකයා පෙනී සිටින අවසාන හා එක ම ප්‍රශ්න පත්‍රය මෙය නම්, ඉහත සඳහන් ලේඛන ඊළඟ වැඩ කරන දිනයේ දී විභාග අංශය වෙත ඉදිරිපත් කළ යුතු ය.

1.40.1.1.5 විභාගය අතරතුර දී යම් හෙයකින් ශිෂ්‍ය වාර්තා පොත/ශිෂ්‍ය හැඳුනුම්පත නැති වුව හොත් එහි දෙවන පිටපතක් විභාග අංශය වෙතින් ලබා ගත යුතු ය.

1.40.1.1.6 ශිෂ්‍ය වාර්තා පොතෙහි/ශිෂ්‍ය හැඳුනුම්පතෙහි සඳහන් නම හා විභාග ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් නම අතර වෙනසක් ඇත්නම් ඒ බව තහවුරු කොට ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. එබඳු සහතිකයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විට ජාතික හැඳුනුම්පත හෝ

බලය ලත් පුද්ගලයකු විසින් සහතික කරනු ලැබූ මෑතක දී ලබා ගත් ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතු ය.

1.40.1.5. විභාගශාලා නිරීක්ෂක ඉදිරිපිට දී විභාග අපේක්ෂකයින් තම ප්‍රවේශ පත්‍රයේ නියමිත ස්ථානයෙහි අත්සන් කිරීමෙන් අනතුරු ව දිනපතා විභාග ප්‍රවේශ පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රයේ අදාළ කොටස විභාගශාලා නිරීක්ෂකට භාර දිය යුතු ය. ඉන් අනතුරු ව විභාගයට පෙනී සිටින සෑම වාරයක දී ම විභාග ප්‍රවේශ පත්‍රයේ නියමිත ස්ථානයෙහි අත්සන් කළ යුතු ය.

1.40.1.6. විභාග අපේක්ෂකයන් තමන්ගේ ප්‍රයෝජනය සඳහා පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, අඩිකෝදු, පාට පැන්සල් ආදි වශයෙන්, නීත්‍යානුකූල ව අවසර ලබා දී ඇති අවශ්‍ය උපකරණ පමණක් රැගෙන ආ යුතු ය. මීට අමතර ව පරීක්ෂණයේ දී අනිසි අන්දමින් ප්‍රයෝජනයට ගත හැකි කිසි ම ලියවිල්ලක් හෝ සටහනක් හෝ උපකරණයක් විභාග ශාලාවට නොගෙනෙන බවට වග බලා ගත යුතු ය. විශේෂයෙන් ජංගම දුරකතන, ගණක යන්ත්‍ර හෝ වෙනත් කිසිදු විද්‍යුත් සන්නිවේදන උපකරණ හෝ වෙනත් කිසිදු තාක්ෂණික උපකරණයක් ළඟ තබා ගැනීම තහනම් ය.

1.40.1.7. විභාග ශාලාධිපති විසින් ඉල්ලා සිටි අවස්ථාවක දී විභාග අපේක්ෂකයන් තමා භාරයේ හෝ ළඟ ඇති ඕනෑම ලිපි-ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් හෝ ඕනෑම උපකරණයක් ඉදිරිපත් කළ යුතු ය.

1.40.1.8. කිසිම විභාග අපේක්ෂකයකු තවත් විභාග අපේක්ෂකයකුගෙන් කිසි ම දෙයක් ඉල්ලා ගැනීම, හුවමාරු කර ගැනීම, කතාබස් කිරීම හෝ කොපි කිරීම නොකළ යුතු ය. වෙනත් විභාග අපේක්ෂකයකුගෙන්/පුද්ගලයකුගෙන් හෝ කුමන අන්දමක හෝ ආධාරයක් ලබා නොගත යුතු ය. වෙනත් අපේක්ෂකයකුගෙන් කොපි කිරීම හෝ වෙනත් අපේක්ෂකයකුට කොපි කිරීමට අනුබල දීම හෝ උපකාර කිරීම ද නොකළ යුතු ය.

1.40.1.9. නියමිත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීම සඳහා එදිනට නිකුත් කරන ලද පිළිතුර සපයන පොත් හා කඩදාසි පමණක් යොදා ගත යුතු ය. පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර උත්තර ලියන පොත් හෝ/සහ පිළිතුර සපයන කඩදාසියේ එදිනට වලංගු දින මුද්‍රාව සහ ඒ මත ශාලාධිපතිගේ හෝ නිරීක්ෂකගේ අත්සන් තිබේ ද යන්න පරීක්ෂා කර බැලීම විභාග අපේක්ෂකයාගේ වගකීම වේ. උත්තර ලියන පොත්වල හෝ කඩදාසිවල වලංගු දින මුද්‍රාව සමග ශාලාධිපතිගේ හෝ නිරීක්ෂකගේ හෝ අත්සන් නැත්නම් පිළිතුරු ලිවීම ආරම්භ නොකළ යුතු අතර, ඒ බව වහා ම විභාග ශාලාධිපති වෙත දැනුම් දී වලංගු දින මුද්‍රාව සහ පෙර කී අයෙකුගේ අත්සන සඳහන් ලිපි ලේඛන ලබා ගැනීම විභාග අපේක්ෂකගේ වගකීම වේ.

1.40.1.10. පිළිතුරු ලිවීම සඳහා අවශ්‍ය කෙරෙන ලිපි ද්‍රව්‍ය (ලියන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ඇඳීමේ කඩදාසි, ලෙජර් හා ජර්නල් කොළ යනාදිය) අවශ්‍ය වන පරිදි විභාග අපේක්ෂකයන් වෙත නිකුත් කරනු ලැබේ. තමාට දෙන ලද කිසිදු කඩදාසියක් හෝ ලියන පොතක් ඉරා දැමීම, සූරා දැමීම, නැවීම, පොඩි කිරීම හෝ වෙනත් අයුරකින් විනාශ කර දැමීම හෝ නොකළ යුතු ය. ශාලාධිපති/නිරීක්ෂක විසින් දෙන ලද ලිපි ද්‍රව්‍ය පමණක් පාවිච්චි කළ යුතු අතර, තමා වෙත සපයන ලද සියලු ම ලිපි ද්‍රව්‍ය හා උපකරණ (පාවිච්චි කළ හෝ නොකළ) ස්වකීය මේසය මත ම තබා යා යුතු ය. ඒවා විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම සම්පූර්ණයෙන් තහනම් ය.

1.40.1.11. පිළිතුරු ලිවීමට පෙර, තමාට අයත් ලියාපදිංචි අංකය හා පරීක්ෂණයේ නම පැහැදිලි ලෙස පිළිතුරුපතෙහි අදාළ ස්ථානයෙහි ලිවිය යුතු ය. පිළිතුරු ලිවීමට යොදා ගන්නා අනෙකුත් සියලු ම කඩදාසිවල ද ස්වකීය විභාග අංකය සටහන් කර තිබිය යුතු ය. කිසිම විභාග අපේක්ෂකයකු ස්වකීය නම හෝ වෙනත් හඳුනා ගැනීමේ සලකුණු යනාදිය පිළිතුරුපත්‍රවල නොලිවිය යුතු ය. කෙනෙකුගේ පිළිතුරුපත්‍රයට වෙනත් විභාග අංකයක් යෙදීම පරීක්ෂණ විෂමාචාරයක් ලෙස සලකනු ලැබේ. ලියාපදිංචි අංකය යොදා නොමැති හෝ හඳුනාගත නොහැකි පිළිතුරුපත් ප්‍රතික්ෂේප කෙරේ.

1.40.1.12. කටුවැඩ ආදිය සඳහා යොදා ගන්නා ලද කඩදාසි හා ලියන කඩදාසි ද පිළිතුරු පත්‍රය සමඟ අමුණා තැබිය යුතු ය. එහෙත් පිළිතුරුපත්‍රයට අනවශ්‍ය කොටස් පැහැදිලි සේ ඉරි ගසා කපා දැමිය යුතු ය. ප්‍රවේශ පත්‍රයේ, කාල සටහනේ, ප්‍රශ්න පත්‍රයේ හෝ ශිෂ්‍ය වාර්තා පොතේ කටුවැඩ නොකළ යුතු ය. මෙම උපදෙස් නොපිළිපදින අපේක්ෂකයන් විභාග නීතිරීති උල්ලංඝනය කළා සේ සලකනු ලැබේ.

1.40.1.13. විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළ විභාග ශාලාධිපතිට, නිරීක්ෂකවරුන්ට සහ අනෙකුත් අපේක්ෂකයන්ට බාධා හෝ හිරිහැර හෝ නොවන සේ හැසිරිය යුතු ය. විභාග ශාලාව තුළ හා අවට නිශ්ශබ්දතාව රැකිය යුතු ය. හදිසි අවස්ථාවක දී හැර විභාගය පවත්නා අතරතුර විභාග ශාලාවෙන් තාවකාලික ව බැහැර යාමට අවසර නොදෙනු ඇත. හදිසි අවස්ථාවක දී නිරීක්ෂක විසින් තම පරීක්ෂාව යටතේ තාවකාලික ව බැහැර යාමට අවසර දිය හැකි ය. ඉහත උපදෙස් අනුව නොහැසිරෙන අය විභාග ශාලාවෙන් ඉවත් කිරීමට ශාලාධිපතිට බලය තිබේ. පරීක්ෂණය පැවැත්වෙන විට විභාග ශාලාව තුළ දී ශාලාධිපති හෝ නිරීක්ෂකවරයකු සමඟ හැර වෙනත් අය සමඟ කථාබහ කිරීම සම්පූර්ණයෙන් තහනම් අතර, ගැටලු මතුවන අවස්ථාවල දී තම අසුනේ සිට අත එසවීමෙන් ශාලාධිපති හෝ නිරීක්ෂකගේ අවධානය ලබා ගත හැකි ය.

1.40.1.14. විභාග අපේක්ෂකයින් තමාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමට පහසුවන ආකාරයේ සුදුසු ඇඳුමක් හැඳගෙන විභාග ශාලාවට පැමිණිය යුතු ය.

1.40.1.15. කිසි ම විභාග අපේක්ෂකයකු තමා විසින් ම ලියන ලද පිළිතුරු මිස ක්ෂේත්‍ර පොතක් හෝ ක්ෂේත්‍ර වැඩසටහනක් හෝ නිබන්ධයක් හෝ, විභාගයක් සඳහා මුළුමණින් ම හෝ කොටසක් වශයෙන් හෝ අන්‍ය තැනැත්තෙකු විසින් කරන ලද්දක් හෝ ඉදිරිපත් නොකළ යුතු ය.

1.40.1.16. කිසි ම අපේක්ෂකයකු තමා වෙනුවෙන් වෙනත් කෙනෙකුට පරීක්ෂණයට ඉදිරිපත් වීමට අවසර නොදිය යුතු අතර, වෙනත් කෙනෙකු වෙනුවෙන් පෙනී සිටීමට ද කිසිදු අපේක්ෂකයකුට අවසර නැත.

1.40.1.17. විභාග ශාලාවේ දී උද්ගත වන ඕනෑම කරුණක් වෙනුවෙන් විභාග අපේක්ෂකයකුගෙන් ප්‍රශ්න කිරීමට සහ ප්‍රකාශ ලබා ගැනීමේ පූර්ණ බලතල විභාග ශාලාධිපති සතුවන බව විභාග අපේක්ෂකයන් දැන සිටිය යුතු ය. එවැනි අවස්ථාවක දී පිළිතුරු ලබා දීමට සහ ප්‍රකාශ අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමට විභාග අපේක්ෂකයකුට නොහැකි වේ.

1.40.1.18. විභාගය අවලංගු කිරීමට හෝ කල් දැමීමට හේතු වන තත්ත්වයක් උද්ගත වී ඇතැයි විභාග ශාලාධිපතිට ඒත්තු ගිය හොත්, වහා ම විභාගය නවත්වා පිළිතුරු පත්‍ර එකතු කොට ඒ පිළිබඳ ව වහා ම ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරීට වාර්තා කිරීමට ශාලාධිපති කටයුතු යොදනු ඇත.

1.40.1.19. විභාග ශාලාධිපති විසින් විභාගය නැවැත්වීමේ සංඥාව දුන් වහා ම අපේක්ෂකයන් සියලු ම වැඩ නැවැත් විය යුතු වන අතර, මෙම උපදෙස් නොපිළිපදින්නන් පිළිබඳ ව විභාග අංශයට වාර්තා කිරීමේ අයිතිය ශාලාධිපති/නිරීක්ෂක සතු වේ.

1.40.1.20. විභාග අපේක්ෂකයන් ස්වකීය පිළිතුරුපත්‍ර ශාලාධිපතිට හෝ නිරීක්ෂකවරයකුට හෝ සියතින් ම භාර දිය යුතු ය. එමෙන් ම පිළිතුරු පත් එකතු කරන තෙක් සිය අසුනේ ම රැඳී සිටිය යුතු ය. කවර කරුණක් නිසාවත් පිළිතුරුපත්‍ර ශාලා සේවකයකුට හෝ වෙනත් අයකුට භාර නොදිය යුතු ය. පිළිතුරුපත්‍ර භාර දුන් පසු මොන ම කරුණක් නිසාවත් එය ආපසු ඉල්ලා ගැනීමේ අයිතියක් අපේක්ෂකයකුට නැත.

1.40.1.21. කිසි ම අපේක්ෂකයකුට තමාගේ හෝ වෙනත් අපේක්ෂකයකුගේ පිළිතුරුපත් විභාග ශාලාවෙන් පිටතට ගෙන නොයා යුතු ය.

1.40.1.22. පරීක්ෂණයේ දී අනිසි අන්දමින් ප්‍රයෝජනයට ගත හැකි කිසි ම ලියවිල්ලක් හෝ සටහනක් හෝ උපකරණයක් තමන් වෙත නොමැති බවට සෑම විභාග අපේක්ෂකයකු ම වග බලා ගත යුතු ය. තව ද කිසි ම උපකරණයක් හෝ

ලියවිල්ලක් හෝ සටහනක් හෝ අනිසි අන්දමින් තම ප්‍රයෝජනයට ගැනීමට වෑයම් නොකළ යුතු ය. පරීක්ෂණ විෂමාචාරයක යෙදෙන බවට හෝ යෙදී ඇති බවට සැක මතු විය හැකි සෑම ක්‍රියාවකින් ම වැළකීමට සෑම අපේක්ෂකයකු ම වග බලා ගත යුතු ය.

1.40.1.23. පිළිතුරුපත්‍ර ලකුණු කිරීමේ දී, නියමිත සංඛ්‍යාවට වඩා වැඩි ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සපයා ඇති විට, පිළිතුරු සපයා ඇති අනුපිළිවෙළ අනුව නියමිත පිළිතුරු සංඛ්‍යාව පමණක් ලකුණු කරනු ලැබේ. උදා:- නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට අතිරේක ව ප්‍රශ්නයකට පිළිතුරු සපයා ඇති විට අන්තිම පිළිතුර ලකුණු කරනු නොලැබේ. තව ද නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට අතිරේක ව පිළිතුරු සපයා ඇති විටක ලකුණු කිරීමට අනවශ්‍ය පිළිතුරක් හෝ පිළිතුරු කොටසක් තිබේ නම් එය පැහැදිලි ව කපා හැරීමේ බලය විභාග පරීක්ෂක සතු ය.

1.40.1.24. විභාගය සඳහා ලියාපදිංචි වූ සෑම අපේක්ෂකයකු ම අදාළ විභාගයට අනිවාර්යෙන් ම පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී නොසිටීමට නම්, විභාගයට පෙනී නොසිටීම සම්බන්ධ ව පිළිගත හැකි හේතු සාධක ලිඛිත ව, අදාළ ලිඛිත සාක්ෂ්‍ය ද සමඟ අදාළ පාඨමාලා සම්බන්ධීකාරකගේ නිර්දේශය ද සහිත ව අභියාචනයක් විභාග අංශය වෙත ඉදිරිපත් කොට අදාළ කාලසීමාව තුළ දී අධ්‍යයනාංශ කමිටුවේ/පීඨසභාවේ අවසරය ලබා තිබිය යුතු ය. යම් අපේක්ෂකයකුට, විභාගයේ කොටසකට පෙනී සිටීමට නොහැකි නම් ඒ පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/සහකාර ලේඛකාධිකාරී වෙත වහා ම දැනුම් දී පැය 48ක් ඇතුළත දී ලිඛිත ව අදාළ සාක්ෂ්‍ය ද සමඟ ලියාපදිංචි තැපෑලෙන් ඒ බව දැනුම් දිය යුතු ය.

1.40.1.25. අසනීප නිසා මුළු පරීක්ෂණයට හෝ පරීක්ෂණ කොටසකට හෝ පෙනී නොසිටින්නේ නම් ඒ බව පරීක්ෂණ ආරම්භ වීමට ප්‍රථම හෝ පරීක්ෂණ පැවැත්වෙන කාල සීමාව තුළ හෝ පිළිගත් වෛද්‍ය සහතිකයක් ලබා ගත යුතු ය. එම වෛද්‍ය සහතිකය තමා පදිංචි ප්‍රදේශයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියාගෙන් හෝ රජයේ ආරෝග්‍ය ශාලාවක උපදේශක වෛද්‍යවරයකුගෙන් හෝ රජයේ ආයුර්වේද රෝහලක වෛද්‍යවරයකුගෙන් හෝ ලබාගත් වලංගු වෛද්‍ය සහතිකයක් අදාළ පරීක්ෂණය හෝ කොටස පැවැත්වීමට නියමිත දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය. පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික පිළිගනු නොලැබේ. නමුත් මෙවැනි අවස්ථාවක අවස්ථානුකූල ව තීරණය කිරීමට අධ්‍යයනාංශ කමිටුවට/පීඨ සභාවට හැකි ය.

1.40.1.26. යම් අපේක්ෂකයකු සම්පූර්ණ විභාගයට හෝ ඉන් කොටසකට හෝ පෙනී නොසිට, ඉහත සඳහන් උපදෙස් පරිදි ක්‍රියා කොට අධ්‍යයනාංශ කමිටුවේ/පීඨ සභාවේ අනුමැතිය ලබා ගෙන නොමැති අවස්ථාවකදී ඔහු/ඇය අනතුරුව

පැමිණෙන අවස්ථාවේදී එකී විභාගයට පෙනී සිටීම පුනර් පරීක්ෂණයකට පෙනී සිටියා සේ සලකා කටයුතු කරනු ඇත.

1.40.1.27. යම් අපේක්ෂකයකු සම්පූර්ණ විභාගයට පෙනී නොසිටින්නේ නම්, ඒ සඳහා අධ්‍යයනාංශ කමිටුවේ/පීඨ සභාවේ විශේෂ අනුමැතියක් ලබා නොමැති නම් උපාධිය සම්පූර්ණ කිරීමේ දී විශිෂ්ට සාමර්ථ්‍යයකට හිමිකම් නොලැබේ.

**1.40.2 විභාග අක්‍රමිකතා**

**විභාග අක්‍රමිකතා මතු දැක්වෙන ආකාරයට වර්ග කර ඇත:**

1.40.2.1 බලය නොලත් ලිපිලේඛන ආදිය සන්තකයේ තබා ගැනීම

1.40.2.2 කොපි කිරීම

1.40.2.3 අත්ලෙහි හෝ ශරීරයේ වෙනත් ස්ථානයක හෝ ඇඳුමෙහි හෝ සටහන් ලියාගෙන විභාග ශාලාවට පැමිණීම

1.40.2.4 වංචා කිරීම

1.40.2.5 ආයතනයට අයත් ලිපි ද්‍රව්‍ය ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම

1.40.2.6 විභාග කටයුතුවලට බාධා වන පරිදි අනිසි හැසිරීම

1.40.2.7 විභාග අපේක්ෂකයා තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම හෝ වෙනත් කෙනෙකු වෙනුවෙන් විභාගයට පෙනී සිටීම

1.40.2.8 ප්‍රශ්නපත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැනගැනීම හෝ දැනගැනීමට කුමන ආකාරයකින් හෝ තැත් කිරීම

1.40.2.9 යම් විභාග අක්‍රමිකතාවක් කිරීමට ආධාර හෝ අනුබල දීම සහ වෙනත් අයගේ සහාය ලබා ගැනීම

1.40.2.10 විභාග පරීක්ෂකවරුන්ට හෝ අනිත් විභාග නිලධාරීන්ට අයුතු බලපෑම් කිරීම

1.40.2.11 විභාග ශාලාධිපතිගේ අණ නොපිළිපැදීම හෝ අණට කීකරු නොවීම හෝ විභාග ශාලාධිපතිගේ උපදෙස් නොපිළිපැදීම හෝ විභාග ශාලාධිපති සමඟ හෝ විභාග ශාලාවේ සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලය සමඟ බහින්බස් වීම

1.40.2.12 ජංගම දුරකථන හෝ කුමන වර්ගයකට/කිසිදු ආකාරයකට අයත් වන තාක්ෂණික උපකරණ හෝ විභාග ශාලාවට ගෙන යාම

**1.40.3 විභාග අක්‍රමිකතා පිළිබඳ ව පරීක්ෂණ පැවැත්වීම**

විභාග අක්‍රමිකතා පිළිබඳ ව අදාළ විභාග ශාලාධිපති විසින් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත වාර්තා කරනු ඇත. අනතුරු ව ඔහු/ඇය විසින් එක් එක් විභාග අපේක්ෂකයින් විසින්

සිදු කරන ලද විභාග අක්‍රමිකතා, විභාග අක්‍රමිකතා කමිටුව වෙත ඉදිරිපත් කෙරේ. එලෙස ඉදිරිපත් කරනු ලැබූ විභාග අක්‍රමිකතා පිළිබඳ ව පරීක්‍ෂා කර බැලීමෙන් පසු ව විභාග අක්‍රමිකතා පරීක්ෂණ කමිටුව විසින් දඬුවම් නිර්දේශ කර පීඨ සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනු ලැබේ. විභාග අක්‍රමිකතා පරීක්‍ෂණ කමිටුව පීඨ සභාව විසින් පත් කරනු ලබන පූර්ණ බලැති අනුකමිටුවකි. මෙම පරීක්‍ෂණ කමිටුවේ නිර්දේශ සලකා බලා පීඨ සභාව විසින් අදාළ විභාග අපේක්‍ෂකයින්ට දඬුවම් පමුණුවනු ලබන අතර, පීඨ සභාවේ තීරණය අවසාන තීරණය වේ. පීඨ සභාවෙන් දඬුවම් නියම කිරීමෙන් පසු ව ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විසින් දඬුවම් පිළිබඳ ව අදාළ විභාග අපේක්‍ෂකයන් වෙත දැනුම් දෙනු ලැබේ.

**1.40.4 විභාග අක්‍රමිකතා සඳහා පනවනු ලබන දඬුවම්**

1.40.4.1 බලය නොලත් ලිපිලේඛන ආදිය සන්තකයෙහි තබා ගැනීම

දඬුවම්:-

උපරිම වශයෙන් වර්ෂ 02කට ආයතනයේ විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම හෝ/සහ පීඨ සභාවේ අනුමැතිය පරිදි වෙනත් දඬුවම් පැමිණ වීම

1.40.4.2 කොපි කිරීම

දඬුවම්:-

විභාග අපේක්‍ෂකත්වය අවලංගු කොට උපරිම වශයෙන් අවුරුදු 03කට ආයතනයේ කිසිදු විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම හෝ/සහ පීඨ සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවම් පැමිණ වීම

1.40.4.3 අත්ලෙහි හෝ ශරීරයේ වෙනත් ස්ථානයක හෝ ඇඳුමෙහි හෝ සටහන් ලියාගෙන විභාග ශාලාවට පැමිණීම

දඬුවම්:-

විභාග අපේක්‍ෂකත්වය අවලංගු කොට උපරිම වශයෙන් අවුරුදු 03කට ආයතනයේ කිසිදු විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම හෝ/සහ පීඨ සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවම් පැමිණ වීම

1.40.4.4 වංචා කිරීම

දඬුවම්:-

විභාග අපේක්‍ෂකත්වය අවලංගු කිරීම සහ සනාතන සභාවේ අභිමතය පරිදි කිසියම් කාලයකට ආයතනයේ විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම සහ වෙනත් දඬුවම් පැමිණ වීම

1.40.4.5 ආයතනයට අයත් විභාග ලිපිද්‍රව්‍ය ආදිය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම

දඬුවම්:

විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ පීඨ සභාව මඟින් නියම කරනු ලබන කාල සීමාවකට ආයතනයේ කිසිදු පරීක්ෂණයකට පෙනී සිටීම තහනම් කිරීම

1.40.4.6 විභාග කටයුතුවලට බාධා වන පරිදි අනිසි හැසිරීම

දඬුවම්:-

විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ අවුරුදු 05කට නොවැඩි කාලයකට ආයතනයේ කිසිදු වෙනත් විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම සහ පීඨ සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවම් පැමිණ වීම

1.40.4.7 විභාග අපේක්ෂකයකු තමන් වෙනුවෙන් විභාගයට පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම හෝ වෙනත් කෙනෙකු වෙනුවෙන් විභාගයට පෙනී සිටීම

එවැනි අවස්ථාවක අදාළ පුද්ගලයන් දෙදෙනාට ම දඬුවම් පමුණුවනු ලබන අතර ආයතනයේ ලියාපදිංචි ශිෂ්‍යයකු නොවන අයෙක් විභාග අපේක්ෂකයකු වෙනුවෙන් පෙනී සිට ඇත්නම් ඔහුට/ඇයට එරෙහි ව සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කරනු ඇත.

දඬුවම්:-

විභාග අපේක්ෂකත්වය අවලංගු කොට, වර්ෂ 05කට නොඅඩු වර්ෂ 10කට නොවැඩි කාලයකට ආයතනයේ කිසිදු පරීක්ෂණයකට පෙනී සිටීම තහනම් කිරීම හා පීඨ සභාවේ අභිමතය පරිදි පනවනු ලබන ඕනෑම දඬුවමක්

1.40.4.8 ප්‍රශ්නපත්‍රයක ඇතුළත් දෑ අයථා පරිදි දැනගැනීම හෝ දැනගැනීමට කුමන ආකාරයකින් හෝ තැත් කිරීම

දඬුවම්:-

විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ පීඨ සභාවේ අභිමතය පරිදි පනවනු ලබන දඬුවම්

1.40.4.9 යම් විභාග අක්‍රමිකතාවක් කිරීමට ආධාර හෝ අනුබල දීම සහ වෙනත් අයෙකුගේ සහාය ලබා ගැනීම

දඬුවම්:-

විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ පීඨ සභාවේ අභිමතය පරිදි පනවනු ලබන දඬුවම්

1.40.4.10 විභාග පරීක්ෂකවරුන්ට හෝ අනිකුත් විභාග නිලධාරීන්ට අයුතු බලපෑම් කිරීම

දඬුවම්:-

විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ පීඨ සභාවේ අභිමතය පරිදි පනවනු ලබන දඬුවම්

1.40.4.11 විභාග ශාලාධිපතිගේ අණ නොපිළිපැදීම හෝ අණට කීකරු නොවීම හෝ විභාග ශාලාධිපතිගේ උපදෙස් පිළිනොපැදීම හෝ විභාග ශාලාධිපති සමග හෝ විභාග ශාලාවේ සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලය සමග බහින්බස් වීම

දඬුවම්:-

විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සහ අවුරුදු 05කට නොවැඩි කාලයකට ආයතනයේ කිසිදු වෙනත් විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම සහ පීඨ සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවම් පැමිණ වීම

1.40.4.12 ජංගම දුරකථන හෝ කුමන වර්ගයකට/කිසිදු ආකාරයකට අයත් වන තාක්ෂණික උපකරණ හෝ විභාග ශාලාවට ගෙන ඒම

දඬුවම්:-

විභාග අපේක්ෂකත්වය අවලංගු කොට උපරිම වශයෙන් අවුරුදු 03කට ආයතනයේ කිසිදු විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම හෝ/සහ සනාතන සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවම් පැමිණ වීම

1.40.4.13 යම් විභාග අක්‍රමිකතාවක දී දෙවන වරට වරදකරුවකු වීම

එවැනි විභාග අපේක්ෂකයන්ගේ ශිෂ්‍යභාවය අවලංගු කිරීම හෝ/පීඨ සභාවේ අභිමතය පරිදි වෙනත් දඬුවමක් පැමිණ වීම

## 1.40.5. අනිවාර්ය දඬුවම්

ඉහත සඳහන් දඬුවම් සමග පීඨ සභාවේ අභිමතය පරිදි පහත සඳහන් අනිවාර්ය දඬුවම් සියල්ල ම හෝ කිහිපයක් හෝ එකවර පමුණුවනු ලබන බව සියලු ම විභාග අපේක්ෂකයින් අනිවාර්යෙන් ම දැන සිටිය යුතු ය.

1.40.5.1 අදාළ විෂය ඒකකවල ප්‍රතිඵල අවලංගු කිරීම හා අධ්‍යයන වර්ෂයක් ඉක්මවීමෙන් අනතුරු ව විභාගයට පෙනී සිටීමට අවසර ලබා දීම (වසරක විභාග තහනමක් පැනවීම)

1.40.5.2 විශිෂ්ට සාමර්ථ්‍යයක් ලබා නොදීම

1.40.5.3 අවලංගු කළ ප්‍රශ්නපත්‍රවලට නැවත පෙනී සිටීමේ දී සාමර්ථ්‍යයට අදාළ අවම ලකුණට සීමා කිරීම

1.40.5.4 ශිෂ්‍යත්ව හා වෙනත් මුදල් ආධාර ආදිය අවලංගු කිරීම හෝ අත්හිටුවීම

1.40.5.5 උපාධි ප්‍රදානෝත්සවයට නොකැඳ වීම

1.40.5.6 උපාධි ප්‍රදානය හා ප්‍රතිඵල නිකුත් කිරීම වර්ෂයකින් ප්‍රමාද කිරීම

**1.40.6 මෙහි සඳහන් නොවූවද, විභාග අක්‍රමිකතාවක් ලෙස පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් ඕනෑම වරදකට පීඨ සභාවේ අභිමතය පරිදි දඬුවම් නියම කරනු ඇත.**

**1.40.7 විභාග අක්‍රමිකතාවක් මත දඬුවම් පැමිණවූ විද්‍යාර්ථීන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා**

විභාග අක්‍රමිකතා මත දඬුවම් පැමිණවූ විද්‍යාර්ථීන්ට යම් අභියාචනයක් වෙතොත් අධ්‍යක්ෂ වෙත එය ඉදිරිපත් කළ හැකි ය. එවැනි අභියාචනයක් සලකා බැලීම සඳහා විභාග අක්‍රමිකතා පරීක්ෂණ කමිටුවට ම අධ්‍යක්ෂ විසින් යොමු කිරීමෙන් පසු ව විභාග අක්‍රමිකතා පරීක්ෂණ කමිටුව රැස්වී අදාළ අභියාචනයේ සඳහන් කරුණු පිළිබඳ ව සලකා බලා පීඨ සභාවට නිර්දේශ ඉදිරිපත් කරනු ඇත. එවැනි අභියාචනා සම්බන්ධයෙන් වූ විභාග අක්‍රමිකතා පරීක්ෂණ කමිටුවේ නිර්දේශ සලකා බලා පීඨ සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

දඬුවමකට එරෙහි ව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වන්නේ තමන්ට දඬුවම් පැමිණ වූ බව දන්වා ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විසින් ලිඛිත ව එවනු ලබන ලිපිය ලැබී දින 14ක් ඇතුළත දී පමණි. දින 14කට පසු ව අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවසරය නොමැති බව සියලු ම විභාග අපේක්ෂකයන් දැන සිටිය යුතු ය.

## සමාරම්භක උලෙළ - 2023














සමාරම්භක උලෙළ - 2023

















# 02. ඉගැන්වීමේ පාඨමාලා

CPBS

## 02.1 සහතිකපත්‍ර පාඨමාලා

**02.1.1 EBS: Certificate course in English for Buddhist Studies**

**02.1.2 CPBS: පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා පාලි සහතිකපත්‍ර පාඨමාලාව**

**02.1.3 CCPB : පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා චීන සහතිකපත්‍ර පාඨමාලාව**

**02.1.4 පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා ත්‍රිපිටක මූලාශ්‍රය අධ්‍යයනය පිළිබඳ (කෙටිකාලීන) සහතිකපත්‍ර පාඨමාලාව**

### 02.1.1 Certificate course in English for Buddhist Studies

මෙය ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාවක් බැවින් විස්තර දැනගැනීම සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රකාශිත ශිෂ්‍ය අත්පොත බැලීම මැනවි.

### 02.1.2 පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා පාලි සහතිකපත්‍ර පාඨමාලාව

#### පාඨමාලාවේ ක්ෂේත්‍රය සහ අන්තර්ගතය

මූලික පාලි ව්‍යාකරණය, තෝරාගත් පාලි පාඨ, ඡේද කියවීම සහ අවබෝධය ආවරණය කෙරෙන පරිදි මෙම සහතිකපත්‍ර පාඨමාලාව පහත දැක්වෙන ඒකක තුනෙන් සමන්විත වේ.

CPBS 01: මූලික පාලි ව්‍යාකරණය

CPBS 02: පාලි ග්‍රන්ථ අධ්‍යයනය I

CPBS 03: පාලි ග්‍රන්ථ අධ්‍යයනය II

#### පාඨමාලාවේ අරමුණ

පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි ස්වකීය පර්යේෂණාත්මක අධ්‍යයන කරගෙන යාම පිණිස අවශ්‍ය පාලි භාෂාව පිළිබඳ මූලික දැනුම ශිෂ්‍යයින්ට ලබාදීම සහ ආයතනය විසින් පවත්වනු ලබන පාලි පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස පදනමක් ඔවුනට ලබාදීම මෙම පාඨමාලාවේ අරමුණ වේ.

### ප්‍රවේශය සඳහා සුදුසුකම්

පාලි භාෂාව පිළිබඳ පූර්ව දැනුමක් අවශ්‍ය නොවන අතර අපේක්ෂකයින් පහත දැක්වෙන සුදුසුකම්වලින් එකක් හෝ සපුරා තිබිය යුතු ය.

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් කවර හෝ උපාධියක් ලබා තිබීම

හෝ

ii. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් කවර හෝ සුදුසුකමක්

### පාඨමාලා ව්‍යුහය

පාඨමාලාවේ කාලය වර්ෂයක් වන අතර එය එක් වාරයක් සති දහයකින් සමන්විත වන වාර තුනකින් යුක්ත වේ.

### ඇගයීම් ක්‍රමය

i. එක් එක් විෂය ඒකකයක් සඳහා පැවරුම් දෙකකිː එක් පැවරුමක් සඳහා ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 20කි.

ii. පන්ති සහභාගීත්වයː එක් විෂය ඒකකයක් සඳහා ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 10කි.

iii. සෑම විෂය ඒකකයක් සඳහා ම වර්ෂාවසාන පරීක්ෂණයː එක් විෂය ඒකකයක් සඳහා ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 50කි.

### ශ්‍රේණි

| | | |
|---|---|---|
| 70-100 | A | විශිෂ්ට සාමර්ථ්‍යය |
| 60-69 | B | සම්මාන සාමර්ථ්‍යය |
| 40-59 | C | සාමර්ථ්‍යය |
| 00-39 | W | දුර්වල |

i. **කුසලතා සාමර්ථ්‍යය** - සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 40 ට නොඅඩුව ලබා සියලු විෂය ඒකකවල සාමාන්‍යය ලකුණු 70ක් හෝ ඊට වඩා වැඩිවීම

ii. **සාමර්ථ්‍යය** - සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 40ක් ලබා තිබීම හෝ එක් විෂය ඒකකයකට පමණක් ලකුණු 35-39 අතර ප්‍රමාණයක් ලබා සියලු ඒකකයන්ගේ ලකුණුවල සාමාන්‍ය අගය 40ක් හෝ ඊට වඩා වැඩිවීම

iii. **ඌන සාමර්ථ්‍යය හා අසමත් වීම** - එක් විෂය ඒකකයකින් පමණක් අසමත් වන සිසුන් ඌන සාමර්ථ්‍යයක් ලත් සිසුන් ලෙස සලකනු ලැබේ. ඔවුන්ට එම විෂය ඒකකයට පමණක් නැවත පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. විෂය ඒකක දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අසමත් වන සිසුන් අසමත් අය ලෙස සැලකේ. ඔවුන් සියලු ම ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටිය යුතු ය.

## පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා පාලි සහතිකපත්‍ර පාඨමාලාවේ විෂය නිර්දේශය

CPBS

| | |
|---|---|
| විෂය සංකේතය | **CPBS 01** |
| විෂය නාමය | මූලික පාලි ව්‍යාකරණය |
| අරමුණ | පාලි ගද්‍ය පාඨ සහ පද්‍ය කියවා අවබෝධ කරගැනීමට අවශ්‍ය භාෂා කුසලතාව වර්ධනය කිරීම මෙම පාඨමාලා ඒකකයේ අරමුණ වේ. |
| අන්තර්ගතය | පහත සඳහන් මාතෘකා හා සබැඳි පාලි ව්‍යාකරණය පිළිබඳ මූලික දැනුමක් අපේක්ෂා කෙරේ: පාලි අක්ෂර මාලාව, ලිංග භේදය, සංඛ්‍යා, විභක්ති, නාම සහ නාම වරනැගීම, සංඛ්‍යානාම හා සංඛ්‍යානාම වරනැගීම, නාමවිශේෂණ හා නාම විශේෂණ වරනැගීම, ක්‍රියා හා ක්‍රියා වරනැගීම, කෘදන්ත, ධාතු, නිපාත සහ උපසර්ග |
| කාලසීමාව | පැය 60 |
| ඉගැන්වීමේ ක්‍රමය | දේශන, පරිවර්තන, සාකච්ඡා සහ පැවරුම් |
| ඇගයීම් ක්‍රමය | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| අපේක්ෂිත ඉගෙනුම් ඵල | පාඨමාලාව අවසානයේ දී<br>(1) ග්‍රන්ථ විශ්ලේෂණය සඳහා අවශ්‍ය පාලි භාෂාවේ මූලික ලක්ෂණ පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කිරීමටත්,<br>(2) අවශ්‍ය අවස්ථාවන්හි දී පාලි ශබ්දකෝෂයක ආධාරයෙන් පාලි ග්‍රන්ථ කියවා අවබෝධ කරගැනීමටත්,<br>(3) සරළ පාලි වාක්‍ය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමටත් ශිෂ්‍යයාට හැකියාව ලැබෙනු ඇත. |
| නිර්දේශිත ග්‍රන්ථ | බුද්ධදත්ත හිමි, පොල්වත්තේ ශ්‍රී, (2017). *පාලිභාෂාවතරණය - පළමුවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2016). *පාලිභාෂාවතරණය - දෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2017). *පාලිභාෂාවතරණය - තෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>Anuruddha Thera, Kakkapalliye, (2004). *Dictionary of Pali Idioms: An Aid to the Student of Pali*, Hong Kong: The Chi Lin Nnunnery.<br>Buddhadatta, A. P. (1997). *The New Pali Course - parts I, II*, Dehiwala: Buddhist Cultural Cetre.<br>Buddhadatta Mahāthera, A. P. (1968). *Concise Pali-English Dictionary*, Colombo: The Colombo Apothecaries.<br>De Silva, Lily, (1994). *Pali Primer,* Dhammagiri; Vipassana Research Institute.<br>Dhammajothi, K. L. (2018). *Reading Buddhist Pali Texts, An Elementary Grammatical Guide*, Hong Kong: The Buddha Dharma Centre. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **CPBS 02** |
| **විෂය නාමය** | **පාලි ග්‍රන්ථ අධ්‍යයනය I** |
| **අරමුණ** | ත්‍රිපිටක පාළියෙන් තෝරාගත් සරළ ගද්‍ය පාඨ සහ ගාථා කියවීමේ හා අවබෝධ කරගැනීමේ කුසලතාව පියවරෙන් පියවර වර්ධනය කිරීම සහ ඒවායේ ව්‍යාකරණ විග්‍රහය පිළිබඳ හැකියාව වර්ධනය කිරීම |
| **අන්තර්ගතය** | *දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, අඞ්ගුත්තරනිකාය, ඛුද්දකනිකාය* සහ *විනය පිටකය* යන ග්‍රන්ථවලින් තෝරාගත් සරළ ගද්‍ය පාඨ සහ පද්‍ය |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පරිවර්තන, සාකච්ඡා සහ පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | පාලි වාක්‍ය රටා විශ්ලේෂණය කිරීමට සහ ත්‍රිපිටක පාළි සාහිත්‍යයේ සරළ ගද්‍ය පාඨ සහ ගාථා නිවැරදි ව අධ්‍යයනය කිරීමට පාඨමාලා ඒකකය අවසානයේ දී ශිෂ්‍යයාට හැකියාව ලැබෙනු ඇත. |
| **නිර්දේශිත ග්‍රන්ථ** | බුද්ධදත්ත හිමි, පොල්වත්තේ ශ්‍රී, (2017). *පාලිභාෂාවතරණය - පළමුවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2016). *පාලිභාෂාවතරණය - දෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2017). *පාලිභාෂාවතරණය - තෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>Anuruddha Thera, Kakkapalliye, (2004). *Dictionary of Pali Idioms: An Aid to the Student of Pali*, Hong Kong: The Chi LinNnunnery.<br>_______, (2010). *A Guide to the Study of Pali: The Language of Theravada Buddhism*, Hong Kong: Centre of Buddhist Studies, The University of Hong Kong.<br>Buddhadatta Mahāthera, A. P. (1968). *Concise Pali-English Dictionary*, Colombo: The Colombo Apothecaries.<br>Dhammajothi, K. L. (2018). *Reading Buddhist Pali Texts, An Elementary Grammatical Guide*, Hong Kong: The Buddha Dharma Centre.<br>James, W. Gair and W. S. Karunatilaka, (1968). *A New Course in Reading Pali: Entering the Word of the Buddha*, Delhi: Motilal Banarsidass. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **CPBS 03** |
| **විෂය නාමය** | **පාලි ග්‍රන්ථ අධ්‍යයනය II** |
| **අරමුණ** | පශ්චාත් ත්‍රිපිටක සාහිත්‍යයට අයත් ග්‍රන්ථවලින් තෝරාගත් ගද්‍ය පාඨ සහ ගාථා කියවා අවබෝධ කරගැනීමේ හැකියාව පියවරෙන් පියවර වර්ධනය කිරීම සහ ඒවායේ ව්‍යාකරණ විග්‍රහ කිරීමේ හැකියාව වර්ධනය කිරීම |
| **අන්තර්ගතය** | *මිළින්දපඤ්හ, ධම්මපදට්ඨකථා, රසවාහිනී* සහ *ජිනචරිත* යන ග්‍රන්ථවලින් තෝරාගත් සරළ ගද්‍ය පාඨ සහ ගාථා |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පරිවර්තන, සාකච්ඡා සහ පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | පාඨමාලාව අවසානයේ දී පශ්චාත් ත්‍රිපිටක පාළි සාහිත්‍යයට අයත් ගද්‍ය පාඨ සහ ගාථා නිවැරදි ව කියවා අවබෝධ කරගැනීමට හා ඒවායේ ව්‍යාකරණ විශ්ලේෂණය කිරීමට ශිෂ්‍යයා සමත් වේ. |
| **නිර්දේශිත ග්‍රන්ථ** | බුද්ධදත්ත හිමි, පොල්වත්තේ ශ්‍රී, (2017). *පාලි භාෂාවතරණය - පළමුවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2016). *පාලි භාෂාවතරණය - දෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2017). *පාලි භාෂාවතරණය - තෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>Anuruddha thera, Kakkapalliye, (2004). *Dictionary of Pali Idioms: An Aid to the Student of Pali*, Hong Kong: The Chi Lin Nnunnery.<br>_______, (2010). *A Guide to the Study of Pali: The Language of Theravada Buddhism*, Hong Kong: Centre of Buddhist Studies, The University of Hong Kong.<br>Buddhadatta Mahāthera, A. P. (1968). *Concise Pali-English Dictionary*, Colombo: The Colombo Apothecaries.<br>Dhammajothi, K. L. (2018). *Reading Buddhist Pali Texts, An Elementary Grammatical Guide*, Hong Kong: The Buddha Dharma Centre.<br>James, W. Gair and W. S. Karunatilaka, (1968). *A New Course in Reading Pali: Entering the Word of the Buddha*, Delhi: Motilal Banarsidass. |

## 02.1.3 පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා චීන සහතිකපත්‍ර පාඨමාලාව

මෙය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත් වෙන පාඨමාලාවක් වන අතර ඒ පිළිබඳ විස්තර දැනගැනීම සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රකාශිත ශිෂ්‍ය අත්පොත බැලීම මැනවි.

## උපාධි ප්‍රදානෝත්සවය - 2020







උපාධි ප්‍රදානෝත්සවය - 2020

















## 02.1.4 පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා ත්‍රිපිටක මූලාශ්‍රය අධ්‍යයනය පිළිබඳ (කෙටිකාලීන) සහතිකපත්‍ර පාඨමාලාව

### පාඨමාලාවේ විෂය ක්ෂේත්‍රය හා එහි අන්තර්ගතය

ත්‍රිපිටක මූලාශ්‍රය අධ්‍යයනය පුළුල් පරාසයක් ආවරණය කෙරෙන විෂය ක්ෂේත්‍රයකි. එබැවින් යෝජිත පාඨමාලාව ආරම්භක පියවරේ දී ''ත්‍රිපිටක මූලාශ්‍රය අධ්‍යයනය 1'' ලෙස නම් කොට පාඨමාලා අන්තර්ගතය ත්‍රිපිටකයෙන් තෝරාගත් කියවීම්වලට සීමා කරනු ලැබේ. එම සීමා කිරීමට අනුව, මෙම පාඨමාලාවේ අන්තර්ගතයට පහත සඳහන් මොඩියුල ඇතුළත් වේ.

1. මොඩියුලයඃ පාලි ත්‍රිපිටකයේ ප්‍රභවය හා වර්ධනය
2. මොඩියුලයඃ සිඟාලක සූත්‍රය (දීඝනිකාය)
3. මොඩියුලයඃ කූටදන්ත සූත්‍රය (දීඝනිකාය)
4. මොඩියුලයඃ මහාසතිපට්ඨාන සූත්‍රය (දීඝනිකාය)
5. මොඩියුලයඃ අරියපරියේසන සූත්‍රය (මජ්ඣිමනිකාය)
6. මොඩියුලයඃ මධුපිණ්ඩික සූත්‍රය (මජ්ඣිමනිකාය)
7. මොඩියුලයඃ රට්ඨපාල සූත්‍රය (මජ්ඣිමනිකාය)
8. මොඩියුලයඃ සක්කසංයුත්තයේ දුතියවග්ග (සංයුත්තනිකාය)
9. මොඩියුලයඃ කලහවිවාද සූත්‍රය (සුත්තනිපාත)
10. මොඩියුලයඃ මඞ්ගල සූත්‍රය (සුත්තනිපාත)
11. මොඩියුලයඃ පරාභව සූත්‍රය (සුත්තනිපාත)
12. මොඩියුලයඃ කාළුදායි ථෙරගාථා (ථෙරගාථාපාළි)
13. මොඩියුලයඃ චිත්තවග්ග (ධම්මපදපාළි)
14. මොඩියුලයඃ උරුවෙලපාටිහාරියකථා (මහාවග්ගපාළි)
15. මොඩියුලයඃ පුග්ගලපඤ්ඤත්තිප්පකරණ (ආරම්භයේ සිට ද්වික නිද්දේසය අවසානය දක්වා)

### ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම්

පාලි භාෂාව පිළිබඳ පූර්ව දැනුමක් මෙම පාඨමාලාවට ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය නොවන අතර ලියාපදිංචි වීම අපේක්ෂා කරන විද්‍යාර්ථීන් පහත දක්වෙන සුදුසුකම්වලින් එකක් හෝ සපුරා තිබිය යුතු ය.

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් කවර හෝ උපාධියක් ලබා තිබීම
ii. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණයෙන් සමත් වීම
iii. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් කවර හෝ සුදුසුකමක් සපුරා තිබීම

## ඇගයීම් ක්‍රමය

පාඨමාලාව අවසානයෙහි වාචික පරීක්ෂණයක් පැවැත්වේ. වාචික පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා 80% ක දේශන සහභාගීත්වයක් තිබිය යුතු අතර එම පරීක්ෂණය සාර්ථක ව නිමකරන විද්‍යාර්ථීන්ට ආයතනය මඟින් අදාළ මූලාශ්‍රය අධ්‍යයනයෙහි යෙදුණු බව සහතික කෙරෙන සහතිකපත්‍රයක් ප්‍රදානය කරනු ලැබේ.

## ඉගැනුම් ඵල

පාලි මූලාශ්‍රය අධ්‍යයනයෙහි වැදගත්කම හඳුනා ගැනීම මඟින් පාලි භාෂා අධ්‍යයනය කෙරෙහි අවධානය යොමු කිරීම

## පාඨමාලා කාලය

මෙම පාඨමාලාව කාල්පනික ඉගැනුම් පැය (notional learning hours) 390කින් සමන්විත වේ. එම පැය 390වෙන් පැය 90ක් විද්‍යාර්ථීන් හා ඍජු ව සම්බන්ධ වීමට වෙන් කෙරෙන අතර පැය 300ක් ස්වයං අධ්‍යයනය, වාචික පරීක්ෂණයට සූදානම් වීම හා ඇගැයීම සඳහා වෙන් කරනු ලැබේ.

## දේශන පැවැත්වෙන ක්‍රමය

ආයතනික පරිශ්‍රයේ දී මෙන් ම මාර්ගගත ක්‍රමය අනුව ද දේශන පැවැත් වේ.

## පාඨමාලා පැවැත් වීම

ආයතනය මඟින් පවත්වනු ලබන කෙටිකාලීන පාඨමාලාවක් වන මෙම පාඨමාලාව යම් අධ්‍යයනය වර්ෂයක දී පැවැත් වීම සඳහා ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් ආයතනය වෙත ලැබිය යුතු ය. ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබෙන අවස්ථාවක දී පාඨමාලාව නොපැවැත්වීමේ බලය ආයතනය සතු වේ.

## 02.2. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා

**02.2.1 PGDP පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව**

**02.2.2 PDBS බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව**

**02.2.3 PDBC බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව**

### 02.2.1 PGDP පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

#### පාඨමාලාවේ ක්ෂේත්‍රය සහ අන්තර්ගතය

PGDP

පාලි මූලාශ්‍රය කියවා අවබෝධ කරගැනීමත්, විශේෂයෙන් භාෂාව, සාහිත්‍ය පිළිබඳ විවිධ පැතිකඩ හා පොදුවේ බෞද්ධ ඉගැන්වීම්වල අවබෝධය වර්ධනය කිරීමත් යන අරමුණු ඇති ව පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සැලසුම් කොට ඇත.

#### ප්‍රවේශය සඳහා සුදුසුකම්

බුදුසමය පිළිබඳ මූලික දැනුමක් සහ පාලි භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම, මෙම පාඨමාලාවට ප්‍රවේශ වීම සඳහා මූලික අවශ්‍යතාවක් වේ. කවර හෝ විෂයකින්/විෂයයන්ගෙන් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම උපාධියක් ලබා ඇති පුද්ගලයෙකු පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබේ නම් මෙම පාඨමාලාවට ඇතුළත් වීම සඳහා අයැදුම් කිරීමට සුදුසුකම් ලබයි.

i. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ප්‍රාචීන ප්‍රාරම්භ පරීක්ෂණයෙන් සමත් වීම හෝ අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී පාලි භාෂාවට සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම

හෝ

ii. බෞද්ධ ධර්මාචාර්ය විභාගයේ දී පාලි භාෂාව සඳහා සාමර්ථ්‍යයක් ලබා තිබීම

හෝ

iii. ආයතනය විසින් පවත්වනු ලබන පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා පාලි සහතිකපත්‍රය ලබා තිබීම

හෝ

iv. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

## පාඨමාලාව සඳහා අවශ්‍යතා

පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව, විෂය ඒකක හයකින් සමන්විත වෙයි. එම විෂය ඒකක පහත සඳහන් පරිදි වේ.

PGDP 01: නිර්දිෂ්ට ග්‍රන්ථ I

PGDP 02: නිර්දිෂ්ට ග්‍රන්ථ II

PGDP 03: ව්‍යාකරණය සහ රචනය

PGDP 04: පාලි සාහිත්‍යය

PGDP 05: විස්තාරිත රචනය

PGDP 06: ආදි බුදුසමයේ මූලික ඉගැන්වීම්

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා ඉහත සඳහන් විෂය ඒකක සියල්ල සම්පූර්ණ කළ යුතු ය.

## පාඨමාලා ව්‍යුහය

එක් වාරයක් සති දහයකින් සමන්විත, වාර තුනකින් යුතු, අධ්‍යයන වර්ෂයක් පුරා මෙම පාඨමාලාව පැවැත් වේ. PGDP 05: විස්තාරිත රචනය හැර අනෙක් සෑම පාඨමාලා ඒකකයක් සඳහා ම යටත් පිරිසෙයින් සතියකට එක් පැයක දේශනයක් සහ ඒ හා සබැඳි මාර්ගෝපදේශ ලබා දීම සහ සාකච්ඡා ද පැවැත් වේ.

## ඇගයීම් ක්‍රමය

ඉගැන්වීමේ පාඨමාලා සඳහා

i. එක් පාඨමාලා ඒකකයක් සඳහා පැවරුම් දෙකකිඃ එක් පැවරුමක් සඳහා ලකුණු 15කි.

ii. පන්ති සහභාගීත්වය සඳහා ලකුණු 10කි.

iii. එක් එක් විෂය ඒකකයක් සඳහා වර්ෂාවසාන පරීක්ෂණයඃ එක් විෂය ඒකකයක් සඳහා ලකුණු 60කි.

## විස්තාරිත රචනය

විස්තාරිත රචනය සඳහා ලකුණු 100කි. විස්තාරිත රචනය ඇගයීමේ දී සුදුසු මාතෘකාවක් තෝරාගැනීම, රචනයේ තාර්කික ව්‍යුහය, පැහැදිලි ව අදහස් ඉදිරිපත් කිරීම සහ මූලාශ්‍රය භාවිතයේ හැකියාව සැලකිල්ලට ගනු ලැබේ.

**ශ්‍රේණි**

| | | |
|---|---|---|
| 70-100 | A | විශිෂ්ට සාමර්ථ්‍යය |
| 60-69 | B | සම්මාන සාමර්ථ්‍යය |
| 40-59 | C | සාමර්ථ්‍යය |
| 00-39 | W | දුර්වල |

(i) **කුසලතා සාමර්ථ්‍යය** - සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 40ට නොඅඩුව ලබා සියලු විෂය ඒකකවල සාමාන්‍යය ලකුණු 70ක් හෝ ඊට වඩා වැඩි වීම

(ii) **සාමර්ථ්‍යය** - සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 40ක් ලබා තිබීම හෝ එක් විෂය ඒකකයකට පමණක් ලකුණු 35-39 අතර ප්‍රමාණයක් ලබා සියලු විෂය ඒකකයන්ගේ ලකුණුවල සාමාන්‍යය 40ක් හෝ ඊට වඩා වැඩි වීම

(iii) **ඌන සාමර්ථ්‍යය හා අසමත් වීම** - එක් විෂය ඒකකයකින් පමණක් අසමත් වන සිසුන් ඌන සාමර්ථ්‍යයක් ලත් සිසුන් ලෙස සලකනු ලැබේ. ඔවුන්ට එම විෂය ඒකකයට පමණක් නැවත පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. විෂය ඒකක දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අසමත් වන සිසුන් අසමත් අය ලෙස සැලකේ. ඔවුන් සියලු ම ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටිය යුතු ය. කෙසේ වුව ද PGDP 05 විෂය ඒකකය සමත් වුව හොත් එය නැවත සම්පූර්ණ කිරීමට අවශ්‍ය නැත. තව ද ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වූ දින සිට වසර 04ක් තුළ විභාගය සමත් විය යුතු ය.

## පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශය

| | |
|---|---|
| විෂය සංකේතය | **PGDP 01** |
| විෂය නාමය | **නිර්දිෂ්ට ග්‍රන්ථ I** |
| අරමුණ | ත්‍රිපිටක පාළි ග්‍රන්ථ අධ්‍යයනය කොට අවබෝධ කර ගැනීමේ කුසලතාව වර්ධනය කිරීම |
| අන්තර්ගතය | මෙම පාඨමාලා ඒකකයේ අන්තර්ගතය මෙසේය:<br>i. දීඝනිකාය - අග්ගඤ්ඤ සුත්ත<br>ii. මජ්ඣිමනිකාය - අරියපරියෙසන සුත්ත<br>iii. සංයුත්තනිකාය - කෝසල සංයුත්තයේ කෝසල වග්ග |
| කාලසීමාව | පැය 30 |
| ඉගැන්වීමේ ක්‍රමය | දේශන, පරිවර්තන, සාකච්ඡා සහ පැවරුම් |
| ඇගයීම් ක්‍රමය | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ අවසාන පරීක්ෂණය |
| අපේක්ෂිත ඉගෙනුම් ඵල | පාඨමාලා ඒකකය අවසානයේ දී ශිෂ්‍යයන් තුළ පහත සඳහන් ශක්‍යතා වර්ධනය වනු ඇත.<br>i. වාක්‍ය රටා විශ්ලේෂණය සහ පාලි වාක්‍ය නිවැරදි ව අධ්‍යයනය කිරීම<br>ii. පාලි භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ප්‍රදර්ශනය කිරීම සහ නිර්දේශිත කෘතිවල අන්තර්ගතය අවබෝධ කර ගැනීම<br>iii. තෝරා ගත් පාලි ඡේදවල දක්වෙන බෞද්ධ ඉගැන්වීම් අවබෝධ කරගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම<br>iv. තෝරා ගත් පාලි ඡේද සිංහල භාෂාවට පරිවර්තනය කිරීම |
| නිර්දේශිත ග්‍රන්ථ | බුද්ධදත්ත හිමි, පොල්වත්තේ ශ්‍රී (2017). *පාලිභාෂාවතරණය - පළමුවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2016). *පාලිභාෂාවතරණය - දෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2017). *පාලිභාෂාවතරණය - තෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>Anuruddha, Kakkapalliye (2010). *A Guide to the Study of Pali: The Language of Theravada Buddhism*, Hong Kong: Center of Buddhism Studies, The University of Hong Kong.<br>Hinüber, Oskar Von (2001). *Handbook of Pali Literature*, New Delhi: Munshiram Manoharlal.<br>Jayawardhana, S. (1994). *Handbook of Pali Literature*, Colombo: Karunaratne & Sons Ltd.<br>Law, B.C. (1933). *A History of Pali Literature*, London: Indica.<br>Malalasekera, G.P. (1994). *The Pali Literature of Ceylon*, Kandy: Buddhist Publication Society.<br>Norman, K.R. (1983). *Pāli Literature: Including the Canonical Literature in Prakrit and Sanskrit of All the Hīnayāna Schools of Buddhism*, Wiesbaden: Otto Harrassowitz. |

| | |
|---|---|
| විෂය සංකේතය | **PGDP 02** |
| විෂය නාමය | **නිර්දිෂ්ට ග්‍රන්ථ II** |
| අරමුණ | ත්‍රිපිටක සහ අට්ඨකථා කෘති අධ්‍යයනය කොට අවබෝධ කරගැනීමේ කුසලතාව වර්ධනය කිරීම |
| අන්තර්ගතය | මෙම පාඨමාලා ඒකකයේ අන්තර්ගතය මෙසේය:<br>i. මහාවග්ගපාළි - මහාක්ඛන්ධක<br>ii. උදානපාළි - 1-3 වග්ග<br>iii. සුමඞ්ගලවිලාසිනී - බාහිරනිදාන |
| කාලසීමාව | පැය 30 |
| ඉගැන්වීමේ ක්‍රමය | දේශන, පරිවර්තන, සාකච්ඡා සහ පැවරුම් |
| ඇගයීම් ක්‍රමය | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ අවසාන පරීක්ෂණය |
| අපේක්ෂිත ඉගෙනුම් ඵල | පාඨමාලා ඒකකය අවසානයේ දී ශිෂ්‍යයින් තුළ පහත සඳහන් ශක්‍යතා වර්ධනය වනු ඇත.<br>i. වාක්‍ය රටා විශ්ලේෂණය සහ පාලි වාක්‍ය නිවැරදි ව අධ්‍යයනය කිරීම<br>ii. පාලි භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ප්‍රදර්ශනය කිරීම සහ නිර්දේශිත කෘතිවල අන්තර්ගතය අවබෝධ කර ගැනීම<br>iii. තෝරා ගත් පාලි ඡේදවල දක්වෙන බෞද්ධ ඉගැන්වීම් අවබෝධ කර ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කිරීම<br>iv. තෝරා ගත් පාලි ඡේද නූතන භාෂාවලට පරිවර්තනය කිරීම |
| නිර්දේශිත ග්‍රන්ථ | බුද්ධදත්ත හිමි, පොල්වත්තේ ශ්‍රී (2017). *පාලිභාෂාවතරණය - පළමුවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2016). *පාලිභාෂාවතරණය - දෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2017). *පාලිභාෂාවතරණය - තෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>Anuruddha, Kakkapalliye (2010). *A Guide to the Study of Pali: The Language of Theravada Buddhism*, Hong Kong: Center of Buddhist Studies, The University of Hong Kong.<br>Hinüber, Oskar Von (2001). *Handbook of Pali Literature*, New Delhi: Munshiram Manoharlal.<br>Jayawardhana, S. (1994). *Handbook of Pali Literature*, Colombo: Karunaratne & Sons Ltd.<br>Law, B.C. (1933). *A History of Pali Literature*, London: Indica.<br>Malalasekera, G.P. (1994). *The Pali Literature of Ceylon*, Kandy: Buddhist Publication Society.<br>Norman, K.R. (1983). *Pāli Literature: Including the Canonical Literature in Prakrit and Sanskrit of All the Hīnayāna Schools of Buddhism*, Wiesbaden: Otto Harrassowitz. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PGDP 03** |
| **විෂය නාමය** | ව්‍යාකරණය හා රචනය |
| **අරමුණ** | පාලි ව්‍යාකරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබාදීම සහ පාලි රචනා ලිවීමේ කුසලතාව වර්ධනය කිරීම |
| **අන්තර්ගතය** | i. පහත සඳහන් මාතෘකා විශේෂ කොට ගෙන පාලි භාෂාව පිළිබඳ සාමාන්‍ය දැනීම වර්ධනය කිරීම: පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයෝ, පාලි ශබ්දමාලාව, නාමපද සහ ක්‍රියාපද සකස් කිරීම, සන්ධි, සමාස, තද්ධිත, කාරක, නිපාත සහ උපසර්ග<br>ii. පාලි භාෂාවෙන් සිංහල භාෂාවටත්, සිංහල භාෂාවෙන් පාලි භාෂාවටත් ඡේද පරිවර්තනය කිරීම සහ පාලි භාෂාවෙන් රචනා ලිවීම |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පරිවර්තන, සාකච්ඡා සහ පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ අවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | මෙම පාඨමාලා ඒකකය අවසානයේ දී ශිෂ්‍යයන් තුළ පහත සඳහන් ශක්‍යතා වර්ධනය වනු ඇත.<br>i. ග්‍රන්ථ විශ්ලේෂණය සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ව්‍යාකරණ දැනුමක් ප්‍රදර්ශනය කිරීම<br>ii. අවශ්‍ය වූ කල්හි පාලි ශබ්දකෝෂයක ආධාරයෙන් පාලි ග්‍රන්ථ අධ්‍යයනය කිරීම සහ අවබෝධ කරගැනීම<br>iii. පාලි භාෂාවෙන් සිංහල භාෂාවටත්, සිංහල භාෂාවෙන් පාලි භාෂාවටත් ඡේද පරිවර්තනය කිරීම සහ පාලි භාෂාවෙන් රචනා ලිවීම |
| **නිර්දේශිත ග්‍රන්ථ** | බුද්ධදත්ත හිමි, පොල්වත්තේ ශ්‍රී (2017). *පාලිභාෂාවතරණය - පළමුවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2016). *පාලිභාෂාවතරණය - දෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>_______, (2017). *පාලිභාෂාවතරණය - තෙවැනි පොත*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>Anuruddha, Kakkapalliye (2010). *A Guide to the Study of Pali: The Language of Theravada Buddhism*, Hong Kong: Center of Buddhism Studies, The University of Hong Kong.<br>Buddhadatta, A.B. (1997). *The New Pali Course, Part I and II*, Dehiwela: Buddhist Cultural Centre.<br>Warder, A. K. (2001). *Introduction to Pali*, Pali Text Society, Oxford: Pali Text Society. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PGDP 04** |
| **විෂය නාමය** | **පාලි සාහිත්‍යය** |
| **අරමුණ** | පාලි සාහිත්‍යය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ශිෂ්‍යයින්ට ලබාදීම |
| **අන්තර්ගතය** | ථේරවාද ත්‍රිපිටක පාළිය, පශ්චාත් ත්‍රිපිටක ග්‍රන්ථ, අට්ඨකථා, ටීකා, පකරණ, සහ පාලි සාහිත්‍යයේ වෙනත් අංශයන්ගෙන් මෙම විෂය ඒකකයේ අන්තර්ගතය සමන්විත වෙයි. මෙම කෘතිවල ව්‍යුහය, අන්තර්ගතය සහ ඓතිහාසික වර්ධනය වෙත අවධානය යොමු කෙරෙමින් එම පුළුල් අංශ හඳුන්වා දෙනු ලැබේ. මෙම අධ්‍යයන ක්ෂේත්‍රයේ තවත් පැතිකඩක් වනුයේ වෙනත් බෞද්ධ රටවල පාලි සාහිත්‍යයේ සිදු වූ වර්ධනය හැදෑරීම යි. |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පරිවර්තන, සාකච්ඡා සහ පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ අවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | මෙම පාඨමාලා ඒකකය අවසානයේ දී පාලි සාහිත්‍යයේ විවිධ අංශ පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ප්‍රදර්ශනය කිරීමට ශිෂ්‍යයින්ට හැකියාව ලැබෙනු ඇත. |
| **නිර්දේශිත ග්‍රන්ථ** | බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2007). *පාලි සාහිත්‍යය*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>Adikaram, E.W. (1994). *Early History of Buddhism in Ceylon*, Colombo: Buddhist Cultural Centre.<br>Bode, Mabel Haynes (2009). *Pali Literature of Burma*, London. Royal Asiatic Society.<br>Endo, Toshiichi (2013). *Studies in Pāli Commentarial Literature*, Hong Kong: Center of Buddhism Studies, The University of Hong Kong.<br>Hinüber, Oskar Von (2001). *Handbook of Pali Literature*, New Delhi: Munshiram Manoharlal.<br>Jayawardhana, S. (1994). *Handbook of Pali Literature*, Colombo: Karunaratne & Sons Ltd.<br>Law, B.C. (1933). *A History of Pali Literature*, London: India.<br>Malalasekera, G.P. (1994). *The Pali Literature of Ceylon*, Kandy: Buddhist Publication Society.<br>Norman, K.R. (1983). *Pāli Literature: Including the Canonical Literature in Prakrit and Sanskrit of All the Hīnayāna Schools of Buddhism*, Wiesbaden: Otto Harrassowitz.<br>Saddhatissa, H. (1992). *Pali Literature of South-East Asia*, Singapore. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PGDP 05** |
| **විෂය නාමය** | **විස්තාරිත රචනය** |
| **අරමුණ** | ශාස්ත්‍රීය ලේඛන කුසලතාව වර්ධනය කිරීම |
| **අන්තර්ගතය** | පාඨමාලාව හා සම්බන්ධ ආචාර්යවරයෙකුගේ උපදෙස් මත ආයතනයේ අනුමැතිය ද සහිත ව තෝරා ගත් මාතෘකාවක් යටතේ ශිෂ්‍යයින් විසින් විස්තාරිත රචනයක් සම්පාදනය කළ යුතු වේ. මෙම රචනය 3000කට නොඅඩු වචන සංඛ්‍යාවකින් සමන්විත විය යුතු වන අතර එය පාලි කෘතියක් (හෝ ඉන් කොටසක්) අධ්‍යයනය කිරීමක් හෝ විශ්ලේෂණය කිරීමක් හෝ විය යුතු ය. නොඑසේ නම් ඍජුව ම පාලි කෘති අධ්‍යයනය හෝ විශ්ලේෂණය පදනම් කර ගත් කවර හෝ විෂයයක් පිළිබඳ (ධර්මමය හෝ වෙනත්) අධ්‍යයනයක් විය යුතු ය.<br>සෑම ශිෂ්‍යයෙක් ම දෙවන වාරය අවසන් වීමට පෙර ඔවුන්ගේ රචනා මාතෘකා ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු ය. පාඨමාලාවේ වර්ෂාවසාන පරීක්ෂණයේ අවසාන ප්‍රශ්න පත්‍රයට අදාළ පරීක්ෂණය පැවැත් වූ දින සිට දින 30ක් තුළ විස්තාරිත රචනය ආයතනය වෙත භාරදිය යුතු ය. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PGDP 06** |
| **විෂය නාමය** | **ආදි බුදුසමයේ මූලික ඉගැන්වීම්** |
| **අරමුණ** | ආදි බුදුසමයේ මූලික ඉගැන්වීම් පිළිබඳ විස්තරාත්මක අවබෝධයක් ලබා දීම |
| **අන්තර්ගතය** | පහත දැක්වෙන තේමා වෙත විශේෂ අවධානය යොමු කරමින්, ආදි බුදුසමයේ මූලික ඉගැන්වීම් පිළිබඳ විස්තරාත්මක අවබෝධයක් ලබා දීම පිණිස මෙම පාඨමාලාව සැලසුම් කර ඇත. ත්‍රිලක්ෂණය හා ප්‍රතීත්‍යසමුත්පාදය පිළිබඳ ඉගැන්වීම මගින් පෙන්වා දෙන සත්ත්වයාගේ පැවැත්ම පිළිබඳ බෞද්ධ දැක්ම; ස්කන්ධ, ආයතන සහ ධාතු වශයෙන් ආනුභූතික පුද්ගලභාවය පිළිබඳ විශ්ලේෂණය හා එමගින් ආත්මය පිළිබඳ භෞතික හා අධිභෞතික දෘෂ්ටි, උච්ඡේදවාදී (භෞතික) හා සස්සතවාද ආදී දෘෂ්ටි බැහැර කිරීම; චතුරාර්ය සත්‍යයෙන් පිළිබිඹු වන මිනිස් ස්වභාවය හා මිනිසාගේ පරිපූර්ණත්වය සහ විමුක්තිය පිළිබඳ බෞද්ධ විග්‍රහය; බෞද්ධ මනෝ විශ්ලේෂණය හා ආධ්‍යාත්මික ශික්ෂණයෙහි ලා එහි ඇති උපයෝගිතාව; බෞද්ධ ආචාර ධර්ම හා එමගින් අපේක්ෂිත ආගමික හා සමාජීය පරමාර්ථ; බෞද්ධ ඥාන විභාගීය ස්ථාවරය හා බුදුසමයෙහි දක්නට ලැබෙන එහි අනුභූතිවාදී ප්‍රවණතාව, චතුර්විධ ප්‍රශ්න ව්‍යාකරණය, දෘෂ්ටි හා අව්‍යාකත ප්‍රශ්න පිළිබඳ විචාරය; ආගමක් හා දර්ශනයක් වශයෙන් බුදුසමයෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | ආදි බුදුසමයේ මූලික සංකල්ප විස්තර කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | ඤාණසීහ හිමි, හේන්පිටගෙදර (1962). *මහරහතන් වහන්සේ.* කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.<br>තෝමස්, ඊ. ජේ. (1966). *බෞද්ධ චින්තාවේ ඉතිහාසය.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගමය.<br>සුමනපාල, ගල්මංගොඩ (2012). *ආදි බෞද්ධ දර්ශනය සහ සංස්කෘතිය.* කොළඹ: සරස්වතී ප්‍රකාශන.<br>ධම්මසිරි හිමි, පිටාරඹ (1988). *නිර්වාණය.* අළුත්ගම: සමගි මුද්‍රණාලය.<br>ධර්මසිරි, ගුණපාල (1980). *බෞද්ධ සදාචාරයේ මූලධර්ම.* නුගේගොඩ: සිස්ටමැටික් ප්‍රින්ටර්ස්.<br>මහින්ද හිමි, දීගල්ලේ (2015). *නිර්වාණය හා සදාචාරය.* කොළඹ: ස්ටැන් ෆර්ඩ් ලේක් ප්‍රකාශන.<br>රාහුල හිමි, වල්පොළ (1993). *බුදුන් වදාළ ධර්මය.* කොළඹ: ගුණසේන ප්‍රකාශන.<br>විජේබණ්ඩාර, චන්ද්‍රිම හා මොරටුවගම, එච්. එම්. (1995). *ආදි බෞද්ධ චින්තනය: අදහස් කීපයක්.* කොළඹ: ගොඩගේ ප්‍රකාශන. |

PGDP

| | |
|---|---|
| නිර්දේශිත ග්‍රන්ථ | Conze, E. (1960). *Buddhism: Its Essence and Development.* Oxford: Dover Publications.<br>De Silva, Padmasiri (1979). *An Introduction to Buddhist Psychology.* (Third Edition). London, Rowman & Littlefield Publishers.<br>Kalupahana, D. J. (1976). *Buddhist Philosophy: A Historical Analysis.* Honolulu: University of Hawaii Press.<br>Sangharakshita, Bhikshu (1976). *A survey of Buddhism.* Bangalore: Windhorse Publications.<br>Tachibana S. (1961). *Ethics of Buddhism*. New Delhi: Cosmo Publication.<br>Warder, A. K. (1980). *Indian Buddhism.* Delhi: Motilal Banarsidass. |

## 02.2.2 බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

### පාඨමාලාවේ විෂය ක්ෂේත්‍රය හා අන්තර්ගතය

පර්යේෂණාත්මක බෞද්ධ අධ්‍යයනය සඳහා ප්‍රවේශයක් වශයෙන් සැලකිය හැකි මෙම පාඨමාලාව බෞද්ධ අධ්‍යයනයට අදාළ විෂය පිළිබඳ මූලික අවබෝධයක් නොමැති, එහෙත් එම විෂයයන් ගැඹුරින් අධ්‍යයනය කරනු කැමති විද්‍යාර්ථීන් සඳහා සකස් වූවකි. මේ සඳහා බෞද්ධ මූලාශ්‍රය ගැඹුරින් පරිශීලනය කර නැත්තා වූ ද මූලාශ්‍රය භාෂා පිළිබඳ විධිමත් දැනුමක් නැත්තා වූ ද අපේක්ෂකයන්ට වුව ද සහභාගි විය හැකි ය. භාරතීය ඉතිහාසය හා භාරතීය ආගමික චින්තනය පිළිබඳ අවබෝධය මේ සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම පාඨමාලාව මඟින් බුදුසමයේ උදාවට පසුබිම් වූ භාරතීය ආගමික හා දාර්ශනික චින්තනය කෙරෙහි අවධානය යොමු කරමින් බුදුදහමෙහි මූලික ඉගැන්වීම් සම්බන්ධ ප්‍රාමාණික අවබෝධයක් ලබා දීම අපේක්ෂා කෙරේ. අනෙකුත් භාරතීය සමය සම්ප්‍රදායයන් විෂයයෙහි බුදුසමයට හිමි වන තැනත්, අවුරුදු දෙදහස් පන්සියයක කාලය තුළ බෞද්ධ චින්තනය හා සංස්කෘතිය මානව සමාජය කෙරෙහි බලපා ඇති ආකාරයත් මෙම පාඨමාලාවෙහි දී විශ්ලේෂණයට ලක් වේ. මෙම පාඨමාලාව යටතේ බුදුසමය පදනම් කරගත් නූතන හා සාම්ප්‍රදායික අධ්‍යයන හඳුන්වා දීම ද සිදු වේ.

### ප්‍රවේශය සඳහා සුදුසුකම්

මෙම පාඨමාලාවට ඇතුළත් වීමට බලාපොරොත්තු වන අයැදුම්කරුවකු පහත සඳහන් සුදුසුකම්වලින් යටත් පිරිසෙයින් එකක් හෝ සපුරා තිබිය යුතු ය.

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම

හෝ

ii. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණයෙන් සමත් වීම

හෝ

iii. ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

### පාඨමාලාව සඳහා අවශ්‍යතා

බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව පහත සඳහන් විෂය ඒකක හයකින් යුක්ත වේ.

**පාඨමාලා ඒකක**

PDBS 01: භාරතීය ආගමික පසුබිම සහ බුදුසමයේ උදාව
PDBS 02: ආදි බුදුසමයේ මූලික ඉගැන්වීම්
PDBS 03: බෞද්ධ සමාජ දර්ශනය
PDBS 04: බෞද්ධ සංස්කෘතිය: සංක්ෂිප්ත අධ්‍යයනයක්
PDBS 05: විස්තාරිත රචනය
PDBS 06: බෞද්ධ ආචාර විද්‍යාවේ මූලික ඉගැන්වීම්

## පාඨමාලා ව්‍යුහය

එක් වාරයක් සති දහයකින් සමන්විත, වාර තුනකින් යුතු, අධ්‍යයන වර්ෂයක් පුරා මෙම පාඨමාලාව පැවැත්වේ. PDBS 05: විස්තාරිත රචනය හැර අනෙක් සෑම පාඨමාලා ඒකකයක් සඳහා ම යටත් පිරිසෙයින් සතියකට එක් පැයක දේශනයක් සහ ඒ හා සබැඳි මාර්ගෝපදේශ ලබා දීම සහ සාකච්ඡා ද පැවැත් වේ.

## ඇගයීම් ක්‍රමය

**ඉගැන්වීමේ පාඨමාලා සඳහා**

i. එක් විෂය ඒකකයක් සඳහා පැවරුම් දෙකකි: එක් පැවරුමක් සඳහා ලකුණු 15කි.

ii. පන්ති සහභාගීත්වය සඳහා ලකුණු 10කි.

iii. එක් එක් විෂය ඒකකයක් සඳහා වර්ෂාවසාන පරීක්ෂණය: එක් විෂය ඒකකයක් සඳහා ලකුණු 60කි.

**විස්තාරිත රචනය:** ලකුණු 100කි.

විස්තාරිත රචනය ඇගයීමේ දී සුදුසු මාතෘකාවක් තෝරා ගැනීම, රචනයේ තාර්කික ව්‍යුහය, පැහැදිලි ව අදහස් ඉදිරිපත් කිරීම සහ මූලාශ්‍රය භාවිතයේ හැකියාව සැලකිල්ලට ගනු ලැබේ.

## ශ්‍රේණි

| | | |
|---|---|---|
| 75-100 | A | විශිෂ්ට සාමර්ථ්‍යය |
| 65-74 | B | සම්මාන සාමර්ථ්‍යය |
| 50-64 | C | සාමර්ථ්‍යය |
| 00-49 | W | දුර්වල |

i. **කුසලතා සාමර්ථ්‍යය** - සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 40ට නොඅඩුව ලබා සියලු විෂය ඒකකවල සාමාන්‍යය ලකුණු 70ක් හෝ ඊට වඩා වැඩි වීම

ii. **සාමර්ථ්‍යය** - සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 40ක් ලබා තිබීම හෝ එක් විෂය ඒකකයකට පමණක් ලකුණු 35 - 39 අතර ප්‍රමාණයක් ලබා සියලු විෂය ඒකකයන්ගේ ලකුණුවල සාමාන්‍යය 40ක් හෝ ඊට වඩා වැඩි වීම

iii. **ඌන සාමර්ථ්‍යය හා අසමත් වීම** - එක් විෂය ඒකකයකින් පමණක් අසමත් වන සිසුන් ඌන සාමර්ථ්‍යයක් ලත් සිසුන් ලෙස සලකනු ලැබේ. ඔවුන්ට එම විෂය ඒකකයට පමණක් නැවත පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. විෂය ඒකක දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අසමත් වන සිසුන් අසමත් අය ලෙස සැලකේ. ඔවුන් සියලු ම ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටිය යුතු ය. කෙසේ වුව ද PDBS 05 විෂය ඒකකය සමත් වුව හොත් එය නැවත සම්පූර්ණ කිරීමට අවශ්‍ය නැත. තව ද ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වූ දින සිට වසර 04ක් තුළ විභාගය සමත් විය යුතු ය.

## බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශය

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBS 01** |
| **විෂය නාමය** | **භාරතීය ආගමික පසුබිම හා බුදුසමයේ උදාව** |
| **අරමුණ** | ප්‍රාග් බෞද්ධ භාරතීය ආගමික හා දාර්ශනික සම්ප්‍රදායයන්ගේ ආරම්භය හා විකාශයත්, බුදුසමයේ සම්භවයට ඒවායෙහි බලපෑමත් හඳුනා ගැනීම |
| **අන්තර්ගතය** | බුදුසමයේ උදාවට පසුබිම් වූ භාරතීය ආගමික හා දාර්ශනික පසුබිම විමර්ශනය කෙරෙන මෙම අධ්‍යයනයෙහි දී පහත සඳහන් අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ. බහුදේවවාදයේ සිට එකෙකේශ්වරවාදය හා ඒකදේවවාදය තෙක් වෛදික ආගමේ ප්‍රභවය හා එහි පරිණාමය; උපනිෂදයන්ගේ ප්‍රභවය හා ඒවායේ කේන්ද්‍රීය ඉගැන්වීම්; පරම සත්‍ය ගවේෂණය හා ආත්මන්-බ්‍රහ්මන් අනන්‍යතාව; පුනර්ජන්මය හා කර්මය පිළිබඳ ඉගැන්වීම් සහ ඥාන මාර්ගය හා එමගින් අපේක්ෂිත විමුක්ති සාධනය; බ්‍රාහ්මණික සංස්කෘතිය හා සබැඳි ආගමික චර්‍යා හා සමාජ සංස්ථා; ශ්‍රමණ සංස්කෘතියේ උදාව, එහි විවිධ දෘෂ්ටිවාද හා විප්ලවීය ප්‍රවණතා; ෂට් ශාස්තෘවරු සහ ඔවුන්ගේ ඉගැන්වීම්; පරිබ්‍රාජකයන් හෙවත් සංචාරක ආගමික තාපසවරු; තාපසචර්යා හා ඉන් අපේක්ෂිත ආගමික අරමුණු; ජීවිතය පිළිබඳ සස්සතවාදය හා උච්ඡේදවාදය අතර ගැටුම හා සංශයවාදයේ ආරම්භය; බුදුසමයේ ප්‍රභවය හා තත්කාලීන භාරතීය ආගම් හා දර්ශන කෙරෙහි එහි ඇති සබඳතාව |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ අවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | ප්‍රාග් බෞද්ධ භාරතීය ආගමික හා දාර්ශනික සම්ප්‍රදායයන්ගේ සුවිශේෂී ලක්ෂණ හා බුදුසමයේ උදාව කෙරෙහි ඒවායේ බලපෑම පැහැදිලි කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | කලුපහන, ඩී. ජේ. (1961). *භාරතීය දර්ශන ඉතිහාසය.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව.<br>ගුණසේන, දේශප්‍රිය (2011). *ශ්‍රමණ සම්ප්‍රදායේ පසුබිම හා බුදුසමයේ අනන්‍යතාව,* කොළඹ: සරස්වතී ප්‍රකාශන.<br>ඤාණිස්සර හිමි, අල්පිටියේ (1990). *භාරත දර්ශනය.* කොළඹ: ගොඩගේ ප්‍රකාශන.<br>ඩේවිඩ්ස්, රීස්, (1956). *බෞද්ධ භාරතය.* කොළඹ:<br>ධම්මරතන හිමි, නාරාවිල හා පඤ්ඤාලෝක හිමි, හැඩිපන්නල (1957). *භාරතීය දර්ශනය,* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව.<br>රාධාක්‍රිෂ්ණන් එස්. (1970). *ඉන්දීය දර්ශනය.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.<br>රාහුල හිමි, රත්නපුරේ (1995). *බුදුසමයේ උදාව.* බාඳුරාගොඩ: කර්තෘ ප්‍රකාශන.<br>හිරියන්න, ඇම්. (1970). *සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය,* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

PDBS

| | |
|---|---|
| නිර්දේශිත ග්‍රන්ථ | Barua, M. B. (1921). *Pre-Buddhistic Indian Philosophy.* Calcutta: University of Calcutta.<br>Basham, L.,(Ed.). (1975). *A Cultural history of India.* Oxford: University Press.<br>Dasgupta, S. (1963). *A History of Indian Philosophy.* Vol. I, Cambridge: Cambridge University Press.<br>Glasenap, H. V. (1978). *Vedanta and Buddhism.* Kandy: Buddhist Publication Society.<br>Jaytileke, K. N. (1963). *Early Buddhist Theory of Knowledge.* London: Georos Allen & Unwin Lte.<br>Joshi, Lal Mani (1987). *Brahmanism, Buddhism and Hinduism.* Kandy: Buddhist Publication Society. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBS 02** |
| **විෂය නාමය** | **ආදි බුදුසමයේ මූලික ඉගැන්වීම්** |
| **අරමුණ** | ආදි බුදුසමයේ මූලික ඉගැන්වීම් පිළිබඳ විස්තරාත්මක අවබෝධයක් ලබාදීම |
| **අන්තර්ගතය** | පහත දැක්වෙන තේමා වෙත විශේෂ අවධානය යොමු කරමින්, ආදි බුදුසමයේ මූලික ඉගැන්වීම් පිළිබඳ විස්තරාත්මක අවබෝධයක් ලබා දීම පිණිස මෙම පාඨමාලාව සැලසුම් කර ඇත. ත්‍රිලක්ෂණය හා ප්‍රතීත්‍යසමුත්පාදය පිළිබඳ ඉගැන්වීම මගින් පෙන්වා දෙන සත්ත්වයාගේ පැවැත්ම පිළිබඳ බෞද්ධ දැක්ම; ස්කන්ධ, ආයතන සහ ධාතු වශයෙන් ආනුභූතික පුද්ගලභාවය පිළිබඳ විශ්ලේෂණය හා එමගින් ආත්මය පිළිබඳ භෞතික හා අධිභෞතික දෘෂ්ටි, උච්ඡේදවාදී (භෞතික) හා සස්සතවාදී දෘෂ්ටි බැහැර කිරීම; චතුරාර්ය සත්‍යයෙන් පිළිබිඹු වන මිනිස් ස්වභාවය හා මිනිසාගේ පරිපූර්ණත්වය සහ විමුක්තිය පිළිබඳ බෞද්ධ විග්‍රහය; බෞද්ධ මනෝ විශ්ලේෂණය හා ආධ්‍යාත්මික ශික්ෂණයෙහි ලා එහි ඇති උපයෝගිතාව; බෞද්ධ ආචාර ධර්ම හා එමගින් අපේක්ෂිත ආගමික හා සමාජීය පරමාර්ථ; බෞද්ධ ඥාන විභාගීය ස්ථාවරය හා බුදුසමයෙහි දක්නට ලැබෙන එහි අනුභූතිවාදී ප්‍රවණතාව, චතුර්විධ ප්‍රශ්න ව්‍යාකරණය, දෘෂ්ටි හා අව්‍යාකත ප්‍රශ්න පිළිබඳ විචාරය; ආගමක් හා දර්ශනයක් වශයෙන් බුදුසමයෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ අවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | ආදි බුදුසමයේ මූලික සංකල්ප විස්තර කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | ගල්මංගොඩ, සුමනපාල, (2012). *ආදි බෞද්ධ දර්ශනය.* දිවුලපිටියඃ සරස්වතී ප්‍රකාශන.<br>ඥාණසීහ හිමි, හේන්පිටගෙදර (1962). *මහරහතන් වහන්සේ.* කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.<br>තෝමස්, ඊ. ජේ. (1966). *බෞද්ධ චින්තාවේ ඉතිහාසය.* (දෙවැනි මුද්‍රණය). කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගමය.<br>ධම්මසිරි හිමි, පිටාරඹ (1988). *නිර්වාණය.* අළුත්ගමඃ සමගි මුද්‍රණාලය.<br>ධර්මසිරි, ගුණපාල (1996). *බෞද්ධ සදාචාරයේ මූලධර්ම.* නුගේගොඩඃ සිස්ටමැටික්ස් ප්‍රින්ටර්ස්,<br>මහින්ද හිමි, දීගල්ලේ (2015). *නිර්වාණය හා සදාචාරය,* නුගේගොඩඃ ස්ටැන්ෆඩ් ලේක් ප්‍රකාශන<br>රාහුල හිමි, වල්පොළ (1993). *බුදුන් වදාළ ධර්මය.* (සවැනි මුද්‍රණය). කොළඹඃ ගුණසේන ප්‍රකාශන.<br>විජේබණ්ඩාර චන්දිම හා මොරටුවගම එච්. එම්. (1995). *ආදි බෞද්ධ චින්තනයඃ අදහස් කීපයක්.* කොළඹඃ ගොඩගේ ප්‍රකාශන. |

PDBS

| | |
|---|---|
| නිර්දේශිත ග්‍රන්ථ | Conze, E. (2003). *Buddhism, Its Essence and Development.* Oxford: Dover Publications.<br>De Silva, Padmasiri (1979). *An Introduction to Buddhist Psychology.* London: Palgrave Macmillan.<br>Kalupahana, D. J. (1976). *Buddhist Philosophy: A Historical Analysis.* Honolulu: University Press of Hawaii.<br>Sangharakshita, Bhikshu (2006 ). *A survey of Buddhism*. Delhi: Motilal Banarsidass.<br>Tachibana S., (1926). *The Ethics of Buddhism*. Delhi: Cosmo Publications.<br>Warder, A. K. (1980). *Indian Buddhism*. (Second Edition) Delhi: Motilal Banarsidass. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBS 03** |
| **විෂය නාමය** | **බෞද්ධ සමාජ දර්ශනය** |
| **අරමුණ** | පාලි සූත්‍ර දේශනා හා විනය පිටකය පදනම් කොට ගෙන බුදුසමයේ සමාජ දර්ශනය පිළිබඳ විශ්ලේෂණාත්මක හා ඇගයුම්ශීලී අධ්‍යයනයක් |
| **අන්තර්ගතය** | මිනිසා පිළිබඳ බෞද්ධ සංකල්පය හා ඉන් ගම්‍යවන අදහස් මෙම අධ්‍යයනයට පසුබිම් වන අතර, එහි දී පහත සඳහන් මාතෘකා වෙත විශේෂ අවධානය යොමු කෙරේ: බ්‍රාහ්මණ වර්ණ ධර්ම හා ස්වධර්ම පදනම් කොට ගත් ආගමික හා සමාජ සංස්ථා පිළිබඳ බෞද්ධ විචාරය; සමාජ ප්‍රභවය හා එහි පරිණාමය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම; මානව වර්ගයාගේ ඒකත්වය පිළිබඳ ජීව විද්‍යාත්මක, ඓතිහාසික හා ආචාර විද්‍යාත්මක තර්ක; මිනිසාගේ ප්‍රමුඛත්වයට වඩා ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ අවධාරණය; මානව නිෂ්ටා හා සමාජගත පරමාදර්ශ පිළිබඳ සදාචාරාත්මක නිර්ණායක; පුද්ගලයා, සමාජය හා පුද්ගලාන්තර සම්බන්ධතා; ධම්මචරියා සහ සමචරියා; බෝධිසත්ව පරමාදර්ශය සහ චරණය; ගෘහස්ථ සමාජයෙහි ලා සංඝයාගේ කාර්යභාරය; ආර්ථිකය හා දේශපාලනය පිළිබඳ බෞද්ධ නිරීක්ෂණ; නායකත්වයේ ගුණාංග; රාජධර්ම සහ චක්කවත්ති සංකල්පය; අපරිහානිය ධම්ම සහ සංගහවත්ථු; නීතිය, යුක්තිය සහ දණ්ඩනය පිළිබඳ බෞද්ධ පර්යාවලෝකනය |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ අවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | පාලි සූත්‍ර දේශනාවන්හි හා විනය පිටකයෙහි ප්‍රකට වන බෞද්ධ සමාජ දර්ශනයේ මූලික සංකල්ප විශ්ලේෂණය කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | තිලකරත්න, අසංග (2020). *බෞද්ධ නූතනත්ව අධ්‍යයන*. (මිරිස්වත්තේ විමලඥාන හිමි, ඩෙන්සිල් සේනාධීර (සංස්.), නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.<br>දේවානන්ද හිමි, බොකන්නොරුවේ (2002). *බෞද්ධ සමාජ දර්ශනය*. කොළඹ 10: සමයවර්ධන ප්‍රකාශකයෝ, (24 - 49 පිටු).<br>ප්‍රනාන්දු, එස්. දයා (1984). *බුදුසමයේ දේශපාලන චින්තනය*. කොළඹ: ගොඩගේ ප්‍රකාශන.<br>මලලසේකර, ජී. පී. සහ ජයතිලක, කේ. එන්. (2007). *බුදුසමය හා ජාති ප්‍රශ්නය*. කොළඹ: කුරුළු පොත් ප්‍රකාශන.<br>රතනසාර හිමි, හැවැන්පොළ (1995). *බෞද්ධ අධ්‍යාපන දර්ශනය*. කොළඹ: කතෘ ප්‍රකාශන.<br>වික්‍රමසිංහ, මාර්ටින් (2003). *බුදුසමය හා සමාජ දර්ශනය*. (පස්වන මුද්‍රණය) කොළඹ: සරස ප්‍රකාශන.<br>විජේසේකර, ඕ. එච්. ද ඒ. (1961). *බෞද්ධ සමාජ ධර්මය*. මහනුවර: බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය.<br>වීරසිංහ, හෙන්රි (1999). අධ්‍යාපන සංකල්ප: පෙරදිග හා අපරදිග (ප්‍රථම මුද්‍රණය) කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ. |

PDBS

| | |
|---|---|
| **නිර්දේශිත ග්‍රන්ථ** | සෝමරංසි හිමි, උඩගල්දෙණියේ (1999). *බෞද්ධ දර්ශනය හා සමාජ දර්ශනය* (තෙවැනි මුද්‍රණය). කොළඹ: සමයවර්ධන ප්‍රකාශන.<br>Gnānārāma Ven. Pātegama (1996). *An Approach to Buddhist Social philosophy.* Singapore: Ti-Sarana Buddhist Association.<br>Gokuldas, D. (1955). *Democracy in Early Buddhist Sangha*, Calcutta: Culcutta University.<br>Jayatilleke, K. N. (1969). *Aspects of Buddhist Social Philosophy*. Kandy: Buddhist Publication Society.<br>Jones, Ken (1981). *Buddhism and Social Action*. Kandy: Buddhist Publication Society.<br>Ling, Trevor (1966). *Buddha, Marx and God*. London: Palgrave Macmillan. |

| විෂය සංකේතය | **PDBS 04** |
|---|---|
| විෂය නාමය | **බෞද්ධ සංස්කෘතිය: සංක්ෂිප්ත අධ්‍යයනයක්** |
| අරමුණ | බෞද්ධ ඉගැන්වීම් සහ ඒ හා සම්බන්ධ සංස්ථාගත ව්‍යුහය සමාජය කෙරෙහි කළ බලපෑම, සමාජ සංස්කෘතික දෘෂ්ටිකෝණයකින් පුළුල් ලෙස අධ්‍යයනය කිරීම |
| අන්තර්ගතය | මෙම අධ්‍යයනය කිසියම් භූගෝලීය ප්‍රදේශයකට සීමා නොවන අතර පොදුවේ බුදුසමයේ ආභාසය ලත් රටවල් ආශ්‍රයෙන් යෝග්‍ය අවස්ථා සමාලෝචනයට ලක් කෙරේ. නව ධර්මය ප්‍රචාරය කිරීමේ දී හා දේශීය ජනතාව එය පිළිගැනීමේ දී බෞද්ධ භික්ෂූන් වහන්සේ හා ගිහි ජනතාව ඉටු කළ කාර්‍යභාරය පිළිබඳ ඇගයීමක් ද මෙහි ලා අපේක්ෂිත යි. බුදුදහම හඳුන්වා දීමට පෙර එක් එක් රටක පැවති ආගමික හා සංස්කෘතික තත්ත්වය පිළිබඳ සමාලෝචනයක් මෙම අධ්‍යයනයෙහි ලා පසුබිම් වේ. විවිධ රටවල දීර්ඝ ඉතිහාසය පුරා එහි ජනතාවගේ ආධ්‍යාත්මික හා භෞතික සංවර්ධනය හැඩගැන්වීමෙහි ලා ඔවුන්ගේ දිවිපැවැත්මට හා චින්තනයට බුදුසමයෙන් ලද දායකත්වයත්, නිර්මාණාත්මක කලාකෘතීන්ගේ සහ භාෂා සාහිත්‍යයේ පෝෂණය පිණිස වූ බුදුසමයේ ආභාසයත් පිළිබඳ ඇගයීමක් ද මෙහි ලා සිදුවේ. |
| කාලසීමාව | පැය 30 |
| ඉගැන්වීමේ ක්‍රමය | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| ඇගයීම් ක්‍රමය | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ අවසාන පරීක්ෂණය |
| අපේක්ෂිත ඉගෙනුම් ඵල | භාරතය හා තෝරා ගත් වෙනත් රටවල සංස්කෘතීන් කෙරෙහි බුදුසමයේ බලපෑම විශ්ලේෂණය කළ හැකි වීම |
| නිර්දේශිත ග්‍රන්ථ | අදිකාරම්, ඊ. ඩබ්ලිව්. (1969). *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය.* කොළඹ: ජේ. කේ. ජී. ජයවර්ධන ප්‍රකාශන.<br>ධම්මරතන හිමි, හිස්සැල්ලේ (1962). *දකුණු ඉන්දියාවේ බෞද්ධ ඉතිහාසය.,* මහනුවර: බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමාගම.<br>බෂාම්, ඒ. එල්. 1962. *අසිරිමත් ඉන්දියාව.* කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.<br>රාහුල හිමි, වල්පොළ (2002). *ලක්දිව බුදුසමයේ ඉතිහාසය.* (සත්වැනි මුද්‍රණය) කොළඹ: එස්. ගොඩගේ ප්‍රකාශනය.<br>විජේබණ්ඩාර, චන්ද්‍රිම හා එච්. එම්. මොරටුවගම (1995). *බෞද්ධ ශිෂ්ටාචාරය: මූලධර්මය සහ වංශකථාව.* කොළඹ: ලේක් හවුස් ප්‍රකාශනය.<br>විමලසිරි හිමි, බෝයගම (1970). *තායිලන්ත බෞද්ධ සංස්කෘතිය.* (පළමු මුද්‍රණය) කොළඹ:<br>Banerjee. A. C. (1973). *Buddhism in India and Abroad* (First Edition). Calcutta: The world Press Publication'<br>Dutt. R. C. (1980). *Buddhism and Buddhist Civilization in India*. Delhi: Seema Publication. |

PDBS

| | |
|---|---|
| නිර්දේශිත ග්‍රන්ථ | Hazra. K. L. (1996). *History of Theravada Buddhism in South-East Asia*. New Delhi: Munshiram Manoharlal Publication.<br>Joshi. Lalmani, (1977) *Studies in the Buddhistic Culture of India* (Second Edition). Delhi: Motilal Banarsidass Publication.<br>Seckel, D. (1964). *The Art of Buddhism*. New York: Crown Publishers.<br>Singhal. D. P. (1984). *Buddhism in East Asia*. (First Edition). New Delhi: Books and Books Publications.<br>Vogel. J. Ph. (1936) *Buddhist Art in India*, *Ceylon and Java*. Oxford: At the Clarendon Press. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBS 05** |
| **විෂය නාමය** | **විස්තාරිත රචනය** |
| **අරමුණ** | ශාස්ත්‍රීය ලේඛන කුසලතාව වර්ධනය කිරීම |
| **අන්තර්ගතය** | පාඨමාලාවේ ආචාර්යවරයෙකුගේ උපදෙස් මත ආයතනයේ අනුමැතිය ද සහිත ව තෝරා ගත් මාතෘකාවක් යටතේ ශිෂ්‍යයින් විසින් විස්තාරිත රචනයක් සම්පාදනය කළ යුතු වේ. මෙම රචනය 3000කට නොඅඩු වචන සංඛ්‍යාවකින් සමන්විත විය යුතු වන අතර එය පාඨමාලාවේ විෂය ඒකකවලට අදාළ තේමාවක් යටතේ කරනු ලබන අධ්‍යයනයක් පදනම් කරගත් එකක් විය යුතු ය. සෑම ශිෂ්‍යයෙක් ම දෙවන වාරය අවසන් වීමට පෙර ඔවුන්ගේ රචනා මාතෘකා ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු වන අතර, පාඨමාලාවේ අවසාන වාර්ෂික පරීක්ෂණයේ අවසාන ප්‍රශ්න පත්‍රයට අදාළ පරීක්ෂණය පැවැත් වූ දින සිට දින 30ක කාලයක තුළ විස්තාරිත රචනය ආයතනය වෙත භාරදිය යුතු ය. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBS 06** |
| **විෂය නාමය** | **බෞද්ධ ආචාර විද්‍යාවේ මූලික ඉගැන්වීම්** |
| **අරමුණ** | පෙළෙහි අන්තර්ගත ආචාර විද්‍යාවට අයත් මූලික ඉගැන්වීම් පිළිබඳ අවබෝධයක් ලබා දීම |
| **අන්තර්ගතය** | පෙළෙහි අන්තර්ගත ආචාර විද්‍යාවට අයත් මූලික ඉගැන්වීම් අධ්‍යයනය සඳහා මෙම විෂය පත්‍රය සකසා ඇත. සීලයෙහි ප්‍රභේද, කර්මය හා පුනර්භවය මඟින් හෙළි වන සදාචාර ඇගයුම්, පුණ්‍ය-පාප සහ කුසල-අකුසල, සතර බ්‍රහ්මවිහරණ සහ නිවනෙහි සදාචාරාත්මක අගය යන මූලික ඉගැන්වීම් අධ්‍යයනය කෙරේ. එමෙන් ම ආර්ය අෂ්ටාංගික මාර්ගය සහ පාරමිතා යන ඉගැන්වීම් ද විමර්ශනය කෙරේ. සදාචාර සංවර්ධනයට අදාළ ව බෝධිසත්ත්ව, අරහත් සහ බුද්ධ යන සංකල්ප සාකච්ඡා කෙරේ. |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ අවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | පෙළෙහි අන්තර්ගත ආචාර විද්‍යාවට අයත් මූලික ඉගැන්වීම් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | ධර්මසිරි, ගුණපාල (1988). *බෞද්ධ සදාචාරයේ මූලධර්ම.* රත්මලානඃ සර්වෝදය ග්‍රන්ථ ප්‍රකාශන සේවය.<br>මහින්ද හිමි, දීගල්ලේ (2015). *නිර්වාණය සහ සදාචාරය.* පන්නිපිටියඃ සීමාසහිත ස්ටැම්ෆර්ඩ් ලේක් (පුද්ගලික) සමාගම.<br>Harvey, Peter (2000). *An Introduction to Buddhist Ethics: Foundations, Values, and Issues*. Cambridge: Cambridge University Press.<br>McDermott. P. (2003). *Development in the Early Buddhist Concept of Kamma/ Karma*. New Delhi: Munshiram Manoharlal.<br>Misra, G.S.P. (19840. *Development of Buddhist Ethics*, New Delhi: Munshiram Manaharlal.<br>Prasad, Hari Sankar (2007). *The Centrality of Ethics in Buddhism: Exploratory Essays*. Delhi: Motilal Banarsidass Publishers.<br>Saddhatissa, Hammalawa (2001). *Buddhist Ethics*. Boston: Wisdom Publications. |

## 02.2.3 බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

### පාඨමාලාවේ විෂය ක්ෂේත්‍රය හා අන්තර්ගතය

බුදුදහම හා ආයුර්වේදය යන විෂයයන් දෙකත්, ඊට සමගාමී ව ජ්‍යොතිෂ්‍යය හා ශාන්තිකර්ම වැනි චිකිත්සක අංශයනුත් සංකලනය කරමින් දේශීය සංස්කෘතියට වඩාත් සමීප වූ උපදේශන ක්‍රමයක් හඳුන්වා දීම මෙම පාඨමාලාවේ අරමුණ යි. එසේ ම මෙම පාඨමාලාව සිද්ධාන්ත අධ්‍යයනය හා ප්‍රායෝගික වැඩමුළුවලින් ද සමන්විත වේ.

### ප්‍රවේශය සඳහා සුදුසුකම්

මෙම පාඨමාලාවට ඇතුළත් වීමට බලාපොරොත්තු වන අයැදුම්කරුවකු පහත සඳහන් සුදුසුකම්වලින් යටත් පිරිසෙයින් එකක් හෝ සපුරා තිබිය යුතු ය.

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම

ii. ආයුර්වේද ශාස්ත්‍රී ඩිප්ලෝමාව සමත් වීම හා වසර පහකට නොඅඩු ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබා තිබීම

iii. ශ්‍රී ලංකා පොලිස් සේවයේ වසර 10ක අවම නොකැළැල් සේවා කාලයක් සපුරණ ලද සේවය ස්ථිර කර ඇති උපපොලිස් පරීක්ෂක ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ ශ්‍රේණියක නිලධරයෙකු වීම

iv. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

### පාඨමාලා ව්‍යුහය

විස්තාරිත රචනය ද සහිත ව මෙම පාඨමාලාව පහත දැක්වෙන පරිදි විෂය ඒකක අටකින් සමන්විත වේ. එයින් විස්තාරිත රචනය ද ඇතුළු ව විෂය ඒකක හයක් ශිෂ්‍යයින් විසින් හදාරා සමත් විය යුතු ය. අදාළ අධ්‍යයන වර්ෂය තුළ දී උගන්වනු ලබන විෂය ඒකක පහ පිළිබඳ ව වර්ෂය ආරම්භයේ දී ශිෂ්‍යයන් දැනුම්වත් කෙරේ.

PDBC 01: මනෝකායික ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය
PDBC 02: මනෝකායික ගැටලු පිළිබඳ බෞද්ධ උපදේශන ක්‍රම
PDBC 03: මනෝකායික ගැටලු පිළිබඳ ආයුර්වේදීය විග්‍රහය
PDBC 04: මනෝකායික ගැටලු පිළිබඳ ආයුර්වේදීය උපදේශන ක්‍රම
PDBC 05: උපදේශන විෂයයෙහි අදාළ බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනය
PDBC 06: බෞද්ධායුර්වේද මූලාශ්‍රය අධ්‍යයනය
PDBC 07: බෞද්ධ භාවනාව I (මූලධර්ම භාවිතය)
PDBC 08: විස්තාරිත රචනය

එක් වාරයක් සති දහයකින් සමන්විත, වාර තුනකින් යුතු අධ්‍යයන වර්ෂයක් වේ. PDBC 08 - විස්තාරිත රචනය ඒකකය හැර සෑම විෂය ඒකකයක් සඳහා ම අධ්‍යයන වාරය තුළ යටත් පිරිසෙයින් සතියකට පැයක දේශනයක් පැවැත්වෙන අතර ආචාර්යවරයාගේ අභිමතය පරිදි, එය දේශන, සාකච්ඡා, ඉදිරිපත් කිරීම් හෝ පැවරුම් වශයෙන් ක්‍රියාත්මක වෙයි.

## ඇගයීම් ක්‍රමය

විස්තාරිත රචනය හැර අනෙක් විෂය ඒකක සඳහා පහත සඳහන් පරිදි ඇගයීම සිදු කෙරේ.

| | |
|---|---|
| අඛණ්ඩ ඇගයීම | ලකුණු 15 |
| වාචික පරීක්ෂණය | ලකුණු 10 |
| ප්‍රායෝගික ක්‍රියාකාරකම් (වැඩමුළු) | ලකුණු 25 |
| වර්ෂාවසාන ලිඛිත පරීක්ෂණය | ලකුණු 50 |

**විස්තාරිත රචනය**

විස්තාරිත රචනය සඳහා ලකුණු 100 කි. එය ඇගයීමේ දී සුදුසු මාතෘකාවක් තෝරා ගැනීම, රචනයේ තාර්කික ව්‍යුහය, පැහැදිලි ව අදහස් ඉදිරිපත් කිරීම සහ මූලාශ්‍රය භාවිතයේ හැකියාව සැලකිල්ලට ගනු ලැබේ.

## ශ්‍රේණි

| | | |
|---|---|---|
| 70-100 | A | විශිෂ්ට සාමර්ථ්‍යය |
| 60-69 | B | සම්මාන සාමර්ථ්‍යය |
| 40-59 | C | සාමර්ථ්‍යය |
| 00-39 | W | දුර්වල |

(i) **කුසලතා සාමර්ථ්‍යය** - සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 50කට නොඅඩුව ලබා සියලු විෂය ඒකකවල සාමාන්‍යය ලකුණු 70ක් හෝ ඊට වඩා වැඩි වීම

(ii) **සාමර්ථ්‍යය** - සාමර්ථ්‍යය සඳහා සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 50ක් ලබා තිබීම හෝ එක් විෂය ඒකකයකට පමණක් ලකුණු 45-49 අතර ප්‍රමාණයක් ලබා සියලු විෂය ඒකකයන්ගේ ලකුණුවල සාමාන්‍යය ලකුණු 50ක් හෝ ඊට වඩා වැඩි වීම

(iii) **ඌන සාමර්ථ්‍යය හා අසමත් වීම** - එක් විෂය ඒකකයකින් පමණක් අසමත් වන සිසුන් ඌන සාමර්ථ්‍යයක් ලත් සිසුන් ලෙස සලකනු ලැබේ. ඔවුන්ට එම විෂය ඒකකයට පමණක් නැවත පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. විෂය ඒකක දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අසමත් වන සිසුන් අසමත් අය ලෙස සැලකේ. ඔවුන් සියලු ම ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටිය යුතු ය. කෙසේ වුව ද PDBC 08 විෂය ඒකකය සමත් වුව හොත් එය නැවත සම්පූර්ණ කිරීමට අවශ්‍ය නැත. තව ද ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වූ දින සිට වසර 04ක් තුළ විභාගය සමත් විය යුතු ය.

## බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශය

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBC 01** |
| **විෂය නාමය** | **මනෝකායික ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය** |
| **අරමුණ** | මනෝකායික ගැටලු පිළිබඳ බුදුසමයාගත විවරණය පැහැදිලි කිරීම |
| **අන්තර්ගතය** | පුද්ගලයා හා ලෝකය පිළිබඳ බෞද්ධ විග්‍රහය; බෞද්ධ හේතුඵල න්‍යාය; චරිත විභාගය; රූප විභාගය; චිත්ත-චෛතසික විභාගය; සඤ්ඤා හා දිට්ඨි (ගැටලු ප්‍රභවය); පරිසරය, ආර්ථිකය, දේශපාලනය, සෞන්දර්යය, සෞඛ්‍යය පිළිබඳ බෞද්ධ ආකල්පය; කායික හා මානසික රෝග; කර්මය, පුනර්භවය, සැපය හා විමුක්තිය; බෞද්ධ ආචාරධර්ම |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා සහ පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම්<br>■ ඉදිරිපත් කිරීම් (Presentation)<br>■ ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | බුදුසමයෙහි විග්‍රහ වන මනෝකායික ගැටලුවල ප්‍රභවය මෙන් ම මනෝකායික ගැටලු අතරෙහි පවතින අන්තර් සබඳතාව හඳුනා ගෙන විස්තර කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | ප්‍රකාශන.<br>චන්දවිමල හිමි, රේරුකානේ (1987). *අභිධර්ම මාර්ගය.* පිටකෝට්ටේ: ඒ. සී. ජයවර්ධන ප්‍රකාශන.<br>ඤාණසීහ හිමි, හේන්පිටගෙදර. හා හේන්පිටගෙදර ඤාණාවාස හිමි, (1959). *ඛන්ධක විනය.* කොළඹ: රත්න පොත් ප්‍රකාශන.<br>___________ , (1977) *අභිධර්මය පිළිබඳ ප්‍රශ්න හා පිළිතුරු,* හැදැල්ලන: එම්. ජී. ප්‍රේමරත්න ප්‍රකාශන.<br>තෝමස්, ඊ. ජේ. (2014). *බෞද්ධ චින්තාවේ ඉතිහාසය.* දෙහිවල: බී. සී. සී සමාගම.<br>ධර්මසිරි, ගුණපාල, (1996). *බෞද්ධ සදාචාරයේ මූලධර්ම.* දෙහිවල: බී. සී. සී. සමාගම.<br>පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ, (2000). *ආගම හා සමාජය.* කැලණිය විද්‍යාලංකාර පිරිවෙණ.<br>රාහුල හිමි, වල්පොළ, (1993). *බුදුන් වදාළ ධර්මය.* කොළඹ: ගුණසේන පොත් ප්‍රකාශන.<br>විජයබණ්ඩාර, චන්දිම හා එච්. එම්. මොරටුවගම, (1980). *බෞද්ධ දර්ශනය සහ සංස්කෘතිය.* කොළඹ. ගොඩගේ සහ සහෝදරයෝ. |

| | |
|---|---|
| නිර්දේශිත ග්‍රන්ථ | Conze, E. (2008). *Buddhist Thought in India*. London: Routledge.<br>Johanson, E. A. Rune (1979). *The Dynamic Psychology of Early Buddhism*. Oxford: Curzon Press.<br>Karunadasa, Y. (1989). *Buddhist Analysis of Matter*. Singapore: The Buddhist Research Society.<br>Karunaratne, W. S. (1988). *The Theory of Causality in early Buddhism*. (First edition). Nugegoda: Indumati Karunaratne.<br>Nyanaponika, Ven. (1998). *Abhidhamma Studies*. Kandy: Buddhist Publication Society.<br>Saratchandra, E. R. (1994). *Buddhist Psychology of Perception*. Dehiwala: Buddhist Cultural Centre.<br>Sumanapala, G. D. (1998). *An Introduction to Theravada Abhidhamma*. Singapore: Buddhist Research Society. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBC 02** |
| **විෂය නාමය** | **මනෝකායික ගැටලු පිළිබඳ බෞද්ධ උපදේශන ක්‍රම** |
| **අරමුණ** | බෞද්ධ උපදේශන මූලධර්ම මෙන් ම බෞද්ධ සංස්කෘතියට අයත් විවිධ උපදේශන විධික්‍රම හා උපදේශන ප්‍රවේශ හඳුන්වා දීම |
| **අන්තර්ගතය** | උපදේශනයː විවිධ නිර්වචන හා බෞද්ධ අනුශාසන සංකල්පය; උපදේශකයෙකු සතු ගුණාංග; සාර්ථක බෞද්ධ උපදේශනය පිළිබඳ පැරණි වාර්තා; භාෂාව හා එහි භාවිතය; බෞද්ධ උපදේශන මූලධර්ම; භාවනා ක්‍රම; අභිචාරවිධි හා ශාන්තිකර්ම; ජ්‍යෝතිෂ්‍යය හා උපදේශනය; පුණ්‍යකර්ම හා උපදේශනය; බෞද්ධ විමුක්ති සංකල්පය හා උපදේශනය |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා සහ පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම්<br>■ ඉදිරිපත් කිරීම් (Presentation)<br>■ ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>■ වර්ෂ අවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | බුදුදහම මෙන් ම බෞද්ධ සංස්කෘතිය හා සබැඳි විවිධ උපදේශන විධික්‍රම මෙන් ම උපදේශන ප්‍රවේශ වෙන් වෙන් ව හඳුනා ගෙන විස්තර කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | අබේනායක, ඔලිවර් (2003). *පාලි සාහිත්‍ය ඉතිහාසය I:* විනය පිටකය. කොළඹː ගොඩගේ ප්‍රකාශන.<br>ගල්මංගොඩ, සුමනපාල (2003). *ආයුර්වේද අධ්‍යයන. ගම්පහː වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය.*<br>____, (2006). *බෞද්ධ භාවනාක්‍රම සහ මනෝ චිකිත්සාව.* කොළඹː සරස්වතී ප්‍රකාශන.<br>ගෛගර්, විල්හෙල්ම් (1969). *මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය.* කොළඹː ගොඩගේ සහ සහෝදරයෝ.<br>රාහුල හිමි, වල්පොළ (1987). *බුදුන් වදාළ ධර්මය.* කොළඹː ගුණසේන සහ සමාගම.<br>De Silva, Padmasiri (1979). *An Introduction to Buddhist Psychology*. London: Palgrave Macmillan.<br>Galmangoda, Sumanapala (2001). *Early Buddhist Philosophy and Social Concepts*, Singapore: Buddhist Research Society.<br>Harischandra, D. V. J. (1998). *Psychiatric Aspects of Jataka Stories.* Galle: Upuli.<br>Johanson, E. A. Rune, (1969). *The Psychology of Nirvana*. New York: Allen & Unwin.<br>Tachibana, S. (1961). *Ethics of Buddhism*. London: Routledge.<br>Sumanapala, G. D., (2005). *Buddhist Social Philosophy and Ethics*. Singapore: Buddhist Research Society. |

PDBC

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBC 03** |
| **විෂය නාමය** | **මනෝකායික ගැටලු පිළිබඳ ආයුර්වේදීය විග්‍රහය** |
| **අරමුණ** | මනෝකායික ගැටලු කෙරෙහි බලපාන විවිධ සාධක මෙන් ම මනෝකායික ගැටලු පිළිබඳ ආයුර්වේදීය විග්‍රහය හඳුන්වා දීම |
| **අන්තර්ගතය** | ආයුර්වේදයේ ආරම්භය හා විකාශය; ශරීර නිර්මාණය හා රචනා ශරීර; පංචමහාභූත සමවායී ශරීරය; ත්‍රිදෝෂවාදය; සප්තධාතු හා උපධාතු; මනස හා මානසික දෝෂ; මානස ගුණ හා ක්‍රියා; ස්වස්ථභාවය; ශාරීරික දෝෂ විෂමතාව හා එහි ලක්ෂණ; පුද්ගල ප්‍රකෘතිය; ප්‍රකෘතිය හා බැඳුණු මානසික තත්ත්ව |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා සහ පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම්<br>■ ඉදිරිපත් කිරීම් (Presentations)<br>■ ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | මනෝකායික ගැටලු කෙරෙහි බලපාන මානසික හා කායික සාධක වෙන් වෙන් ව හඳුනා ගෙන විස්තර කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | බුද්ධදාස ආර්. (පරි.) (2007). *අෂ්ටාංගහෘදය*. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.<br>*වෛද්‍යාලංකාරය. (සංස්), බටුවන්තුඩාව, රොබට්, (1950), කොළඹ.*<br>අබේසේකර, චන්ද්‍රා (1999). ශරීර රචනා.<br>කොඩිකාරආරච්චි, සී. (2004). බෞද්ධ මනෝවිද්‍යාව, අතුරුගිරිය: විමර්ශන ප්‍රකාශන. පද්මබන්ධු,<br>කොළඹගේ, බී. (2004). *ආයුර්වේද ප්‍රවේශ මාර්ගය*. මල්වාන: සරසවි ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය.<br>කුමාරසිංහ, ආර්යදාස (1982). *ආයුර්වේද ඉතිහාසය*. ආයුර්වේද දෙපාර්තමේන්තුව.<br>_____________, (1985). *තුන්දොස් තතු විවැරුම හෙවත් ත්‍රිදෝෂ තත්ත්ව විවරණය*. ආයුර්වේද දෙපාර්තමේන්තුව.<br>ගල්මංගොඩ, සුමනපාල, (2003). *ආයුර්වේද අධ්‍යයන*. ගම්පහ: වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය.<br>ඇම්. කේ. (1955). ත්‍රිදෝෂ තත්ත්ව විවරණය. කැලණිය: පොන්නම්පෙරුම, අමරසිරි, (1988). *ආයුර්වේදයේ ජීවන දර්ශනය*.<br>කරුණාරත්න ඩබ්. එස්. සහ වෙනත් අය (සංස්.) (1968). වික්‍රමාරච්චි අභිනන්දන<br>හේමචන්ද්‍ර, එච්. පී. එස්., කරුණාරත්න, එච්. කේ. බී. එච්. එස්. (2007). *අෂ්ටාංග ආයුර්වේදය: ද්‍රව්‍යගුණ දර්පණය*. කැලණිය: කතෘ ප්‍රකාශන.<br>Dash, Vaidya Bhagavan, (2003). *A Hand Book of Ayurveda* (Reprinted). Delhi: Concept Publishing Company.<br>_______, (1978). *Fundamentals of Ayurvedic Medicine*. Delhi. Konark Publishers.<br>Jaggi, D. P. (1981). *Indian System of Medicine*, Delhi. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBC 04** |
| **විෂය නාමය** | **මනෝකායික ගැටලු පිළිබඳ ආයුර්වේදීය උපදේශන ක්‍රම** |
| **අරමුණ** | මනෝකායික ගැටලු නිරාකරණය උදෙසා භාවිතයට ගත හැකි ආයුර්වේදීය උපදේශන න්‍යාය හා ප්‍රවේශ හඳුන්වා දීම |
| **අන්තර්ගතය** | ඉපැරණි ආයුර්වේදීය චිකිත්සා සම්ප්‍රදායයෝ; දෝෂශමන උපක්‍රම; දිනචර්යා; ඍතුචර්යා; මානසරෝග චිකිත්සාව; උන්මාදරෝග උපශමනය; භූතවිද්‍යාව; වාජීකරණ; ව්‍යායාමය; ආහාරවිහරණ |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා සහ පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම්<br>■ ඉදිරිපත් කිරීම් (Presentations)<br>■ ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | ආයුර්වේදීය මූලධර්මයන්හි විග්‍රහ වන උපදේශන න්‍යාය හා ප්‍රවේශ වෙන් කොට හඳුනා ගෙන විස්තර කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | දත්ත ශාස්ත්‍රී, රාජේශ්වර (සංස්.) (1976). *ස්වස්ථවෘත්තසමුච්චය.* බරණැස.<br>කරුණාරත්න, ඩබ්. එස්. සහ වෙනත් අය (1968). *වික්‍රමාරච්චි අභිනන්දන ග්‍රන්ථය.* ගම්පහ.<br>ගල්මංගොඩ, සුමනපාල (2003). *ආයුර්වේද අධ්‍යයන.* ගම්පහ: වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය.<br>David, Frawely, (1992). *Ayurvedic Healing*. Wisconsin: Lotus Press.<br>Kutumbiah, P., (1984). *Ancient Indian Medicine*. Hyderabad: Orient Longman Limited. |

PDBC

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBC 05** |
| **විෂය නාමය** | **උපදේශන විෂයයෙහි අදාළ බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනය** |
| **අරමුණ** | සූත්‍ර පිටකයෙන් පැනෙන උපදේශන මූලධර්ම හඳුන්වා දීම |
| **අන්තර්ගතය** | කේවඩ්ඪ, සම්පසාදනීය සහ ගණකමොග්ගල්ලාන ආදී සූත්‍ර ඇසුරින් බෞද්ධ උපදේශනයේ සුවිශේෂතාව හඳුනා ගැනීම; තිස්සමෙත්තෙය්‍ය සූත්‍ර නිර්දේශ ප්‍රමුඛ කොට ගත් මූලාශ්‍රය ඇසුරින් බෞද්ධ උපදේශන මූලධර්මයන්හි ප්‍රායෝගික භාවිතය හඳුනා ගැනීම; මිගසාලා, වඩ්ඩී, මංගල, වේළුද්වාර යන සූත්‍රවල විවරණය කරනු ලබන බෞද්ධ උපදේශනයෙහි පරමාර්ථය හා අරමුණු; සිගාල සූත්‍රය අවධාරණය කරනු ලබන අධ්‍යාපන, වෘත්තීය, පවුල් ජීවිතය, මිත්‍රත්වය ප්‍රමුඛ කොට ගත් සමාජයීය සබඳතා විෂයයෙහි භාවිතයට ගත යුතු විවිධ උපදේශන ප්‍රවේශ; උපදේශනයේ දී භාවිතයට ගත යුතු සත්චාරිත්‍ර ධර්ම පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගැනීම |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා පැවරුම් සහ වැඩමුළු |
| **ඇගයීම් ක්‍රමය** | ▪ පැවරුම්<br>▪ ඉදිරිපත් කිරීම් (Presentations)<br>▪ ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>▪ වර්ෂවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | බෞද්ධ උපදේශන මූලධර්ම, නූතන උපදේශන මූලධර්ම සමඟ තුලනය කිරීමේ හැකියාව හා උපදේශන සැසියක දී බෞද්ධ උපදේශන මූලධර්ම ප්‍රායෝගික ව භාවිත කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | *අඞ්ගුත්තරනිකාය (ෂෂ්ට භාගය).* (සංස්. ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවෙහි අඞ්ගුත්තරනිකාය සංශෝධක මණ්ඩලය. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (244-246 පිටු, වඩ්ඩී සූත්‍රය).<br>*අඞ්ගුත්තරනිකාය (චතුර්ථ භාගය).* (සංස්. ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවෙහි අඞ්ගුත්තරනිකාය සංශෝධක මණ්ඩලය. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (110-117 පිටු, මිගසාලා සූත්‍රය).<br>*බුද්දකනිකාය (ප්‍රථම භාගය).* (සංස්. ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලය). (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (6-8 පිටු, මඞ්ගල සූත්‍රය).<br>*චුල්ලනිද්දෙසපාළි* (සංස්. ලබුගම ලංකානන්ද ස්ථවිර හා කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිර) (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (90-101 පිටු, තිස්සමෙත්තෙය්‍ය සූත්‍ර නිර්දේශය).<br>*දීඝනිකාය (තෘතීය භාගය).* (සංස්. බලංගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර). (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (166-193 පිටු, සම්පසාදනීය සූත්‍රය).<br>*දීඝනිකාය (ද්විතීය භාගය).* (සංස්. බලංගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර). (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (288-311 පිටු, සිගාලක සූත්‍රය).<br>*දීඝනිකාය 1* (සංස්. අග්ගමහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර). (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (484-539 පිටු,කේවඩ්ඪ සූත්‍රය).<br>*මජ්ඣිමනිකාය (තෘතීය භාගය).* (සංස්. ලබුගම ලංකානන්ද ස්ථවිර) (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (90-99 පිටු, ගණකමොග්ගල්ලාන සූත්‍රය).<br>සංයුත්තනිකාය (පඤ්චම භාගය 2). (සංස්. ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය) (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (154-160 පිටු, වේළුද්වාරෙය්‍ය සූත්‍රය). |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBC 06** |
| **විෂය නාමය** | බෞද්ධායුර්වේද මූලාශ්‍රය අධ්‍යයනය |
| **අරමුණ** | මනෝකායික ස්වස්ථතාවෙන් තොර ව පරමාර්ථ සාධනය අපහසු කාර්යයක් බව සහ බුදුදහමින් අවධාරණය කරනු ලබන ස්වස්ථතාවෙහි ආචාර විද්‍යාත්මක පදනම හඳුන්වා දීම |
| **අන්තර්ගතය** | මනෝකායික ස්වස්ථතාව සහ එහි ආචාර විද්‍යාත්මක පදනම සාකච්ඡා කරනු ලබන චුල්ලවග්ගපාළිය හා මහාවග්ගපාළිය ආදී විනය පිටකාගත මූලාශ්‍රය සහ සූත්‍ර පිටකාගත අංගුත්තරනිකායාගත ගිලානවග්ගය, ගිරිමානන්ද සූත්‍රය, සංයුත්ත නිකායාගත මොළියසීවක (සීවක) සූත්‍රය සහ මජ්ඣිම නිකායාගත චුල්ලකම්මවිභංග සූත්‍රය ආදී තෝරා ගනු ලැබූ මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමු කිරීම |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා, පැවරුම් සහ වැඩමුළු |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම්<br>■ ඉදිරිපත් කිරීම් (Presentations)<br>■ ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | බුදුදහමින් පැනෙන ස්වස්ථතාව හා එය මනෝකායික සමවායට අයත් ව ඉදිරිපත් කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | *අඞ්ගුත්තරනිකාය (ෂෂ්ට භාගය).* (සංස්. ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවෙහි අඞ්ගුත්තරනිකාය සංශෝධක මණ්ඩලය. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (244-246 පිටු, වඩ්ඪි සූත්‍රය).<br>*අඞ්ගුත්තරනිකාය (චතුර්ථ භාගය).* (සංස්. ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවෙහි අඞ්ගුත්තරනිකාය සංශෝධක මණ්ඩලය. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (110-117 පිටු, මිගසාලා සූත්‍රය).<br>*ඛුද්දකනිකාය (ප්‍රථම භාගය).* (සංස්. ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලය). (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (6-8 පිටු, මඞ්ගල සූත්‍රය).<br>*චුල්ලනිද්දෙසපාළි* (සංස්. ලබුගම ලංකානන්ද ස්ථවිර හා කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිර) (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (90-101 පිටු, තිස්සමෙත්තෙය්‍ය සූත්‍ර නිර්දේශය).<br>*දීඝනිකාය (තෘතීය භාගය).* (සංස්. බලංගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර). (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (166-193 පිටු, සම්පසාදනීය සූත්‍රය).<br>*දීඝනිකාය (ද්විතීය භාගය).* (සංස්. බලංගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර). (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (288-311 පිටු, සිගාලක සූත්‍රය).<br>*දීඝනිකාය 1* (සංස්. අග්ගමහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර). (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (484-539 පිටු,කේවඩ්ඪ සූත්‍රය).<br>*මජ්ඣිමනිකාය (තෘතීය භාගය).* (සංස්. ලබුගම ලංකානන්ද ස්ථවිර) (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (90-99 පිටු, ගණකමොග්ගල්ලාන සූත්‍රය).<br>සංයුත්තනිකාය (පඤ්චම භාගය 2). (සංස්. ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය) (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව. (154-160 පිටු, වේළුද්වාරෙය්‍ය සූත්‍රය). |

PDBC

| | |
|---|---|
| **විෂය සංකේතය** | **PDBC 07** |
| **විෂය නාමය** | **බෞද්ධ භාවනාව I (මූලධර්ම භාවිතය)** |
| **අරමුණ** | උපදේශන කාර්යයෙහි සාර්ථකත්වය උදෙසා පාලි මූලාශ්‍රය ඇසුරින් බෞද්ධ භාවනා ක්‍රමයන්හි න්‍යායාත්මක පසුබිම හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් ලබා දීම |
| **අන්තර්ගතය** | මානසික ගැටලු විෂයයෙහි බලපාන අකුසල මානසික තත්ත්ව හඳුනා ගැනීම; භාවනාව විෂයයෙහි පදනම වන ශීල ප්‍රතිපදාව; භාවනා පූර්වකෘත්‍යය; චරිත විග්‍රහය; කමටහන්; සමථ භාවනාවේ හා විදර්ශනා භාවනාවේ න්‍යායාත්මක පදනම; ප්‍රායෝගික භාවිතය හා එම භාවනා ක්‍රමයන්හි මනෝ ප්‍රතිකාරමය අගය |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා, පැවරුම් සහ වැඩමුළු |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම්<br>■ ඉදිරිපත් කිරීම් (Presentations)<br>■ ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | බෞද්ධ භාවනා ක්‍රම උපදේශන කාර්යයෙහි ලා යොදා ගැනීමේ ශක්‍යතාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | නිශ්ශංක, එච්. එස්. එස්. (2007). *බෞද්ධ මනෝචිකිත්සාව* කොළඹ: ගුණසේන.<br>ගල්මංගොඩ, සුමනපාල, (2006). *බෞද්ධ භාවනා ක්‍රම හා මනෝචිකිත්සාව,* දිවුලපිටිය. සරස්වතී ප්‍රකාශන.<br>Bhikkhu Analayo (2003). *Satipaṭṭhāna: The Direct Path to Realisation.* Kandy: Buddhist Publication Society.<br>Gunaratane Thera, Henepola, (2011). *Mindfulness in Plain English.* Bostone: Wisdom Publications.<br>______, (2007). *Eight Mindful Steps to Happiness (Walking the path of the Buddha).* Somerville M A: Wisdom Publications.<br>Nyanaponika Thero (2005). *The Heart of Buddhist Meditation (The Buddha's Way of Mindfulness).* Kandy: Buddhist Publication Society. |

| | |
|---|---|
| විෂය සංකේතය | **PDBC 08** |
| විෂය නාමය | **විස්තාරිත රචනය** |
| අරමුණ | ශාස්ත්‍රීය ලේඛන කුසලතාව වර්ධනය කිරීම |
| අන්තර්ගතය | පාඨමාලාව හා සම්බන්ධ ආචාර්යවරයෙකුගේ උපදෙස් මත ආයතනයේ අනුමැතිය ද සහිත ව තෝරා ගත් මාතෘකාවක් යටතේ ශිෂ්‍යයින් විසින් රචනයක් සම්පාදනය කළ යුතු වේ. මෙම රචනය 3000කට නොඅඩු වචන සංඛ්‍යාවකින් සමන්විත විය යුතු වන අතර, එය පාඨමාලාවේ විෂය ඒකකවලට අදාළ තේමාවක් යටතේ කරනු ලබන අධ්‍යයනයක් පදනම් කරගත් එකක් විය යුතු ය.<br>සෑම ශිෂ්‍යයෙක් ම දෙවන වාරය අවසන් වීමට පෙර ඔවුන්ගේ රචනා මාතෘකා ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු වන අතර, පාඨමාලාවේ අවසාන වාර්ෂික පරීක්ෂණයේ අවසාන ප්‍රශ්න පත්‍රයට අදාළ පරීක්ෂණය පැවැත් වූ දින සිට දින 30ක් තුළ විස්තාරිත රචනය ආයතනය වෙත භාරදිය යුතු ය. |



ආයතනික නව පරිශ්‍රයයෙහි ඉදිකිරීම් කටයුතු

## ආයතනික නව පරිශ්‍රයයෙහි ඉදිකිරීම් කටයුතු





















## 02.3 ශාස්ත්‍රපති උපාධි පාඨමාලා (එක් අවුරුදු)

**02.3.1 පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව**

**02.3.2 බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව**

**02.3.3 බෞද්ධ උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව**

## 02.3.1 පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

### පාඨමාලාවේ විෂය ක්ෂේත්‍රය හා අන්තර්ගතය

පාලි මූලාශ්‍රය කියවා අවබෝධ කර ගැනීම සහ විශේෂයෙන් පාලි භාෂාව හා සාහිත්‍යය පිළිබඳවත්, පොදුවේ බෞද්ධ ඉගැන්වීම්වල විවිධ පැතිකඩ පිළිබඳවත් අවබෝධය වර්ධනය කිරීම යන අරමුණ ඇති ව පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සැලසුම් කොට ඇත.

### ප්‍රවේශය සඳහා සුදුසුකම්

බුදුසමය පිළිබඳ මූලික දැනුමක් ද පාලි භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ද මෙම පාඨමාලාවට පිවිසීම සඳහා වන මූලික අවශ්‍යතා වේ. මෙම පාඨමාලාවට ඇතුළත් වීමට බලාපොරොත්තු වන අයැදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම්වලින් යටත් පිරිසෙයින් එකක්වත් සපුරා තිබිය යුතු ය.

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් පාලි විෂයයෙන් ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය ලබා තිබීම

හෝ

ii. පාලි උප විෂය සහිත ව විශේෂ උපාධියක් හෝ පාලි විෂය සහිත ව සාමාන්‍ය උපාධියක් ලබා තිබීම

හෝ

iii. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන විභාගය සමත් වීම

හෝ

iv. විද්‍යෝදය හෝ විද්‍යාලඞ්කාර පිරිවෙන්වල අවසාන සහතිකපත්‍ර විභාගය සමත්වීම

හෝ

v. පිළිගත් විශ්වවිද්‍යාලයක/ආයතනයක පාලි පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සමත්වීම

හෝ

vi. ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

## අධ්‍යයන පාඨමාලා සඳහා අවශ්‍යතා

පාලි ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන සිසුන් පහත සඳහන් විෂය ඒකක හතක් සම්පූර්ණ කළ යුතු ය.

## පාඨමාලා ඒකක

MAPL 01: නිර්දිෂ්ට ග්‍රන්ථ I : ත්‍රිපිටක පාළි සාහිත්‍යය

MAPL 02: නිර්දිෂ්ට ග්‍රන්ථ II : පශ්චාත් ත්‍රිපිටක පාළි හා අට්ඨකථා සාහිත්‍යය

MAPL 03: උසස් පාලි ව්‍යාකරණය හා රචනය

MAPL 04: පාලි සාහිත්‍ය ඉතිහාසය (වරණීය)

MAPL 05: පාලි ඡන්දෝලංකාර

MAPL 06: පර්යේෂණ ක්‍රමවේදය හා විස්තාරිත රචනය

MAPL 07: පාලි ග්‍රන්ථ විචාරය (වරණීය)

MAPL 08: ථේරවාද සම්ප්‍රදායඃ ඉතිහාසය හා ධර්ම කරුණු පිළිබඳ අධ්‍යයනයක්

## පාඨමාලා ව්‍යුහය

මෙම පාඨමාලාව වාර තුනකින් යුක්ත එක් අධ්‍යයන වර්ෂයකින් සමන්විත වන අතර එක් එක් වාරයකට සති දහයක් ඇතුළත් වෙයි. MAPL 06 පර්යේෂණ ක්‍රමවේදය හා විස්තාරිත රචනය විෂය ඒකකය හැර සෑම පාඨමාලා ඒකකයක් සඳහා ම යටත් පිරිසෙයින් සතියකට පැයක දේශනයක් පැවැත් වෙන අතර එයට අතිරේක ව විෂය මාර්ගෝපදේශ සහ නිර්දේශයට අදාළ ශාස්ත්‍රීය සාකච්ඡා ද පැවැත් වෙනු ඇත.

## ඇගයීම් ක්‍රමය

i. එක් එක් විෂය ඒකකය වෙනුවෙන් පැවරුම් දෙකකිඃ එක් පැවරුමකට ලකුණු 15කි.

ii. පන්ති සහභාගීත්වය සඳහා ලකුණු 10කි.

iii. එක් එක් විෂය ඒකකයක් සඳහා වර්ෂාවසාන පරීක්ෂණයඃ එක් විෂය ඒකකයක් සඳහා ලකුණු 60කි.

## පර්යේෂණ ක්‍රමවේදය සහ විස්තාරිත රචනය

ලකුණු 100කි. වැඩමුළුවලට සහභාගීවීම, පර්යේෂණ යෝජනාව සම්පාදනය කිරීම සහ රචනය ලියා ඉදිරිපත් කිරීම යන කරුණු මෙහි දී සැලකිල්ලට ගනු ලැබේ.

**ශ්‍රේණි**

| | | |
|---|---|---|
| 75-100 | A | විශිෂ්ට සාමර්ථ්‍යය |
| 65-74 | B | සම්මාන සාමර්ථ්‍යය |
| 50-64 | C | සාමර්ථ්‍යය |
| 00-49 | W | දුර්වල |

(i) **කුසලතා සාමර්ථ්‍යය** - සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 50ට නොඅඩුව ලබා සියලු විෂය ඒකකවල සාමාන්‍යය ලකුණු 75ක් හෝ ඊට වඩා වැඩි වීම

(ii) **සාමර්ථ්‍යය** - සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 50ක් ලබා තිබීම හෝ එක් විෂය ඒකකයකට පමණක් ලකුණු 45-49 අතර ප්‍රමාණයක් ලබා සියලු විෂය ඒකකයන්ගේ ලකුණුවල සාමාන්‍යය 50ක් හෝ ඊට වඩා වැඩි වීම

(iii) **ඌන සාමර්ථ්‍යය හා අසමත් වීම** - එක් විෂය ඒකකයකින් පමණක් අසමත් වන සිසුන් ඌන සාමර්ථ්‍යයක් ලත් සිසුන් ලෙස සලකනු ලැබේ. ඔවුන්ට එම විෂය ඒකකයට පමණක් නැවත පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. විෂය ඒකක දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අසමත් වන සිසුන් අසමත් අය ලෙස සැලකේ. ඔවුන් සියලු ම ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටිය යුතු ය. කෙසේ වුව ද PDBC 06 විෂය ඒකකය සමත් වුව හොත් එය නැවත සම්පූර්ණ කිරීමට අවශ්‍ය නැත. තව ද ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වූ දින සිට වසර 04ක් තුළ විභාගය සමත් විය යුතු ය.

MAPL

## පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MAPL 01** |
| **විෂය නාමය** | **නිර්දිෂ්ට ග්‍රන්ථ I: ත්‍රිපිටක පාළි සාහිත්‍යය** |
| **අරමුණ** | නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය මගින් ත්‍රිපිටක පාළි සාහිත්‍යය පිළිබඳ පුළුල් දැනුමක් විද්‍යාර්ථීන්ට ලබා දීම |
| **අන්තර්ගතය** | මෙම විෂය ඒකකය නිර්දිෂ්ට ග්‍රන්ථවලින් සමන්විත වෙයි. ත්‍රිපිටක පාළි ග්‍රන්ථ උසස් පර්යේෂණ සඳහා වන මූලාශ්‍රය ලෙස භාවිත කරනු පිණිස විද්‍යාර්ථීන්ගේ විශ්ලේෂණාත්මක සහ විචාරාත්මක කුසලතා වර්ධනය කිරීමේ අරමුණ ඇති ව පහත සඳහන් පරිදි නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරාගත් ඡේද අධ්‍යයනය කරනු ලැබේ.<br>i. දීඝනිකාය: බ්‍රහ්මජාල සුත්ත, සාමඤ්ඤඵල සුත්ත, පොට්ඨපාද සුත්ත, මහාපරිනිබ්බාන සුත්ත, මහාපදාන සුත්ත, අග්ගඤ්ඤ සුත්ත<br>ii. මජ්ඣිමනිකාය: මූලපරියාය සුත්ත, සම්මාදිට්ඨි සුත්ත, අලගද්දූපම සුත්ත, මධුපිණ්ඩික සුත්ත, සටීකාර සුත්ත, අම්බලට්ඨිකරාහුලෝවාද සුත්ත, මහා වත්තාළීසක සුත්ත<br>iii. සුත්තනිපාත: අට්ඨක වග්ග හා පාරායන වග්ග<br>iv. චුල්ලවග්ගපාළි - ඛුද්දකවත්ථුක්ඛන්ධක<br>v. කථාවත්ථු: සබ්බමත්ථිකථා<br>vi. පිටක සාහිත්‍යයෙන් තෝරාගත් වෙනත් කෘති |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පරිවර්තන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | මෙම විෂය ඒකකය හදාරා අවසානයේ දී විද්‍යාර්ථීන් පහත දෑ සඳහා සමත් වනු ඇත.<br>i. වාක්‍ය රටා විචාරාත්මක ව විග්‍රහ කිරීම සහ පාලි වාක්‍යය නිවැරදි ව හැදෑරීම<br>ii. පාලි භාෂාවේ ප්‍රවීණත්වය ප්‍රදර්ශනය කිරීම සහ නිර්දිෂ්ට කෘතිවල අන්තර්ගතය අවබෝධ කර ගැනීම<br>iii. තෝරා ගත් පාලි ඡේදවල දක්නට ලැබෙන පරිදි බෞද්ධ ඉගැන්වීම් අවබෝධ කර ගැනීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කිරීම<br>iv. තෝරා ගත් පාලි ඡේද සිංහල භාෂාවට පරිවර්තනය කිරීමේ හැකියාව |

| | |
|---|---|
| **නිර්දේශිත ග්‍රන්ථ** | බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 2007. *පාලි සාහිත්‍යය*, මරදාන: රත්න පොත් ප්‍රකාශන, (4 මුද්‍රණය)<br>Anuruddha, Kakkapalliye (2010). *A Guide to the Study of Pali: The Language of Theravada Buddhism*. Hong Kong: The University of Hong Kong.<br>Hinüber, Oskar Von. (2001). *Handbook of Pali Literature*, New Delhi: Munshiram Manoharlal.<br>Jayawardhana, S. (1994). *Handbook of Pali Literature*, Colombo: Karunaratne & Sons Ltd.<br>Law, B.C. (2007). *A History of Pali Literature*. New Delhi: Rekha printers Pvt. Ltd.<br>Norman, K.R. (1983). *Pāli Literature: Including the Canonical Literature in Prakrit and Sanskrit of All the Hīnayāna Schools of Buddhism*. Wiesbaden: Otto Harrassowitz. |

MAPL

| විෂය සංකේතය | **MAPL 02** |
|---|---|
| **විෂය නාමය** | **නිර්දිෂ්ට ග්‍රන්ථ II: පශ්චාත් ත්‍රිපිටක පාළි හා අට්ඨකථා සාහිත්‍යය** |
| **අරමුණ** | විවිධ කාලපරිච්ඡේදවල සම්පාදිත පශ්චාත් ත්‍රිපිටක පාළි හා අට්ඨකථා කෘතිවලින් තෝරා ගත් පාඨ පරිශීලනය මගින් එම යුගයට අයත් ග්‍රන්ථ පිළිබඳ පුළුල් අවබෝධයක් විද්‍යාර්ථීන්ට ලබාදීම |
| **අන්තර්ගතය** | පශ්චාත් ත්‍රිපිටක පාළි හා අට්ඨකථා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ උසස් පර්යේෂණ සඳහා වන මූලාශ්‍රය ලෙස භාවිත කරනු පිණිස ශිෂ්‍යයින්ගේ විශ්ලේෂණාත්මක සහ විචාරාත්මක කුසලතා වර්ධනය කිරීමේ අරමුණ ඇතිව පහත දැක්වෙන නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරාගත් ඡේද අධ්‍යයනය කරනු ලැබේ.<br>i. මිළින්දපඤ්හ: සබ්බඤ්ඤුතඤාණ<br>ii. නෙත්තිප්පකරණ<br>iii. විසුද්ධිමග්ග: පඤ්ඤාභූමි නිද්දෙස<br>iv. පපඤ්චසූදනී: මූලපරියාය සුත්තවණ්ණනා<br>v. මනෝරථපූරණී: එතදග්ගවග්ග<br>vi. සමන්තපාසාදිකා: සුත්තවිභංගවණ්ණනා - පාරාජිකා<br>vii. දීඝනිකායටීකා: මහාපරිනිබ්බාන සුත්තවණ්ණනා<br>viii. සාරත්ථදීපනී: ධනියවත්ථුවණ්ණනා<br>ix. අභිධම්මාවතාර: පඤ්ඤත්තිවාර<br>x. පශ්චාත් ත්‍රිපිටක පාළි සාහිත්‍යයෙන් තෝරාගත් වෙනත් කෘති |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පරිවර්තන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්,<br>■ පන්ති සහභාගීත්වය,<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | මෙම විෂය ඒකකය හැදෑරීමෙන් පසු විද්‍යාර්ථීන් පහත ශක්‍යතා සඳහා සමත් වනු ඇත.<br>i. වාක්‍ය රටා විචාරාත්මක ව විග්‍රහ කිරීම සහ පාලි වාක්‍යය නිවැරදි ව අධ්‍යයනය කිරීම<br>ii. පාලි භාෂාවේ ප්‍රවීණත්වය ප්‍රදර්ශනය කිරීම සහ නිර්දිෂ්ට කෘතිවල අන්තර්ගතය අවබෝධ කර ගැනීම<br>iii. තෝරා ගත් පාලි ඡේදවල දක්නට ලැබෙන පරිදි බෞද්ධ ඉගැන්වීම් අවබෝධ කර ගැනීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කිරීම |
| **නිර්දේශිත ග්‍රන්ථ** | Hinüber, Oskar Von. (2001). *Handbook of Pali Literature.* New Delhi: Munshiram Manoharlal.<br>Jayawardhana, S. (1994). *Handbook of PaliLiterature.* Colombo: Karunaratne & Sons Ltd.<br>Law, B.C. (2000). *A History of Pali Literature*. Varanasi: Indica Books.<br>Malalasekera, G.P. (1994). *The Pali Literature of Ceylon.* Kandy: Buddhist Publication Society.<br>Norman, K.R. (1983). *Pāli Literature: Including the Canonical Literature in Prakrit and Sanskrit of All the Hīnayāna Schools of Buddhism*. Wiesbaden: Otto Harrassowitz. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MAPL 03** |
| **විෂය නාමය** | **ඓතිහාසික පාලි ව්‍යාකරණය හා රචනය** |
| **අරමුණ** | පාලි ව්‍යාකරණය පිළිබඳ උසස් දැනුමක් විද්‍යාර්ථීන්ට ලබා දීම හා පාලි භාෂා මාධ්‍යයෙන් ගද්‍ය රචනා කිරීමේ කුසලතාව වර්ධනය කිරීම |
| **අන්තර්ගතය** | ප්‍රාකෘත, සංස්කෘත හා බෞද්ධ සංස්කෘත ආශ්‍රයෙන් ශබ්ද මාලාව, උපඝාතය, ස්වර, ව්‍යඤ්ජන, සම්ප්‍රසාරණ, ස්වරභක්ති, සන්ධි, කාරක, නාම හා නාම වරනැගීම, සර්වනාම, සංඛ්‍යානාම හා සංඛ්‍යානාම වරනැගීම, ක්‍රියා හා ක්‍රියා වරනැගීම යනාදී පාලි භාෂාවේ වාග්විද්‍යාත්මක විශේෂතා විමර්ශනය කිරීම මෙම විෂය ඒකකයේ අන්තර්ගතය වෙයි. |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | ප්‍රාකෘත, සංස්කෘත සහ බෞද්ධ සංස්කෘත ආශ්‍රයෙන් පාලි භාෂාවේ වාග්විද්‍යාත්මක සුවිශේෂත්වය පිළිබඳ දැනුමක් ප්‍රදර්ශනය කිරීමට මෙම විෂය ඒකකය අවසානයේ දී ශිෂ්‍යයින්ට හැකියාව ලැබේ. |
| **නිර්දේශිත ග්‍රන්ථ** | පියරතන හිමි, වැගම (1995). (සංස්). *කච්චායන ව්‍යාකරණය.* කොළඹ: එස්. ගොඩගේ සහෝදරයෝ.<br>පියරතන හිමි, වැගම (2000). *පාලි අට්ඨකථාවන්හි පිළිබිඹු වන ව්‍යාකරණ සම්ප්‍රදාය.* කොළඹ: සමයවර්ධන පොත්හල.<br>ගයිගර්, විල්හෙල්ම් (1989). *පාලි ව්‍යාකරණය* (සිංහල පරිවර්තනය: චන්ද්‍රා වික්‍රමගමගේ), කොළඹ: ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය.<br>පඤ්ඤාශේඛර නාහිමි කලුකොඳයාවේ, විමලතිස්ස හිමි, දික්වැල්ලේ (සංස්.) (1983). *බාලාවතාර.* කොළඹ: මොඩර්න් පොත් සමාගම.<br>*සීලානන්ද හිමි, අරුග්ගොඩ (සංස්.) (1909). මහා සද්දනීති ව්‍යාකරණ.*<br>ශ්‍රීනිවාස ස්ථවිර, මයිලැවේ (1966). *පාලි ව්‍යාකරණ විවරණය.* ගල්කිස්ස: වික්‍රම මු. ජයතිලක බන්ඩා මහතා.<br>සිරිසම්බෝධි ස්ථවිර, පැණිහෙල (2000). *පාළි භාෂාව හා රචනය.* කොළඹ: සමයවර්ධන පොත්හල.<br>Warder, A.K. (1995). *An Introduction to Pali.* London: Pali Text Society.<br>Geiger, Welhelm (1994). *Pali Grammar*, (Revised by K. R. Norman) London: Pali Text Society.<br>______, (1978). *Pali Literature and Lanaguage*, New Dilhi:<br>Wijesekara, O.H. de A. (1993). *Syntax of the Cases in the Pali Nikayas* Colombo: PGIPBS: |

MAPL

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MAPL 04** |
| **විෂය නාමය** | **පාලි සාහිත්‍යය ඉතිහාසය** |
| **අරමුණ** | පාලි සාහිත්‍යය පිළිබඳ විචාරාත්මක දැනුමක් ලබා දීම |
| **අන්තර්ගතය** | ත්‍රිපිටක පාළි සාහිත්‍යය, පශ්චාත් ත්‍රිපිටක හා අට්ඨකථා කෘති, ටීකා, වංසකථා, පකරණ හා කාව්‍ය ග්‍රන්ථ ඇතුළු ශ්‍රී ලංකාවෙහි හා වෙනත් බෞද්ධ රටවල ද රචනා කරන ලද පාලි ග්‍රන්ථ හඳුනා ගැනීම මෙම විෂය ඒකකයෙහි අන්තර්ගතයට අයත් වේ. ත්‍රිපිටක සාහිත්‍යය මුඛ පරම්පරාගත ව පවත්වාගෙන ආ අයුරු විමසා බැලීම මෙම අධ්‍යයනයේ විශේෂ ලක්ෂණය යි. |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | ත්‍රිපිටක පාළි, පශ්චාත් ත්‍රිපිටක ග්‍රන්ථ හා අට්ඨකථා, ටීකා, පකරණ, වංසකථා හා කාව්‍ය ග්‍රන්ථ ඇතුළු පාලි සාහිත්‍යයට අයත් ග්‍රන්ථ ඓතිහාසික නයින් සමාලෝචනය කිරීමට ශිෂ්‍යයාට හැකියාව ලැබේ. |
| **නිර්දේශිත ග්‍රන්ථ** | බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2007). *පාලි සාහිත්‍යය* (4 මුද්‍රණය). මරදානඃ රත්න පොත් ප්‍රකාශන.<br>මලලසේකර, ගුණපාල (1965). *ශ්‍රී ලංකාවේ පාලි සාහිත්‍යය*. එම්. ඩී. ගුණසේන සහ සමාගම.<br>අදිකාරම්, ඊ. ඩබ්ලිව්. (1969). *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය*. කොළඹඃ ජේ. කේ. ජී. ජයවර්ධන සහ සමාගම.<br>Law, B. C. (2007). *A History of Pali Literature*. Varanasi: Indica.<br>Norman, K. R. (1983). *Pali Literature*. Otto Harrassowitz: Wiesbaden.<br>Wintenitz, M. (1990). *History of Indian Literature*. Vol 11. New Delhi: Motilal Banarsidass.<br>Hinuber, Oskar von (1996). *A Handbook of Pali Literature*. Berlin: Walter de Grnyter.<br>Jayawardana, S. (1994). *Handbook of pali Literature*. Colombo: Karunaratna & Sons. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MAPL 05** |
| **විෂය නාමය** | **පාලි ඡන්දෝලංකාර** |
| **අරමුණ** | විද්‍යාර්ථීන්ට පාලි ඡන්දස් හා අලංකාර පිළිබඳ ප්‍රාගුණ්‍යයක් ලබා දීම හා එමගින් කාව්‍ය රචනයෙහි පරිචයක් ලබා දීමත්, පාලි සාහිත්‍යාගත විචාර ක්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා දීමත් අපේක්ෂිත යි. |
| **අන්තර්ගතය** | වුත්තෝදය හා සුබෝධාලංකාරය පදනම් කොටගත් මෙම අධ්‍යයනයේ දී හත්ථවනගල්ලවිහාරවංස සහ සමන්තකූටවණ්ණනා වැනි පාලි කාව්‍ය ග්‍රන්ථ වලින් තෝරා ගන්නා ලද කොටස් ද අධ්‍යයනය කෙරේ. |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ වර්ෂාවසාන පරීක්‍ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | මෙම පාඨමාලා ඒකකය අවසානයේ දී පාලි පද්‍ය විශ්ලේෂණය කරමින් ඡන්දස් හා අලංකාර ඇසුරින් පාලි පද්‍ය පන්ති විචාරයටත්, රසාස්වාදයෙහි යෙදීමටත්, පාලි භාෂාවෙන් කාව්‍ය නිර්මාණයෙහි යෙදීමටත් විද්‍යාර්ථියාට හැකියාව ලැබේ. |
| **නිර්දේශිත ග්‍රන්ථ** | ලංකානන්ද හිමි, ලබුගම (1946). (සංස්). *වුත්තෝදය*. කොළඹ: සමයවර්ධන පොත්හල.<br>_______, (1937). (සංස්). *සුබෝධාලංකාරය*. හොරණ: විද්‍යාශේඛර මුද්‍රණාලය.<br>ධම්මරතන හිමි, උතුරාවල (1982). (සංස්). *හත්ථවනගල්ලවිහාරවංසය*. මරදාන: සමයවර්ධන ප්‍රකාශනය.<br>ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (1959). (සංස්). *සමන්තකූටවණ්ණනා*. කොළඹ: ගුණසේන<br>Warder, A.K. (1966). *Pali Metre*. London: Luzac and Company. |

MAPL

**විෂය සංකේතය** MAPL 06

**විෂය නාමය** පර්යේෂණ ක්‍රමවේදය සහ විස්තාරිත රචනය

**අරමුණ**

පර්යේෂණ විධික්‍රම පිළිබඳ සහ ශාස්ත්‍රීය ලේඛනය පිළිබඳ මූලික දැනුම සහ කුසලතාව වර්ධනය කර ගැනීම මෙහි අරමුණ වේ. එහි දී බෞද්ධ සාහිත්‍යය මූලාශ්‍රය, පර්යේෂණයක මූලික ලක්ෂණ, මූලාශ්‍රය දැක්වීමේ ක්‍රම, පර්යේෂණ යෝජනාවක් සම්පාදනය කිරීම සහ ශාස්ත්‍රීය ලේඛනය යන කරුණු අධ්‍යයනය කෙරේ.

**අන්තර්ගතය**

ආයතනය විසින් සංවිධානය කරනු ලබන වැඩමුළුවලට ශිෂ්‍යයින් සහභාගී විය යුතු වන අතර ඔවුන් විසින් පර්යේෂණ යෝජනාවක් සහ වචන 5000කින් පමණ සමන්විත විස්තාරිත රචනයක් සම්පාදනය කළ යුතු ය. එකී රචනය පාලි ග්‍රන්ථයක් (හෝ ඉන් කොටසක්) පිළිබඳ අධ්‍යයනයක්/විශ්ලේෂණයක් හෝ ඍජුව ම පාලි ග්‍රන්ථ අධ්‍යයනය හෝ විශ්ලේෂණය පදනම් කරගත් (ධර්මමය හෝ වෙනත්) කවර හෝ විෂයයක් පිළිබඳ අධ්‍යයනයක් විය යුතු ය.
සම්පාදනය කරන ලද විස්තාරිත රචනය අවසාන වාර්ෂික පරීක්ෂණයේ අදාළ පාඨමාලාවේ අවසන් ප්‍රශ්න පත්‍රයේ පරීක්ෂණය පැවැත් වූ දින සිට දින 30ක් ඇතුළත ආයතනය වෙත භාර දිය යුතු ය.

**ඉගැන්වීමේ ක්‍රමය**

ඉගැන්වීමේ ක්‍රියා පිළිවෙළ මෙසේය:

| අදියර | පැවැත්වීමට අපේක්ෂිත කාලය | තේමාව |
|---|---|---|
| ප්‍රථම වැඩමුළුව | 2 වන වාරයේ 4 වන සතිය | පාළි මූලාශ්‍රය සහ පර්යේෂණයක මූලික ලක්ෂණ |
| දෙවන වැඩමුළුව | 2 වන වාරයේ 9 වන සතිය | මූලාශ්‍රය දැක්වීමේ ක්‍රම, පර්යේෂණ යෝජනාව සම්පාදනය කිරීම සහ ශාස්ත්‍රීය ලේඛන සැකසීම |

ශිෂ්‍යයින් විසින් ස්වකීය රචනයේ මාතෘකාව ඉදිරිපත් කළ යුතු කාලය: 2 වන වාරයේ 5 වන සතියට පෙර
අනුමත/සංශෝධිත මාතෘකා කාර්යාලයෙන් ලබාගැනීමේ කාලය: 2 වන වාරයේ 7 වැනි සතිය

**ඇගයීම් ක්‍රමය**

- වැඩමුළු සඳහා සහභාගීත්වය — ලකුණු 10
- පර්යේෂණ යෝජනාව සම්පාදනය කිරීම — ලකුණු 20
- විස්තාරිත රචනය — ලකුණු 70

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

ශිෂ්‍යයින් විසින් පර්යේෂණ ක්‍රම සහ විචාරශීලීත්වය ප්‍රදර්ශනය කරමින් ශාස්ත්‍රීය ලේඛනයෙහි කුසලතාව ප්‍රකට කිරීම

| | |
|---|---|
| **නිර්දේශිත ග්‍රන්ථ** | ධම්මපාල හිමි, ගතාරේ (1985). *පර්යේෂණ ක්‍රම විද්‍යාව.* ගංගොඩවිල: තරංජී ප්‍රින්ටස්.<br>Cryer, Pat (1999). *The Research Student Guide to Success.* Mumbai: VIVA Books Private Ltd.<br>Glough Peter & Nutbrown Cathy (2002). *A Student Guide to Methodology Justifying Enquiry.* London: SAGE Publications Company.<br>Nicholas, Walliman (2005). *Your Research Project.* New Delhi: Vistaar Publications.<br>Potter, Stephen (Eds.) (2002). *Doing Postgraduate Research.* London: SAGE Publications Company. |

MAPL

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MAPL 07** |
| **විෂය නාමය** | **පාලි ග්‍රන්ථ විචාරය** |
| **අරමුණ** | පාලි ග්‍රන්ථ සංස්කරණය සඳහා අවශ්‍ය ක්‍රම ශිල්ප පිළිබඳ පුළුල් දැනුමක් විද්‍යාර්ථීන්ට ලබා දීම |
| **අන්තර්ගතය** | පාලි ග්‍රන්ථ සංස්කරණයේ ඉතිහාසය, ශ්‍රී ලංකේය පාලි පුස්කොළ ලේඛන සම්ප්‍රදායයේ ආරම්භය හා වර්ධනය, පුස්කොළ පිටපත් සම්ප්‍රේෂණය, පුස්කොළ ලේඛන හඳුනා ගැනීම, පුස්කොළ ලේඛන එකතු හඳුනා ගැනීම, ශ්‍රී ලාංකේය පුස්කොළ ලේඛනයන්හි උපයුක්ත විශේෂ ශිල්පීය ක්‍රම, පාලි ග්‍රන්ථ සංස්කරණය පිළිබඳ ක්‍රමවේද, පුස්කොළ පිටපතක වංශාවලිය සකස් කිරීම, පුස්කොළ පිටපත්හි විශේෂතා සහ පාඨාන්තර දෝෂ හඳුනා ගැනීම, විචාරාත්මක සංස්කරණ ක්‍රමවේදය, පාලි ග්‍රන්ථ සංස්කරණය සඳහා අවශ්‍ය ඓතිහාසික ව්‍යාකරණ සිද්ධාන්තයන්හි අවශ්‍යතාව හඳුනා ගැනීම, තුලනාත්මක සංස්කරණය සඳහා අවශ්‍ය මූලාශ්‍රය එනම්, නිකායාන්තර මූලාශ්‍රය, අට්ඨකථා සහ ටීකා හඳුනා ගැනීම, පාලි ග්‍රන්ථ රචනා කිරීම සඳහා උපයුක්ත අක්ෂරමාලා එනම්, සිංහල, බුරුම, දේව නාගරී, රෝමන් හා කාම්බෝජ අක්ෂරමාලා ලිවීමේ හා කියවීමේ පුහුණුව ලබා ගැනීම සහ එම අක්ෂර මාලාවන්ගෙන් රචිත පාලි ග්‍රන්ථ සංස්කරණය කිරීමේ ප්‍රායෝගික පුහුණුව |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගීත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | මෙම පාඨමාලා ඒකකය අවසානයේ දී පාලි ග්‍රන්ථ සංස්කරණය සඳහා අවශ්‍ය ක්‍රමවේද විස්තර කිරීමේ හැකියාව මෙන් ම සිංහල, බුරුම, නාගරී, රෝමන්, තායි හා කාම්බෝජ අක්ෂර මාලාවන්ගෙන් රචිත පාලි ග්‍රන්ථ සංස්කරණය කිරීමේ හැකියාව ලැබේ. |
| **නිර්දේශිත ග්‍රන්ථ** | කුලසූරිය, ආනන්ද (1992). *ගතක් සැකසීම.* කොළඹ: ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලය.<br>ලගමුව, ආරිය (2006). *ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව.* කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.<br>සෝමදස, කේ.ඩී. (1959). *ලංකා පුස්කොළ පොත් නාමාවලිය.* කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.<br>De Silva, W.A. (1938). *Catalogue of Palm Leaf manuscripts in the Library of the Colombo Museum.* Colombo: Ceylon Government Press.<br>Kelemen, Erick (2009). *Textual Editing and Criticism: An Introduction.* New York: W.W. Norton and Company.<br>Jerome, J.A. (1992). *A Critical of Modern Textual Criticism.* Britain: Yale Centre.<br>Katre, S.M. (1954). *Indian Textual Criticism.* Poona: Deccan Collage.<br>Ñāṇatusita, Bhikkhu (2010). *Pali Manuscripts in Sri Lanka, Mainland South Eastsian Manuscripts in Sri Lanka.* Kandy: Buddhist Publication Society.<br>Mass, P. (1968). *Textual Criticism.* Oxford:<br>Hall, F.W. (1913). *A Companion to Classical Texts.* Oxford:<br>West, M.L. (1973). *Textual Criticism and Editorial Techniques.* Stuttgart: B.G. Teubner. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MAPL 08** |
| **විෂය නාමය** | **ථේරවාද සම්ප්‍රදායː ඉතිහාසය හා ධර්ම කරුණු පිළිබඳ අධ්‍යයනයක්** |
| **අරමුණ** | ඓතිහාසික කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කරමින් ධර්ම හා විනය අර්ථකථන සම්ප්‍රදායයක් ලෙස ථේරවාදය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් කිරීම |
| **අන්තර්ගතය** | 1. ථේරවාදයෙහි ඓතිහාසික ආරම්භය<br>ථේරවාදය හා ආදි බුදුසමය අතර වෙනසක් තිබේ ද? ආදි බුදුසමය හා ථේරවාදය අතර සම්බන්ධතාවෙහි ස්වරූපය, සංගායනා, සාම්ප්‍රදායිකත්වය, විනය පිළිබඳ අවධාරණය, භික්ෂුණී ශාසනය කෙරෙහි වූ ආකල්ප වැනි කරුණු පිළිබඳ ව අවධාරණය කරමින් ථේරවාද සම්ප්‍රදාය ආරම්භ වූ අයුරු අධ්‍යයනය කරනු ලැබේ.<br>2. ථේරවාද සම්ප්‍රදාය අධ්‍යයනයෙහි මූලාශ්‍රය<br>නෙත්තිප්පකරණ, පේටකොපදෙස හා මිළින්දපඤ්හ වැනි පශ්චාත් ත්‍රිපිටක කෘති, විසුද්ධිමග්ගය ඇතුළු අටුවා හා ටීකා ප්‍රකරණ හා අනෙකුත් පාලි සිංහල කෘති, පශ්චාත් ත්‍රිපිටක හා අට්ඨකථා ඇතුළු අර්ථකථන සම්ප්‍රදායයෙහි විශේෂ අංග<br>3. ථේරවාදයෙහි අන්තර්ගතය<br>3.1 සූත්‍ර පිටකාගත ධර්ම කරුණු පිළිබඳ ථේරීය අර්ථකථන, පටිච්චසමුප්පාදය, නිර්වාණය, නිවන්මග<br>3.2 විනය පිටකාගත කරුණු පිළිබඳ ථේරීය අර්ථකථන<br>(අ) සමන්තපාසාදිකාව, එහි ටීකාව හා විනය ග්‍රන්ථ තුළ දක්නට ඇති නව සංවර්ධනය<br>(ආ) පාලි මුත්තකවිනය<br>3.3 අභිධර්ම පිටකාගත කරුණු පිළිබඳ ථේරීය අර්ථකථන<br>(අ) ධම්මවාදය හා සතර පරමාර්ථ ධර්ම පිළිබඳ සංකල්පය<br>(ආ) සම්මුතිය හා පරමාර්ථ සත්‍යය<br>(ඇ) ක්ෂණවාදය හා පරමාණුවාදය<br>(ඈ) අභිධර්මයෙහි නිදානය පිළිබඳ ගැටලුව<br>4. හීනයාන අර්ථකථන හා ථේරවාදය<br>වෛභාෂික හා සෞත්‍රාන්තික ඇතුළු අනිකුත් හීනයාන නිකාය හා ථේරීය සම්ප්‍රදාය අතර පැවති ධර්ම කරුණු පිළිබඳ විවාද මේ යටතේ හදාරනු ලැබේ.<br>5. ථේරවාදය හා පාලි භාෂාව<br>පාලි භාෂාව බුදුරදුන් විසින් කථා කරන ලද භාෂාව ද? පාලි භාෂාව බෞද්ධයින්ගේ 'පූජනීය භාෂාව' බවට පරිවර්තනය වූ අයුරු වැනි කරුණු සාකච්ඡා කරනු ලැබේ. |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම්<br>■ පන්ති සහභාගිත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |

MAPL

| | |
|---|---|
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | ධර්මය හා විනය අර්ථකථනයෙහි ලා ථේරවාද සම්ප්‍රදායයේ අනන්‍යතාව පැහැදිලි කිරීමට ශිෂ්‍යයාට හැකි වීම |
| **නිර්දේශිත ග්‍රන්ථ** | *කථාවත්ථුප්පකරණ*. (1967). (බුද්ධ ජයන්ති සංස්කරණය). ලංකා ආණ්ඩුව මගින් ප්‍රකාශිතයි.<br>අදිකාරම්, ඊ. ඩබ්ලිව්. (1969). *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය*. කොළඹ: ජේ. කේ. ජී ජයවර්ධන සහ සමාගම.<br>තිලකරත්න, අසංග (2012) අභිධර්ම අධ්‍යයන, කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.<br>පඤ්ඤාසාර හිමි, දෙහිගස්පේ ආදීහු (සංස්.) (1931). *පාලිමුත්තකවිනයවිනිච්ඡය*. කොළඹ: ගොඩගේ ප්‍රකාශන.<br>වජිරඤාණ හිමි, හොරණ (2000). *ලක්දිව විනය සාහිත්‍යය*. මරදාන: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.<br>Abeynayake, Oliver (1984). *A Textual and Historiacal Analysis of Khuddaka Nikaya.* Colombo: Karunaratne.<br>Adikaram, E. W. (1953). *Early History of Buddhism in Ceylon.* Colombo: M. D Gunasena & Co.<br>Dutt, N. (1980). *Early History of the Spread of Buddhism and the Buddhist Schools.* New Delhi: Rajesh Publications.<br>Gethin, Rupert. (1998). *Foundations of Buddhism*. Oxford: Oxford University Press.<br>Gombrich, Richard (1988). *Theravada Buddhism: A Social Histroy from Ancient Benares to Morderm Colombo*. London: Routledge and Kegan Paul.<br>Hinuber, Oskar Von (1994). *Selected Papers on Pali Studies.* London: PTS.<br>Nanamoli, Bhikku, (1962). *The Guide*. London: Pali Text Society.<br>Norman, K. R. (1992). *Colleted Papers, Vol. iii*. London: PTS.<br>__________, (1997). *A philological Approach to Buddhism.* London: University of London. |

## 02.3.2 බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

### විෂය ක්ෂේත්‍රය හා අන්තර්ගතය

බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා ගවේෂණය කිරීමට හැකි වනු පිණිස එම ක්ෂේත්‍රයේ බහුවිධ ශාඛා පිළිබඳ වඩාත් ම යාවත්කාලීන දැනුම් සම්භාරය සහ ඊට අදාළ පර්යේෂණ විද්‍යාර්ථීන්ට හඳුන්වා දීම මෙම පාඨමාලාවේ අපේක්ෂාව යි.

අධ්‍යයන අංශ තුනක් මගින් සම්බන්ධීකරණය කරනු ලබන පාලි, සංස්කෘත, සිංහල, තිබ්බත හා සම්භාව්‍ය චීන ආදී භාෂාවන්ගෙන් රචිත බෞද්ධ මූලාශ්‍රය පදනම් කර ගත් මෙම පාඨමාලාව බෞද්ධ චින්තනය හා එහි ඓතිහාසික වර්ධනය, බෞද්ධ සමාජ දර්ශනය හා සමාජ සංවිධාන, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ කලාශිල්ප හා සාහිත්‍යය යන ක්ෂේත්‍ර දක්වා විහිද යයි. මෙම විෂය ක්ෂේත්‍ර ආවරණය කෙරෙන පුළුල් පරාසයක පාඨමාලා ශ්‍රේණියක් ආයතනය මගින් ඉදිරිපත් කරනු ලැබේ. මෙහි දී අදාළ විෂය මූලාශ්‍රය භාෂා පිළිබඳ දැනුමක් අත්‍යවශ්‍ය නොවන නමුදු ඇතැම් පාඨමාලා තෝරා ගත යුත්තේ අදාළ භාෂා පිළිබඳ නිපුණත්වයක් ඇති ශිෂ්‍යයන් විසින් පමණි. බෞද්ධ අධ්‍යයනය හෝ ඊට සමීපස්ථ ක්ෂේත්‍රයක උපාධියක් නොමැති ශිෂ්‍යයකු බෞද්ධ චින්තනයට ප්‍රවේශයක් වශයෙන් උපයෝගි විය හැකි පාඨමාලා ඒකක තෝරා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. ස්වකීය භාෂා ප්‍රවීණත්වය වර්ධනය කරගැනීමට ඇති අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම පිණිස ශිෂ්‍යයින් දිරිමත් කෙරේ. සිය ප්‍රථම උපාධිය බෞද්ධ අධ්‍යයනය හා සමීප සම්බන්ධයක් නොමැති ක්ෂේත්‍රයක ශිෂ්‍යයෙකු විසින් බෞද්ධ චින්තනයට ප්‍රවේශයක් වශයෙන් උපයෝගී විය හැකි පාඨමාලා ඒකක තෝරා ගැනීම වඩාත් යෝග්‍ය විය හැකි ය. මෙම ආයතනයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව බෞද්ධ අධ්‍යයනය හෝ තුලනාත්මක ආගම් අධ්‍යයනය පිළිබඳ පර්යේෂණ කාර්යයන් සඳහා සූදානම් වීමක් වශයෙන් ද, උසස් අධ්‍යාපන ආයතනවල බුදුදහම උගන්වන ආචාර්යවරුන්ට පුහුණු පාඨමාලාවක් වශයෙන් ද, බුද්ධිය හා විචාරාත්මක දෘෂ්ටිය වර්ධනය කරන ස්වාධීන අධ්‍යයනයක ව්‍යාප්තියක් වශයෙන් ද සලකනු ලැබේ.

### ප්‍රවේශය සඳහා සුදුසුකම්

බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ඇතුළත් වීමට බලාපොරොත්තු වන අයැදුම්කරුවකු පහත සඳහන් සුදුසුකම්වලින් යටත් පිරිසෙයින් එකක්වත් සපුරා තිබිය යුතු ය.

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධියක්

හෝ

ii. පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබාගත් බෞද්ධ අධ්‍යයනය/පාලි පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

හෝ

iii. ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණයෙන් සමත් වීම

MABS

හෝ

iv. පිළිගත් විශ්වවිද්‍යාලයක/ආයතනයක බෞද්ධ ආයුර්වේද උපදේශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සමත් වීම

හෝ

iv. ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන සේ ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් හෝ ලබා තිබීම

## අධ්‍යයන පාඨමාලා සඳහා අවශ්‍යතා

අදාළ අධ්‍යයන වර්ෂය සඳහා නිර්දේශිත පාඨමාලා ඒකක අතරින් ඒකක හතක් (07) ශිෂ්‍යයෙකු විසින් හැදෑරිය යුතු වන අතර එහි දී MABS 01 සහ MABS 72 විෂය ඒකක අනිවාර්ය වේ.

## පවත්නා පාඨමාලා ඒකක :

MABS 01: පාලි නිකායාගත බෞද්ධ චින්තනය: විග්‍රහය හා විවරණය (අනිවාර්ය)

MABS 02: ථේරවාද අභිධර්මය: ප්‍රභවය හා වර්ධනය

MABS 04: අභිධර්ම සම්ප්‍රදායාගත ධර්මමූලක මතවාද

MABS 05: බුද්ධවේදයේ සංවර්ධනය: පූර්ව මහායාන සාහිත්‍යය ඇසුරෙන් අධ්‍යයනයක්

MABS 06: මහායාන බුදුසමයෙහි ප්‍රභවය සහ මහායාන සූත්‍ර සාහිත්‍යය

MABS 07: මූලමධ්‍යමකකාරිකාවෙන් පිළිබිඹු වන නාගාර්ජුන ආචාර්යපාදයන්ගේ දර්ශනය

MABS 09: බෞද්ධ විනය හා ආරාමික සංවිධානය

MABS 16: චීන භාෂාගත බෞද්ධ ත්‍රිපිටකය: ඓතිහාසික හා විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

MABS 21: බෞද්ධ සෞන්දර්ය සංකල්ප: විශ්ලේෂණය සහ ඇගයීම

MABS 22: බෞද්ධ කලා හා ගෘහ නිර්මාණය I (ඉන්දියානු අර්ධද්වීපය)

MABS 23: බෞද්ධ කලා හා ගෘහ නිර්මාණය II (ශ්‍රී ලංකාව)

MABS 26: බෞද්ධ මනෝචිකිත්සාව

MABS 27: බුදුසමයේ සමාජ ප්‍රස්තරය

MABS 33: බෞද්ධ ආර්ථික දර්ශනය

MABS 35: ථේරවාද සම්ප්‍රදාය: ඉතිහාසය හා ධර්ම කරුණු පිළිබඳ අධ්‍යයනයක්

MABS 39: මූලික පාලි, පර්යේෂණ ක්‍රමවේදය හා තර්කානුකූල චින්තනය

MABS 40: බෞද්ධ අධ්‍යාපනය හා විඥාපන දර්ශනය

MABS 52: ඉන්දියානු බුදුසමයේ ඉතිහාසය: එහි ප්‍රභවයේ සිට මහායානයේ උදාව දක්වා

MABS 54: මහායාන බුදුසමය: ධර්මමය සමීක්ෂණයක්

MABS 56: පාලි අට්ඨකථා සාහිත්‍යය

MABS 57: බුද්ධ සංකල්පය සහ ථේරවාදයේ බෝධිසත්ව පරමාදර්ශය

MABS 60: සර්වාස්තිවාද අභිධර්මය: ධර්මමූලක මතවාද

MABS 61: සර්වාස්තිවාද සම්ප්‍රදායයේ ආධ්‍යාත්මික ක්‍රමවේද

MABS 62: ශූන්‍යතාව පිළිබඳ ධර්මතාව: ප්‍රඥාපාරමිතා සූත්‍ර සහ ආදි මධ්‍යමක දර්ශනය

MABS 63: ආදි ඉන්දියානු යෝගාචාර ඉගැන්වීම්

MABS 64: චීන බුදුසමයේ ඉතිහාසය

MABS 65: ජපන් බුදුසමය: ඉතිහාසය සහ ඉගැන්වීම්

MABS 66: ටිබෙට් බුදුසමය: ඉතිහාසය සහ ඉගැන්වීම්

MABS 67: පාලි සූත්‍ර අධ්‍යයනය

MABS 68: බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ අධ්‍යයනය

MABS 69: ටිබෙට් බෞද්ධ ග්‍රන්ථ අධ්‍යයනය

MABS 70: බෞද්ධ ඉගැන්වීම්: නූතන දාර්ශනික පර්යාවලෝකන

MABS 71: බෞද්ධ ආචාරධර්ම: සංකල්ප සහ දාර්ශනික අර්ථකථන

MABS 72: පර්යේෂණ ක්‍රමවේදය හා විස්තාරිත රචනය (අනිවාර්ය)

MABS 73: පාලි භාෂාව: හැඳින්වීමක්

MABS 74: බෞද්ධ භාවනා සම්ප්‍රදායයෝ

(අධ්‍යයන වර්ෂයක දී පවත් වනු ලබන විෂය ඒකකයන් ආයතනය විසින් තීරණය කරනු ලැබේ.)

## පාඨමාලා ව්‍යුහය

මෙම පාඨමාලාව වාර තුනකින් යුතු එක් අධ්‍යයන වර්ෂයකින් සමන්විත වන අතර එක් එක් වාරයකට සති දහයක් ඇතුළත් වෙයි. MABS 72 - පර්යේෂණ ක්‍රමවේදය හා විස්තාරිත රචනය විෂය ඒකකය හැර සෑම පාඨමාලා ඒකකයක් සඳහා ම යටත් පිරිසෙයින් සතියකට පැයක දේශනයක් පැවැත් වෙන අතර එයට අතිරේක ව විෂය මාර්ගෝපදේශ සහ නිර්දේශයට අදාළ ශාස්ත්‍රීය සාකච්ඡා ද පැවැත් වෙනු ඇත.

## ඇගයීම් ක්‍රමය

i. එක් එක් විෂය ඒකකය වෙනුවෙන් පැවරුම් දෙකකි: එක් පැවරුමකට ලකුණු 15කි.

ii. පන්ති සහභාගිත්වය සඳහා ලකුණු 10කි.

iii. එක් එක් විෂය ඒකකයක් සඳහා වර්ෂාවසාන පරීක්ෂණය: එක් විෂය ඒකකයක් සඳහා ලකුණු 60කි.

## පර්යේෂණ ක්‍රමවේදය සහ විස්තාරිත රචනය

ලකුණු 100කි. වැඩමුළුවලට සහභාගී වීම, පර්යේෂණ යෝජනාව සම්පාදනය කිරීම සහ රචනය ලියා ඉදිරිපත් කිරීම යන කරුණු එහි දී සැලකිල්ලට ගනු ලැබේ. වැඩිදුර විස්තර සඳහා අදාළ විෂය නිර්දේශය බලන්න.

**ශ්‍රේණි**

| | | |
|---|---|---|
| 75 - 100 | A | විශිෂ්ට සාමර්ථ්‍යය |
| 65 - 74 | B | සම්මාන සාමර්ථ්‍යය |
| 50 - 64 | C | සාමර්ථ්‍යය |
| 00 - 49 | W | දුර්වල |

**(i) කුසලතා සාමර්ථ්‍යය**

සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 50ට නොඅඩුව ලබා සියලු විෂය ඒකකවල සාමාන්‍යය ලකුණු 75ක් හෝ ඊට වඩා වැඩි වීම

**(ii) සාමර්ථ්‍යය**

සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 50ක් ලබා තිබීම හෝ එක් විෂය ඒකකයකට පමණක් ලකුණු 45 - 49 අතර ප්‍රමාණයක් ලබා සියලු විෂය ඒකකයන්ගේ ලකුණුවල සාමාන්‍යය 50ක් හෝ ඊට වඩා වැඩි වීම

**(iii) ඌන සාමර්ථ්‍යය හා අසමත් වීම**

එක් විෂය ඒකකයකින් පමණක් අසමත් වන සිසුන් ඌන සාමර්ථ්‍යයක් ලත් සිසුන් ලෙස සලකනු ලැබේ. ඔවුන්ට එම විෂය ඒකකයට පමණක් නැවත පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. විෂය ඒකක දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අසමත් වන සිසුන් අසමත් අය ලෙස සැලකේ. ඔවුන් සියලු ම ප්‍රශ්න පත්‍රවලට නැවත පෙනී සිටිය යුතු ය. කෙසේ වුව ද MABS 72 විෂය ඒකකය සමත් වුව හොත් එය නැවත සම්පූර්ණ කිරීමට අවශ්‍ය නැත. තව ද ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වූ දින සිට වසර 04ක් තුළ විභාගය සමත් විය යුතු ය.

# බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABS 01** |
| **විෂය ඒකකය** | **පාලි නිකායාගත බෞද්ධ චින්තනයඃ විග්‍රහය හා විවරණය** |
| **අරමුණ** | පාලි නිකාය ග්‍රන්ථයන්හි එන බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ විචාරාත්මක හා විස්තරාත්මක දැනුමක් ලබා දීම |
| **අන්තර්ගතය** | ආදි බුදුසමයේ මූලික ඉගැන්වීම්, එම ඉගැන්වීම් විවරණය කිරීමේ දී නූතන විද්වතුන් විසින් මතු කොට ඇති ප්‍රශ්න හා එහි ලා ඔවුන් විසින් යෝජනා කොට ඇති විසඳුම්, ඉන්ද්‍රිය විඥෙය ලෝකයේ යථාභූත ස්වරූපය පිළිබඳ ව සූත්‍ර දේශනාවන්හි දක්නට ලැබෙන විවිධ ප්‍රවණතා බුදුසමයෙහි ආගමික හා දාර්ශනික ඉගැන්වීම් විෂයයෙහි අර්ථවත් ලෙස වටහා ගැනීම, ආදි බුදුසමයේ දාර්ශනික පද්ධතිය සහ එහි සුවිශේෂතාව<br>මෙම පාඨමාලා ඒකකය සූත්‍ර දේශනා පදනම් කොට ඇති අතර, යථායෝග්‍ය පරිදි අභිධර්ම පිටකයෙහි හා අට්ඨකථාවන්හි එන අර්ථකථන ද උපයෝගි කර ගනු ලැබේ. මෙම පාඨමාලා ඒකකය හැදෑරීමේ දී පාලි සූත්‍ර දේශනා අධ්‍යයනය කොට වටහා ගැනීමේ හැකියාව බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ▪ පැවරුම් දෙකක්<br>▪ පන්ති සහභාගිත්වය<br>▪ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | සූත්‍ර පිටකාගත මූලික ඉගැන්වීම් විචාරාත්මක ව විග්‍රහ කිරීමේ හා ප්‍රාථමික මූලාශ්‍රයවල අදාළ සූත්‍ර අධ්‍යයනය කොට අවබෝධ කර ගැනීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | කරුණාරත්න, ඩබ්ලිව්. එස්. (2011). *බෞද්ධ දර්ශනය හා චරණය*. කොළඹඃ සමයවර්ධන ප්‍රකාශන.<br>චන්දවිමල හිමි, රේරුකානේ (1998). *පටිච්චසමුප්පාද විවරණය*. කොළඹඃ චන්දවිමල අරමුදල.<br>ඤාණසීහ හිමි, හේන්පිටගෙදර (1962). *මහරහතන් වහන්සේ*. කොළඹඃ බී. එම්. කේ. බන්ඩාර ප්‍රකාශක.<br>ඤාණිස්සර හිමි, අල්පිටියේ (1960). *භාරත දර්ශනය*. (දෙවැනි මුද්‍රණය) කොළඹඃ ගොඩගේ ප්‍රකාශන.<br>ධර්මසිරි, ගුණපාල, (1996). *බෞද්ධ සදාචාරයේ මූලධර්ම*. දෙහිවලඃ බී. සී. සී. ප්‍රකාශන.<br>බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1962). *ථේරවාද බෞද්ධ දර්ශනය*. කොළඹඃ රත්න පොත් පශකාශන.<br>රාධාක්‍රිෂ්ණන්, එස්. (1970). *ඉන්දීය දර්ශනය* (I කාණ්ඩය). කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.<br>සීලරතන හිමි, හෙන්ඩියගල (2001). *පුනර්භවය හා නිර්වාණය*. කොළඹඃ රත්න පොත් පශකාශන.<br>හිරියන්න, එම්. (1970). *සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය*. කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

| | |
|---|---|
| නිර්දේශිත ග්‍රන්ථ | Conze, E. (1967). *Budhist Thought in India*. London: George Allen Unwin.<br>Johanson, Rune E. A. (1979). *The Dynamic Psychology of Early Buddhism*. Oxford: Curzon Press.<br>______ (1979). *The Psychology of Nirvana*. New York: Allen & Unwin.<br>Karunaratna, W. S. (1988). *The Theory of Causality in Early Buddhism*. Nugegoda: Indumati Karunaratne.<br>Kalupahana, D. J. (1975.) *Causality: The Central Philosophy of Buddhism*. Honolulu: The University Press of Hawaii.<br>Murti, T. R. V. (1955). *The Central Philosophy of Buddhism*. London: Routledge.<br>Pande, G. C. (1957). *Studies in the Origins of Buddhism*. Delhi: Motilal Banarsidass.<br>Warder, A. K. (1980). *Indian Buddhism.* Delhi: Motilal Banarsidass. |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABS 02** |
| **විෂය ඒකකය** | **ථේරවාද අභිධර්මය: ප්‍රභවය හා වර්ධනය** |
| **අරමුණ** | අභිධර්මයේ ප්‍රභවයට හේතු පූර්වක වූ ධර්මමය ප්‍රවණතා හා ඓතිහාසික සාධක හඳුනා ගැනීම, පිටකාගත අභිධර්මයෙහි අන්තර්ගත අර්ථ ව්‍යාඛ්‍යාන ක්‍රම හා කේන්ද්‍රීය සංකල්ප හඳුනා ගැනීම, එම සංකල්පවලට අදාළ ව පශ්චාත් ත්‍රිපිටක අභිධර්ම සාහිත්‍යයෙහි දැක්වෙන වැඩිදුර විස්තර විවරණ හඳුනා ගැනීම |
| **අන්තර්ගතය** | අභිධර්මයේ ප්‍රභවයට හේතු වූ ධර්මමය ප්‍රවණතා හා ඓතිහාසික සාධක, පිටකාගත අභිධර්මයෙහි අන්තර්ගත අර්ථ ව්‍යාඛ්‍යාන ක්‍රම හා කේන්ද්‍රීය සංකල්ප, අට්ඨකථා හා සංග්‍රහ ග්‍රන්ථ සාහිත්‍යයෙහි දැක්වෙන ආභිධර්මික විවරණ, අභිධර්මයේ කේන්ද්‍රීය සංකල්පය වන ධම්ම සංකල්පය, පඤ්ඤත්ති-පරමත්ථ සත්තා භේදය හා සම්මුති-පරමත්ථ සත්‍ය විභාගය, අටුවා සාහිත්‍යයෙහි 'ධම්ම' යන්න 'සභාව' ලෙස අර්ථකථනය කිරීම හා සර්වාස්තිවාදීන්ගේ ත්‍රෛකාලික අස්ථිත්ව න්‍යායික සන්දර්භය තුළ එහි ඇති වැදගත්කම; ආභිධර්මික නාම-රූප විභාගය; නාම-රූප ධර්ම පිළිබඳ ආභිධර්මික විග්‍රහය; භවංග සංකල්පය හා ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය; භාවසාධන සහ අනෙකුත් නිර්වචන විධි, කාල ප්‍රඥප්තිය හා ක්‍ෂණභංගුරත්වය; ඉදප්පච්චයතාව; භාවනාව සහ මනසේ උසස් අධිගම |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ▪ පැවරුම් දෙකක්<br>▪ පන්ති සහභාගිත්වය<br>▪ වර්ෂාවසාන පරීක්‍ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | අභිධර්මයේ ප්‍රභවයට හේතු වූ ධර්මමය හා ඓතිහාසික සාධක විස්තර කළ හැකි වීම, පිටකාගත අභිධර්මයෙහි අන්තර්ගත අර්ථ ව්‍යාඛ්‍යාන ක්‍රම හා කේන්ද්‍රීය සංකල්ප විවරණය කළ හැකි වීම, අට්ඨකථා හා සංග්‍රහ ග්‍රන්ථ සාහිත්‍යයේ දැක්වෙන අතිරේක විස්තර පැහැදිලි කළ හැකි වීම |
| **නිර්දේශිත ග්‍රන්ථ** | ආනන්ද මෛත්‍රෙය හිමි, බලන්ගොඩ (1973). *සතර පරමාර්ථය.* මහනුවර: බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය.<br>ආනන්ද හිමි, කෝන්ගස්තැන්නේ (1996). *අභිධර්මය වෙනම පිටකයක් ද?.* රත්නපුර: කර්තෘ ප්‍රකාශන.<br>ඤාණසීහ හිමි, හේන්පිටගෙදර (1972). *අභිධර්මය පිළිබඳ ප්‍රශ්න හා පිළිතුරු.* කොළඹ.<br>චන්ද්‍රවිමල හිමි, රේරුකානේ (1987). *අභිධර්ම මාර්ගය.* කොළඹ: ඒ. සී ජයවර්ධන ප්‍රකාශන.<br>තිලකරත්න, අසංග (සංස්.) (1995). *අභිධර්ම අධ්‍යයන.* කොළඹ: කරුණාරත්න සහ පුත්‍රයෝ.<br>පෙරේරා, ටෙනිසන් (සංස්.) (1991). *නිවන්මග: අභිධර්මය විමර්ශන අංකය.* කොළඹ: රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය.<br>රත්නපාල, අමරදාස (1967). *අභිධර්මාර්ථ ප්‍රදීපිකා.* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.<br>රාධාක්‍රිෂ්ණන්, එස්. (1970). *ඉන්දීය දර්ශනය* (1 කාණ්ඩය). කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

MABS

ලංකානන්ද හිමි, ලබුගම (සංස්.) (1967). *කථාවත්ථුප්පකරණ*. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා අංක 44. කොළඹ: ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය.

සාසනරතන හිමි, මොරටුවේ (1948). *අභිධර්මකෝෂය*. පානදුර: පෙරේරා ප්‍රකාශන.

Bodhi, Bhikkhu (1999). *A Comprehensive Manuel of Abhidhamma*. Kandy: Buddhist Publication Society.

Davids, Mrs. Rhys (1923). *Buddhist Manual of Psychological Ethics* (tr. Dhammasangani), London:

Guenther, H. (1976). *Philosophy and Psychology in the Abhidharma*. Berkeley: Shambhala Publications.

Jayasuriya, W.F. (1976). *The Psychology and Philosophy of Buddhism*. Kuala Lumpur: Buddhist Missionary Society.

Karunadasa, Y. (2014.) *The Theravada Abhidhamma*. University of Hong: Centre of Buddhist Studies.

Kasyap, Ven. J. (1943). *The Abhidhamma Philosophy*. Saranath: Mahabodhi Society.

Nyanaponika Thera, Ven. (1976). *Abhidhamma Studies: Researches in Buddhist Psychology*. Kandy: Buddhist Publicaion Society.

_______ , (1949). *Guide Through the Abhidhamma Pitaka*. Kandy:Buddhist Publication Society.

_______ , (1998). *Abhidhamma Studies*. Kandy: Buddhist Publication Society.

Pieris, Aloysius, S.J. (2004). *Studies in the Philosophy and Literature of Pali Abhidhammika Buddhism*. Colombo: The Ecumenical Institute for Study of Dialoge.

Ronkin, Noa (2005). *Early Buddhist Metaphysics, The Making of a Philosophical Tradition*. London & New York: Routledge Curzon.

Sarachchandra, E.R. (1994). *Buddhist Psychology of Perception*. Dehiwala: Buddhist Cultural Centre.

Warder, A. K. (1961). '*Mātikā' (Introductory Essay)*. Mohavicchedanī, London: PTS.

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABS 04** |
| **විෂය ඒකකය** | **අභිධර්ම සම්ප්‍රදායාගත ධර්ම මූලක මතවාද** |
| **අරමුණ** | ආභිධර්මික සම්ප්‍රදාය තුළ වර්ධනය වූ විවාදයට තුඩු දුන් පූර්ව-මහායාන ධර්මමය විවරණ හා නව සංකල්ප පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් කිරීම |
| **අන්තර්ගතය** | දෙවැනි ධර්ම සංගායනා සමයේ දී බුදුසසුන තුළ ඇති වූ නිකාය භේදය ඓතිහාසික දෘෂ්ටි කෝණයකින් සමාලෝචනය කරමින් ආරම්භ වන මෙම විෂය ඒකකයේ අන්තර්ගතයට පහත දැක්වෙන ප්‍රධාන විවාදාත්මක ධර්මමය මාතෘකා පිළිබඳ විස්තරාත්මක සාකච්ඡාවක් අයත් වෙයි: සර්වාස්ථිවාදය, පුද්ගලවාදය, කර්මවාදය හා සම්බන්ධ අවිඥප්ති, අවිප්‍රණාස හා බීජ සංකල්පය, ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ඥානය පිළිබඳ විවිධ විවරණ, මහාසාඞ්ඝිකයන්ගේ බුද්ධ සංකල්පය, රහතුන් වහන්සේගේ ආධ්‍යාත්මික තත්ත්වය හා අන්තරාභව වාදය |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගිත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | නිකායාන්තර බෞද්ධ සම්ප්‍රදායයන් අතර වර්ධනය වූ ධර්මමූලක මතවාද විස්තර කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | ඤාණසීහ හිමි, හේන්පිටගෙදර (1973). *ඥාන ප්‍රස්ථානය.* කොළඹ: රත්න ප්‍රකාශන.<br>බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1963). *භාරතීය බෞද්ධාචාර්‍යයෝ.* (ද්විතීය මුද්‍රණය). උපග්‍රන්ථය (පිටු 191-233). කොළඹ: ගුණසේන සහ සමාගම.<br>රාධාක්‍රිෂ්ණන්, එස්. (1970). *ඉන්දීය දර්ශනය* I කාණ්ඩය, (පිටු 508-587). කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.<br>සාසනරතන හිමි, මොරටුවේ (1948). *අභිධර්මකෝෂය.* පානදුර: පෙරේරා ප්‍රකාශන.<br>හිරියන්න එම්. (1970). *සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,(පිටු 179-208)<br>André Bareau,. *The Buddhist Sects of the Lesser Vehicle.Translated into English by* Gelongma Migme Chodron (2005); http:// www. gampoabbey. org/ translations 2/ani-migme/ Bareau/ sects-Bouddhiques %20.pdf (accessed 25 January, 2011).<br>Conze, E. (1962.). *Buddhist Thought in India.* Michihan: University of Michigan Press.<br>Dhammajoti, K.L. (2007). *Abhidharma Doctrine and Controversies on Perception.* Hong Kong: Center of Buddhist Studies" The University of Hong Kong.<br>______, (2009). *Sarvāstivāda Abhidharma.*Hong Kong: Center of Buddhist Studies. The University of Hong Kong.<br>Dube S.N. (1980). *Cross – currents in Early Buddhism.* Dehli: South Asia Books.<br>Karunadasa, Y. (1989). *Buddhist Analysis of Matter*. Singapore: The Buddhist Research Society.<br>______, (2010). *The Theravāda Abhidhamma: Its Inquiry into The Nature of Conditioned Reality.* Hong Kong: Center of Buddhist Studies The University of Hong Kong.<br>Masuda, J.tr. (1923). "*Origin and doctrines of early Indian Buddhist Schools*", in Asia Major. Vol. 2. (1925): 1-78.<br>Stacherbatsky, Th. (1923). *The Central Conception of Buddhism.* London: Royal Asiatic Society. |

MABS

| | |
|---|---|
| විෂය සංකේතය | **MABS 06** |
| විෂය ඒකකය | **මහායාන බුදුසමයෙහි ප්‍රභවය හා ආදි මහායාන සූත්‍ර සාහිත්‍යය** |
| අරමුණ | නිකාය සහ ආගම මූල ග්‍රන්ථ හා පූර්ව මහායාන බෞද්ධ සම්ප්‍රදාය ඇසුරින් මහායාන බුදුසමයෙහි ප්‍රභවය සහ වර්ධනය අධ්‍යයනය කිරීම සහ පැරණි මහායාන සූත්‍ර ඇසුරින් සුවිශේෂී මහායාන සංකල්ප අධ්‍යයනය කිරීම |
| අන්තර්ගතය | නිකාය සහ ආගම ග්‍රන්ථයන්හි එන පූර්ව මහායාන බෞද්ධ සංකල්ප; පූර්ව මහායාන බෞද්ධ සම්ප්‍රදාය (මහාසාංඝික, විභජ්ජවාදී ආදී); සමාජ-ආර්ථික තත්ත්ව සහ බුදුසමයෙන් බැහැර ධර්මමය බලපෑම සැලකිල්ලට ගනිමින් මහායාන බුදුසමයෙහි ප්‍රභවයට තුඩු දුන් කරුණු අධ්‍යයනය කිරීම; සංස්කෘත හා චීන මූලාශ්‍රය (විශේෂයෙන් 2 වන සහ 3 වන සියවස්වලට අයත් පරිවර්තන) පදනම් කොට ගෙන පැරණි මහායාන සූත්‍ර අධ්‍යයනය කිරීම; මහායාන ධර්මය පිළිබඳ පසුබිම් අවබෝධයක් ලබා දීම සඳහා කථාවත්ථුප්පකරණය (අටුවාව සහිත) සමයභෙදොපරචනාචක්‍රය සහ අභිධර්ම මහාවිභාෂා ශාස්ත්‍ර වැනි මූල ග්‍රන්ථයන්හි අදාළ කොටස් ද විමර්ශනය කිරීම<br>සංස්කෘත හා චීන මූලාශ්‍රය භාෂා පිළිබඳ දැනුමක් මෙහි ලා අනිවාර්ය නොවන නමුදු, මහායාන චින්තනය හා සම්බන්ධ පාරිභාෂික ශබ්දමාලාව පිළිබඳ හුරුව ප්‍රයෝජනවත් වේ. |
| කාලසීමාව | පැය 30 |
| ඉගැන්වීමේ ක්‍රමය | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| ඇගයීම් ක්‍රමය | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගිත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| අපේක්ෂිත ඉගෙනුම් ඵල | නිකාය සහ ආගම ග්‍රන්ථ ඇසුරෙන් මහායානයෙහි ප්‍රභවයට තුඩුදුන් හේතු පැහැදිලි කිරීමටත්, පැරණි මහායාන සූත්‍ර හා සබැඳි පූර්ව මහායාන සම්ප්‍රදාය සහ මහායාන සංකල්ප විස්තර කිරීමටත් ශිෂ්‍යයා සමත් වීම |
| නිර්දේශිත ග්‍රන්ථ | එලියට්, සර් චාර්ල්ස් (1967). *හින්දුසමය හා බුදුසමයඃ ඓතිහාසික සටහනක්.* (II කාණ්ඩය) කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.<br>තෝමස්, ඊ. ජේ. (1966). *බෞද්ධ චින්තාවේ ඉතිහාසය.* (සිංහල පරිවර්තනයඃ කරුණා සේනානායක). දෙහිවලඃ බී. සී. සී ප්‍රකාශන.<br>රාධාක්‍රිෂ්ණන්, එස්. (1970). *ඉන්දීය දර්ශනය* (I කාණ්ඩය). කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.<br>සාසනරතන හිමි, මොරටුවේ (1970). *මාධ්‍යමික දර්ශනය* (කාණ්ඩ i හා ii). කොළඹ.<br>Conze, E. (1978). *The Prajñāpāramitā Literature (2nd* Edition). Tokyo: Reiyukai.<br>______, (1958). tr. *Aṣṭasāhasrikā Prajñāpāramitā* Bibliothica Varanasi: Indica Books.<br>Dayal, Har. (1975). *The Bodhisattva Doctrine in Buddhist Sanskit Literature.* Delhi( Motilal Banarsidass. |

Dutt, N. (1930). *Aspects of Mahayana Buddhism and its relation to Hinayana'* Delhi: Munshiram Manoharlal Sanskrit and Hindi Book Sellers.

Kimura, R. (1927). *A Historical Study of the Terms Hinaydna and Mahayana and the Origin of Mahayana Buddhism.* Calcutta: University of Culcutta.

Nakamura, H. (1957). *'Historicat Studies on the Coming into Existence of Mahayana Sutras.* Bulletin of the Okuvayala Oriental Research Institute, No. 2.

Soothill, W.E. (1925). *The Lotus of the Wonderful Law or the Lotus Gospel.* (Second Edition). London: Routledge/Curzon.

Warder, K. (1982). *Indian Buddhism.* (Third Edition). New Delhi: Motilal Banarsidass.

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABS 07** |
| **විෂය ඒකකය** | **මූලමධ්‍යමකකාරිකාවෙන් පිළිබිඹු වන නාගාර්ජුන ආචාර්යපාදයන්ගේ දර්ශනය** |
| **අරමුණ** | ප්‍රාථමික මූලාශ්‍රය ආශ්‍රයෙන් නාගාර්ජුනපාදයන්ගේ දර්ශනය අධ්‍යයනය කිරීම |
| **අන්තර්ගතය** | ආචාර්ය නාගාර්ජුනපාදයෝ සාමාන්‍යයෙන් මහායානිකයෙකු ලෙස සැලකේ. උන්වහන්සේ මහායානයේ ආරම්භකයා ලෙස ඉන්දියාවේ සැලකෙන අතර චීනයේ දී අටවැදෑරුම් මහායාන සම්ප්‍රදායයන්හි ප්‍රමුඛ ආචාර්යවරයා ලෙස සම්මානයට පාත්‍ර වෙති. දැනට චීන පරිවර්තනවල සුරක්ෂිත ව පවත්නා කෘති රාශියක් එතුමන් විසින් කරන ලදැයි සැලකෙන අතර, එම කෘතීන් අතරින් විශේෂයෙන් මහාප්‍රඥාපාරමිතාශාස්ත්‍රය, බෝධි සත්ත්වවරයකුගේ පරහිතකාමීත්වය ආදී කෘති බෞද්ධ තේමාවන් මුල් කොට ගෙන රචිත ය. ඒ අනුව නූතන විද්වතුන් බොහෝ දෙනෙකු විසින් උන්වහන්සේ ශ්‍රේෂ්ඨ මහායාන අර්ථවිචාරකයෙකු ලෙස පිළිගනු ලැබෙත්. කෙසේ වෙතත්, ඇතැම් නූතන පර්යේෂකයින් විසින් උන්වහන්සේ විසින් කරන ලදැයි සැලකෙන මහාප්‍රඥාපාරමිතාශාස්ත්‍රයෙහි සහ වෙනත් කෘතිවල කර්තෘත්වය පිළිබඳ ව සැක පහළ කර ඇත. විශේෂයෙන් ඒ. කේ. වෝර්ඩර් පඬිතුමා නාගාර්ජුනපාදයන් සැබැවින් ම මහායානිකයකු දැයි ප්‍රශ්න කර ඇත. නාගාර්ජුන පාදයන් විසින් රචිත යැයි අවිවාදයෙන් පිළිගනු ලබන මූලමධ්‍යමකකාරිකාව පිළිබඳ තියුණු අධ්‍යයනයක් මගින් එතුමන්ගේ මූලික දාර්ශනික ස්ථාවරය අනාවරණය කර ගැනීම මෙම පාඨමාලාවෙහි අරමුණ වේ. ප්‍රස්තුත ග්‍රන්ථය ඒ පිළිබඳ පැරණි අට්ඨකථා ද උපයෝගී කර ගනිමින් පරිච්ඡේදයක් පාසා ගැඹුරින් සහ විචාරාත්මක ව අධ්‍යයන කිරීමෙන් ආචාර්ය නාගාර්ජුනපාදයන්ගේ සැබෑ ස්ථාවරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ශිෂ්‍යයන්ට ලබා ගැනීමට හැකි වනු ඇත. |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, සාකච්ඡා හා පැවරුම් |
| **ඇගයීම් ක්‍රමය** | ■ පැවරුම් දෙකක්<br>■ පන්ති සහභාගිත්වය<br>■ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | නාගාර්ජුනපාදයන්ගේ කෘති හඳුනා ගැනීමටත්, උන්වහන්සේගේ දාර්ශනික ස්ථාවරය, මූලික සංකල්ප හා ශුන්‍යතා දර්ශනය පැහැදිලි කිරීමටත් ශිෂ්‍යයින්ට හැකි වීම |
| නිර්දේශිත ග්‍රන්ථ | ගල්මංගොඩ, සුමනපාල (2007). *ආදි බෞද්ධ දර්ශනය.* දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.<br>තිලකරත්න, අසංග (2008). *මිනිස් ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය.* දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.<br>නිශ්ශංක, එච්. එස්. එස්. (2007). *බෞද්ධ මනෝචිකිත්සාව* (සිවුවන මුද්‍රණය). කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.<br>ප්‍රඥාකීර්ති හිමි, කොටහේනේ. (1950). *ආගම හා සමාජය.* කැළණිය: විද්‍යාලංකාර පිරිවෙණ.<br>හෙට්ටිආරච්චි, ධර්මසේන (2006). *බෞද්ධ මනෝවිද්‍යා ප්‍රවේශය.* මරදාන: දයාවංශ ජයකොඩි සහ සමාගම.<br>_______, (2001). *බෞද්ධ සමාජවිද්‍යා ප්‍රවේශය.* කොළඹ: ගොඩගේ ප්‍රකාශන.<br>Abenayake, O. (1995). *Fundamentals of Buddhist Polity*. Singapore: Ti-Sarana Buddhist Association.<br>Callicott, J. Baird, Ames Roger T. (1991). *Nature in Asian Traditions of Thought*. Essays in Environmental Philosophy. New York: State University Press.<br>Cakravarti, Uma (1987). *The Social Dimensions of Early Buddhism.* Delhi. Munshiram Manoharlal Publisher. |

De Silva, Padmasiri (1998). *Environmental Philosophy and Ethics in Buddhism*. Great Britain: Macmillan press.

Dhammavihari Ven. (1990). *A Correct Vision and Life Sublime*. Riverhead Books.

Hettiaracchi, Dharmasena (2001). *Buddhist Economic Philosophy*. Colombo: Educational Publication Department.

Jayatilake, K. N. (1969). *Aspects of Buddhist Social Philosophy*. Kandy: Buddhist Publication Society.

Jayatilake, K. N., Malalasekara G.P. (1958). *Buddhism and the Race Question*, Paris: Unesco.

Keown Damien (2001). *Buddhism and Bioethics*. London: Palgrave Macmillan.

| | |
|---|---|
| විෂය සංකේතය | **MABC 03** |
| විෂය ඒකකය | බෞද්ධ මනෝචිකිත්සාව |
| අරමුණ | පාලි බුදුසමයාගත මනෝචිකිත්සාවේ ස්වභාවය හා මනෝචිකිත්සාමය ප්‍රවේශ හඳුන්වා දීම |
| අන්තර්ගතය | i. බෞද්ධ මනෝචිකිත්සාව හා අපරදිග මනෝචිකිත්සාව - හැඳින්වීම<br>ii. බෞද්ධ චිකිත්සා සංකල්පය<br>iii. කායික චිකිත්සා පිළිබඳ බෞද්ධ විග්‍රහය<br>iv. මානසික චිකිත්සා පිළිබඳ බෞද්ධ විග්‍රහය<br>v. සීලය හා චර්යාත්මක චිකිත්සාව<br>vi. සමාධිය හා මනෝචිකිත්සාව<br>vii. ප්‍රඥාව හා ප්‍රජානන චිකිත්සාව |
| ඉගැන්වීමේ ක්‍රමය | දේශන, පැවරුම් හා වැඩමුළු |
| ඇගයීම් ක්‍රමය | ▪ අඛණ්ඩ ඇගයීම්<br>▪ වාචික පරීක්ෂණය<br>▪ පන්ති සහභාගීත්වය<br>▪ වර්ෂාවසාන පරීක්ෂණය |
| අපේක්ෂිත ඉගෙනුම් ඵල | අපරදිග මනෝචිකිත්සාව හා බෞද්ධ මනෝචිකිත්සාව අතර පවතින සම විෂමතා හඳුනා ගැනීම |
| නිර්දේශිත ග්‍රන්ථ | පාලි සාහිත්‍යයට අයත් තෝරා ගත් මූලාශ්‍රය<br>ගල්මංගොඩ, සුමනපාල (2007). *ආදි බෞද්ධ දර්ශනය.* දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.<br>____________, (2003). *ආයුර්වේද අධ්‍යයන.* පැපිලියාන: ඉසුරු ප්‍රින්ටර්ස්.<br>____________, (2006). *බෞද්ධ භාවනාක්‍රම හා මනෝචිකිත්සාව.* දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.<br>නිශ්ශංක, එච්. එස්. එස්. (2007). *බෞද්ධ මනෝචිකිත්සාව* (සිවුවන මුද්‍රණය). කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.<br>හෙට්ටිආරච්චි, ධර්මසේන (2006). *බෞද්ධ මනෝවිද්‍යා ප්‍රවේශය.* මරදාන: දයාවංශ ජයකොඩි සහ සමාගම.<br>Bodhi, Bhikkhu (ed.) (1999). *A Comprehensive Manual of Abhidhamma*, Kandy: BPS.<br>Galmangoda, Sumanapala (2005). *Buddhist Social Philosophy and Ethics*. Singapore.<br>Harischandra, D. V. J. (1998). *Psychiatric Aspects of Jataka Stories.* Galle.<br>Hall, Manly P. (1979). *Buddhism and Psychotherapy: The Healing of Heart Doctrine*. Los Angeles: The Philosophical Research Society.<br>Kawal, Hayao. (1996). *Buddhism and the Art of Psychotherapy*, USA: Texas A & M University Press.<br>Magid, Barry (2002). *Ordinary Mind: Exploring the common ground of Zen and Psychotherapy*. Boston: Wisdom Publications.<br>Nissanka, H.S.S. (1993). *Buddhist Psychotherapy*. Dehiwela: Buddhist cultural centre. |

| | |
|---|---|
| විෂය සංකේතය | **MABC 04** |
| විෂය ඒකකය | ආයුර්වේදීය මානසික රෝග නිධාන |
| අරමුණ | මානසික රෝග හටගැනීම විෂයයෙහි බලපාන රෝගකාරක සහ මානසික රෝග පිළිබඳ ආයුර්වේදීය විග්‍රහය |
| අන්තර්ගතයː | i. ආයුර්වේදයෙහි දැක්වෙන මානසික රෝග ප්‍රභේද, පංච උන්මාද සහ සප්ත උන්මාද පිළිබඳ හේතු, සම්ප්‍රාප්ති හා ලක්ෂණ<br>ii. ග්‍රහ ආවේෂ, භූතජ උන්මාද ඇතුළු වෙනත් මානසික රෝග අවස්ථා පිළිබඳ පැහැදිලි කිරීම හා ඒවායේ ලක්ෂණ<br>iii. අපස්මාර, සූතිකා උන්මාද, කෝල සන්නි, දාහ, මූර්ඡා, මද, සන්‍යාසද, ආක්ෂේප හා වාත රෝග ප්‍රභේද යන උන්මාද රෝග නිර්ණයේ දී සැලකිය යුතු රෝග තත්ත්ව පිළිබඳ අධ්‍යයනය<br>iv. මානසිකරෝග සම්බන්ධ පථ්‍යාපථ්‍ය, උපශය අනුපශය විධි හා සාධ්‍ය අසාධ්‍යතා පිළිබඳ කරුණු අධ්‍යයනය<br>v. මානසිකරෝග සහ සද්වෘත්ත, වෛද්‍යවෘත්ත<br>vi. විසිවැදෑරුම් දේශීය උමතු රෝගයන්ගේ හේතු ලක්ෂණ අධ්‍යයනය ප්‍රායෝගික වශයෙන් - රෝහල්ගත රෝගීන් අධ්‍යයනය සහ සායනවල කටයුතු කිරීම |
| ඉගැන්වීමේ ක්‍රමය | දේශන, පැවරුම් හා වැඩමුළු |
| ඇගයීම් ක්‍රමය | ▪ අඛණ්ඩ ඇගයීම්<br>▪ වාචික පරීක්ෂණය<br>▪ පන්ති සහභාගීත්වය<br>▪ වර්ෂාවසාන පරීක්ෂණය |
| අපේක්ෂිත ඉගෙනුම් ඵල | ආයුර්වේදයෙහි විග්‍රහ වන මනෝරෝග කාරක හා විවිධ මානසික රෝග විස්තර කිරීමේ හැකියාව |
| නිර්දේශිත ග්‍රන්ථ | *චරකසංහිතාව; සුශ්‍රැතසංහිතාව; අෂ්ටාංගහෘදයසංහිතාව* :- නිර්දේශිත කොටස්<br>*පණ්ඩිත ආර්යදාස කුමාරසිංහ (1994). මාධවනිධානය. කොළඹː ආයුර්වේද දෙපාර්තමේන්තුව.*<br>කරුණාරත්න ඩබ්. එස්. සහ වෙනත් අය (සංස්.) (1968) වික්‍රමාරච්චි අභිනන්දන ග්‍රන්ථය. ගම්පහː<br>ධර්මකීර්ති නාහිමි, විලේගොඩ (2006), *හෙසජ්ජමඤ්ජුසා.* කොළඹː කමල් ඇඹුල්දෙනිය.<br>පද්මබන්දු, ඇම්. කේ. (1955). *ත්‍රිදෝෂ තත්ව විවරණය.* කැලණියː<br>විසුද්ධාලෝක හිමි, බලපිටියේ (1983). *විසුද්ධිමග්ග.* කොළඹː ගුණසේන ප්‍රකාශන.<br>Bodhi, Bhikkhu (ed.) (1999). *A Comprehensive Manual of Abhidhamma*, Bodhi, Bhikkhu (ed.) (1999). *A Comprehensive Manual of Abhidhamma.* Kandy: BPS.<br>Dash, Vaidya Bhagwan (1980). *Basic Principles of Ayurveda*. New delhi: Concept Publishing Company Pvt. Ltd.<br>_____, (1980). *Five Specialized Therapies in Ayurveda.* New Delhi: Concept Publishing Company Pvt. Ltd.<br>_____, (1966). *Diagnosis and Treatment of Diseases in Ayurveda*, Parts i-v, New Delhi: Concept Publishing Company Pvt. Ltd. |

MABC

Frawley, David (1992). *Ayurvedic Healing*. Wisconsin: Lotus press.

Harischandra, D. V. J. (1998). *Psychiatric Aspects of Jataka Stories.* Galle: S.N. Publisher.

Jayatilake, K. N. (1963). *Early Buddhist Theory of Knowedge*. London: Allen and Unwin Ltd.

Krishnamurthy, K. H. (1991). *A Source Book of Indian Medicine, An Anthology*. Delhi: B.R. Publishing Corporation.

Shepard, D. L. (1977). *Psychology: The Science of Human Behaviour.* USA: Science Research Associates, Inc.

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABC 05** |
| **විෂය ඒකකය** | **ආයුර්වේදීය මානසික රෝග චිකිත්සා** |
| **අරමුණ** | ආයුර්වේදයෙහි විග්‍රහ වන මනෝරෝග චිකිත්සක ක්‍රම හඳුන්වා දීම |
| **අන්තර්ගතය** | i. බුද්ධි වර්ධක, මේධාකර, ස්මෘති වර්ධක, ශෝධන හා ශමන ආදී මානසිකරෝග විෂයයෙහි යෙදෙන ද්‍රව්‍ය පිළිබඳ නාමරූප, ගුණකම් හා ප්‍රයෝග විඥානය අධ්‍යයනය<br>ii. ද්‍රව්‍යග්‍රහණ පරිභාෂා හා ඖෂධ සංකරණ විධි<br>iii. මානසික රෝග චිකිත්සා මූලධර්ම, ශාරීරික හා මානසික දෝෂයන්ගේ ශෝධන ශමන උපාය මාර්ග<br>iv. අදෘෂ්ට භූත චිකිත්සා, භූත වෛද්‍ය උපක්‍රම<br>v. විසිවැදෑරුම් උමතු රෝග ශමනයෙහි ලා භාවිත වන දේශීය ප්‍රතිකාර<br>vi. මානසික රෝග හා රෝග ශමනය පිළිබඳ වැදගත් ප්‍රාථමික මූලාශ්‍රය |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පැවරුම් හා වැඩමුළු |
| **ඇගයීම් ක්‍රමය** | ▪ අඛණ්ඩ ඇගයීම්<br>▪ වාචික පරීක්ෂණය<br>▪ පන්ති සහභාගීත්වය<br>▪ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | විද්‍යාර්ථියා මානසිකරෝග ශමනය විෂයයෙහි කායික විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක චිකිත්සක ක්‍රම වෙන් වෙන් ව හඳුනා ගෙන විස්තර කිරීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | *චරකසංහිතාව* :- නිර්දේශිත කොටස්<br>*සුශ්‍රුතසංහිතාව* :- නිර්දේශත කොටස්<br>*අෂ්ටාංගහෘදයසංහිතාව* :- නිර්දේශිත කොටස්<br>ආරියවංශ, එච්. ඒ. එස්. (2007). *පංචකර්ම විඥානය.* මරදාන: ගොඩගේ සහ සහෝදරයෝ.<br>කුමාරසිංහ, ආරියදාස (1984). *ශ්‍රී ලංකා දේශීය චිකිත්සා සංග්‍රහය.* (ප්‍රථම මුද්‍රණය) කොළඹ: ආයුර්වේද දෙපාර්තමේන්තුව.<br>ධර්මකීර්ති නාහිමි, විලේගොඩ (සංස්.) (1967). *භේසජ්ජමඤ්ජුසා.* ඇල්පිටිය:<br>වෛද්‍ය රාජේශ්වර් දත්ත, ශාස්ත්‍රී (සංස්.) (1976). *ස්වස්ථවෘත්තසමුච්චය.* බරණැස.<br>සද්ධාතිස්ස හිමි, බී. (සංස්.) (1914). *විසුද්ධිමග්ග.* කොළඹ:<br>Dash, Vidya Bhagwan (2004). *Massage Therapy in Ayurveda*. New Delhi: Concept Publishing Company.<br>______, (1999). *Fundamentals of Ayurvedic Medicine*. delhi: Satguru Publication.<br>Dash, Vaidya Bhagwan V. (1983). *A Hand Book of Ayurveda.* Delhi: Chaukhambha Publications.<br>Frawley, David, (1992). *Ayurvedic Healing*. Delhi: Lotus Press.<br>Harischandra, D. V. J. (1998). *Psychiatric Aspects of Jataka Stories*. Galle: S.N. Publisher.<br>Krishnamurthy. K. H. (1991). *A source Book of Indian Medicine: An anthology*. (1st Edition). Delhi: B.R. Publishing Corporation.<br>Thakr, B. J.(1989), *Methodology and Research in Ayurveda*. India. |

MABC

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABC 06** |
| **විෂය ඒකකය** | **උපදේශන විෂයයෙහි අදාළ බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනය** |
| **අරමුණ** | තෝරා ගනු ලැබූ මුල් බුදුසමයාගත සූත්‍ර, අටුවා මෙන් ම ජාතක කථා කෙරෙහි අවධානය යොමු කරමින්, විවිධ පෞරුෂ ව්‍යාබාධ, මානසික රෝග හා අසාමාන්‍ය චර්යා විවිධත්වය ද එම ගැටලු නිරාකරණයෙහි ලා භාවිත විවිධ බෞද්ධ උපදේශන ක්‍රම ද හඳුනා ගැනීම |
| **අන්තර්ගතය** | රෝග, සල්ලේඛ, වත්ථූපම, සල්ල, සුනක්ඛත්ත, සොකසල්ලහරණ, පියජාතික, අලබ්භනීයඨාන යනාදී සූත්‍ර හා එම අටුවා අනුසාරයෙන් විවිධ පෞරුෂ ව්‍යාබාධ, අසාමාන්‍ය චර්යා හා විවිධ මානසික ගැටලු පිළිබඳ බෞද්ධ විවරණය හඳුනා ගැනීම; තවදුරටත් තෝරාගත් ජාතක කථා කෙරෙහි අවධානය යොමු කරමින් මෙම පෞරුෂ ව්‍යාබාධ, අසාමාන්‍ය චර්යා සහ මානසික ගැටලුවල විවිධ ලක්ෂණ හඳුනා ගැනීම; විශේෂයෙන් ම සූත්‍ර, අටුවා සහ ජාතක කථා ඉස්මතු කොට දක්වන මනෝ ගැටලු ප්‍රතිකාරමය ප්‍රවේශ හා න්‍යාය අධ්‍යයනය කිරීම |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පැවරුම් හා වැඩමුළු |
| **ඇගයීම් ක්‍රමය** | ▪ අඛණ්ඩ ඇගයීම්<br>▪ වාචික පරීක්ෂණය<br>▪ පන්ති සහභාගීත්වය<br>▪ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | මෙම විෂය ඒකකය අධ්‍යයනය කරනු ලබන විද්‍යාර්ථියාට බෞද්ධ මූලාශ්‍රය තුළ විවරණය කරනු ලබන විවිධ පෞරුෂ ව්‍යාබාධ, අසාමාන්‍ය චර්යා, මානසික ගැටලු හා එම ගැටලු නිරාකරණයෙහි ලා භාවිතයට ගත හැකි ප්‍රතිකාරමය ප්‍රවේශ හඳුනා ගැනීමට හැකි වීම |
| **නිර්දේශිත ග්‍රන්ථ** | |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABC 07** |
| **විෂය ඒකකය** | **මනෝකායික සුවතාව පිළිබඳ බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනය** |
| **අරමුණ** | බෞද්ධායුර්වේද රෝග නිවාරණය සහ චිකිත්සා විධි අධ්‍යයනය |
| **අන්තර්ගතය** | i. චුල්ලවග්ගපාළි: වත්තක්ඛන්ධකය<br>ii. මහාවග්ගපාළි: භෙසජ්ජක්ඛන්ධකය<br>iii. විසුද්ධිමග්ග: කම්මට්ඨානගහණ නිද්දේස<br>iv. භෙසජ්ජමඤ්ජුසා: තෝරා ගත් කොටස් කෙරෙහි අවධානය යොමු කිරීම |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පැවරුම් හා වැඩමුළු |
| **ඇගයීම් ක්‍රමය** | ▪ අඛණ්ඩ ඇගයීම්<br>▪ වාචික පරීක්ෂණය<br>▪ පන්ති සහභාගීත්වය<br>▪ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | ප්‍රතිකාර නිර්දේශ කිරීමට වඩා රෝග වළක්වා ගැනීම කෙරෙහි පුද්ගලයා පෙළඹවීමට බෞද්ධායුර්වේදය උත්සුක වන බව සහ මානසික නිරෝගීකම උදෙසා ඍජුව කායික සෞඛ්‍ය සම්බන්ධ වන ආකාරය වටහා ගැනීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | *චුල්ලවග්ගපාළි (2 කාණ්ඩය)* (සංස්. බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහානායක ස්ථවිර හා උඩුවේ ජනානන්ද ස්ථවිර) (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 5 (II). කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව.(335-423 පිටු).<br>*මහාවග්ගපාළි (ද්විතීයභාගය)* (සංස්. අම්බලංගොඩ ධම්මකුසල ස්ථවිර) (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 4. කොළඹ: ශ්‍රී ලංකා ආණ්ඩුව.(520-623 පිටු).<br>*විසුද්ධිමග්ගො* (සංස්. පමුණුවේ බුද්ධදත්ත ථෙර). (1919). කොළඹ: සයිමන් හේවාවිතාරණ. (63-87 පිටු).<br>*විස්තරාර්ථ සන්න සහිත විසුද්ධිමාර්ගය* (2008). නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.<br>ධම්මානන්ද මහාස්ථවිර විලේගොඩ. (1967). *භේසජ්ජමඤ්ජුසා නූතන සන්නය.* කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.<br>*Bhesajjamañjusā* (ed. Jinadasa Liyanaratne) (1996). Oxford: Pali Text Society.<br>*The Book of the Discipline V* (tr. I. B. Horner). (1963). London: Luzac and Company Ltd. (281-329).<br>*The Book of the Discipline IV* (tr. I. B. Horner). (1971). London: Luzac and Company Ltd. (81-87).<br>*The Path of Purification (Visuddhimagga)* (tr. Bhikkhu Ñanamoli). (2010 edition). Kandy: Buddhist Publication Society. (269-350). |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABC 08** |
| **විෂය ඒකකය** | **බෞද්ධ භාවනාව II (චිකිත්සාමය භාවිතය)** |
| **අරමුණ** | බෞද්ධ භාවනාවේ මනෝරෝග චිකිත්සාමය වටිනාකම, පාලි මූලාශ්‍රය හා නූතන භාවනා ප්‍රතිකාර ඇසුරින් පැහැදිලි කිරීම |
| **අන්තර්ගතය** | පාලි මූලාශ්‍රය ඇසුරින් සාකච්ඡා කෙරෙන මානසික ගැටලු (දෝමනස්ස, උපායාස, පරිළාහ, උපාදාන, විපල්ලාස, වික්ඛිත්තචිත්ත, සංඛිත්තචිත්ත, බ්‍යාපන්නචිත්ත) සහ නූතන මනෝ චිකිත්සාව අවධානය යොමු කරන ආතතිය (stress), කාංසාව (anxiety), විෂාදය (depression) බඳු මානසික රෝග සුවපත් කිරීම විෂයයෙහි බෞද්ධ භාවනාවේ අදාළතාව;<br>නූතන මනෝ ගැටලු චිකිත්සාමය ප්‍රවේශ වන Rational Emotive Behavior Therapy (REBT), Acceptance and Commitment Therapy (ACT), Dialectical Behavioral Therapy (DBT), Morita Therapy (MT), Mindfulness Based Stress Reduction (MBSR), Mindfulness Based Cognitive Therapy (MBCT), Core Process Psychotherapy (CPP) ආදී භාවනාමය ප්‍රතිකාර ප්‍රවේශ මෙන් ම ඒ පිළිබඳ මේ වන විට ගොඩනැගී ඇති විවිධ මතවාද |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පැවරුම් හා වැඩමුළු |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | පාලි මූලාශ්‍රය විවරණ ඇසුරින් විවිධ මානසික ගැටලු හඳුනා ගැනීමට සමත් වේ. එම අවබෝධය නූතන මානසික ගැටලු සමග කෙතෙක් දුරට සම විෂම වන්නේද යන්න හඳුනා ගනී. මානසික ගැටලු විෂයයෙහි භාවනාව ප්‍රතිකාරයක් ලෙස භාවිත කිරීමට සුදුසු අවස්ථා සහ නුසුදුසු අවස්ථා තේරුම් ගැනීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | De Silva, Padmasiri (2014). *An Introduction to Buddhist Psychology and Counseling; Pathways of Mindfulness Based Therapies*. London: Palgrave Macmillan.<br>Dennis, Tirch (2015). *Buddhist Psychology and Cognitive Behavioral Therapy: A Clinician's Guide*, 1st Edition.<br>Espstein, Mark (2004). *Thoughts without a thinker: Psythotherapy from Buddhist Perspective*.<br>Jenny, Quek, (2007). *The Buddha's Technique and Practice of Counseling as Depicted in the Pali Cannon*, Singapore: KP Media Intedrnational pvt. Ltd.<br>Espstein, Mark, (2007). *Psychotherapy without the Self: A Buddhist Perspective*.<br>Galmangoda, Sumanapala, *An Introduction of the Methods of Meditation in the Theravada Tradition*. Singapore: Buddhist Research Society.<br>Goleman, D. (1976). '*Meditation and Consciousness, An Asian Approach to Mental Health*, American Journal of Psychotherapy, vol., 30 (1), (2002). |

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABC 09** |
| **විෂය ඒකකය** | **පර්යේෂණ ක්‍රමවේදය හා විස්තාරිත රචනය** |
| **අරමුණ** | පර්යේෂණ විධික්‍රම පිළිබඳ සහ ශාස්ත්‍රීය ලේඛනය පිළිබඳ මූලික දැනුම සහ කුසලතාව වර්ධනය කර ගැනීම පිණිස අවස්ථාව සැලසීම |
| **අන්තර්ගතය** | බෞද්ධ සාහිත්‍යමය මූලාශ්‍රය, පර්යේෂණයක මූලික ලක්ෂණ, මූලාශ්‍රය දැක්වීමේ ක්‍රම, පර්යේෂණ යෝජනාවක් සම්පාදනය කිරීම සහ ශාස්ත්‍රීය ලේඛනය යන කරුණු අධ්‍යයනය කිරීම; ආයතනය විසින් සංවිධානය කරනු ලබන වැඩමුළුවලට ශිෂ්‍යයින් සහභාගී විය යුතු වන අතර, එම වැඩමුළුවල දී දෙනු ලබන උපදෙස් සහ මාර්ගෝපදේශ අනුව පාඨමාලා ඒකකවලට අදාළ කිසියම් තේමාවක් යටතේ, ඔවුන් විසින් පර්යේෂණ යෝජනාවක් සහ වචන 5000කින් පමණ සමන්විත විස්තාරිත රචනයක් සම්පාදනය කළ යුතු ය. දෙවන වාරය අවසන් වීමට පෙර සියලු ම ශිෂ්‍යයින් ඔවුන්ගේ පර්යේෂණ යෝජනාව ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු ය. සම්පාදනය කරන ලද විස්තාරිත රචනය වර්ෂාවසාන පරීක්ෂණයේ අවසන් ප්‍රශ්න පත්‍රයට අදාළ පරීක්ෂණය පැවැත් වූ දින සිට දින 30ක් ඇතුළත ආයතනය වෙත භාර දිය යුතු ය. |
| **ඉගැන්වීමේ ක්‍රමය** | ඉගැන්වීමේ ක්‍රියා පිළිවෙත මෙසේය: |

| අදියර | පැවැත්වීමට අපේක්ෂිත කාලය | තේමාව |
|---|---|---|
| ප්‍රථම වැඩමුළුව | 2 වන වාරයේ 4 වන සතිය | බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රය සහ පර්යේෂණයක මූලික ලක්ෂණ |
| දෙවන වැඩමුළුව | 2 වන වාරයේ 9 වන සතිය | මූලාශ්‍රය දැක්වීමේ ක්‍රම, පර්යේෂණ යෝජනාවක් සම්පාදනය කිරීම සහ ශාස්ත්‍රීය ලේඛන සැකසීම |

- ශිෂ්‍යයින් විසින් ස්වකීය රචනයේ මාතෘකාව ඉදිරිපත් කළ යුතු කාලය: 2 වන වාරයේ 5 වන සතියට පෙර
- අනුමත/සංශෝධිත මාතෘකා කාර්යාලයෙන් ලබා ගැනීමේ කාලය: 2 වන වාරයේ 7 වැනි සතිය

| | | |
|---|---|---|
| **ඇගයීම් ක්‍රමය** | ▪ වැඩමුළු සඳහා සහභාගීත්වය | ලකුණු 10 |
| | ▪ පර්යේෂණ යෝජනාව සම්පාදනය කිරීම | ලකුණු 20 |
| | ▪ විස්තාරිත රචනය | ලකුණු 70 |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | ශිෂ්‍යයින් විසින් පර්යේෂණ ක්‍රම සහ විචාරශීලීබව ප්‍රදර්ශනය කරමින් ශාස්ත්‍රීය ලේඛනයෙහි කුසලතාව වර්ධනය කර ගැනීමේ හැකියාව | |

MABC

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABC 10** |
| **විෂය ඒකකය** | **සෞන්දර්ය හා මනෝ උපදේශනය - බෞද්ධ විශ්ලේෂණය හා අර්ථකථනය** |
| **අරමුණ** | පුද්ගල සංවර්ධනය මානසික සහනය උදෙසා බෞද්ධ සාහිත්‍ය සම්ප්‍රදායයෙහි මෙන් ම සංස්කෘතියෙහි ප්‍රකට වන සෞන්දර්යාත්මක මූලධර්ම අවබෝධ කොට ගෙන භාවිත කිරීම |
| **අන්තර්ගතය** | බෞද්ධ සම්ප්‍රදායයෙහි සෞන්දර්ය ඇගයීම හා භාවිතය; ආධ්‍යාත්මික සංවර්ධනය හා සෞන්දර්යය අතර සම්බන්ධය; විවේකය හා මානසික සුවය; නිර්මාණශීලී භාවය; කලා නිර්මාණ හා මානසික සංවර්ධනය; සාහිත්‍ය කලාව හා රසඥතාව; ස්වභාව සෞන්දර්යය ඇගයීම; තීර්ථයාත්‍රා හා වන්දනා; පූජාචාරිත්‍රවල සෞන්දර්යය හා මනෝඋපදේශනාත්මක පැතිකඩ; හාස, පීති, පමෝද සංකල්ප; බෞද්ධ දෘශ්‍යකලා; මානසික සුවය උදෙසා බෞද්ධ චිත්‍රකලාව භාවිතය; නච්ච, ගීත, වාදිත පිළිබඳ බෞද්ධ අර්ථකථන අවබෝධ කොට ගැනීම; පද්‍ය නිර්මාණය හා ගායනය, අන්තර්පුද්ගල සබඳතා හා මානසික සුවතාව, ආධ්‍යාත්මික සංවර්ධනය හා සෞන්දර්යය |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පැවරුම් හා වැඩමුළු |
| **ඇගයීම් ක්‍රමය** | ▪ අඛණ්ඩ ඇගයීම්<br>▪ වාචික පරීක්ෂණය<br>▪ පන්ති සහභාගීත්වය<br>▪ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | පුද්ගල සංවර්ධනය මානසික සහනය උදෙසා බෞද්ධ සාහිත්‍ය සම්ප්‍රදායයෙහි මෙන් ම සංස්කෘතියෙහි ප්‍රකට වන සෞන්දර්යාත්මක මූලධර්ම තේරුම් ගැනීමේ හැකියාව |
| **නිර්දේශිත ග්‍රන්ථ** | බස්නායක, එච්. ටී. (2002). *ඉන්දියාවේ බෞද්ධ කලා ශිල්ප*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ: මරදාන.<br>වික්‍රමසිංහ, මාර්ටින්. (2016 - 08 වැනි මුද්‍රණය), *සාහිත්‍ය කලාව*. රාජගිරිය: සරස.<br>වික්‍රමසිංහ, මාර්ටින්. (2008 - 03 වැනි මුද්‍රණය), *රසවාදය හා බෞද්ධ කාව්‍යය*. රාජගිරිය: සරස.<br>විජේරත්න, බී. එස්. (1951). *ලංකා චිත්‍ර කලා ඉතිහාසය*. කොළඹ: ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.<br>විමලඤාණ හිමි, මිරිස්වත්තේ (2018). "බෞද්ධ කලාවෙහි නිරූපිත ජාතක". *නිවන්මග, ජාතක සාහිත්‍යය*. කොළඹ: රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය.<br>විමලඤාණ හිමි, මිරිස්වත්තේ (2006). "විසුද්ධිමග්ග ටීකාවේ අනුප්‍රාස භාවිතය සහ බෞද්ධ සාහිත්‍යාගත ව්‍යඤ්ජනාර්ථ පද විග්‍රහය පිළිබඳ සංක්ෂිප්ත විමර්ශනයක්" *අන්වේෂණා*. කොහුවල: කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය. |

Foucher, A (n.b.), *The Beginnings of Buddhist Art and Other Essays in Indian and Central Asian Archaeology*. New Delhi: Asian Education Services.

Inada, Kenneth K. (1994). “The Buddhist Aesthetic Nature". *Asian Philosophy* (Vol. 4, No. 2).

Mead, Hunter. (1952). *An Introduction to Aesthetics*. New York: The Ronald Press Company.

Marshall, Sir, John (1927). *The Caves of Bhag: The Bhag Caves in the Gawalior State*. London: The India Society.

Pande, Anupama (2008). —Ethical Teachings of *Jatakas*, Avadanas and Early Buddhist Literature, *Buddhist Ethics Symposium Volume*, (of IABU summit at Mahachulalonkhorn Rajavidyalaya University: Bangkok.

Sangharakshita (1953). *The Religion of Art*. Cambridge: Windhorse Publications.

Sanyal, Narayan (1984). *Immortal Ajanta*. Calcutta: Bharati Book Stall.

MABC

| | |
|---|---|
| **විෂය සංකේතය** | **MABC 11** |
| **විෂය නාමය** | **මානුෂ මනෝවිද්‍යාව, බුදුසමය හා සුවතාව** |
| **අරමුණ** | පුද්ගල සුවතාව වර්ධනයෙහි ලා බුදුසමයාගත ඉගැන්වීම්හි අන්තර්ගත මානුෂවාදී උපදේශනාත්මක මූලධර්ම නූතන මානුෂවාදී මනෝවිද්‍යාත්මක ඉගැන්වීම් සමග සංසන්දනාත්මක ව හඳුනා ගැනීම |
| **අන්තර්ගතය** | මානුෂ මනෝවිද්‍යාවෙහි ඉතිහාසය තේරුම් ගැනීම; ඒබ්‍රහම් මාස්ලෝ එරික්ෆ්‍රොම්, කාල්රොජස් යන මානුෂවාදී මනෝවිද්‍යාඥයින්ගේ මූලික ඉගැන්වීම්; මනුෂ්‍ය ස්වභාවය සම්බන්ධයෙන් බුදුසමයෙහි සහ මානුෂවාදී මනෝවිද්‍යාවේ දැක්ම - ඒ අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකරනු ලැබේ. මානව අවශ්‍යතා, මානව ශක්‍යතා, ජීවිතයෙහි අර්ථය, ආත්මාවබෝධය, ආත්ම ප්‍රතිග්‍රහණය, ආත්ම සාක්ෂාත්කරණය, පුරුෂාර්ථ, ස්වඡන්දතාව, සමස්ත පෞරුෂය, සෞඛ්‍යය, යහපත, පරිපූර්ණත්වය, පෞරුෂ සාධනය, වේදනාව, දුක සහ සුවසහනය |
| **කාලසීමාව** | පැය 30 |
| **ඉගැන්වීමේ ක්‍රමය** | දේශන, පැවරුම් හා වැඩමුළු |
| **ඇගයීම් ක්‍රමය** | ▪ පැවරුම්<br>▪ පන්ති සහභාගිත්වය<br>▪ වර්ෂාවසාන පරීක්ෂණය |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵල** | බුදුසමය හා නූතන මානුෂවාදී මනෝවිද්‍යාව සාකච්ඡා කරනු ලබන මානව ශක්‍යතාවන්හි අන්තර්ගත රෝග නිවාරණ හැකියාව නූතන මානසික හා කායික ගැටලු නිරාකරණයෙහි ලා භාවිතයට ගැනීම පිළිබඳ මෙම විෂය ඒකකය අවසානයේ ශිෂ්‍යයන්ට හැකියාව ලැබීම |
| **නිර්දේශිත ග්‍රන්ථ** | හපුආරච්චි, ගාමිණී (2010). *මනෝවිද්‍යාව න්‍යාය හා භාවිතය.* දෙහිවල: වත්මා ප්‍රකාශකයෝ.<br>අබේපාල, රෝලන්ඩ් (2010). *සාංදෘෂ්ටික හා මානුෂික මනෝවිද්‍යා ප්‍රවේශය.* කොට්ටාව: සාර ප්‍රකාශන.<br>පද්මසිරි හිමි, රළුවේ (2006). *ශෙන් බුදුසමය හා මනෝවිශ්ලේෂණවාදය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.<br>Child, Irvin. L. (1915). *Humanistic Psychology and The Research Tradition: Their Several Virtues*. London.<br>Schneider, K.J., Pierson, J.F., Bugental, J.F.T. (ed), (2018). *The Handbook of Humanistic Psychology: Theory, Research and Practice*. Los Angeles: Sage Publications Ltd.<br>House, Richard., Kalisch, David., Maidman, Jennifer. (ed), (2018). *Humanistic Psychology: Current Trends and Future Prospects*. London: Routledge.<br>Fromm, Eric (2013). *Psychoanalysis and Zen Buddhism*. New York: Open Road Media.<br>_____, (1950). *Psychoanalysis and Religion*. New Haven: Yale University Press. |

බෞද්ධ උපදේශන වැඩමුළුව - මීතිරිගල







# වැඩමුළු හා දේශන











# 03. පර්යේෂණ උපාධි

## උසස් උපාධි පාඨමාලා

පහත සඳහන් පර්යේෂණ උපාධි සඳහා විද්‍යාර්ථීන්ට ආයතනයෙහි ලියාපදිංචි විය හැකි ය.

03.1 ශාස්ත්‍රපති (Master of Arts) උපාධිය (දෑවුරුදු) (පාලි හා බෞද්ධ අධ්‍යයනය)

03.2 දර්ශනපති (Master of Philosophy) උපාධිය සහ දර්ශන විශාරද (Doctor of Philosophy) උපාධිය

## 03.1 ශාස්ත්‍රපති (Master of Arts) උපාධිය (දෑවුරුදු) (පාලි හා බෞද්ධ අධ්‍යයනය)

### 03.1.1 හැඳින්වීම

මෙම දෑවුරුදු උපාධි පාඨමාලාව විෂයපත්‍ර හැදෑරීම සහ නිබන්ධයක් සම්පාදනය කිරීම යන කොටස් දෙකකින් සමන්විත වෙයි. පාඨමාලාවට අදාළ විෂයපත්‍ර හැදෑරීම ප්‍රථම වර්ෂයේ දී සම්පූර්ණ කළ යුතු වන අතර ඊට අනුගාමී දෙවැනි වර්ෂයේ දී නිබන්ධය සම්පාදනය කොට ඉදිරිපත් කළ යුතු වේ. පාඨමාලාවේ කාර්යය පාලි අධ්‍යයන එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MAPL) හා බෞද්ධ අධ්‍යයන එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MABS) ට සමගාමී ව පවත්වනු ලැබේ. පාලි අධ්‍යයන දෑවුරුදු ශාස්ත්‍රපති උපාධිය සඳහා ලියාපදිංචි වී සිටින විද්‍යාර්ථීන් MAPL 06 (I කොටස) ඇතුළු ව විෂය ඒකක අටක් සම්පූර්ණ කළ යුතු අතර බෞද්ධ අධ්‍යයන දෑවුරුදු ශාස්ත්‍රපති උපාධිය සඳහා ලියාපදිංචි වී සිටින විද්‍යාර්ථීන් MABS 01 සහ MABS 72 (I කොටස) යන ඒකකවලින් ද සමන්විත වන අයුරින් විෂය ඒකක අටක් සම්පූර්ණ කළ යුතු ය. MAPL 06 (II කොටස) හා MABS 72 (II කොටස) වූ කලී අධීක්ෂකවරයෙකු/අධීක්ෂකවරු යටතේ සම්පාදනය කළ යුතු නිබන්ධය යි. එය වචන 45,000 සිට 60,000 අතර සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

### 03.1.2 ප්‍රවේශය සඳහා සුදුසුකම්

**පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය (දෑවුරුදු)**

පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය (දෑවුරුදු) සඳහා ඇතුළත් වීමට බලාපොරොත්තු වන අයැදුම්කරුවෙකු පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

i. පිළිගත් විශ්වවිද්‍යාලයක පාලි විෂයයෙන් විශේෂ/ගෞරව ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණයෙන් පළමු හෝ දෙවන පෙළ (ඉහළ) ශ්‍රේණියක් ලබා සමත් වීම හෝ

ii. ඉහත දැක්වෙන සුදුසුකම්වලට සමානයැයි ආයතනයේ පීඨ සභාව හා විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

**බෞද්ධ අධ්‍යයනය ශාස්ත්‍රපති උපාධිය (දෑවුරුදු)**

බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය (දෑවුරුදු) සඳහා ඇතුළත් වීමට බලාපොරොත්තුවන අයැදුම් කරුවෙකු පහත සඳහන් සුදුසුකස්වලින් යටත් පිරිසෙන් එකක් හෝ සපුරා තිබිය යුතුය.

i. පාලි/බෞද්ධ අධ්‍යයනය/බෞද්ධ දර්ශනය/බෞද්ධ සංස්කෘතිය/බෞද්ධ ශිෂ්ටාචාරය/බෞද්ධ මනෝවිද්‍යාව/බෞද්ධ උරුමය/සංචාරක කර්මාන්තය හා භාරතීය දර්ශනය යන විෂයයන් අතරින් එක් විෂයයකින් පිළිගත් විශ්වවිද්‍යාලයක විශේෂ/ගෞරව ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණයෙන් පළමු හෝ දෙවන පෙළ (ඉහළ) ශ්‍රේණියක් ලබා සමත් වීම

හෝ

ii. සංස්කෘත, බටහිර දර්ශනය හෝ මනෝවිද්‍යාව යන විෂයයකින් ගෞරව ශාස්ත්‍රවේදී උපාධියක් හදාරා අවසන් වසර නිබන්ධය බෞද්ධ අධ්‍යයනය, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ශිෂ්ටාචාරය යන විෂයයක් හා සම්බන්ධ මාතෘකාවක් යටතේ සිදු කොට තිබීම

හෝ

iii. ඉහත දැක්වෙන සුදුසුකම්වලට සමානයැයි ආයතනයේ පීඨ සභාව හා විශ්වවිද්‍යාලයේ සනාථන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

හෝ

iv. උක්ත සුදුසුකම් සපුරා නැති අවස්ථාවක දී කිසියම් ශිෂ්‍යයෙක් දෑ අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ පර්යේෂණ නිබන්ධය සඳහා බෞද්ධ අධ්‍යයනයෙහි විශේෂ ප්‍රවීණතාවක් ඇති බව පෙන්වන්නේ නම්, එබඳු ශිෂ්‍යයෙක් සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට සුදුසුකම් ලැබීමෙන් අනතුරු ව දෑවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට ඇතුළත් වීමට සුදුසුකම් ලබන්නේ ය.

### 03.1.3 ලියාපදිංචි කිරීම

විද්‍යාර්ථියා විසින් ස්වකීය ජීවදත්ත සමග ඉදිරිපත් කරන ලද මූලික අයැදුම්පත්‍රය ආයතනයේ පීඨ සභාව විසින් පිළිගත් දින සිට ඔහු/ඇය දෑවුරුදු MAPL හා MABS පාඨමාලා සඳහා ලියාපදිංචි වූවා සේ සලකනු ලැබේ. (ශිෂ්‍ය අත්පොතේ පොදු නියමාවලියෙහි අංක 1.3 සිට 1.39 දක්වා වූ සාමාන්‍ය තොරතුරු මේ සඳහා අදාළ වේ.)

### 03.1.4 අනුක්‍රමික අවශ්‍යතා

**ප්‍රථම වර්ෂය**

1. ඉගැන්වීමේ පාඨමාලා කාර්යයන් සම්පූර්ණ කිරීම
2. පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව (MAPL 06 - I කොටස) හා (MABS 72 – I කොටස)
3. පර්යේෂණ මාතෘකාව ඉදිරිපත් කිරීම

4. පර්යේෂණ යෝජනාව ඉදිරිපත් කිරීම (ලිඛිත)
5. පර්යේෂණ යෝජනාව ඉදිරිපත් කිරීම (වාචික)

**දෙවන වර්ෂය**

6. නිබන්ධය සම්පූර්ණ කිරීම
7. අවසාන ඉදිරිපත් කිරීම
8. නිබන්ධය පළමුවර ඉදිරිපත් කිරීම
9. නිබන්ධය දෙවැනිවර ඉදිරිපත් කිරීම
10. සම්මුඛ පරීක්ෂණය
11. නිබන්ධය ආවසානික ලෙස ඝන පිටකවරය යොදා සවිමත් රෙක්සින් බැම්මෙන් බැඳ ඉදිරිපත් කිරීම

### 03.1.5 පර්යේෂණ මාතෘකාව සහ පර්යේෂණ යෝජනාව

අධ්‍යයන ක්ෂේත්‍රය හා සබැඳි පර්යේෂණ මාතෘකාව වචන 300කට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විතව එහි සාරසංක්ෂේපයක් ද සහිත ව ප්‍රථම වර්ෂය තුළ දී විද්‍යාර්ථියා විසින් ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු ය. අධ්‍යයන කමිටුව විසින් සහ පීඨ සභාව විසින් පර්යේෂණ මාතෘකාව අනුමත කරනු ලැබීමෙන් අනතුරු ව පර්යේෂණ යෝජනාව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. මෙම අවස්ථාවේදී අපේක්ෂකයා වෙනුවෙන් පත්කරනු ලැබ ඇති අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ උපදෙස් ලබා ගත යුතු වන අතර, ආයතනය විසින් නියම කර ඇති කාලය තුළ පර්යේෂණ යෝජනාව සම්පාදනය කිරීම සඳහා ආයතනයේ පර්යේෂණ ඒකකයේ සහාය තවදුරටත් ලබා ගත හැකි ය.

### 03.1.6 පර්යේෂණ යෝජනාවේ අන්තර්ගතය

පර්යේෂණ යෝජනාව පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත විය යුතු ය.

i. මාතෘකා පිටුව
ii. අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ හැඳින්වීම
iii. අධ්‍යයනයේ අරමුණ
iv. පූර්ව අධ්‍යයන සමාලෝචනය
v. පර්යේෂණ ගැටලුව
vi. උපයෝගී කරගනු ලබන පර්යේෂණ විධික්‍රමය/විධික්‍රම
vii. පර්යේෂණයේ සීමා
viii. පරිච්ඡේද ව්‍යුහය (තාවකාලික)
ix. අපේක්ෂිත ප්‍රතිඵල
x. මූලික මූලාශ්‍රය නාමාවලිය

### 03.1.7 පර්යේෂණ යෝජනාව ඉදිරිපත් කිරීම

ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති මාර්ගෝපදේශ අනුව පිළියෙල කරන ලද පර්යේෂණ යෝජනාව අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ නිර්දේශය ද සහිත ව නියමිත කාලය තුළ ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ සඳහා වන අධ්‍යයන කමිටුවේ සහ පීඨ සභාවේ තීරණය අපේක්ෂකයා වෙත ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විසින් ලිඛිත ව දන්වනු ඇත. අපේක්ෂකයා ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

### 03.1.8 ප්‍රථම ඉදිරිපත් කිරීම (වාචික)

පර්යේෂණ යෝජනාව සඳහා අනුමැතිය ලැබීමෙන් අනතුරු ව ආයතනය විසින් නියම කරනු ලබන දිනයක දී අංශාධිපතිවරයා සහ අධීක්ෂකවරුන් ද ඇතුළත් ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය හමුවෙහි අපේක්ෂකයින් විසින් සිය ඉදිරිපත් කිරීම සිදු කළ යුතු ය. ප්‍රථම ඉදිරිපත් කිරීමේ දී අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ හැඳින්වීමක්, පර්යේෂණ ගැටලුව, පර්යේෂණ විධික්‍රමය, පූර්ව අධ්‍යයන සමාලෝචනය, අධ්‍යයනයේ තාවකාලික පරිච්ඡේද ව්‍යුහය සහ මූලික මූලාශ්‍රය නාමාවලිය වෙත ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතු ය.

ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම් වාර්තාවක් අධ්‍යයන කමිටුව වෙත ද ඉන් අනතුරු ව පීඨ සභාව වෙත ද අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත.

### 03.1.9 ලියාපදිංචිය දීර්ඝ කිරීම

දෑවුරුදු උපාධි වැඩසටහනේ අවශ්‍යතා නියම කර ඇති කාලය තුළ සම්පූර්ණ කර ගැනීමට අසමත් අපේක්ෂකයෙකුට ලියාපදිංචි කාලය දීර්ඝ කර ගැනීම පිණිස සිය අධීක්ෂකවරුන් මගින් ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. අධ්‍යයන කමිටුවේ නිර්දේශය සහ පීඨ සභාවේ අනුමැතිය ලද තීරණය අපේක්ෂකයා වෙත ලිඛිත ව දන්වනු ලැබේ. නිබන්ධ කාලය දීර්ඝ කිරීම අමතර අවුරුදු දෙකක් සඳහා පමණක් සිදු කෙරෙන අතර වසර හතරක් (04)ක් තුළ ශිෂ්‍යයා ශාස්ත්‍රපති දෑවුරුදු උපාධිය හදාරා අවසන් කළ යුතු ය.

### 03.1.10 නිබන්ධයේ ගුණාත්මක හා නිර්ව්‍යාජ භාවය

i. ආයතනයේ අධ්‍යයන කමිටුව විසින් නිර්දේශිත ව පීඨ සභාව විසින් අනුමත කරන ලද මාතෘකාවක් යටතේ අපේක්ෂකයා විසින් ස්වාධීන ව පවත්වන ලද පර්යේෂණයෙහි ප්‍රතිඵල නිබන්ධයෙහි අන්තර්ගත විය යුතු ය. පර්යේෂණ නිබන්ධය හෝ එහි කොටසක් හෝ මෙම ආයතනයෙහි හෝ වෙනත් ආයතනයක/විශ්වවිද්‍යාලයක ඩිප්ලෝමාවක්, උපාධියක් හෝ වෙනත් කිසිදු සුදුසුකමක් සඳහා අපේක්ෂකයා විසින් හෝ වෙනත් කිසිදු පුද්ගලයෙකු විසින් මෙයට පෙර ඉදිරිපත් කරන ලද ලේඛනයක් නොවිය යුතු ය. නිබන්ධයේ නිර්ව්‍යාජත්වය පිළිබඳ ව අපේක්ෂකයා විසින් කරනු ලබන ප්‍රකාශයක් නිබන්ධයෙහි අන්තර්ගත කළ යුතු ය. අපේක්ෂකයා ස්වකීය නිබන්ධය මගින් බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි පවත්නා ඥාන සම්භාරයට විශිෂ්ට ප්‍රදානයක් සිදු කළ යුතු වන අතර, නව සාධක අනාවරණය කර ගැනීමෙන් හා ස්වාධීන විචාරාත්මක චින්තනය උපයෝගී කර ගැනීමෙන් පර්යේෂණ කාර්යයට අදාළ අපූර්වතාවක් ප්‍රකට කළ යුතු ය.

ii. ආයතනය විසින් පත්කරනු ලබන අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ අපේක්ෂකයා විසින් පර්යේෂණය සිදු කොට නිබන්ධය සම්පාදනය කළ යුතු ය. අපේක්ෂකයා/අපේක්ෂිකාව සිය අධීක්ෂණය යටතේ අදාළ පර්යේෂණය සිදු කර නිබන්ධය සම්පාදනය කළ බවටත්, අදාළ උපාධිය පිරිනැමීම සඳහා පරීක්ෂාවට ලක්කිරීම පිණිස එය සුදුසු බවටත් ප්‍රකාශ වන අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ නිර්දේශයක් ද නිබන්ධයෙහි අන්තර්ගත විය යුතු ය.

iii. පර්යේෂණයේ ප්‍රගතිය අනුව වඩාත් යෝග්‍ය වන්නේ යැයි අදහස් කරන්නේ නම් අපේක්ෂකයාට/අපේක්ෂිකාවට තමා විසින් ඉදිරිපත් කරන ලද මුල් පර්යේෂණ යෝජනාවේ කිසියම් සංශෝධනයක් සිදු කළ හැකි ය. එහෙත් එවැනි සෑම සංශෝධනයක් සඳහා ම අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් ස්වකීය අධීක්ෂකවරුන් මගින් ආයතනයේ අනුමැතිය ලබා ගත යුතු ය. එවැනි සංශෝධන සඳහා කෙරෙන ඉල්ලීම් අධ්‍යයන අංශ කමිටුව හා පීඨ සභාව වෙත ඉදිරිපත් කරනු ඇත.

iv. ආයතනය විසින් නියම කොට ඇති නිර්ණායකවලට අනුකූල නොවන අයුරින් සකස් කොට ඇතැයි තමන්ට හැඟී යන නිබන්ධයක් වෙතොත් එය ඇගයීමට ලක්කිරීම පිණිස පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමට ආයතනයට බලය ඇත.

### 03.1.11 නිබන්ධය ඉදිරිපත් කිරීම

i. **ප්‍රථම ඉදිරිපත් කිරීම**: තාක්ෂණික දෝෂ කිසිවක් තිබේ දැයි පර්යේෂණ ඒකකය විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා සර්පිලාකාර බැම්මෙන් බඳින ලද නිබන්ධයේ එක් පිටපතක් අධ්‍යයන කාලය නිමවීමට පෙර ආයතනයේ ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත ඉදිරිපත් කළ යුතු ය.

ii. **දෙවන ඉදිරිපත්කිරීම**: ප්‍රථම ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සංශෝධන දක්වා තිබේ නම් අධීක්‍ෂකවරයාගේ/අධීක්‍ෂකවරුන්ගේ උපදෙස් පරිදි ඒවා සකස් කොට සර්පිලාකාර බැම්මෙන් බඳින ලද නිබන්ධයේ සමාන පිටපත් තුනක් ආයතනයේ ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත ඉදිරිපත් කළ යුතු ය. එවිට එම නිබන්ධය පීඨ සභාව විසින් පත් කරන ලද පරීක්ෂකවරුන්ගේ ඇගයීම සඳහා යවනු ලැබේ.

iii. **අවසාන ඉදිරිපත් කිරීම**: වාචික පරීක්ෂණයේදී (Viva Voce) යෝජනා කරන ලද කිසියම් සංශෝධනයක් වේ නම් අපේක්ෂකයා විසින් ඒ අනුව සිය පර්යේෂණ නිබන්ධය සංශෝධනය කළ යුතු අතර එකී යෝජනා අනුව අදාළ නිබන්ධයෙහි අදාළ සංශෝධන සිදු කළ බවට සුපරීක්ෂක නිර්දේශය සහිතව නිබන්ධය ඉදිරිපත් කළ යුතුය. එහිදී ආයතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවල සඳහන් පරිදි තද බැම්මෙන් බඳින ලද (පිටකවරය රතුපාටින් යුතු) නිබන්ධයේ පිටපත් තුනක් සහ එහි MS-Word හා PDF ආකෘතිවලින් සකසන ලද මෘදු පිටපතක් ද ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත භාරදිය යුතු ය.

### 03.1.12 වාචික පරීක්ෂණය

නිබන්ධය ඇගයීමෙන් අනතුරු ව පරීක්ෂක මණ්ඩලය විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයක් ආයතනය විසින් සංවිධානය කෙරෙනු ඇත. පර්යේෂණාත්මක අධ්‍යයනයෙහි යෙදී සිටින අපේක්ෂකයා ආයතනය විසින් තීරණය කරනු ලබන දිනයක දී එම වාචික පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. පරීක්ෂක මණ්ඩලයේ තීරණ පිළිගැනීමට අපේක්ෂකයා බැඳී සිටී. වාචික පරීක්ෂණය සඳහා කැඳවීම ලබන අපේක්ෂකයා විසින් ඇගයීම සඳහා ඉදිරිපත් කළ ඔහුගේ/ඇයගේ නිබන්ධයේ පිටපතක් රැගෙන ඒම අවශ්‍ය වේ.

### 03.1.13 පරීක්ෂණ ප්‍රතිඵල

i. පරීක්ෂණ මණ්ඩලය තීරණ හතරින් එකකට එළඹෙනු ඇත. එනම්, නිබන්ධය පවත්නා ස්වරූපයෙන් ම පිළිගැනීම හෝ යෝග්‍ය යැයි සැලකෙන සංශෝධනවලට යටත් ව නිබන්ධය පිළිගැනීම, නිබන්ධය නැවත සකස් කිරීමට යොමු කිරීම හෝ නිබන්ධය ප්‍රතික්ෂේප කිරීම වශයෙනි.

ii. නිබන්ධය පිළිගෙන ඇති අවස්ථාවක දී එය එපරිද්දෙන් ම මුද්‍රණය කොට ප්‍රකාශයට පත්කිරීම යෝග්‍ය වන්නේද යන්න කමිටු වාර්තාවේ සඳහන් කරනු ඇත.

iii. සුළු සංශෝධනවලට යටත් ව නිබන්ධය පිළිගන්නා ලද්දේ නම් වාචික පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සංශෝධන යථාපරිදි සිදු කොට මාස තුනක කාලයක් ඇතුළත අපේක්ෂකයා විසින් නිබන්ධය ආයතනය වෙත භාරදිය යුතු ය. මණ්ඩලය විසින් නිර්දේශිත සංශෝධන අපේක්ෂකයා විසින් නිසිපරිදි සිදු කොට ඇති බවට අධීක්ෂකවරයා/අධීක්ෂකවරුන් විසින් සුපරීක්ෂක නිර්දේශය කරනු ලැබ තිබීම අවශ්‍ය වේ.

iv. සැලකිය යුතු තරම් විශාල සංශෝධනයක් නිබන්ධයේ සිදු කළ යුතු යැයි පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර ඇත්නම්, එම මණ්ඩලය විසින් නියම කර ඇති කාලය තුළ සංශෝධන සිදු කොට එලෙස සංශෝධිත නිබන්ධය අපේක්ෂකයා විසින් ආයතනය වෙත භාරදිය යුතු ය. මෙම අවස්ථාවේදී ද පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශිත සංශෝධන අපේක්ෂකයා විසින් නිසිපරිදි සිදුකොට ඇති බවට අධීක්ෂකවරයා/අධීක්ෂකවරුන් විසින් සුපරීක්ෂක නිර්දේශය කරනු ලැබ තිබීම අවශ්‍ය වේ. (සුපරීක්ෂක නිර්දේශය සඳහා ආදර්ශය සඳහා 3.4.9 බලන්න)

v. පරීක්ෂණ මණ්ඩලයේ තීරණය මත උපාධිය ප්‍රදානය කිරීම සඳහා නිබන්ධය පිළිගනු ලැබේ නම්, සංශෝධිත නිබන්ධය ආයතනය වෙත භාරදුන් දිනය උපාධිය වලංගු වන දිනය ලෙස සලකනු ලැබේ.

vi. නිබන්ධය සුදුසු නොවන බවට සලකමින් එක් පරීක්ෂකවරයෙකු විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අතර අනෙක් පරීක්ෂකවරයා විසින් එය සුදුසු යැයි නිර්දේශ කර ඇති අවස්ථාවක දී එම නිබන්ධය තෙවැනි පරීක්ෂකවරයෙකු වෙත යොමු කළ යුතු ය. තෙවැනි පරීක්ෂකවරයාගේ නිර්දේශය මත විභාග මණ්ඩලය විසින් අවසන් තීරණයකට එළඹෙනු ඇත. (එබඳු අවස්ථාවක දී වැය වන අමතර මුදල් විද්‍යාර්ථියා විසින් ආයතනය වෙත ගෙවිය යුතු ය.)

vii. නිබන්ධය පරීක්ෂා කළ පරීක්ෂකවරුන් දෙදෙනා අතරින් එක් පරීක්ෂකවරයෙකු නිබන්ධය අදාළ උපාධි ප්‍රදානයට සුදුසු බවට නිර්දේශ කොට ඇතත් අනෙක් පරීක්ෂකවරයා විසින් හෝ පරීක්ෂකවරුන් දෙදෙනා ම හෝ නිබන්ධයෙහි අන්තර්ගත කරුණු අන්තර්ජාලයෙන් හෝ නිබන්ධයකින් හෝ වෙනත් ලේඛනවලින් හෝ උපුටාගත් කොටස් 15% (Plagiarism) කට වැඩියෙන් ඇතැයි වාර්තා කොට ඇත්නම් නිබන්ධය නැවත පරීක්ෂා කිරීම සඳහා තෙවැනි පරීක්ෂකවරයෙකු වෙත නො යැවිය යුතුය. එබඳු අවස්ථාවකදී විභාග වංචා සම්බන්ධ ආයතනික නිර්ණායක අනුව කටයුතු කරනු ලැබේ.

viii. සියලු ම උසස් පර්යේෂණාත්මක උපාධි පරීක්ෂණවල ප්‍රතිඵල අදාළ අපේක්ෂකයින් වෙත පෞද්ගලික ව දන්වා යවනු ලැබේ.

ix. පර්යේෂණ උපාධි ලාභය සඳහා අනුමත වූ පර්යේෂණ නිබන්ධයෙහි එක් පිටපතක් ආයතනයේ පුස්තකාලයෙහි විමර්ශන කටයුතු සඳහා තැන්පත් කර තබනු ඇත. තවත් පිටපතක් අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයෙහි තැන්පත් කර තබන අතර, අනෙක් පිටපත ශිෂ්‍යයා වෙත ආපසු භාරදෙනු ලැබේ.

### 03.1.14 නිබන්ධ තැන්පත් කර තැබීම

වාචික පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව පිළියෙල කොට ඉදිරිපත් කෙරෙන ඝන පිටකවරය යොදා සවිමත් රෙක්සින් බැම්මෙන් බඳින ලද පර්යේෂණ නිබන්ධයේ එක් පිටපතක් ආයතන පුස්තකාලයේ විමර්ශන කටයුතු සඳහා තැන්පත් කර තබනු ඇත. තවත් පිටපතක් අධ්‍යක්ෂ කාර්යාලයේ තැන්පත් කර තබනු ලබන අතර ඉතිරි පිටපත අපේක්ෂකයාට භාරදෙනු ලැබේ.

### 03.1.15 පර්යේෂණ කටයුතු හා සබැඳි මූලික අවශ්‍යතා

පීඨ සභාව විසින් පර්යේෂණ යෝජනාව අනුමත කිරීමෙන් අනතුරු ව එකී සභාව විසින් පත්කර ඇති අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ මාර්ගෝපදේශකත්වය සහ උපදෙස් යටතේ අපේක්ෂකයා විසින් ඔහුගේ/ඇයගේ පර්යේෂණාත්මක අධ්‍යයනය කරගෙන යා යුතු ය. මෙහි ලා පහත දැක්වෙන අවශ්‍යතා විද්‍යාර්ථීයා විසින් සපුරනු ලැබිය යුතු වේ.

i. ලියාපදිංචි දින සිට මාස තුනක් ඇතුළත පර්යේෂණ යෝජනාව පදනම් කර ගනිමින් වාචික ඉදිරිපත් කිරීම

ii. සෑම තෙමසකට වරක් ම අධීක්ෂකවරයා/අධීක්ෂකවරුන් මගින් ආයතනය වෙත ප්‍රගතිවාර්තා ඉදිරිපත් කිරීම

iii. මසකට වරක් අධීක්ෂකවරයා/අධීක්ෂකවරුන් පෞද්ගලික ව හමුවී සිය පර්යේෂණාත්මක අධ්‍යයනය සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම. දිවයිනෙන් බැහැර ව සිටින අපේක්ෂකයෙකු වන්නේ නම් අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය මත දුරකථනය, විද්‍යුත් ලිපි හුවමාරුව හෝ අන්තර්ජාල සබඳතා වැනි ක්‍රම මගින් අධීක්ෂකවරයාගෙන්/අධීක්ෂකවරුන්ගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගත යුතු ය. තමන් හමුවී උපදෙස් ලබා ගත් බව සනාථ කිරීම පිණිස අධීක්ෂකවරයාට සටහනක් තැබීම සඳහා සිය ශිෂ්‍ය වාර්තා පොත අධීක්ෂකවරයා වෙත

ඒ අවස්ථාවේ දී ම ඉදිරිපත් කිරීම අපේක්ෂකයාගේ වගකීමකි. අධීක්ෂකවරයා පෞද්ගලික ව හමු නොවී වෙනත් මාර්ගවලින් උපදෙස් ලබා ගත් අවස්ථාවන්හි දී ඒ බව අදාළ දිනය හා වෙනත් අදාළ විස්තර ද අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ සනාථ කිරීම් ද සය මාසික ප්‍රගති වාර්තාවෙහි අපේක්ෂකයා විසින් සඳහන් කළ යුතු ය.

iv. පර්යේෂණයට අදාළ ව සිදු කරනු ලබන ලිඛිත හෝ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල දී අපේක්ෂකයා විසින් ඒ සඳහා සිය අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ මාර්ගෝපදේශකත්වය හා උපදෙස් ලබා ගැනීම

v. ස්වකීය පර්යේෂණාත්මක අධ්‍යයනය මගින් අදාළ විෂය ක්ෂේත්‍රයෙහි ලා පිරිනැමෙන ස්වීය දායකත්වය ප්‍රකට කරමින් අපේක්ෂකයා විසින් වාචික ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. මෙම වාචික ඉදිරිපත් කිරීම සිදු කළ යුතු වනුයේ පර්යේෂණ නිබන්ධය ආයතනය වෙත මුල්වරට භාරදීමට ප්‍රථමයෙනි.

### 03.1.16 අවසාන ඉදිරිපත් කිරීම

වාචික පරීක්ෂණයේ දී පරීක්ෂක මණ්ඩලය විසින් යෝජනා කරන ලද කිසියම් සංශෝධනයක් වේ නම් අපේක්ෂකයා විසින් ඒ අනුව සිය පර්යේෂණ නිබන්ධය සංශෝධනය කළ යුතු වන අතර, එකී යෝජනා අනුව අදාළ නිබන්ධයෙහි සංශෝධන සිදු කර ඇති බවට අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ නිර්දේශය ද ලබා ගත යුතු ය. අධීක්ෂක නිර්දේශ ලබා ගැනීම සඳහා අවශ්‍ය නියමිත ආකෘතිපත්‍රය ආයතනයේ ශිෂ්‍ය කටයුතු අංශයෙන් ලබා ගත හැකි ය. මාර්ගෝපදේශ අනුව පිළියෙල කළ ඝන පිටකවරය යොදා සවිමත් රෙක්සින් බැම්මෙන් බඳින ලද සංශෝධිත නිබන්ධයේ පිටපත් තුනක් සහ (DVD තැටියක සුරක්ෂිත MS-Word හා PDF ආකෘතිවලින් සකසන ලද) එහි මෘදු පිටපතක් ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු ය.

### 03.1.17 නිබන්ධය සම්පාදනය සඳහා මාර්ගෝපදේශ

i. පීඨ සභාව විසින් අනුමත කරන ලද භාෂා මාධ්‍යයකින් නිබන්ධය සම්පාදනය කළ යුතු ය.

ii. පරිගණක අක්ෂර සංයෝජනයෙන් නිබන්ධය මුද්‍රණය කළ යුතු වන අතර, ඒ සඳහා ආයතනය විසින් වර්තමානයේ දී සිංහල මාධ්‍ය සඳහා FM අභය අක්ෂරමාලාව ද ඉංග්‍රීසි මාධ්‍ය සඳහා Times New Roman අක්ෂරමාලාව ද නිර්දේශ කෙරේ.

iii. නිබන්ධ ශරීරය මුද්‍රණය කිරීම සඳහා නිර්දේශිත අක්ෂරයේ ප්‍රමාණය 12 වන අතර, පාදක සටහන් හෝ අන්ත සටහන් හෝ සඳහා වන අක්ෂරයේ ප්‍රමාණය 10 වේ.

iv. මාතෘකා පිටුව පිළියෙල කිරීමේ දී නිබන්ධ මාතෘකාව 22 ප්‍රමාණයේ තද කළු (bold) අක්ෂරයෙන් ද අපේක්ෂකයාගේ නම සහ ලියාපදිංචි අංකය 16 ප්‍රමාණයේ අක්ෂරයෙන් ද ආයතනයේ නම සහ නිබන්ධය පිළිබඳ විස්තරය 18 ප්‍රමාණයේ අක්ෂරයෙන් ද නිම කළ යුතු ය. පරිච්ඡේද ශීර්ෂ සඳහා 14 ප්‍රමාණයේ අක්ෂර ද උප ශීර්ෂ සඳහා 12 ප්‍රමාණයේ

තද කළු (bold) අක්ෂර ද යොදා ගත යුතු ය. ඉංග්‍රීසි භාෂාවෙන් සම්පාදනය කෙරෙන නිබන්ධවල දී පාලි, සංස්කෘත, ලතින් හෝ ග්‍රීක වැනි සම්භාව්‍ය භාෂා භාවිත කරන්නේ නම් අවශ්‍ය අවස්ථාවන්හි දී උච්චාරණ සංකේත (Diacritical marks) යෙදීම අවශ්‍ය ය.

v. ප්‍රධාන නිබන්ධය 2.0 පරතරයෙන් යුතු පේළිවලින් සකස් කළ යුතු ය.

vi. අපේක්ෂකයාගේ නම, නිබන්ධ මාතෘකාව, උපාධියේ නම සහ අදාළ වර්ෂය නිබන්ධ නාරටියෙහි සඳහන් කළ යුතු ය.

vii. A 4 ප්‍රමාණයේ GSM 80 ඝනත්වයෙන් යුතු කඩදාසිවල එක් පැත්තක පමණක් නිබන්ධය මුද්‍රණය කළ යුතු ය.

viii. කඩදාසියේ වම් කෙළවරෙහි සෙ. මී. 4 සහ ඉහළ, පහළ හා දකුණු කෙළවර සඳහා සෙ. මී. 2.5 බැගින් ඉඩ තැබිය යුතු ය.

ix. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දෑ අවුරුදු ශාස්ත්‍රපති උපාධිය සඳහා වන නිබන්ධය වචන 45,000 සිට 60,000 අතර ප්‍රමාණයකින් සමන්විත වීම අවශ්‍ය වේ. මේ සඳහා පාදක/අන්ත සටහන් හෝ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ගණන් ගනු නොලැබේ.

x. ඉහත දක්වා ඇති වචන සංඛ්‍යාවෙන් නිබන්ධය සමන්විත විය යුතු යැයි නියම කර ඇති නමුදු නිබන්ධය ඇගයීමේ දී වචන සංඛ්‍යාව පමණක් නොව නිබන්ධයේ ගුණාත්මක බව ද සලකා බලනු ඇත.

xi. වචන 250කට නොවැඩි වන සේ සකස් කළ නිබන්ධයේ සාරසංක්ෂේපයක් පටුනට පෙර පිටුවෙහි අන්තර්ගත කළ යුතු ය. සිංහල භාෂාවෙන් සම්පාදනය කෙරෙන නිබන්ධයක් නම් සාරසංක්ෂේපයෙහි ඉංග්‍රීසි පරිවර්තනයක් ද සිංහල සාරසංක්ෂේපයට පසු ව අන්තර්ගත කළ යුතු ය.

xii. නිබන්ධයේ සැලැස්ම, ප්‍රමාණය සහ එහි බන්ධනය (binding) ආයතනය විසින් නියම කර ඇති නිර්දේශයන්ට සම්පූර්ණයෙන් ම එකඟ විය යුතු ය.

### 03.1.18 නිබන්ධයේ සැලැස්ම

නිබන්ධය පහත සඳහන් අංගවලින් සමන්විත විය යුතු ය.

i. මාතෘකා පිටුව (සිංහල සහ ඉංග්‍රීසි) (ආදර්ශයක් 161 පිටුවෙහි දැක්වේ.)

ii. අපේක්ෂකයාගේ ප්‍රකාශය (ආදර්ශයක් 158 පිටුවෙහි 03.5.10 යටතේ දැක්වේ.)

iii. අධීක්ෂකවරුන්ගේ/අධීක්ෂකවරයාගේ නිර්දේශ/ය (ආදර්ශයක් 159 පිටුවෙහි 03.5.11 දැක්වේ.)

iv. උපකාරානුස්මෘති (අවශ්‍ය වන්නේ නම්)

v. සාරසංක්ෂේපය (වචන 250ක පමණ) (සිංහල සහ ඉංග්‍රීසි)

vi. පටුන

vii. සංක්ෂේපණ

viii. පරිච්ඡේද

ix. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

x. චිත්‍ර (අවශ්‍ය වන්නේ නම්)

xi. රූපසටහන් සහ ප්‍රස්තාර (අවශ්‍ය වන්නේ නම්)

xii. සූචි (අවශ්‍ය වන්නේ නම්)

### 03.1.19 ශාස්ත්‍රපති දෑවුරුදු පාඨමාලාවේ සිට එක් අවුරුදු පාඨමාලාව වෙත මාරු වීම

ශාස්ත්‍රපති දෑවුරුදු පාඨමාලාවේ සිට එක් අවුරුදු පාඨමාලාව වෙත මාරු වීම සඳහා වන අවස්ථා දෙකකි.

i. ශාස්ත්‍රපති දෑවුරුදු පාඨමාලාවේ පළමු වසර අවසන් පරීක්ෂණය පැවැත්වීමට පෙර එක් අවුරුදු පාඨමාලාව වෙත මාරු වීමට ශිෂ්‍යයන් විසින් කරනු ලබන අයැදුම් කිරීම

ii. ශාස්ත්‍රපති දෑවුරුදු පාඨමාලාවේ පළමු වසරේ අවසන් පරීක්ෂණයට සහභාගි වීමෙන් පසු එක් අවුරුදු පාඨමාලාව වෙත මාරු වීමට ශිෂ්‍යයන් විසින් කරනු ලබන ඉල්ලීම

ඉහත අවස්ථා දෙක සඳහා ශිෂ්‍යයන් විසින් අයැදුම් කිරීමේ දී ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය විසින් ලබා දෙනු ලබන ආකෘති පත්‍රය (ආදර්ශය පිටු අංක 144) විධිමත් ව පූරවා පාඨමාලා සමායෝජකගේ අත්සන සහිත ව ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු ය.

### 03.1.20 ශාස්ත්‍රපති දෑවුරුදු පාඨමාලාවේ සිට එක් අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාව වෙත මාරු වීමේ දී අනුගමනය කළ යුතු නිර්දේශ

ශාස්ත්‍රපති දෑ අවුරුදු පාඨමාලාවේ සිට එක් අවුරුදු පාඨමාලාව වෙත මාරු වීම සඳහා අවස්ථා දෙකකි.

i. පාඨමාලාව අතරතුර දී දෑඅවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාවෙන් එක් අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාවට යොමු වන්නේ නම් පාඨමාලාව ආරම්භ කොට මාස 6ක් ඇතුළත අයැදුම් කළ යුතු ය. එහි දී MAPL - 06 හෝ MABS - 72 විෂය ඒකකයට අදාළ ව විස්තාරිත රචනය සඳහා යෝජනා කරනු ලබන මාතෘකාව හා එක් අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාවේ අවසන් පරීක්‍ෂණයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂය ඒකක 06 ආකෘති පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

ii. දෑවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාවේ පළමු වර්ෂ අවසාන පරීක්‍ෂණයෙන් අනතුරු ව එක් අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාවට යොමු වීමට අපේක්ෂා කරන්නේ නම්, වර්ෂාවසාන පරීක්‍ෂණය අවසන් වූ දින සිට මාසයක් තුළ ඉල්ලීම් කළ යුතු ය. එහි දී එක් අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා ගණනය කළ යුතු විෂය ඒකක සහ අතිරේක ලෙස සැලකිය යුතු විෂය ඒකකය අයැදුම් පත්‍රයෙහි පැහැදිලි ව සඳහන් කළ යුතු ය. ඊට අමතර ව විස්තාරිත රචනය සඳහා යෝජනා කරනු ලබන මාතෘකාව ද ආයතනය විසින් නියම කරනු ලබන දිනයේ දී ආයතනය වෙත භාර දිය යුතු ය.

| For office use<br>Date Received |
|---|

**ශාස්ත්‍රපති දෑවුරුදු පාඨමාලාවෙන් එක් අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාව වෙත මාරුවීමේ අයැදුම්පත**

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**

**පළමු වසර අවසන් පරීක්ෂණය පැවැත්වීමට පෙර/අවසන් පරීක්ෂණයට පසු එක් අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාව වෙත යොමු වීම** (අනවශ්‍ය වචන කපා හරින්න)

01. නම :- ..................................................................................................................................

........................................................................ හිමි/මහතා/මහත්මිය/ මෙනවිය

02. පාඨමාලාව :- ..................................................................................................................................

03. අධ්‍යයන වර්ෂය :- ............................................................ 04. ලි.ප අංකය :- ..................................................

05. එක් අවුරුදු පාඨමාලාවේ අවසන් පරීක්ෂණයට පෙනී සිටි/පෙනී සිටීමට අපේක්ෂිත විෂය ඒකක

| අනු අංක | විෂය අංකය | විෂය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |

අතිරේක ලෙස සැලකිය යුතු විෂය ඒකකය

| අනු අංකය | විෂය අංකය | විෂය |
|---|---|---|
| | | |

විස්තාරිත රචනය සඳහා යෝජනා කරනු ලබන මාතෘකාව :- ..................................................................................

..................................................................................................................................

.......................................... ..........................................

දිනය අයැදුම්කරුගේ අත්සන

**පාඨමාලා සම්බන්ධීකාරක නිර්දේශය**

ඉහත ඉල්ලීම නිර්දේශ කරමි/නොකරමි.

නම :- ................................................................................................ අත්සන:- ..................................................

දිනය :- ........................................................

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

අධ්‍යයනාංශ කමිටුවේ නිර්දේශය හා දිනය :- ..................................................................................

පීඨ සභාවේ අනුමත දිනය :- ..................................................................................

විෂය ලිපිකරු :- ..................................................................................

ජ්‍යෝ.ස.ලේ/ස.ලේ නිර්දේශය හා සටහන් :- ..................................................................................

## 03.2 දර්ශනපති (Master of Philosophy) උපාධිය සහ දර්ශන විශාරද (Doctor of Philosophy) උපාධිය

### 03.2.1 ප්‍රවේශය සඳහා සුදුසුකම්

#### දර්ශනපති උපාධිය

01. පර්යේෂණ උපාධි අධ්‍යයනයක් සඳහා අයැදුම් කරන අපේක්ෂකයෙකු පහත දක්වෙන සුදුසුකම් අතරින් යටත් පිරිසෙන් එකක් හෝ සපුරා තිබිය යුතු යः

i. බෞද්ධ අධ්‍යයනය, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ශිෂ්ටාචාරය, භාරතීය දර්ශනය, බටහිර දර්ශනය, සමය අධ්‍යයනය, සිංහල, පුරාවිද්‍යාව, ඉතිහාසය, මනෝවිද්‍යාව, සමාජවිද්‍යාව, පාලි, සංස්කෘත, සම්භාව්‍ය චීන භාෂාව, සම්භාව්‍ය තිබ්බතීය භාෂාව හෝ බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ වෙනත් විෂයයකින් හෝ ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක සාමාන්‍ය ශාස්ත්‍රවේදී හෝ විශේෂ/ගෞරව ශාස්ත්‍රවේදී හෝ උපාධි පරීක්ෂණයෙන් පළමු හෝ දෙවන පෙළ (ඉහළ) ශ්‍රේණියක් ලබා සමත් වීම

ii. පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අයත් විෂයයකින් පිළිගත් විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයෙන් සමත් වීම

iii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක ඉහත (i) හෝ (ii) යටතේ සඳහන් කවර හෝ විෂයයක් හදාරා ලබාගත් සාමාන්‍ය ශාස්ත්‍රවේදී හෝ විශේෂ/ගෞරව ශාස්ත්‍රවේදී උපාධියක පළමු හෝ දෙවන පෙළ (ඉහළ) ශ්‍රේණියට සමානයැයි ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන සුදුසුකම් විදේශීය රටක විශ්වවිද්‍යාලයකින් ලබා තිබීම සහ එම සහතික රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සහතික කර තිබීම

iv. ඉහත (i) හෝ (ii) යටතේ සඳහන් කවර හෝ විෂයයක් හදාරා ලබා ගත් සාමාන්‍ය ශාස්ත්‍රවේදී හෝ විශේෂ/ගෞරව ශාස්ත්‍රවේදී උපාධියක් පළමු හෝ දෙවන පෙළ (ඉහළ) ශ්‍රේණියට සමානයැයි ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන සුදුසුකම් විදේශීය රටක විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා තිබීම සහ එම සුදුසුකම් විදේශීය රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සහතික කර තිබීම

v. ඉහත දැක්වෙන සුදුසුකම්වලට සමානයැයි ආයතනයේ පීඨ සභාව හා විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

#### දර්ශන විශාරද උපාධිය

i. බෞද්ධ අධ්‍යයනය, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි හෝ බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ වෙනත් විෂයයකින් ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක විශේෂ/ගෞරව ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණයෙන් පළමු පන්ති සාමර්ථ්‍යයක් ලබා තිබීම (එසේ වුවද විද්‍යාර්ථියාගේ පර්යේෂණ ශක්‍යතාව සලකා බැලීමට යටත් වේ)

ii. පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අයත් විෂයයකින් පිළිගත් විශ්වවිද්‍යාලයක දෑවුරුදු ශාස්ත්‍රපති (පර්යේෂණ) උපාධියක් හෝ දර්ශනපති උපාධියක් හෝ ලබා තිබීම

iii. ඉහත (i) හෝ (ii) යටතේ සඳහන් කවර හෝ විෂයයක් හදාරා විශේෂ/ගෞරව ශාස්ත්‍රවේදී (පළමු පෙළ) උපාධියකට හෝ දෑවුරුදු ශාස්ත්‍රපති (පර්යේෂණ) උපාධියකට හෝ දර්ශනපති උපාධියකට හෝ සමානයැයි ආයතනය විසින් පිළිගනු ලබන සුදුසුකම් විදේශීය රටක විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා තිබීම සහ එම සුදුසුකම් විදේශීය රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සහතික කර තිබීම

iv. ඉහත දැක්වෙන සුදුසුකම්වලට සමානයැයි ආයතනයේ පීඨ සභාව හා විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

02. ඉහත සඳහන් සුදුසුකම් නොමැති, එහෙත් පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ක්ෂේත්‍රයෙහි ශාස්ත්‍රීය කාර්යයන්හි නිරත වීමෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අපූර්ව දායකත්වයක් ලබාදී ඇතැයි සැලකෙන විද්‍යාර්ථීන්ට ද පර්යේෂණ උපාධි අධ්‍යයනය සඳහා අයැදුම් කළ හැකි වන අතර, එම ඉල්ලීම් ආයතනයේ අධ්‍යයන අංශ කමිටුව හා පීඨ සභාව විසින් සලකා බලා තීරණයක් ගනු ඇත.

03. මෙම ආයතනය විසින් පවත්වනු ලබන බෞද්ධායුර්වේද උපදේශන ඩිප්ලෝමාව හා බෞද්ධ මනෝ උපදේශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සමත් විද්‍යාර්ථීන් පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ක්ෂේත්‍රයෙහි දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා මෙම ආයතනය විසින් පවත් වනු ලබන පාලි හෝ බෞද්ධ අධ්‍යයනය හෝ පිළිබඳ ශාස්ත්‍රපති එක් අවුරුදු පාඨමාලාව හදාරා එම උපාධිය සමත් ව තිබිය යුතු ය.

04. එහෙත්, මෙම ආයතනය විසින් පවත් වනු ලබන බෞද්ධ මනෝඋපදේශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සමත් විද්‍යාර්ථියකු ස්වකීය දර්ශනපති පර්යේෂණ නිබන්ධය ආයතනය වෙත භාරදීමට පෙර ආයතනය විසින් පවත්වනු ලබන බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා නිර්දේශිත විෂයයන් පහක් ඔහු/ඇය විසින් සමත් වනු ලැබීමට යටත් ව බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි. එසේ ම දර්ශනපති පර්යේෂණ නිබන්ධය භාරදීමට පෙර මෙම විෂය පහ සමත් ව තිබිය යුතු ය. එම විෂය පහ තෝරා ගැනීමේ දී MABS 01: **පාලි නිකායාගත බෞද්ධ චින්තනය: විග්‍රහය හා විවරණය** සහ MABS 35: **ථේරවාද සම්ප්‍රදාය : ඓතිහාසික හා ධර්ම කරුණු පිළිබඳ අධ්‍යයනයක්** යන විෂය ඒකක දෙක අනිවාර්ය බව ද, MABS 26: **බෞද්ධ මනෝචිකිත්සාව** හැර වෙනත් කවර හෝ විෂයයන් තුනක් තෝරා ගත හැකි බව ද සැලකිය යුතු ය.

05. පර්යේෂණ උපාධි අධ්‍යයනයක් සඳහා අයැදුම් කරන විද්‍යාර්ථියෙකුට අපේක්ෂිත අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් තිබිය යුතු ය. ඇතැම් විටෙක එම විද්‍යාර්ථියා විසින් පර්යේෂණ කාර්යයට අදාළ අතිරේක අවශ්‍යතාවක් ලෙස බෞද්ධ අධ්‍යයනය හා සම්බන්ධ විෂය මූලාශ්‍රය භාෂාවක් (උදා. පාලි, සංස්කෘත, සම්භාව්‍ය චීන, සම්භාව්‍ය තිබ්බත) පිළිබඳ ප්‍රවීණත්වය ලබා ගත යුතු යැයි නියම කරනු ලැබිය හැකි ය. තවද පර්යේෂණ උපාධි අධ්‍යයනයෙහි නිරත

ව සිටින විද්‍යාර්ථීන් ආයතනයේ පර්යේෂණ ඒකකයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගත යුතු වන අතර එම ඒකකය විසින් පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ ව සංවිධානය කරනු ලබන වැඩමුළුවලට අනිවාර්යයෙන් ම සහභාගී විය යුතු ය.

### 03.2.2 ඇතුළත් වීම

01. පර්යේෂණ උපාධි අධ්‍යයන ලියාපදිංචිය සඳහා අයැදුම්පත් අධ්‍යයන වර්ෂයේ කවර හෝ දිනයක ආයතනය වෙත ඉදිරිපත් කළ හැකි ය. තමන් අභිමත පර්යේෂණ මාතෘකාවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා හෝ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු හමුවී කරන ලද සාකච්ඡාවකින් අනතුරු ව පර්යේෂණ උපාධිය සඳහා ලියාපදිංචි වීමට අයැදුම් කිරීමේ අවස්ථාව අපේක්ෂකයෙකුට ඇත. කෙසේ වෙතත්, ලියාපදිංචිය ක්‍රියාත්මක වීම සඳහා අදාළ මාතෘකාව ආයතනයේ අධ්‍යයන කමිටුව විසින් නිර්දේශ කොට, එය පීඨ සභාව විසින් අනුමත කළ යුතු ය.

### 03.2.3 ලියාපදිංචි කිරීම

01. පර්යේෂණ උපාධියක් සඳහා වන අයැදුම්කරුගේ ජීවදත්ත සටහන් හා වචන 300කට නොවැඩි වන සේ පිළියෙල කරන ලද සංක්ෂිප්ත විස්තරයක් ද සමඟ යෝජිත පර්යේෂණ මාතෘකාව සහිත අයැදුම්පතක් ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලැබූ දින සිට එම අයැදුම්කරු අදාළ උපාධි අධ්‍යයනය සඳහා ලියාපදිංචි වූවකු ලෙස සැලකේ. ඉදිරිපත් කළ යුතු පර්යේෂණ යෝජනාව සම්පාදනය කිරීම සඳහා පර්යේෂණ අධීක්ෂකවරයාගේ, ආයතනයේ ආචාර්යවරුන්ගේ සහ පර්යේෂණ ඒකකයේ මාර්ගෝපදේශකත්වය මෙහි දී අපේක්ෂකයාට ලබා ගත හැකි ය. කෙසේ වෙතත්, පහත 02. අංකය යටතේ සඳහන් වන අයුරින් පිළියෙල කළ පර්යේෂණ යෝජනාව ලියාපදිංචිය ක්‍රියාත්මක වන දින සිට මාස 06ක් ඉකුත් ව යාමට පෙර ආයතනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

02. පර්යේෂණ නිබන්ධ මාතෘකාව පීඨ සභාව විසින් අනුමත කළ දින සිට මාස 06ක් ඇතුළත පර්යේෂණ උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන් විසින් පහත සඳහන් කරුණු ඇතුළත් පර්යේෂණ යෝජනාව ඉදිරිපත් කළ යුතු ය.

    i. යෝජිත පර්යේෂණ උපාධිය සහ මාතෘකාව
    ii. හැඳින්වීම
    iii. අධ්‍යයනයේ අරමුණ
    iv. පූර්ව අධ්‍යයන සමාලෝචනය
    v. පර්යේෂණ ගැටලුව
    vi. උපයෝගී කර ගනු ලබන පර්යේෂණ විධික්‍රමය/විධික්‍රම
    vii. පර්යේෂණ ක්ෂේත්‍රය සහ එහි සීමා
    viii. පරිච්ඡේද ව්‍යුහය (තාවකාලික)
    ix. අපේක්ෂිත ප්‍රතිඵල
    x. ආශ්‍රේය මූලාශ්‍රය නාමාවලිය

03. දර්ශනපති උපාධි අධ්‍යයනය සඳහා ලියාපදිංචි වී ස්වකීය පර්යේෂණ කටයුතුවල විශිෂ්ට ප්‍රගතියක් ප්‍රදර්ශනය කරන විද්‍යාර්ථියෙකුට සිය අභිමතය පරිදි තම අධ්‍යයනය දර්ශන විශාරද උපාධිය සඳහා උසස් කරන ලෙස විධිමත් පරිදි කරුණු දක්වමින් ඉල්ලීමක් කළ හැකි ය. එම ඉල්ලීම කළ හැකි වනුයේ දර්ශනපති උපාධි අධ්‍යයනය සඳහා ලියාපදිංචි වූ දින සිට මාස 12 සහ 18 අතර කාල පරිච්ඡේදය තුළ දී වන අතර, ඒ වන විට අදාළ පර්යේෂණ කාර්යයෙහි 50% කට වඩා ඔහු විසින් සම්පූර්ණ කොට තිබිය යුතු ය. පර්යේෂණ අධීක්ෂකවරුන්ගේ ද අදාළ අධ්‍යයනාංශ ප්‍රධානියාගේ ද නිර්දේශය සමග එම ඉල්ලීම ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. දර්ශනපති උපාධි අධ්‍යයනය දර්ශන විශාරද උපාධි අධ්‍යයනය දක්වා උසස් කිරීම සඳහා වන ඉල්ලීම සාධාරණීකරණය කරමින් සහ ප්‍රදානය කිරීමට අපේක්ෂිත අතිරේක ශාස්ත්‍රීය දායකත්වය පැහැදිලි කරමින් අපේක්ෂකයා විසින් විවෘත සංක්ෂිප්ත ශාස්ත්‍රීය ඉදිරිපත් කිරීමක් (presentation) පවත්වනු ලැබිය යුතු ය.

04. පළමු වරට දර්ශනපති හෝ දර්ශන විශාරද උපාධිය සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නෙකු විසින් තම පර්යේෂණ කුසලතාව සනාථ කෙරෙන ලිඛිත සාධක ස්වකීය අයැදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

### 03.2.4 සංක්ෂිප්ත ශාස්ත්‍රීය ඉදිරිපත් කිරීම

01. පර්යේෂණ උපාධි ශිෂ්‍යයින් විසින් ආයතනයේ අධ්‍යක්ෂවරයා, අදාළ අංශයේ අංශ ප්‍රධාන ඇතුලු ආයතනයේ ආචාර්යවරුන් සහ පර්යේෂණ අධීක්ෂකවරුන් හමුවෙහි පහත සඳහන් පරිදි සංක්ෂිප්ත ශාස්ත්‍රීය ඉදිරිපත් කිරීම් (ප්‍රථම, උත්තීර්ණ හා අවසාන) සිදු කළ යුතු ය. එම දේශනවල දී විද්‍යාර්ථියා විසින් ප්‍රදර්ශනය කරනු ලබන පර්යේෂණ ප්‍රගතිය සහ සිය දැනුම ඉදිරිපත් කිරීමේ කුසලතාව පිළිබඳ ව සම්පාදනය කෙරෙන වාර්තාව, පළමුව අධ්‍යයන මණ්ඩලයටත්, ඉන් අනතුරු ව පීඨ සභාවටත් යොමු කෙරේ.

### 03.2.5 දර්ශනපති උපාධි අපේක්ෂකයින්

01. පළමු ඉදිරිපත් කිරීම

පර්යේෂණ යෝජනාව පදනම් කර ගනිමින් පළමු ඉදිරිපත් කිරීම ලියාපදිංචි වූ දින සිට ප්‍රථම මාස 06 තුළ දී ද,

02. අවසන් ඉදිරිපත් කිරීම

පර්යේෂණ ප්‍රතිඵල පදනම් කරගෙන ස්වීය දායකත්වය ඉදිරිපත් කරමින් දෙවන ඉදිරිපත් කිරීම මාස 18 සිට මාස 24 දක්වා වූ කාලය තුළ දී ද,

03. උත්තීරණය සඳහා වන ඉදිරිපත් කිරීම

දර්ශනපති උපාධි අපේක්ෂකත්වය, දර්ශන විශාරද උපාධි අපේක්ෂකත්වය දක්වා උසස් කර ගැනීමට අපේක්ෂිත අපේක්ෂකයින්, සිය අපේක්ෂකත්වය දර්ශන විශාරද උපාධි අපේක්ෂකත්වය දක්වා උසස් කර ගැනීමට කෙරෙන ඉල්ලීමට දක්වා ඇති හේතු සාධාරණීකරණය කරමින් සිදු

කරන උත්තීරණය සඳහා වන ඉදිරිපත් කිරීම මාස 12 සිට මාස 18 දක්වා කාලය තුළ දී ද සිදු කළ යුතු ය.

### 03.2.6 දර්ශන විශාරද උපාධි අපේක්ෂකයින්

01. පළමු ඉදිරිපත් කිරීම
    පර්යේෂණ යෝජනාව පදනම් කර ගනිමින් ප්‍රථම ඉදිරිපත් කිරීම ලියාපදිංචි වූ දින සිට ප්‍රථම මාස 06 තුළ දී ද,
02. අවසන් ඉදිරිපත් කිරීම
    පර්යේෂණ ප්‍රතිඵල පදනම් කර ගෙන ස්වීය දායකත්වය ඉදිරිපත් කරමින් අවසාන ඉදිරිපත් කිරීම මාස 24 සිට මාස 36 දක්වා වූ කාලය තුළ දී ද සිදු කළ යුතු ය.

### 3.2.7 පර්යේෂණ අධීක්ෂණය

දර්ශනපති උපාධිය හෝ දර්ශන විශාරද උපාධිය හෝ සඳහා ලියාපදිංචි වන සෑම විද්‍යාර්ථියෙකු වෙනුවෙන් ම ආයතනය විසින් අධීක්ෂකවරයෙකු/අධීක්ෂකවරුන් පත් කරනු ලැබේ. පර්යේෂණ විෂයයේ ස්වභාවය සලකා බලා අවශ්‍ය වන්නේ නම් අධ්‍යයන කමිටුවේ හා පීඨ සභාවේ නිර්දේශය මත අධීක්ෂකවරුන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු වුව ද පත්කළ හැකි ය. සෑම විද්‍යාර්ථියෙකු ම අධීක්ෂකවරුන්ගෙන් පෞද්ගලික ව ලැබෙන මාර්ගෝපදේශකත්වය යටතේ සිය අධ්‍යයනයෙහි නිරත විය යුතු ය. සෑම අපේක්ෂකයෙක් ම මාස 6කට වරක් සිය පර්යේෂණ කටයුතු පිළිබඳ ප්‍රගති වාර්තා, සිය අධීක්ෂකවරුන් මගින් ආයතනය වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. යම් වර්ෂයක් තුළ අනුගාමී ව ප්‍රගති වාර්තා දෙකක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

### 3.2.8 පර්යේෂණ උපාධි කාලසීමාව

01. පර්යේෂණ උපාධි අධ්‍යයන වැඩසටහන් සඳහා නියමිත අවම කාල පරිච්ඡේද මෙසේය:
    i. පූර්ණකාලීන දර්ශනපති උපාධි වැඩසටහන වසර 2 යි.
    ii. අර්ධකාලීන දර්ශනපති උපාධි වැඩසටහන වසර 3 යි.
    iii. පූර්ණකාලීන දර්ශන විශාරද උපාධි වැඩසටහන වසර 3 යි.
    iv. අර්ධකාලීන දර්ශන විශාරද උපාධි වැඩසටහන වසර 4 යි.
02. නියමිත කාලය තුළ සිය පර්යේෂණ කටයුතු නිමකර ආයතනය වෙත නිබන්ධය භාරදීමට අපොහොසත් වන විද්‍යාර්ථීන්ට සිය ලියාපදිංචි කාලය දීර්ඝ කරන ලෙස අධීක්ෂකවරුන් මගින් ඉල්ලුම් කළ හැකි ය. ආයතනය විසින් එම ඉල්ලීම් සලකා බලා පූර්ණකාලීන දර්ශනපති උපාධි ශිෂ්‍යයින්ගේ ලියාපදිංචි කාලය උපරිම වශයෙන් වසර හතරක් දක්වා ද, අර්ධකාලීන විද්‍යාර්ථීන්ගේ ලියාපදිංචි කාලය උපරිම වශයෙන් වසර හයක් දක්වා ද දීර්ඝ කළ හැකි ය. තව ද පූර්ණකාලීන දර්ශන විශාරද උපාධි විද්‍යාර්ථීන්ගේ ලියාපදිංචි කාලය උපරිම වශයෙන් වසර හයක් දක්වා ද, අර්ධකාලීන විද්‍යාර්ථීන්ගේ ලියාපදිංචි කාලය උපරිම වශයෙන් වසර අටක් දක්වා ද දීර්ඝ කළ හැකි ය. එම කාල සීමාව තුළ සිය අධ්‍යයනය නිම කරගැනීමට අපොහොසත් විද්‍යාර්ථීන්ගේ ලියාපදිංචිය අහෝසි වේ.

## 03.3 උසස් උපාධියක් සම්පූර්ණ කිරීම සඳහා වන අවශ්‍යතා

### 03.3.1 දර්ශනපති උපාධි අධ්‍යයනය

මෙම අධ්‍යයන වැඩසටහන පහත සඳහන් අංගවලින් සමන්විත වෙයි.

i. ආයතනය විසින් අනුමත මාතෘකාව අනුව සම්පාදනය කෙරෙන පර්යේෂණ නිබන්ධය
ii. 03.2.4 හි දක්වා ඇති පරිදි පැවැත් විය යුතු සංක්ෂිප්ත ශාස්ත්‍රීය ඉදිරිපත් කිරීම් (presentations)
iii. සම්පාදිත පර්යේෂණ නිබන්ධය අයත් පර්යේෂණ ක්ෂේත්‍රය හා සම්බන්ධ ප්‍රශ්න පත්‍ර දෙකකින් (i නිබන්ධය ඇසුරෙන් හා ii නිබන්ධය අදාළ විෂය ඇසුරෙන්) යුක්ත ලිඛිත පරීක්ෂණය
iv. වාචික පරීක්ෂණය

මෙම වාචික පරීක්ෂණය ආයතනයේ අධ්‍යක්ෂවරයා, අදාළ අධ්‍යයනාංශාධිපති, පරීක්ෂකවරුන් සහ අධීක්ෂකවරුන්ගෙන් සමන්විත මණ්ඩලයක් විසින් පවත්වනු ලැබේ. කෙසේ වුව ද දර්ශනපති උපාධිය සඳහා වන වාචික පරීක්ෂණයට කැඳවීමට පෙර අපේක්ෂකයා ඊට අදාළ ලිඛිත පරීක්ෂණයෙන් සමත් ව සිටිය යුතු ය.

### 03.3.2 දර්ශන විශාරද උපාධි අධ්‍යයනය

මෙම අධ්‍යයන වැඩසටහන පහත සඳහන් අංගවලින් සමන්විත වෙයි.

i. ආයතනය විසින් අනුමත මාතෘකාව අනුව සම්පාදනය කෙරෙන පර්යේෂණ නිබන්ධය
ii. 03.2.6 හි දක්වා ඇති පරිදි පැවැත් විය යුතු සංක්ෂිප්ත ශාස්ත්‍රීය ඉදිරිපත් කිරීම් (presentations)
iii. පර්යේෂණ නිබන්ධය හා සම්බන්ධ වාචික පරීක්ෂණය. (මෙම වාචික පරීක්ෂණය ද ඉහත 03.3.1 (iv) හි දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත කමිටුවක් විසින් පවත්වනු ලැබේ.

### 03.3.3 පර්යේෂණ නිබන්ධය

1. ආයතනයේ පීඨ සභාව විසින් අනුමත කරනු ලැබූ මාතෘකාවක් යටතේ පර්යේෂණ උපාධි අපේක්ෂකයා විසින් ස්වාධීන ව කරනු ලබන පර්යේෂණයන්හි ප්‍රතිඵල පර්යේෂණ නිබන්ධයෙහි අන්තර්ගත විය යුතු ය. පර්යේෂණ නිබන්ධය මෙම ආයතනයේ හෝ වෙනත් විශ්වවිද්‍යාලයක හෝ එබඳු අන් අධ්‍යයන ආයතනයක හෝ උපාධියක් සඳහා මෙයට පෙර තමා විසින් හෝ අන් අයෙකු විසින් ඉදිරිපත් කළ නිබන්ධයක් නොවිය යුතු අතර, අපේක්ෂකයා විසින් අදාළ නිබන්ධය ස්වකීය ස්වාධීන පර්යේෂණ අධ්‍යයනයක් බව සනාථ කෙරෙන ප්‍රකාශයක් නිබන්ධයෙහි අන්තර්ගත කළ යුතු ය. පර්යේෂණ නිබන්ධය බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි ඥාන සම්භාරයට විශිෂ්ට ප්‍රදානයක් විය යුතු අතර, නව සාධක අනාවරණය කර ගැනීමෙන් හා ස්වාධීන විචාර ශක්තිය උපයෝගී කර ගැනීමෙන් පර්යේෂණ කාර්යයට අදාළ අපූර්වතාවක් එමගින් ප්‍රකට විය යුතු ය. ආයතනය විසින් පත්කරනු ලැබූ අධීක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ අපේක්ෂකයා විසින් පර්යේෂණය සිදුකර නිබන්ධය සම්පාදනය කළ යුතු ය. ඒ බව සනාථ කරමින් නිබන්ධය අදාළ උපාධිය පිරිනැමීම පිණිස සලකා බැලීම සඳහා සුදුසු බවට ප්‍රකාශ වන අධීක්ෂකවරුන්ගේ නිර්දේශයක් ද නිබන්ධයෙහි අන්තර්ගත විය යුතු ය.

2. යම් විද්‍යාර්ථියෙකු තම පර්යේෂණය කරගෙන යාමේ දී අනුමත කරන ලද නිබන්ධ සැලැස්මෙහි කිසියම් සංශෝධනයක් කිරීම අවශ්‍ය වන්නේ යැයි හැඟී යන්නේ නම් ඒ සඳහා අධීක්ෂකවරුන් මගින් ආයතනයෙන් ඉල්ලීමක් කළ හැකි වන අතර, එම ඉල්ලීම සලකා බැලීම සඳහා අධ්‍යයනාංශ කමිටුව වෙත යොමු කරනු ඇත.

3. දර්ශනපති උපාධිය සඳහා වන පර්යේෂණ නිබන්ධය වචන 50,000 - 75,000 අතර ප්‍රමාණයකින් සමන්විත විය යුතු වන අතර, දර්ශන විශාරද උපාධිය සඳහා වන පර්යේෂණ නිබන්ධය වචන 65,000 - 80,000 අතර ප්‍රමාණයකින් සමන්විත විය යුතු ය. වචන සංඛ්‍යාව ගණනය කිරීමේ දී ආශ්‍රිත ග්‍රන්ථාවලිය නොසැලකේ. ග්‍රන්ථ සංස්කරණයක් පර්යේෂණ නිබන්ධය ලෙස ඉදිරිපත් කිරීමේ දී මෙම වචන සංඛ්‍යාව පිළිබඳ සීමා අදාළ නොවේ. පර්යේෂණාත්මක නිබන්ධයක් ඉහත සඳහන් කළ වචන සංඛ්‍යාවෙන් සමන්විත විය යුතු වුව ද, එහි ලා නිබන්ධයේ ප්‍රමාණාත්මක බව පමණක් නොව එහි ගුණාත්මක බව ද සලකා බැලෙනු ඇත.

4. පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන සෑම පර්යේෂණ නිබන්ධයක ම වචන 300කට වැඩි නොවන සාර සංක්ෂේපයක් නිබන්ධය ආරම්භයේ දී ඊට අන්තර්ගත කළ යුතු ය. සිංහල භාෂාවෙන් සම්පාදනය කෙරෙන නිබන්ධයක දී මෙම සාරසංක්ෂේපයෙහි ඉංග්‍රීසි පරිවර්තනයක් ද නිබන්ධයෙහි අන්තර්ගත කළ යුතු ය.

5. පර්යේෂණ නිබන්ධයේ ආකෘතිය, ප්‍රමාණය හා නිමාව ආයතනය විසින් වරින්වර අනුමත කරනු ලබන නිර්ණායකවලට අනුකූල විය යුතු ය.

6. ආයතන නියමාවලියේ සඳහන් කරුණුවලට එකඟ නොවන අයුරින් සකස් කොට ඇතැයි සැලකෙන නිබන්ධයක් වෙතොත්, එය ප්‍රතික්ෂේප කිරීමේ බලය ආයතනය සතු වේ.

7. සෑම අයැදුම්කරුවකු ම තම පර්යේෂණ නිබන්ධයේ එකිනෙකට සමාන වූ පිටපත් තුනක් ඇගයීම සඳහා ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු ය.

### 03.3.4 වාචික පරීක්ෂණය හා ඒ හා සබැඳි තීරණ

1. පර්යේෂණ නිබන්ධය ඇගයීමෙන් අනතුරු ව මසක් ඇතුළත පරීක්ෂණ කමිටුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය පැවැත්වීම සඳහා ආයතනය විසින් කටයුතු සම්පාදනය කෙරේ. එහෙත් දර්ශනපති උපාධිය සම්බන්ධ වාචික පරීක්ෂණය පවත්වනු ලබනුයේ ලිඛිත පරීක්ෂණය සමත් වීමෙන් අනතුරුව ය. නිබන්ධය ඇගයීමෙන් මසක් තුළ එම ලිඛිත පරීක්ෂණය පැවැත් වේ.

2. වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අපේක්ෂකයෙකු ඇගයීම සඳහා ආයතනය වෙත ඉදිරිපත් කළ නිබන්ධයේ පිටපතක් රැගෙන පැමිණිය යුතු ය.

3. පර්යේෂණ නිබන්ධය උපාධි ප්‍රදානය සඳහා පිළිගැනීමට හෝ එය සංශෝධනය විය යුතු යැයි නිර්දේශ කිරීමට හෝ නිබන්ධය නැවත සකස් කිරීමට යොමු කිරීම හෝ එය නුසුදුසු යැයි ප්‍රතික්ෂේප කිරීමට හෝ පරීක්ෂණ මණ්ඩලයට බලය ඇත.

4. සුළු සංශෝධනවලට යටත් ව නිබන්ධය පිළිගන්නා ලද්දේ නම්, පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශිත සංශෝධන යථා පරිදි සිදු කොට මාස තුනක කාලයක් ඇතුළත අපේක්ෂකයා විසින් නිබන්ධය ආයතනයට භාර දිය යුතු ය. එහි දී පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද සංශෝධන නිසි පරිදි අපේක්ෂකයා විසින් සිදු කොට ඇති බවට අධීක්ෂකවරයා/වරුන් විසින් සුපරීක්ෂක නිර්දේශ කර තිබීම අවශ්‍ය ය.

5. සැලකිය යුතු තරම් විශාල සංශෝධනයක් නිබන්ධයේ සිදු කළ යුතු යැයි පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශ කර තිබේ නම්, එලෙස සංශෝධිත නිබන්ධය එම මණ්ඩලය විසින් නියම කර ඇති කාලය තුළ සංශෝධන සිදු කොට අපේක්ෂකයා විසින් ආයතනය වෙත භාර දිය යුතු ය. මෙම අවස්ථාවේ දී ද පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සංශෝධන නිසි පරිදි අපේක්ෂකයා විසින් සිදු කොට ඇති බවට අධීක්ෂකවරයා/වරුන් විසින් සුපරීක්ෂක නිර්දේශ කොට තිබිය යුතු ය.

6. පරීක්ෂක මණ්ඩලයේ තීරණය මත නිබන්ධය උපාධිය ප්‍රදානය කිරීම සඳහා පිළිගනු ලැබේ නම්, සංශෝධිත නිබන්ධය ආයතනය වෙත භාරදුන් දිනය උපාධිය වලංගු වන දිනය ලෙස සලකනු ලැබේ.

7. නිබන්ධය සුදුසු නොවන බවට සලකමින් එක් පරීක්ෂකවරයෙකු විසින් එය ප්‍රතික්ෂේප කර ඇති අතර, අනෙක් පරීක්ෂකවරයා විසින් එය සුදුසු යැයි නිර්දේශ කර ඇති අවස්ථාවක දී එම නිබන්ධය තෙවැනි පරීක්ෂකවරයෙකු වෙත යොමු කළ යුතු ය. තෙවැනි පරීක්ෂකවරයාගේ නිර්දේශය මත පරීක්ෂක මණ්ඩලය විසින් අවසන් තීරණයකට එළඹෙනු ඇත. (එබඳු අවස්ථාවක දී වැය වන අමතර මුදල් විද්‍යාර්ථියා විසින් ආයතනය වෙත ගෙවිය යුතුය.)

8. නිබන්ධය පරීක්ෂා කළ පරීක්ෂකවරුන් දෙදෙනා අතරින් එක් පරීක්ෂකවරයෙකු නිබන්ධය අදාළ උපාධි ප්‍රදානයට සුදුසු බවට නිර්දේශ කොට ඇතත් අනෙක් පරීක්ෂකවරයා විසින් නිබන්ධයෙහි අන්තර්ගත කරුණු අන්තර්ජාලයෙන් හෝ නිබන්ධයකින් හෝ වෙනත් ලේඛනවලින් හෝ උපුටාගත් කොටස් 15% (Plagiarism) කට වැඩියෙන් ඇතැයි වාර්තා කොට ඇත්නම් නිබන්ධය නැවත පරීක්ෂා කිරීම සඳහා තෙවැනි පරීක්ෂකවරයෙකු වෙත නො යැවිය යුතුය. එබඳු අවස්ථාවකදී අදාළ විද්‍යාර්ථියා විසින් නිබන්ධය නැවත සකස් කොට ඉදිරිපත් කළ යුතු බවට හෝ අදාළ උපාධි ප්‍රදානය සඳහා සුදුසු තත්ත්වයකින් නිබන්ධය සකස් වී නැතැයි ප්‍රතික්ෂේප කිරීමට හෝ වාචික පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කළ යුතුය.

9. ස්වකීය පර්යේෂණ කාර්යයෙහි අතිවිශිෂ්ට නිපුණතාවක් සහ නව්‍ය දායකත්වයක් ප්‍රදර්ශනය කෙරෙන දර්ශනපති උපාධි අපේක්ෂකයෙකුගේ පර්යේෂණ නිබන්ධය වෙනුවෙන් දර්ශන විශාරද උපාධිය ප්‍රදානය කිරීම මැනවැයි අධ්‍යක්ෂවරයා වෙත නිර්දේශ කිරීමේ හැකියාව පරීක්ෂකවරුන්ට ඇත. මේ සඳහා අදාළ පරීක්ෂකවරුන් සියලු දෙනාගේ ම නිර්දේශ අවශ්‍ය ය. එම නිර්දේශය පළමු ව අධ්‍යක්ෂවරයා විසින් ද දෙවනු ව පීඨ සභාව විසින් ද සලකා බලනු ඇත.

### 03.3.5 පරීක්ෂණ ප්‍රතිඵල

1. පීඨ සභාවේ නිර්දේශ හා සනාතන සභාවේ අනුමැතියෙන් පර්යේෂණ උපාධි පරීක්ෂණයන්හි ප්‍රතිඵල අපේක්ෂකයින් වෙත පෞද්ගලික ව දනුම් දෙනු ලැබේ.

### 03.3.6 නිබන්ධ තැන්පත් කර තැබීම

1. පර්යේෂණ උපාධි ලාභය සඳහා අනුමත වූ පර්යේෂණ නිබන්ධයෙහි එක් පිටපතක් ආයතනයේ පුස්තකාලයෙහි විමර්ශන කටයුතු සඳහා තැන්පත් කර තබනු ඇත. තවත් පිටපතක් අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයෙහි තැන්පත් කර තබන අතර, අනෙක් පිටපත ශිෂ්‍යයා වෙත ආපසු භාරදෙනු ලැබේ.

### 03.3.7 නිබන්ධ මුද්‍රණය කිරීම

1. පරීක්ෂණ මණ්ඩලය විසින් පර්යේෂණ නිබන්ධය පිළිගනු ලැබූ විට එය එපරිද්දෙන් ම මුද්‍රණය කර ප්‍රකාශයට පත්කිරීම යෝග්‍ය වන්නේ නම්, ඒ බව ද පරීක්ෂකවරුන්ගේ වාර්තාවල සඳහන් කරනු ඇත.

## 03.4 පර්යේෂණ උපාධි ශිෂ්‍යයින් සඳහා මාර්ගෝපදේශ

### 03.4.1 පර්යේෂණ උපාධි සඳහා අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම

1. පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයෙහි පර්යේෂණ උපාධියක් හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථියෙකු විසින් පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ක්ෂේත්‍රයට අයත්, යෝග්‍ය යැයි තමන් අදහස් කරන, මාතෘකාවක් තීරණය කොට පළමු ව ඒ පිළිබඳ ව ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු හමුවී සාකච්ඡා කළ යුතු ය. එහි දී අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයා හෝ එම පර්යේෂණ මාතෘකාවේ යෝග්‍යතාව පිළිබඳ ව නිර්දේශ කරනු ඇත.

2. එම මාතෘකාව සඳහා මූලික අනුමැතිය ලද්දේ නම්, ආයතනයේ කාර්යාලයෙන් ලබා ගත් අයැදුම්පතෙහි නියමිත ස්ථානයේ එය සඳහන් කරමින්, එම අයැදුම්පත නිසි පරිදි සම්පූර්ණ කොට මාතෘකාව සාකච්ඡා කළ අධ්‍යක්ෂවරයාගේ හෝ අධ්‍යයන අංශ කාර්ය මණ්ඩල සාමාජිකයාගේ නිර්දේශය ද සහිත ව ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. පර්යේෂණ උපාධියක් සඳහා ලියාපදිංචි වීම පිණිස ඉදිරිපත් කරනු ලබන සෑම අයැදුම්පතක් ම ආයතනයේ අධ්‍යයනාංශ කමිටුවේ නිර්දේශ මත පීඨ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරෙන අතර, එහි දී එම මාතෘකාව අනුමත කිරීමට, එහි කළ යුතු කිසියම් සංශෝධනයක් සඳහා යෝජනාවක් කිරීමට හෝ අයැදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හෝ එම කමිටුවට හා පීඨ සභාවට බලය ඇත. එම තීරණය අනුව අයැදුම්කරු ක්‍රියා කළ යුතු ය. අදාළ පර්යේෂණාත්මක අධ්‍යයනය සඳහා ලියාපදිංචි වූ දිනය ලෙස සලකනු ලබන්නේ සංශෝධන රහිත ව හෝ සංශෝධනවලට යටත්ව පර්යේෂණ මාතෘකාව පීඨ සභාව විසින් අනුමත කළ දිනය යි.

### 03.4.2 පර්යේෂණ යෝජනාව ඉදිරිපත් කිරීම

1. ආයතනය විසින් නිකුත් කර ඇති නියමයන්ට අනුව අධීක්‍ෂකවරයාගේ/වරුන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ සැකසූ පර්යේෂණ යෝජනාව ලියාපදිංචි වූ දින සිට මාස හයක් ඉකුත් ව යාමට පෙර එම අධීක්‍ෂකවරයාගේ/වරුන්ගේ නිර්දේශය ද සහිත ව ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත අපේක්‍ෂකයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.
2. පීඨ සභාවේ තීරණය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/සහකාර ලේඛකාධිකාරී විසින් අපේක්‍ෂකයාට ලිඛිත ව දන්වා යවනු ලබන අතර එහි දී අපේක්‍ෂකයා එම උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.

### 03.4.3 පර්යේෂණ කාර්යයෙහි මූලික අවශ්‍යතා

1. පර්යේෂණ යෝජනාව පීඨ සභාව විසින් අනුමත කරනු ලැබීමෙන් පසු පීඨ සභාව විසින් පත් කරන ලද අධීක්‍ෂකවරයාගේ/වරුන්ගේ මාර්ගෝපදේශ හා උපදෙස් යටතේ විද්‍යාර්ථියා විසින් සිය පර්යේෂණාත්මක අධ්‍යයනය සිදු කළ යුතු අතර එහි දී පහත සඳහන් අවශ්‍යතා ඔහු විසින් සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.
   i. පර්යේෂණ යෝජනාව පදනම් කොට ගෙන ලියාපදිංචි වූ දින සිට මාස හයක් ඇතුළත විවෘත සංක්‍ෂිප්ත ඉදිරිපත් කිරීමක් (1st Presentation) සිදු කිරීම
   ii. අධීක්‍ෂකවරයා/වරුන් මඟින් සෑම හය මසකට වරක් ම ආයතනය වෙත පර්යේෂණාත්මක අධ්‍යයනය සම්බන්ධයෙන් ප්‍රගත වාර්තාවක් ඉදිරිපත් කිරීම
   iii. මසකට වරක් අධීක්‍ෂකවරයා/වරුන් පෞද්ගලික ව හමු වී සිය පර්යේෂණාත්මක අධ්‍යයනය සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම. දිවයිනෙන් බැහැර ව සිටින අපේක්‍ෂකයෙකු වන්නේ නම් දුරකථනය, විද්‍යුත් ලිපි හුවමාරුව හෝ අන්තර්ජාල සබඳතා වැනි ක්‍රම මඟින් අධීක්‍ෂකවරයාගෙන්/වරුන්ගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගත යුතු ය. තමන් හමු වී උපදෙස් ලබා ගත් බව සනාථ කිරීම පිණිස අධීක්‍ෂකවරයාට සටහනක් තැබීම සඳහා සිය ශිෂ්‍ය වාර්තා පොත අධීක්‍ෂකවරයා වෙත ඒ අවස්ථාවේ දී ම ඉදිරිපත් කිරීම අපේක්‍ෂකයාගේ වගකීමකි. අධීක්‍ෂකවරයා පෞද්ගලික ව හමු නොවී වෙනත් මාර්ගවලින් උපදෙස් ලබා ගත් අවස්ථාවන්හි දී ඒ බව අදාළ දිනය හා වෙනත් අවශ්‍ය විස්තර ද දක්වමින් අධීක්‍ෂකවරයා/වරුන්ගේ සනාථ කිරීම් ද සහිත ව සිය මාසික ප්‍රගති වාර්තාවෙහි අපේක්‍ෂකයා විසින් සඳහන් කළ යුතු ය.
   iv. පර්යේෂණයට අදාළ ව සිදු කරනු ලබන ලිඛිත හෝ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල දී අපේක්‍ෂකයා විසින් ඒ සඳහා සිය අධීක්‍ෂකවරයාගේ/වරුන්ගේ මාර්ගෝපදේශකත්වය සහ උපදෙස් ලබා ගැනීම
   v. දර්ශනපති උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන් විසින් උපාධිය සඳහා ලියාපදිංචි වූ දිනයේ සිට මාස 18ක් ඉකුත්වීමෙන් පසුව ද, දර්ශන විශාරද උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන් විසින් උපාධිය සඳහා ලියාපදිංචි වූ දින සිට මාස 24ක් ඉක්ම යාමෙන් පසුව ද ස්වකීය පර්යේෂණ මඟින් අදාළ විෂය ක්ෂේත්‍රයෙහි පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳ ස්වීය දායකත්වය ප්‍රකට කරමින් විවෘත,

සංක්ෂිප්ත ශාස්ත්‍රීය දේශනයක් පවත්වනු ලැබීම. මෙම විවෘත සංක්ෂිප්ත ශාස්ත්‍රීය දේශනය සිදු කළ යුතු වන්නේ පර්යේෂණ නිබන්ධය ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත මුල්වරට භාරදීමට ප්‍රථමයෙනි.

vi. නියමිත කාලය තුළ පර්යේෂණය නිමා කිරීමට අපොහොසත් වන අවස්ථාවන්හි දී ඒ සඳහා කරුණු ඉදිරිපත් කරමින් අධීක්ෂකවරයාගේ/වරුන්ගේ නිර්දේශය ද සහිත ව සිය අධ්‍යයන කාලය දීර්ඝ කරන ලෙස ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී මගින් අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලා සිටීම (එවැනි දීර්ඝ කිරීමක දී පූර්ණකාලීන අපේක්ෂකයන්ට දර්ශනපති උපාධිය සඳහා උපරිම කාලය වසර 2ක් වන අතර දර්ශන විශාරද උපාධිය සඳහා වසර තුනකි.)

### 03.4.4 උත්තීරණය කිරීම පිණිස වන විවෘත සංක්ෂිප්ත දේශනය

1. දර්ශනපති උපාධි අධ්‍යයනය සඳහා ලියාපදිංචි වූ අපේක්ෂකයෙකු ස්වකීය අධ්‍යයනය දර්ශන විශාරද උපාධි අධ්‍යයනයක් සඳහා උත්තීර්ණය කරගැනීමට අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා අදාළ අධීක්ෂකවරයාගේ/වරුන්ගේ නිර්දේශය ද සහිත ලිඛිත ඉල්ලීමක් දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි වූ දින සිට වර්ෂයක් ඉකුත් ව යාමෙන් පසු ව සහ මාස 18ක් ඉකුත් ව යාමට පෙර පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබීමට යටත් ව ආයතනය වෙත ඉදිරිපත් කළ හැකි ය.

   i. පර්යේෂණාත්මක අධ්‍යයනයෙන් දැනටමත් 50%ක් සම්පූර්ණ කොට ඇති බවටත්

   ii. අයැදුම්කරුගේ පර්යේෂණ කුසලතා හා පර්යේෂණ මාතෘකාවේ විෂය පථය දර්ශන විශාරද උපාධිය පිණිස වන පර්යේෂණාත්මක අධ්‍යයනයක් සඳහා යෝග්‍ය සහ ප්‍රමාණවත් බවටත් අධීක්ෂකවරයා/වරුන් විසින් නිර්දේශ කරනු ලැබීම

### 03.4.5 අවසන් ඉදිරිපත් කිරීම

1. මෙහි මුලින් දක්වා ඇති 03.2.5 (02)හි සහ 03.2.6 (02)හි ඇති විස්තරය බලන්න.

### 03.4.6 නිබන්ධ ආයතනය වෙත භාරදීම හා ඇගයීමේ ක්‍රියාවලිය

1. ඇති විය හැකි ප්‍රමාද වළක්වා ගැනීම පිණිස ස්වකීය නිබන්ධය පරීක්ෂණ කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට මාස 3කට පෙර ඒ බව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී මගින් ආයතනය වෙත දැනුම් දෙන ලෙස විද්‍යාර්ථීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**නිබන්ධය පළමුවර භාරදීම**

2. ස්වකීය පර්යේෂණාත්මක අධ්‍යයනය අවසන් ව අදාළ පර්යේෂණ නිබන්ධය පරිගණකය මගින් මුද්‍රණය කර නිම වූ පසු, එම නිබන්ධය ආයතනය විසින් පිළිගෙන ඇති නිර්ණායක අනුව පිළියෙල කර තිබේ ද යන්න හා රචනා චෞරත්වය පරීක්ෂා කරනු පිණිස, එහි මුද්‍රිත පිටපතක් නියමිත ආකෘතිය අනුව අධීක්ෂකගේ/වරුන්ගේ නිර්දේශය ද සහිත ව අපේක්ෂකයා විසින් ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත ඉදිරිපත් කළ යුතු ය. කෙසේ වෙතත්, අපේක්ෂකයා එලෙස නිබන්ධය භාරදිය යුතු වනුයේ සිය ලියාපදිංචි කාලය ඉකුත් වීමට පෙර ය. මෙම පිටපත තද

බැම්මෙන් (Hard Binding) බැඳීම නොකළ යුතු ය. එම නිබන්ධ පිටපත සමග එහි MS-Word හා PDF ආකෘතිවලින් සකසන ලද මෘදු පිටපත් ද සංයුක්ත තැටියක් මගින් කාර්යාලය වෙත ලබා දිය යුතු ය. නිබන්ධය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/සහකාර ලේඛකාධිකාරී විසින් භාරගත් බවට ලදුපතක් අපේක්ෂකයා වෙත එම අවස්ථාවේ දී ම නිකුත් කෙරෙනු ඇත.

3. මුද්‍රිත පිටපත ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත භාර දී මාසයක් තුළ එම නිබන්ධය සම්බන්ධයෙන් ඉදිරියට ගත යුතු පියවර පිළිබඳ ව ආයතනය විසින් අපේක්ෂකයා වෙත ලිඛිත ව දැනුම්වත් කෙරේ. මාසයක් තුළ එවැනි දැනුම්දීමක් නොලද හොත් අපේක්ෂකයාට ඒ පිළිබඳ ව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගෙන්/ සහකාර ලේඛකාධිකාරීගෙන් ලිඛිත ව විමසිය හැකි ය. ආයතනය වෙත ඉදිරිපත් කරන ලද නිබන්ධ සම්බන්ධයෙන් වන සියලු ම විමසීම් යොමු කළ යුතු වනුයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ සහකාර ලේඛකාධිකාරී වෙත ය.

4. අපේක්ෂකයා පළමුවර ආයතනය වෙත භාරදෙන ලද නිබන්ධය ආයතනය විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරු ව ලිඛිත පරීක්ෂක උපදෙස් සහිත ව ශිෂ්‍යයා වෙත භාරදෙන අතර එහි සංශෝධන තිබේ නම් අධීක්ෂකවරයාගේ/වරුන්ගේ ද මාර්ගෝපදේශ සහිත ව නිබන්ධයේ අදාළ සංශෝධන නිසිපරිදි සිදු කළ යුතු ය.

**නිබන්ධය දෙවනවර භාරදීම**

5. යථා පරිදි අවශ්‍ය සංශෝධන කරනු ලැබූ පර්යේෂණ නිබන්ධයෙහි මුද්‍රිත පිටපත් තුනක් පරීක්ෂකවරුන් වෙත යවනු පිණිස, තාවකාලික බැම්මෙන් බැඳ අධීක්ෂකවරයාගේ /අධීක්ෂකවරුන්ගේ නිර්දේශ සහිත ව ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත භාරදිය යුතු ය. එහි දී එම නිබන්ධය භාරගත් බවට ආයතනය විසින් නිකුත් කෙරෙන ලදුපත අපේක්ෂකයා විසින් සුරක්ෂිත ව තබා ගත යුතු ය.

6. ඉහත ඡේදයේ සඳහන් පරිදි සිය පර්යේෂණ නිබන්ධය ආයතනයේ ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත භාර දී මාස 03ක් ඉකුත් ව යාමෙන් පසු ව, ඒ පිළිබඳ ව ආයතනයෙන් කිසිදු දැන්වීමක් අපේක්ෂකයා වෙත නොලද හොත් ඒ සම්බන්ධයෙන් අපේක්ෂකයාට ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගෙන්/සහකාර ලේඛකාධිකාරීගෙන් ලිඛිත විමසීමක් හෝ අධ්‍යක්ෂවරයාට හා අධීක්ෂකවරයාට පිටපත් සහිත ව විද්‍යුත් තැපෑලක් මගින් විමසීමක් හෝ කළ හැකි ය.

### 03.4.7 දර්ශනපති උපාධි ලිඛිත පරීක්ෂණය

දර්ශනපති අධ්‍යයනයන්හි නිරත ව සිටින අපේක්ෂකයින් විසින් යථාපරිදි නිමකරන ලද නිබන්ධය පරීක්ෂකවරුන් වෙත යැවීම සඳහා ආයතනයේ ශිෂ්‍ය කටයුතු හා විභාග අංශය වෙත භාරදීමෙන් අනතුරු ව ආයතනය විසින් තීරණය කරන දිනයක දී/දිනයන්හි දී ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. (03.3.1(III) බලන්න.) ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර එක් පත්‍රයක් පර්යේෂණයට අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළ ව ද අනෙක් පත්‍රය පර්යේෂණ නිබන්ධ අන්තර්ගතයට අදාළ ව ද පැවැත් වේ.

### 03.4.8 වාචික පරීක්ෂණය

දර්ශනපති සහ දර්ශන විශාරද පර්යේෂණ අධ්‍යයනයන්හි නිරත ව සිටින අපේක්ෂකයින් ආයතනය විසින් තීරණය කරනු ලබන දිනයක දී පවත්වනු ලබන වාචික පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

### 03.4.9 අවසන් පර්යේෂණ නිබන්ධය

වාචික පරීක්ෂණයේ දී යෝජනා කරන ලද කිසියම් සංශෝධනයක් වේ නම්, අපේක්ෂකයා විසින් ඒ අනුව සිය පර්යේෂණ නිබන්ධය සංශෝධනය කළ යුතු අතර, ඒකී යෝජනා අනුව අදාළ නිබන්ධයෙහි සංශෝධන සිදු කර ඇති බවට අධීක්ෂකගේ/වරුන්ගේ සුපරීක්ෂක නිර්දේශය ලබා ගත යුතු ය. (සුපරීක්ෂක නිර්දේශය ලබා ගැනීමට අවශ්‍ය අයැදුම්පත ආයතනයේ ශිෂ්‍ය කටයුතු හා විභාග අංශයෙන් ලබා ගත හැකි ය.) **සුපරීක්ෂක නිර්දේශයට ආදර්ශය** පහත දැක්වේ.

(නිබන්ධ මාතෘකාව) නමැති මෙම නිබන්ධය (ශිෂ්‍ය අංකය) යටතේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ දර්ශනපති/දර්ශන විශාරද උපාධි පරීක්ෂණය සඳහා ලියාපදිංචි වී ඇති (අපේක්ෂකයාගේ නම) විසින් ස්වාධීන නිබන්ධයක් ලෙස ඉදිරිපත් කරනු ලැබීය. (දිනය) දින පැවති වාචික පරීක්ෂණයේ දී පරීක්ෂණ මණ්ඩලය විසින් නිබන්ධයෙහි පැවති අඩුපාඩු/දුර්වලතා සකස් කරන මෙන් මා වෙත දන්වනු ලැබීය.

ඒ අනුව අඩුපාඩු/දුර්වලතා සියල්ල සකස් කළ බවත්, සුපරීක්ෂක නිර්දේශය සහිත ව සංශෝධිත උපාධි නිබන්ධය නැවත ඉදිරිපත් කරන බවත් දන්වා සිටිමි.

අත්සන<br>
උපාධි අපේක්ෂක

සුපරීක්ෂක නිර්දේශය<br>
(අත්සන)<br>
අධීක්ෂකවරයාගේ නම, තනතුර හා දිනය

## 03.5 නිබන්ධ සම්පාදනය සඳහා මාර්ගෝපදේශ

1. පීඨ සභාව විසින් අනුමත කළ භාෂා මාධ්‍යයෙන් නිබන්ධය සම්පාදනය කළ යුතු ය.
2. පරිගණක අක්ෂර සංයෝජනයෙන් නිබන්ධය මුද්‍රණය කළ යුතු වන අතර, ඒ සඳහා ආයතනය විසින් වර්තමානයේ දී සිංහල මාධ්‍යය සඳහා FM අභය අක්ෂරමාලාව ද ඉංග්‍රීසි මාධ්‍යය සඳහා Times New Roman අක්ෂරමාලාව ද නිර්දේශ කර ඇත.

3. නිබන්ධය මුද්‍රණය කිරීම සඳහා නිර්දේශිත අක්ෂරයේ ප්‍රමාණය 12 වන අතර, පාදක සටහන් හෝ අන්ත සටහන් සඳහා වන අක්ෂරයේ ප්‍රමාණය 10 වේ. මාතෘකා පිටුව සඳහා මෙහි 03.5.9 අංකය යටතෙහි දක්වා ඇති ප්‍රමාණයෙන් ද, පරිච්ඡේද ශීර්ෂ සඳහා 14 ප්‍රමාණය ද පරිච්ඡේද තුළ අනුමාතෘකා සඳහා 12 ප්‍රමාණයේ තද කළු පැහැ අක්ෂර ද භාවිත කළ යුතු ය. ඉංග්‍රීසි භාෂාවෙන් සම්පාදනය කෙරෙන නිබන්ධවල දී පාලි, සංස්කෘත, ලතින් හෝ ග්‍රීක වැනි සම්භාව්‍ය භාෂා භාවිත කරන්නේ නම්, අවශ්‍ය අවස්ථාවන්හි දී උච්චාරණ ශබ්ද සංකේත (diacritical marks) යෙදීම අවශ්‍ය ය. නිබන්ධය සම්පාදනය කෙරෙනුයේ සිංහල මාධ්‍යයෙන් නම්, මාතෘකා පිටුවේ ඉංග්‍රීසි පරිවර්තනයක් සිංහල මාතෘකා පිටුවෙන් අනතුරු ව අන්තර්ගත කළ යුතු ය.

4. ප්‍රධාන නිබන්ධය 2.0 පරතරයෙන් යුතු පේළිවලින් සකස් කළ යුතු ය.

5. A4 ප්‍රමාණයේ GSM 80 ඝනත්වයෙන් යුත් කඩදාසිවල එක් පැත්තක පමණක් නිබන්ධය මුද්‍රණය කළ යුතු ය.

6. කඩදාසියේ වම් කෙළවරෙහි සෙ.මී. 04ක සහ ඉහළ, පහළ සහ දකුණු කෙළවර සඳහා සෙ.මී. 2.5 බැගින් ඉඩ තැබිය යුතු ය.

7. **නියමිත වචන සංඛ්‍යාව:** දර්ශනපති උපාධි නිබන්ධයක් සම්බන්ධයෙන් වචන 50,000 සිට 75,000 දක්වා ද දර්ශන විශාරද උපාධි නිබන්ධයක් සම්බන්ධයෙන් වන විට වචන 65,000 සිට 80,000 දක්වා ද වේ. මේ ගණනයේ දී පාදක සටහන්/අන්ත සටහන් සහ ආශ්‍රිත ග්‍රන්ථාවලිය ගණන් ගනු නොලැබේ.

8. නිබන්ධය පහත දැක්වෙන අංගවලින් සමන්විත විය යුතු ය.

   (අ) මාතෘකා පිටුව (සිංහල සහ ඉංග්‍රීසි)
   (ආ) නිබන්ධය ස්වකීය ස්වාධීන නිබන්ධයක් බවට සහතික කෙරෙන අපේක්ෂකයාගේ ප්‍රකාශය
   (ඇ) අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ නිර්දේශය
   (ඈ) උපකාරානුස්මෘති (අවශ්‍ය නම් පමණක්)
   (ඉ) සාරසංක්ෂේපය (සිංහල සහ ඉංග්‍රීසි)
   (ඊ) පටුන
   (උ) සංක්ෂේපණ
   (ඌ) ප්‍රධාන නිබන්ධය
   (එ) ආශ්‍රිත ග්‍රන්ථාවලිය
   (ඒ) උපග්‍රන්ථ

9. මාතෘකා පිටුවෙහි ආදර්ශයක් 160 පිටුවෙහි දැක්වෙයි.

   මාතෘකා පිටුව පිළියෙල කිරීමේ දී නිබන්ධ මාතෘකාව 22 ප්‍රමාණයේ තද කළු (bold) අක්ෂරයෙන් ද අපේක්ෂකයාගේ නම සහ ලියාපදිංචි අංකය 16 ප්‍රමාණයේ අක්ෂරයෙන් ද ආයතනයේ නම සහ නිබන්ධය පිළිබඳ විස්තරය 18 ප්‍රමාණයේ අක්ෂරයෙන් ද නිම කළ යුතු ය.

10. අපේක්ෂකයාගේ ප්‍රකාශයෙහි ආදර්ශයක් පහත දැක්වෙයි.

(නිබන්ධයේ මාතෘකාව) නමැති මෙම නිබන්ධය මවිසින් ස්වාධීන ව කරන ලද පර්යේෂණාත්මක අධ්‍යයනයක් වන බවත්, ඒ සඳහා උපයෝගී කරගන්නා ලද මූලාශ්‍රය කවරේද යන්න කෘතිය තුළ විධිමත් පරිදි සඳහන් කර ඇති බවත්, මෙම නිබන්ධය හෝ මෙහි අන්තර්ගතය මෙයට පෙර මවිසින් හෝ අන් අයෙකු විසින් වෙනත් කිසිදු විශ්වවිද්‍යාලයක් වෙත හෝ අධ්‍යයන ආයතනයක් වෙත කවරාකාරයකින් හෝ ඉදිරිපත් කරන ලද්දක් නොවන බවත් මෙයින් සහතික කරමි.

අපේක්ෂකයාගේ නම, අත්සන හා දිනය

11. අධීක්ෂකවරයාගේ/වරුන්ගේ නිර්දේශයෙහි ආදර්ශයක් පහත දැක්වෙයි.

(නිබන්ධ මාතෘකාව) නමැති මෙම නිබන්ධය (ශිෂ්‍ය අංකය) යටතේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ශාස්ත්‍රපති/දර්ශනපති/දර්ශන විශාරද පර්යේෂණ උපාධිය සඳහා ලියාපදිංචි වී ඇති (අපේක්ෂකයාගේ නම) විසින් මගේ/අපගේ අධීක්ෂණය යටතේ කරන ලද ස්වාධීන පර්යේෂණ නිබන්ධයක් වන අතර එය ශාස්ත්‍රපති/ දර්ශනපති/දර්ශන විශාරද උපාධිය ප්‍රදානය කිරීම සඳහා සලකා බැලීම පිණිස සුදුසු බවට නිර්දේශ කරමි/කරමු.

අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ අත්සන/අත්සන් හා දිනය

12. අපේක්ෂකයාගේ ප්‍රකාශය සහ අධීක්ෂකවරයාගේ/අධීක්ෂකවරුන්ගේ නිර්දේශ වෙන් වෙන් පිටුවල සඳහන් කළ යුතු ය.

13. වචන 300කට නොවැඩි නිබන්ධයේ සාරසංක්ෂේපයක් පටුනට පෙර අන්තර්ගත කළ යුතු ය. සිංහල භාෂාවෙන් සම්පාදනය කෙරෙන නිබන්ධයක් නම් සාරසංක්ෂේපයෙහි ඉංග්‍රීසි පරිවර්තනයක් ද සිංහල සාරසංක්ෂේපයට පසු ව යෙදිය යුතු ය.

14. නිබන්ධය ප්‍රමාණවත් පරිච්ඡේද සංඛ්‍යාවකින් සමන්විත විය යුතු වන අතර, හැඳින්වීම ප්‍රථම පරිච්ඡේදය ලෙස සැලකිය හැකි ය. හැඳින්වීමේ පරිච්ඡේදයෙහි සඳහන් කළ යුතු කරුණු අතර පූර්ව අධ්‍යයන සමාලෝචනය, පර්යේෂණ ගැටලුව, පර්යේෂණයේ දී භාවිත කළ ක්‍රමවේද පිළිබඳ හැඳින්වීමක් හා අධ්‍යයන ක්‍රමය එනම්, නිගමනයට එළඹීම සඳහා ඒ ඒ පරිච්ඡේදවල දී සාකච්ඡාවට භාජනය වන කරුණු සංක්ෂිප්ත ව පෙන්වා දීම ද වැදගත් වේ. පරිච්ඡේද අවසානයේ දී නිගමනය අන්තර්ගත කළ යුතු වන අතර එය පරිච්ඡේදයක් ලෙස සැලකිය යුතු නොවේ.

15. ඉතා කෙටි උද්ධෘත සඳහා උද්ධෘත කොමා යොදා ගත හැකි වුව ද දීර්ඝ උපුටා ගැනීම් අන්තර්ගත කිරීමේ දී ඒවා පිටුවේ දෙපස වැඩි අවකාශයක් තබා (indent කර) තනි පේළි පරතරයෙන් යුතු ව 11 ප්‍රමාණයේ අක්ෂරවලින් මුද්‍රණය කළ යුතු ය.

16. නිබන්ධයෙහි දැක්වෙන ග්‍රන්ථ නාම සඳහන් කිරීමට හා සම්භාව්‍ය මූලාශ්‍රය භාෂාගත වචන සඳහා ඇල අකුරු භාවිත කළ යුතු වන අතර ඉංග්‍රීසි භාෂාවෙන් රචිත නිබන්ධයක දී ග්‍රීක, රෝම

හෝ ලතින් වැනි භාෂාවලින් උද්ධෘත යොදා ගැනේ නම්, ඒවා ද ඇල අකුරුවලින් යෙදිය යුතු ය.

17. මූලාශ්‍රය දැක්වීමේ දී සමස්ත නිබන්ධය තුළ පිළිගත් එක ම ශෛලියක් (හාර්වඩ් හෝ චිකාගෝ) පමණක් භාවිත කිරීමට සැලකිලිමත් විය යුතු ය. පාදක සටහන් හෝ අන්ත සටහන් භාවිත කරන්නේ නම් ඒ සඳහා එක් එක් පරිච්ඡේදය වෙනුවෙන් වෙන වෙන ම අනුක්‍රමික අංක බණ්ඩ භාවිත කළ යුතු වන අතර, එම සටහන් තනි පරතරයකින් යුතු ව 10 අක්ෂර ප්‍රමාණයෙන් මුද්‍රණය කළ යුතු ය. එම සටහන් දෙකක් අතර ද්විත්ව පරතරයක් තිබිය යුතු ය.

18. ආශ්‍රිත ග්‍රන්ථාවලිය සම්පාදනයේ දී පර්යේෂණය සඳහා අවශ්‍ය වූ දත්ත ලබා ගත් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පමණක් නොව අදාළ විෂය පිළිබඳ ඥානය වර්ධනය කරගැනීම පිණිස පර්යේෂකයා විසින් අධ්‍යයනය කරනු ලැබූ අනෙකුත් ග්‍රන්ථ ද එහි අන්තර්ගත කළ හැකි ය. එහි දී **ප්‍රාථමික මූලාශ්‍රය** පළමුව ද **ද්විතීයක මූලාශ්‍රය**, සහ **කෝෂ ග්‍රන්ථ** පිළිවෙළින් ඉන් අනතුරු ව ද අකාරාදී පිළිවෙළින් දැක්විය යුතු ය. එහෙත් ග්‍රන්ථාවලිය අංකනය කිරීම නොකළ යුතු ය. ග්‍රන්ථයේ කර්තෘ, ග්‍රන්ථ නාමය, ප්‍රකාශක, ප්‍රකාශිත ස්ථානය සහ වර්ෂය යන විස්තර, අනුගමනය කරන ශෛලිය අනුව ග්‍රන්ථාවලියෙහි සඳහන් විය යුතු ය. එහෙත් තමා බොහෝ දෑ කියවා ඇති පුද්ගලයෙකු බව ව්‍යාජ ලෙස පෙන්වීම සඳහා කිසිදු දිනෙක කියවා නොමැති ග්‍රන්ථ එහි අන්තර්ගත කිරීම නොකළ යුතු ය.

19. මාතෘකා පිටුව ප්‍රථම පිටුව ලෙස සැලකිය යුතු වන නමුත්, එහි අංකය සටහන් කිරීම නොකළ යුතු ය. ප්‍රධාන නිබන්ධය ආරම්භ වන තෙක් පිටු අංක සඳහා රෝම ඉලක්කම් භාවිත කළ යුතු වන අතර, ප්‍රධාන නිබන්ධයෙහි සිට නිබන්ධය අවසානය දක්වා පිටු අංක දැක්වීම පිණිස ඉන්දු අරාබි ඉලක්කම් භාවිත කළ යුතු ය. කිසියම් පරිච්ඡේදයක් ආරම්භ වන පිටුවෙහි පිටු අංකය සටහන් නොකළ යුතු වන අතර, අනෙක් පිටුවල දකුණු පස ඉහළ කෙළවරෙහි පිටු අංකය සටහන් කළ යුතු ය.

20. උපාධිය ප්‍රදානය කිරීම සඳහා නිර්දේශ කරනු ලැබීමෙන් අනතුරු ව, ඝන පිටකවරය යොදා සවිමත් රෙක්සින් බැම්මෙන් බැඳ නිබන්ධයේ පිටපත් 03ක් සුපරීක්ෂක නිර්දේශ ආකෘති පත්‍රය සම්පූර්ණ කොට ආයතනය වෙත භාර දිය යුතු ය. (ශිෂ්‍ය කටයුතු හා විභාග අංශයෙන් ආකෘති පත්‍රය ලබාගත හැකි ය.) දෑවුරුදු ශාස්ත්‍රපති උපාධිය සඳහා වන නිබන්ධයක පිටකවරය රතු පැහැයෙන් ද දර්ශනපති උපාධිය සඳහා වන නිබන්ධයක පිටකවරය නිල් පැහැයෙන් ද දර්ශන විශාරද උපාධිය සඳහා වන නිබන්ධයක පිටකවරය කළු පැහැයෙන් ද සමන්විත විය යුතු ය. නිබන්ධයෙහි නාරටියේ ද නිබන්ධ මාතෘකාව, උපාධියේ නම කෙටියෙන් (M.A හෝ MPhil. හෝ PhD ලෙස) සහ අපේක්ෂකයාගේ නම හා වර්ෂය ද ඇතුළත් විය යුතු ය.

21. ඉහත 20හි දැක්වෙන පිටපත් භාරදෙන අවස්ථාවේ දී අපේක්ෂකයා විසින් Microsoft Word සහ PDF ආකෘතිවලින් සැකසූ නිබන්ධයේ මෘදුපිටපතක් (soft copy) ද සංයුක්ත තැටියක් මගින් ආයතනය වෙත භාරදිය යුතු ය.

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව

# නිබන්ධ මාතෘකාව

අපේක්ෂකයාගේ නම

(ලියාපදිංචි අංකය)

කැලණිය විශ්වවිද්‍යාලයයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ශාස්ත්‍රපති/දර්ශනපති/දර්ශන විශාරද උපාධි අධ්‍යයන ඒකදේශීය අවශ්‍යතාවක් සම්පූර්ණ කරනු පිණිස ඉදිරිපත් කරනු ලබන නිබන්ධය

වර්ෂය හා මාසය

## පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ උපාධි ක්‍රියාවලිය



## 03.6 අර්ධකාලීන ශිෂ්‍යයෝ

1. අවශ්‍යතාව අනුව දර්ශනපති හා දර්ශන විශාරද උපාධි අධ්‍යයනය සඳහා අර්ධකාලීන ශිෂ්‍යයින් ලෙස ද මෙම ආයතනයෙහි ලියාපදිංචි විය හැකි ය.

2. අර්ධකාලීන ශිෂ්‍යයෙකු ලෙස ඇතුළත් වීම අපේක්ෂා කරන විද්‍යාර්ථියෙකු විසින් පූර්ණකාලීන ශිෂ්‍යයෙකු සඳහා නිර්දිෂ්ට සියලු ම සුදුසුකම් ඒ අයුරින් ම සපුරා තිබිය යුතු ය.

3. අර්ධකාලීන ශිෂ්‍යයෙකු ලෙස දර්ශනපති උපාධිය සඳහා නියමිත පර්යේෂණාත්මක අධ්‍යයන අවශ්‍යතා, ඒ සඳහා ලියාපදිංචි වූ දින සිට යටත් පිරිසෙයින් වසර තුනක කාල පරිච්ඡේදයක් තුළ සම්පූර්ණ කරන විද්‍යාර්ථියෙකුට එම උපාධිය පිරිනමනු ලැබේ.

4. අර්ධකාලීන ශිෂ්‍යයෙකු ලෙස දර්ශන විශාරද උපාධිය සඳහා නියමිත පර්යේෂණාත්මක අධ්‍යයන අවශ්‍යතා, ඒ සඳහා ලියාපදිංචි වූ දින සිට යටත් පිරිසෙයින් වසර හතරක කාල පරිච්ඡේදයක් තුළ නිසි පරිදි සම්පූර්ණ කරන විද්‍යාර්ථියෙකුට එම උපාධිය පිරිනමනු ලැබේ.

5. දර්ශනපති උපාධි අධ්‍යයනය සඳහා වසර දෙකහමාරකට නොඅඩු කාල පරිච්ඡේදයක් තුළ අර්ධකාලීන ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින විද්‍යාර්ථියෙකු, තම අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල දී විශිෂ්ට ප්‍රගතියක් පෙන්නුම් කරන්නේ නම්, ඔහුගේ/ඇයගේ ඉල්ලීම පර්යේෂණ අධීක්ෂකවරයාගේ හා අදාළ අංශ ප්‍රධානියාගේ නිර්දේශය මත එම අපේක්ෂකයා අර්ධකාලීන දර්ශන විශාරද උපාධි අධ්‍යයනයට අනුයුක්ත කිරීමේ යෝග්‍යතාව පීඨ සභාව විසින් සලකා බලනු ලැබේ. මෙහි ලා පර්යේෂණ අධීක්ෂකවරයා හා අදාළ අංශ ප්‍රධානියා විසින් සපයනු ලබන ප්‍රගති වාර්තා කෙරෙහි පීඨ සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

6. අර්ධකාලීන ශිෂ්‍යයෙකු පූර්ණකාලීන ශිෂ්‍යභාවය අපේක්ෂා කරන්නේ නම්, ඔහුගේ ඉල්ලීම සලකා බලා අධ්‍යයනාංශ කමිටුවේ නිර්දේශය මත ඔහු පූර්ණකාලීන ශිෂ්‍යයෙකුගේ තත්ත්වයට පත් කරනු ඇත. රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ පෞද්ගලික ආයතනයක සේවයේ නියුක්ත අපේක්ෂකයෙකු පූර්ණකාලීන ශිෂ්‍යභාවය අපේක්ෂා කරන්නේ නම්, පූර්ණකාලීන ශිෂ්‍යයෙකු ලෙස අධ්‍යයන කටයුතුවල නිරත වීමට හැකි වනු පිණිස, තම සේවා ආයතනයේ ප්‍රධානියාගෙන් නිවාඩු අනුමත කොට ගත් බව පිළිගත හැකි සාක්ෂ්‍ය මගින් තහවුරු කළ යුතු ය.

7. දර්ශනපති හා දර්ශන විශාරද උපාධි අධ්‍යයනය සඳහා පූර්ණ කාලීන ලෙස ලියාපදිංචි වී සිටින ශිෂ්‍යයින්ට අදාළ අනෙකුත් සියලු ම කොන්දේසි හා රෙගුලාසි අර්ධකාලීන ශිෂ්‍යයින් සඳහා ද ඒ අයුරින් ම බලපානු ඇත.

## 03.7 පශ්චාත් දර්ශන විශාරද අධ්‍යයන (Postdoctoral Studies)

පිළිගත් විශ්වවිද්‍යාලයකින් දර්ශන විශාරද උපාධියක් ලබා ඇති විද්‍යාර්ථියෙකුට, පර්යේෂණ යෝජනාවක් ද ඉදිරිපත් කරමින්, පශ්චාත් දර්ශන විශාරද අධ්‍යයනයක් සඳහා අයැදුම් කළ හැකි ය. මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය වචන 50,000ක පමණ නිබන්ධයකින් සහ විවෘත වාචික ඉදිරිපත් කිරීමකින් (public verbal presentation) සමන්විත වේ. සාර්ථක ලෙස පර්යේෂණ කටයුතු සම්පූර්ණ කෙරෙන අපේක්ෂකයා වෙත ආයතනය විසින් සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

## පුස්තකාලය











# විදේශ දූත කණ්ඩායම්









# 04. පුස්තකාලය

ආයතනයේ පුස්තකාලය, ගොඩනැගිල්ලේ ප්‍රථම මහලේ පිහිටා ඇත. පුස්තකාලයෙහි මෙහෙවර වනුයේ හැකි හොඳ ම තොරතුරු මූලාශ්‍රය සහ සේවා අවශ්‍ය අවස්ථාවේ දී ම විද්‍යාර්ථීන්ට සපයාදීමෙන් ආයතනය තුළ ඉගැන්වීමේ, ඉගෙනීමේ හා පර්යේෂණ කටයුතු සඳහා සහාය දීම යි. බුදුසමය පිළිබඳ ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රයයන්ගෙන් ප්‍රධාන වශයෙන් පුස්තකාලය සමන්විත වෙයි. 25,000කට අධික කෘති ප්‍රමාණයකින් විමර්ශන සහ බැහැර දෙන ග්‍රන්ථ සමූහය සමන්විත වෙයි. බෞද්ධ අධ්‍යයනය හා සම්බන්ධ උසස් අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා අදාළ වන අයුරින් පවත්නා ග්‍රන්ථ සංඛ්‍යාව පුළුල් වෙයි.

භාවිතය මෙන් ම සංරක්ෂණය ද අරමුණු කර ගෙන අප ආයතනයේ විද්‍යාර්ථීන් විසින් සම්පාදිත පර්යේෂණ නිබන්ධ සහ පාඨමාලාවලට අදාළ වන පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍රවල එකතුවක් ද පුස්තකාලය විසින් පවත්වා ගෙන යනු ලැබේ. පාලි, සිංහල, ඉංග්‍රීසි, තායි, කාම්බෝජියානු, දේවනාගරී සහ බුරුම යන භාෂා අක්ෂරවලින් සංග්‍රහ කරන ලද සම්පූර්ණ ත්‍රිපිටක ග්‍රන්ථමාලා හතක් පුස්තකාලය සතුව පවතී. එයට අතිරේක ව චීන ආගමේ තයිෂෝ ග්‍රන්ථමාලාව ද පුස්තකාලයෙහි ඇත.

## විවෘත කර තබන වේලාව සහ නිවාඩු දිනයන්

අධ්‍යයන කාලය තුළ සතියේ සඳුදා, සිකුරාදා සහ සෙනසුරාදා දිනවල පෙරවරු 09.00 සිට පස්වරු 04.30 දක්වා ද, අඟහරුවාදා, බදාදා සහ බ්‍රහස්පතින්දා දිනවල පෙරවරු 09.00 සිට පස්වරු 06.00 දක්වා ද පුස්තකාලය විවෘතව පවතී. ඉරිදා දිනවල සහ රජයේ නිවාඩු දිනවල පුස්තකාලය වසා තබනු ලැබේ.

# 05. මුද්‍රිකා, ත්‍යාග සහ ශිෂ්‍යත්ව

ස්වකීය අධ්‍යයන කාර්යන්හි දී විශිෂ්ටතා දක්වන විද්‍යාර්ථීන්ගේ ක්‍රියාකාරකම් අගය කිරීම පිණිස පහත දැක්වෙන මුද්‍රිකා, ත්‍යාග සහ ශිෂ්‍යත්ව වාර්ෂික ව ආයතනය විසින් ප්‍රදානය කෙරේ.

## ස්වර්ණ මුද්‍රිකාව

බෞද්ධ අධ්‍යයනය පිළිබඳ සිංහල/ඉංග්‍රීසි ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ ඉහළ ම ලකුණු ලබාගන්නා ශිෂ්‍යයන්ට/ශිෂ්‍යාවන්ට ස්වර්ණ මුද්‍රිකාව ප්‍රදානය කෙරේ.

## රජත මුද්‍රිකාව

බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණයේ ඉහළ ම ලකුණු ලබාගන්නා ශිෂ්‍යයාට/ශිෂ්‍යාවට රජත මුද්‍රිකාව ප්‍රදානය කෙරේ.

## මහායාන අධ්‍යයන ත්‍යාගය

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ **MABS: 06 මහායාන බුදුසමයේ ප්‍රභවය හා මහායාන සූත්‍ර සාහිත්‍යය**' යන විෂය ඒකකයේ ඉහළ ම ලකුණු ලබාගන්නා ශිෂ්‍යයින්/ශිෂ්‍යාවන් දෙදෙනාට මෙම ත්‍යාගය ප්‍රදානය කෙරේ. එහි දී එක් එක් ත්‍යාග ලාභියාට මුදලින් රුපියල් 25,000 බැගින් හිමි වෙයි.

## ඒ. ඩබ්ලිව්. ගුණතිලක අරමුදල් ශිෂ්‍යත්වය

බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණයේ දී ඉහළ ම ලකුණු ලබාගන්නා දේශීය ශිෂ්‍යයා වෙත මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කෙරේ. මෙම ශිෂ්‍යත්වය ඒ. ඩබ්ලිව්. ගුණතිලක අරමුදල විසින් පවත්වා ගෙන එනු ලබන අතර ශිෂ්‍යත්වලාභියා බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ ගාස්තුවලින් නිදහස් කෙරේ.

## පාලි හා බෞද්ධ අධ්‍යයන සඳහා ග්ලෝරියස් සන් ශිෂ්‍යත්වය

හොංකොංහි ග්ලෝරියස් සන් ආයතනය විසින් පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය වෙත ශිෂ්‍යත්ව 20ක් පිරිනමන අතර එයින් ශාස්ත්‍රපති උපාධිය සඳහා ශිෂ්‍යත්ව 14ක් ද දර්ශනපති හා දර්ශන විශාරද උපාධි සඳහා ශිෂ්‍යත්ව 6ක් ද පිරිනැමේ. (මේ සඳහා අයැදුම් කිරීමට ආයතනික වෙබ් අඩවිය බලන්න.)

# 06. අනුබද්ධ ආයතන

## CHINA'S BUDDHIST ACADEMY OF MT. PUTUO

The China's Buddhist Academy of Mt. Putuo stands as one of the Higher Institutions of Chinese Buddhist tradition hosted by the Buddhist Association of China, and co-organized by the Buddhist Academy of China, the Buddhist Association of Zhejiang Province and the Buddhist Association of Zhoushan City. It is situated on Zhujiajian Island of Zhoushan City, Zhejiang Province.

The Academy has 68 academic venerable staff (50 permanent academic staff, 13 supervisors, 5 visiting staff). Several famous experts and scholars are invited as academic leaders, honorary professors and visiting professors. Moreover, the excellent corporative relationship among the China's Buddhist Academy of Mt. Putuo, Otani University of Japan, Garden University of Japan, etc. will provide opportunities for further study for students excelling in their studies.

### Academic Staff

Venerable Dr. Hui Xian (Asanga) - Director
(B.A., M.A., PhD)
Venerable Dr. Pang Yahui - Coordinator for Mt. Putuo
(B.A., M.A., PhD)
Venerable Dr. Chen Shiying (Qindao)
(B.A., M.A., PhD)
Venerable Dr. Neng Jin
(B.A., M.A., PhD)
Venerable Dr. Li Xia (B.A., M.A., PhD)

### Coordinator for PGIPBS

Rev. Dr. Wadinagala Pannaloka

## THE BUDDHA-DHARMA CENTRE OF HONG KONG LTD

The Buddha-Dharma Centre of Hong Kong Ltd (BDCHK) established in April 2012, is a Buddhist Centre devoted to the promotion of the integration of Buddhist Studies with spiritual praxis. Its guiding principle is the doctrine of the Five Spiritual Faculties: faith, vigour, mindfulness, equipoise and wisdom. The Director of BDCHK is Venerable Professor KL Dhammajoti, an internationally renowned scholar in Buddhist Studies and a leading scholar in Sarvāstivāda Abhidharma.



### Academic Staff

Venerable Professor K. L. Dhammajoti, PhD (Kelaniya), Director, BDCHK

**Visiting Teaching Staff**

Venerable Professor Miriswatte Wimalagnana

Professor Y. Karunadasa, PhD (London)

Professor Guang Xing, PhD (London)

Professor G. T. Halkias, PhD (Oxon)

Professor F. Hoffman, PhD (London)

Professor P. R. Wasantha Priyadarshana, PhD (Kelaniya)

Professor Xue Yu, PhD (Iowa)

Professor Yao Zhihua, PhD (Boston)

Dr. Chan Ngan Che, PhD (HKU)

Dr. Chiu Kwok Sum, PhD (Hong Kong Buddhist College)

Dr. Li Kwok Fu, PhD (CUHK)

Dr. Tsui Chung-hui, PhD (HKU)

## Coordinator for PGIPBS

Dr. Ashoka Welitota

## BUDDHIST LIBRARY GRADUATE SCHOOL, SINGAPORE

There was a historical and social need to establish an Institution in Singapore that offers an opportunity for the academic study of Buddhism without losing the focus on the spirit of Buddhist practice. It is for this reason that the Buddhist Research Society established the Graduate School of Buddhist Studies in 2001 through the link programmes with the University of Kelaniya, Sri Lanka. Buddhist Research Society founded in 1983 has been promoting Buddhist education through the Buddhist Library and its activities, which includes courses and seminars conducted by renowned Buddhist Scholars from Sri Lanka, Japan, Europe and North America.

The Graduate School of Buddhist Studies is now known as the Buddhist Library Graduate School. It functions within the premises of the Buddhist Library. Students are free to make use of its amenities which include a Resource Centre that houses many resource materials on Buddhism and related subjects such as psychology, ecology and comparative religions. It has an auditorium that could accommodate hundred people and two seminar rooms for lectures and tutorials.





## Academic Staff

Venerable Dr. Bellanwila Dhammaratana, Principal, B.A. Hons., M.A., PhD

Venerable Dr. Wiloye Wimalajothi, B.A. (Hons.), M.A., PhD, Royal Pandit

## Visiting Lecturers

Emeritus Professor Y. Karunadasa, B.A. (Hons.), Ph.D

Professor ChandimaWijebandara, B.A., PhD

Professor Sumanapala Galmangoda, B.A. (Hons.), MA, Ph.D

Professor Alan Sponberg, Ph.D

Richard P. Hayes, Ph.D

Gene Reeves, Ph.D

## Administrator

Mr. Zheng Yuepeng

## Coordinator for PGIPBS

Dr. Rathísiri Rathnayaka

## The Buddhist Academy of The Great Buddha Temple in Guangzhou, China

The Great Buddha Temple (Chinese: 大佛寺; pinyin: dafo si) is a famous Buddhist monastery with a history of more than one thousand years. Located in Yuexiu 越秀 District, a core area of Guangzhou 廣州, it has long been praised as one of the "Five Great Temples" in the city. In recent years, the Great Buddha Temple, led by its abbot Master Yaozhi 耀智, is devoted itself to promoting Buddhist education within the Buddhist society and beyond. Among others it has started in 2020 a MA program in collaboration with the University of Kelaniya, Sri Lanka





## Keling Academy in Guangxiao Temple, Guangzhou, China.

Guangxiao Temple, one of the most important monasteries in China, has a long history dating back to 4th CE. It is the place where critical Mahayana Buddhist sutras were translated. It is in this temple that the famous Flag-or-Wind Argument Koan was originated and Master Huineng, the Sixth Patriarch of Chan Buddhism, was ordained.

Located in Guangdong Province, one of the most developed and internationalized provinces in China, Guangxiao Temple serves as a center for Buddhist exchanges and Dharma spread. It also houses institutions aiming at popularizing Dharma, such as the Buddhist Association of Guangdong, Guangdong Buddhism College, and Guangzhou Kelin Academy.

Among them, Guangzhou Kelin Academy exclusively offers talents for the English Base of Buddhist Exchange, an institution established in 2017 to spread Dharma internationally. So far, the academy has contributed to organizing conferences such as the 22nd China-Korea-Japan Buddhist Friendship Exchange, Buddhist Seminar for Master-Doctoral Monks, and translated texts such as the Platform Sutra and A Life of Bodhi.

Most Venerable Dr. Mingsheng, Vice President of Buddhist Association of China, is the abbot of Guangxiao Temple and the rector of Kelin Academy. Venerable Miaoyi is the Executive Director of the Buddhist Association of Guangdong, the Acting Supervisor of the West Hall of Guangxiao Temple, the Provost of Guangdong Buddhism College. Talents of the Kelin Academy include MA and PhD graduates from Jinan University in China, Colombo University in Sri Lanka, Lancaster University, and Liverpool Business School in the UK, etc.









## The Academy of Chinese Buddhism (ACB)

The Academy of Chinese Buddhism (ACB) is a non-government organization for education, research, and culture founded in 2012 with the mission to promote Buddhist culture through academic study of Chinese Buddhism, Tibetan Buddhism and Theravada Buddhism as a whole by organizing conferences, workshops, cultural tours, meditation sessions, as well as training programs. It was recognized by the Government of the Hong Kong Special Administration Region as a charitable institution/trust of a public character exempted from tax under Section 88 of the Inland Revenue Ordinance in 2014.









### Board of Directors

Dr. Dou Yaping
Dr. Fan Zhou
Professor Xue Yu (Coordinating Director and the Chair).

### The Academic Committee

Professor Xue Yu: The Chinese University of Hong Kong
Ven. Senior Professor Dhammajothi: University of Kelaniya
Professor Cheng Jianhua: Chinese Academy of Social Science

## Malaysian Buddhist Academy

Malaysian Buddhist Academy (MyBA) is instituted as a non-profit, non-sectarian and benevolent organisation for the benefit of the Malaysian community, and its main objectives is to create a viable platform for a systematic and intellectual mode of study in the field of Buddhist studies which are highly relevant for a holistic understanding of oneself in relation to a peaceful and harmonious society and the world.

Thus providing an opportunities for teaching, learning and research to enable Buddhist scholars and students in general to gain knowledge and insight into Buddhist education based on authentic and reliable sources, creating a sustainable platform of integrating intellectual study (pariyatti), spiritual praxis (paṭipatti), and realization (paṭivedha) of the Buddha-dhamma.

Hence, at MYBA one can be assured of the best in quality Buddhist education!





## FACULTY MEMBERS

**Venerable Dr Chuan Chao,** Ph.D (Nanjing, China)

**Venerable Dr Dhammapala Maha Thera**, Ph.D (HKU)

**Venerable Shi Xian Xing**
B.Sc (Hons) (USM, Malaysia) M.A (NTI, Australia), MBS (HKU)

**Dr. Ngui Kuan Sang,** Ph.D (UM), Fulbright Scholar (Stanford, U.S.A)

**Catherine Tan, J.P.,** MBA (Wales, UK), MBS (HKU)

## VISITING FACULTY MEMBERS

**Bhante Dr. Ayagama Siri Yasassi**
B.A. (Hons), M.A, M.Phil, PhD (Kelaniya), Royal Pandith

**Prof. Wimal Hewamanage**
Ph.D (Wuhan, China), CTHE (Colombo)

## COORDINATOR FOR PGIPBS

Dr. Rathnasiri Rathnayake

## Vidyacarana Buddhist Resource in Malaysia

Established in February 2020, the Vidyācaraṇa Buddhist Resource (VBR), Malaysia, aims to promote the integration of Buddhist study and praxis. We strive to minimise the institutionalised aspect of Buddhism and promote the understanding of the True Dharma through direct discernment of the Buddha and his Dharma, beyond the boundaries of sectarianism.

In respect of praxis, we are committed to the Buddhist ideal of progressive unfolding of the human potential to the highest, through creative transformation of the human consciousness in accordance with the Dharma as the frame of orientation.

In respect of study, we endeavour to provide high-quality academic courses, research and publications. Our academic programmes are affiliated to recognised universities, and are open to ALL – irrespective of nationality, ethnicity, religious affiliation, monastics and the laity.












**Main officers including Director, Registrar, coordinators etc.**

Director: Venerable Professor KL Dhammajoti

Chief Administrator: Venerable Sing Kan

Assistant Bursar: Ms Mary Low

Assistant Registrar: Mr Lum Wai Tuck

Executive Assistant: Ms Dionne Chew

Executive Assistant: Mr Richard Tan

Programme Coordinator (English medium nominated by PGIPBS): Dr Ashoka Welitota

Programme Coordinator (Chinese medium): Dr K. F. Li

**Board of Directors**

Venerable Professor KL Dhammajoti

Venerable Sing Kan

**Members of Academic Board**

Professor Y. Karunadasa

Venerable Professor KL Dhammajoti

Dr. Sree Dharmarakhit

Dr. Nagasena Sraman

Dr. Dhammapāla

Dr. K.F. Li

**Members of Management Committee**

Venerable Professor KL Dhammajoti (Director)

Venerable Sing Kan (Chief Administrator)

Dr. Sree Dharmarakhit

Dr. Nagasena Sraman

Dr. K.F. Li

Ms Lotus Wong

**Members of Academic Staff**

1. Venerable Professor KL Dhammajoti (Academic Director)
2. Professor G. A. Somaratne

3. Professor Guang Xing
4. Professor K. L. Kong
5. Dr. Sree Dharmarakhit
6. Dr. Nagasena Sraman
7. Dr. Amrtānanda
8. Dr. Jñānānanda
9. Dr. Dhammapāla
10. Dr. Dīpen Barua
11. Dr. K.F. Li
12. Dr. N.C. Chan
13. Dr. Tsui Chung Hui
14. Dr. Gao Minyuan
15. Dr. Tan Lingfeng

## FACULTY MEMBERS

**Venerable Dr Chuan Chao,** Ph.D (Nanjing, China)

**Venerable Dr Dhammapala Maha Thera**, Ph.D (HKU)

**Venerable Shi Xian Xing**
B.Sc (Hons) (USM, Malaysia) M.A (NTI, Australia), MBS (HKU)

**Dr. Ngui Kuan Sang,** Ph.D (UM), Fulbright Scholar (Stanford, U.S.A)

**Catherine Tan, J.P.,** MBA (Wales, UK), MBS (HKU)

## VISITING FACULTY MEMBERS

**Bhante Dr. Ayagama Siri Yasassi**
B.A. (Hons), M.A, M.Phil, PhD (Kelaniya), Royal Pandith

**Prof. Wimal Hewamanage**
Ph.D (Wuhan, China), CTHE (Colombo)

## COORDINATOR FOR PGIPBS

Dr. Rathnasiri Rathnayake

# 07. සංගම් හා සංවිධාන

i. ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය

ii. පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍ය සංවිධානය

iii. පශ්චාත් උපාධි ශිෂ්‍ය සංවිධානය




**පාලි හා බෞද්ධ අධ්‍යයන**
**පශ්චාත් උපාධි ආයතනය**
කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

දුරකතනය: +94 112809321
ෆැක්ස්: +94 112809320/22
වෙබ් අඩවිය: http://pgipbs.kln.ac.lk
විද්‍යුත් තැපෑල: pgipbs@gmail.com